# වාර්ෂික වාර්තාව 2021

## ශ්‍රී ලංකා තේ මණ්ඩලය

| | | |
|---|---|---|
| තැපැල් ලිපිනය | : | ශ්‍රී ලංකා තේ මණ්ඩලය, 574, ගාලු පාර, කොළඹ 03, ශ්‍රී ලංකාව. |
| දුරකථන අංකය | : | +94-11-2587814/2582121/2583687 |
| ෆැක්ස් | : | +94 112587341/2589132 |
| විද්‍යුත් තැපෑල | : | teaboard@pureceylontea.com |
| වෙබ් අඩවිය | : | www.srilankateaboard.lk<br>www.pureceylontea.com |

# පටුන

දැක්ම හා මෙහෙවර - 03

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සාමාජිකයන් – 04

විගණන කමිටුවේ සාමාජිකයන් හා නිරීක්ෂකයන් - 05

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්යමණ්ඩලය - 05

ප්‍රවර්ධන හා අළෙවිකරණ කමිටුවේ සාමාජිකයන් - 06

සභාපතිතුමාගේ පණිවිඩය - 07

මූලික දත්ත - 09

සංස්ථාපිත පසුබිම - 10

ව්‍යුහය හා සිදුකළ ක්‍රියාකාරකම් - 11

- තේ කොමසාරිස් අංශය - 12
- තේ අපනයන ඒකකය - 21
- තේ ප්‍රවර්ධන අංශය - 24
- තේ රසබැලිමේ ඒකකය - 41
- විශ්ලේෂණ විද්‍යාගාරය - 43
- පරිපාලන අංශය - 46
- අභ්‍යන්තර විගණන අංශය - 47
- තොරතුරු තාක්ෂණ අංශය - 47

කර්මාන්ත පැතිකඩ - 48

තිරසාර සංවර්ධන ඉලක්ක වෙත යොමු වීම - 64

මූල්‍ය සමාලෝචනය - 66

විගණකාධිපතිතුමාගේ වාර්තාව - 99

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කාර්යාල - 110

## දැක්ම

ගෝලීය වෙළඳපොළ තුළ ශ්‍රී ලාංකීය තේ
"වඩාත් ආකර්ෂණීය පානය"
බවට පත් කිරීම

## මෙහෙවර

කර්මාන්තයේ තිරසාර සංවර්ධනය මඟින් රටට ලැබෙන විදේශ විනිමය ඉපැයීම් වැඩිකර ගැනීම සහ එමඟින් වැවිලි කර්මාන්තයේ නියැලි ප්‍රජාවගේ ආර්ථික සංවර්ධනය සුරක්ෂිත කිරීම

# ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සාමාජිකයන් - 2021

## සභාපති

ජයම්පති මොල්ලිගොඩ මයා

ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## සාමාජිකයන්

ඩබ්ලිව්.එම්.ඩී.ටී. වික්‍රමසිංහ මිය

*2021 ජුනි දක්වා*

හර්ෂ ඉලුක්පිටිය මයා

*2021 ජුලි සිට*

වැවිලි අමාත්‍යාංශය

ඩී. ජීවනාදන් මයා

වෙළඳ අමාත්‍යාංශය

ලලිත් ඔබේසේකර මයා

ලංකා වැවිලිකරුවන්ගේ සංගමය

සමන්ත දොඩන්වෙල මයා

*2021 මාර්තු දක්වා*

හිශාන්ත ද මෙල් මයා

*2021 ජුනි සිට*

කොළඹ තැරැව්කරුවන්ගේ සංගමය

ජයන්ත කරුණාරත්න මයා

කොළඹ තේ වෙළෙඳුන්ගේ සංගමය

චන්දිම වික්‍රමසිංහ මයා

*2021 සැප්තැම්බර් දක්වා*

ලයනල් හේරත් මයා

*2021 ඔක්තෝබර් සිට*

ශ්‍රී ලංකා තේ කර්මාන්තශාලා හිමියන්ගේ සංගමය

කේ.එල්. ගුණරත්න මයා

ශ්‍රී ලංකා කුඩා තේ වතු සංවර්ධන සමිති සම්මේලනය

සංජේ හේරත් මයා

තේ අපනයනකරුවන්ගේ සංගමය

ඩබ්ලිව්.එච්.එස්. සමරසේන මයා

අමාත්‍යතුමාගේ නියෝජිත

ජේ.ඩී.පී.සේනානායක මිය

*2021 ඔක්තෝබර් සිට*

කේ.ජ්.ඩබ්. ප්‍රනාන්දු මිය

*2021 නොවැම්බර් සිට*

මුදල් අමාත්‍යාංශය

මහින්ද විදානපතිරණ මයා

*2021 ජනවාරි සිට 2021 ජුනි දක්වා*

තුෂාර ප්‍රියදර්ශන

*2021 ජුලි සිට*

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

## නිරීක්ෂක

අනිල් අල්විස් මයා

# විගණන කමිටුවේ සාමාජිකයින් සහ නිරීක්ෂකයින් - 2021

## සභාපති

ඩබ්ලිව්.එම්.ඩී.ටී.වික්‍රමසිංහ මිය
අතිරේක ලේකම් (සංවර්ධන), වැවිලි අමාත්‍යාංශය
*2021 ජනවාරි සිට 2021 ඔක්තෝබර් දක්වා*

කේ.ජී.ඩබ්ලිව්. ප්‍රනාන්දු මිය
අධ්‍යක්ෂ, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය
*2021 නොවැම්බර් සිට 2021 දෙසැම්බර් දක්වා*

## සාමාජිකයන්

ඩී.ජීවනාදන් මයා
අතිරේක ලේකම්, වෙළඳ අමාත්‍යාංශය

ජයන්ත කරුණාරත්න මයා
සභාපති, කොළඹ තේ වෙළඳ සංගමය
*2021 නොවැ සිට 2021 දෙසැ දක්වා*

චන්දිම වික්‍රමසිංහ මයා
සභාපති, ශ්‍රී ලංකා තේ කර්මාන්ත ශාලා හිමියන්ගේ සංගමය
*2021 ජනවාරි සිට 2021 ඔක්තෝබර් දක්වා*

හර්ෂ ඉලුක්පිටිය මයා.
අතිරේක ලේකම් (සංවර්ධන), වැවිලි අමාත්‍යාංශය
*2021 නොවැම්බර් සිට 2021 දෙසැම්බර් දක්වා*

## නිරීක්ෂකයන්

කේ.ජී.සී.සමන්ත මයා
ප්‍රධාන අභ්‍යන්තර විගණක, වැවිලි අමාත්‍යාංශය

එස්.ඩී.කටුවාවල මිය
*2021 ජනවාරි සිට 2021 ඔක්තෝබර් දක්වා*
එච්.ජී.ඩී.චාන්දනී මිය
*2021 නොවැ. සිට 2021 දෙසැ. දක්වා*
විගණන අධිකාරී, ජාතික විගණන කාර්යාලය

## කැඳවුම්කරු

එස්.ජී. සිරිවර්ධන මයා
අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා තේ මණ්ඩලය

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලය - 2021

එස්.ජී. සිරිවර්ධන මයා
අධ්‍යක්ෂ ජනරාල්

එච්.එල් පවිත්‍රි පීරිස් මෙනවිය
අධ්‍යක්ෂ (ප්‍රවර්ධන)

ආචාර්ය කේ.ආර්.ඩබ්. අබේවික්‍රම මයා
වැඩ බලන අධ්‍යක්ෂ (විශ්ලේෂණ සේවා)

කුලුණු රණසිංහ මයා
අභ්‍යන්තර විගණක

ට්.ජී.ජේ.කේ. එදිරිසිංහ මයා
තේ කොමසාරිස්

පී.ජී.හිරොෂ් ජයංග මයා
අධ්‍යක්ෂ (මුදල්)

එස්.අයි.සී. පෙරේරා මයා
සහකාර අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන)

# ප්‍රවර්ධන හා අලෙවි කමිටු සාමාජිකයන් - 2021

## සභාපති

ජයම්පති මොල්ලිගොඩ මයා
ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## සාමාජිකයන්

අයි.එස්.එච්.ජේ. ඉලුක්පිටිය මයා
අතිරේක ලේකම් (සංවර්ධන), වැවිලි අමාත්‍යාංශය

එච්.එල් පවිත්‍රි පීරිස් මෙනවිය
අධ්‍යක්ෂ (ප්‍රවර්ධන), ශ්‍රී ලංකා තේ මණ්ඩලය

සංජේ හේරත් මයා
සභාපති, තේ අපනයනකරුවන්ගේ සංගමය

මුෆද්දල් ජාෆර්ජි මයා
සාමාජික, තේ අපනයනකරුවන්ගේ සංගමය

සුරංග හේරත් මයා
ප්‍රධාන විධායක නිලධාරී, ඇමසන් ට්‍රේඩින් පුද්. සමාගම

අනුර සිරිවර්ධන මයා
අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා තේ මණ්ඩලය

ජයන්ත කරුණාරත්න මයා
සභාපති, කොළඹ තේ වෙළෙඳුන්ගේ සංගමය

ටියාබ් අක්බරලි මයා
අධ්‍යක්ෂ, අක්බාර් සහෝදරයෝ

දිල්හාන් සී ප්‍රනාන්දු මයා
ප්‍රධාන විධායක නිලධාරී, එම්.ජේ.එෆ්.සමූහය

විශ් ගෝවින්දසාමි මයා
කළමනාකරණ අධ්‍යක්ෂ, ශන්ෂයින් හෝල්ඩින් සමාගම

## නිරීක්ෂක

අනිල් කුක් මයා
කළමනාකාර අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී
ආසියා සියාකා කොමඩිටීස් (පුද්) සමාගම

# සභාපතිතුමාගේ පණිවිඩය

"පාර්ශවකරුවන් විසින් මුහුණ දුන් අභියෝග රැසක් මධ්‍යයේ වුවද 2021 වසර තුළ ශ්‍රී ලංකා තේ කර්මාන්තය විශිෂ්ට කාර්ය සාධනයක් වාර්තා කර ඇත. "



## අපනයන, විකුණුම් ආදායම සහ තේ නිෂ්පාදනය

2021 වසරේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ තේ වලින් ලබා ගත් සමස්ථ අපනයන ආදායම රුපියල් බිලියන 264ක් (ඇමරිකානු ඩොලර් මිලියන 1,320) වේ. අපනයන කළ සමස්ථ තේ ප්‍රමාණය කිලෝ මිලියන 286 කි. 2020 වර්ෂය තුළ අපනයන ආදායම රුපියල් බිලියන 231 (ඇමරිකානු ඩොලර් මිලියන 1,213) වූ අතර අපනයන ප්‍රමාණය කිලෝ මිලියන 266 කි. 2020 දී කිලෝවක් රුපියල් 867 ක් වූ රේගුවේ සාමාන්‍ය FOB මිල කිලෝවකට රුපියල් 921 දක්වා වැඩි වී ඇති අතර 2019 දී අපනයනය කළ තේ කිලෝවක් රු. 823 ක් විය. කොළඹ වෙන්දේසිදී, 2020 වර්ෂයේ රුපියල් බිලියන 169 ට සාපේක්ෂව මුළු විකුණුම් ආදායම රුපියල් බිලියන 182 ක් ලෙස වාර්තා විය. 2020 වර්ෂයේදී කිලෝවක මිල වූ රුපියල් 627ට සාපේක්ෂව තේ කිලෝවක සාමාන්‍ය මිල රුපියල් 616ක් විය. 2020 වර්ෂයේ අදාළ කාලපරිච්ඡේදය තුළ නිෂ්පාදිත තේ කිලෝ මිලියන 279 ක ප්‍රමාණය හා සැසඳීමේ දී සමස්ථ තේ නිෂ්පාදනය කිලෝ මිලියන 299.5 ක් විය.

මෙහිදී මූලික සැලකිය යුතු කරුණ වන්නේ ශ්‍රී ලංකාවේ තේ වතුවල ඵලදායිතාව කාලයක් තිස්සේ පහත වැටීමයි. 2000 වසරේ තේ නිෂ්පාදනය කිලෝ මිලියන 305 ක් වූ අතර 2010 දී එය මිලියන 328 දක්වා වැඩි විය. ඉහලම නිෂ්පාදනය ලෙස කිලෝ මිලියන 340 ක ප්‍රමාණයක් 2013 වසරේ දී වාර්තා වූ අතර එතැන් සිට තේ නිෂ්පාදනයේ ක්‍රමානුකූල පහත වැටීමක් සිදු විය. එය සංයුක්ත වාර්ෂික වර්ධන වේගය මත පදනම්ව 2.6% ක පහත වැටීමකි . ඉඩම් සහ ශ්‍රමය යන දෙකහිම අඩු ඵලදායිතාව, අධික වියදම්, දේශගුණික විපර්යාසවල අහිතකර බලපෑම් සහ කොවිඩ් - 19 වසංගත තත්වයන් ඇතුළු බොහෝ සාධක හේතුවෙන් තේ නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන පිරිවැය ඉහළ යමින් පවතී.

රසායනික පොහොරවල මිල ඉහළයාමේ තත්වය තුළ, සමබර පෝෂක ද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්තියක් ගොඩනැගීමේ හා උපාය මාර්ගයක් ලෙස පසෙහි ගුණාත්මක බව යලි ඇති කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමේ අවශ්‍යතාවයක් පවතී. ශ්‍රී ලංකා තේ කර්මාන්තයේ සමස්ත සැපයුම් දාමයේ පිරිවැය ප්‍රතිලාභ සාක්ෂාත් කර ගැනීම සඳහා එකී සමබර පෝෂක කළමනාකරණය සඳහා දෙමුහුන් රසායනික, කාබනික සහ ඛනිජ ප්‍රභවයන් මිශ්‍ර පොහොර වැඩසටහන් දියත් කළ යුතුය. තේ පර්යේෂණ ආයතනය මේ සම්බන්ධයෙන් උපදේශන මාර්ගෝපදේශ සකස් කිරීමේ කටයුත්තෙහි නියැලෙමින් සිටින බව සතුටින් දන්වා සිටිමි.

## තරඟකාරී වෙළඳපොල විශ්ලේෂණය

කෙන්යානු තේ නිෂ්පාදනය (ශ්‍රී ලංකාවේ තේ සඳහා සිටින ප්‍රධානම තරගකරුවා) ශීඝ්‍රයෙන් ඉහළ යමින් පවතින අතර පසුගිය වසර 10 තුළ ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය පහල බසිමින් පවතින බව මෙහිදී සඳහන් කළ යුතුය. මෙයට හේතු වන්නේ, තේ නැවත වගා කිරීම සහ පාලු සිටුවීම සිදු නොවීම, දේශගුණික විපර්යාස බලපෑම් සහ අනෙකුත් හේතු සඳහා පිළියම් සෙවීමට නිෂ්පාදකයන්ට ඇති නොහැකියාව, පොහොර යෙදුවද පස ක්‍රමයෙන් ඛාදනය වීම සහ ඉඩම් කොටස් වලට කැඩීයාමයි.

අනෙක් අතට කෙන්යානු තේ වෙන්දේසියේ මිල ශ්‍රී ලංකාවේ මිලට වඩා ඇමෙරිකානු ඩොලර් වලින් අඩු වන අතර, එනම්, කොළඹ තේ වෙන්දේසියේ තේ කිලෝවක සාමාන්‍ය මිල ඩොලර් 3.10 හා සැසඳීමේ දී ඩොලර් 1.95 ක සාමාන්‍ය අගයක් වාර්තා කරමින් කෙන්යානු වගාකරුවන්ගේ තේ මිලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ කුඩා තේ වතු හිමියන්ට සාධාරණ මුදලක් හිමි වේ. 1957 අංක 51 දරණ තේ පාලන පනත යටතේ ශ්‍රී ලංකාවේ තේ සැපයුම් ජාල මෙහෙයුම් නියාමනය කරනු ලැබේ. සිලෝන් තේ යනු ගෝලීය වෙළඳපොලේ මිල අධිකම තේ වේ. එම තේ මිල ව්‍යුහය, ගෝලීය වෙළඳපොල අපනයනකරුවන් හා අලෙවිකරුවන් සඳහා වඩාත් තරගකාරී වීමට හේතුවන කරුණක් වේ. ශ්‍රී ලංකා තේ කර්මාන්තයේ සමස්ත කාර්ය සාධනය සතුටුදායක වේ. කෙසේ වෙතත්, සිලෝන් තේ සඳහා තවදුරටත් ඉහළ මිලක් ලබා ගැනීම අභියෝගයක් වී ඇත. මන්ද, කෙන්යානු සහ ඉන්දීය වෙන්දේසි මිල කොළඹ වෙන්දේසි මිලට වඩා බෙහෙවින්ම අඩු බැවිනි.

## ප්‍රවර්ධන සහ අලෙවිකරණ උපාය මාර්ගය

ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය හුදෙක් බොහෝ සෙයින් අවශ්‍ය කරන විදේශ විනිමය උපයන අපනයන ව්‍යාපාරයක් නොව එය මිලියන 2'5 කට අධික ජනතාවට ජීවන මාර්ගයක් ලෙස හා එහෙයින්, ගැනුම්කරුගේ සිට පාරිභෝගිකයා දක්වා තේ අපනයනයට අමතරව සිලෝන් තේ ගැනුම්කරුගේ සිට ගැනුම්කරු දක්වා ප්‍රවර්ධනය හා අලෙවිය කෙරෙහි සැබෑ අවධානයක් යොමු කරමින් තේ අපනයනකරුවන් 280ක් පමණ දිරිමත් කිරීම මගින් දැනට ක්‍රියාත්මක වන කුඩා තේ වතු හිමියන් 480,000 ක් සහ තේ කර්මාන්ත ශාලා 600 ක් සහ වතු කම්කරුවන් 135,000 ක් ආරක්ෂා කර පෝෂණය කළ යුතුය. ශ්‍රී ලංකාවේ තේවලින් 80%කට වැඩි ප්‍රමාණයක් රටවල් විස්සකට අපනයනය කෙරෙන අතර ප්‍රධාන ආනයනික රටවල් වන්නේ ඉරාකය, තුර්කිය, රුසියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ඉරානය සහ චීනයයි.

"සිලෝන් තේ ගෝලීය ව්‍යාපාරය" යටතේ දැනටමත් අනුමත ප්‍රවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සහ සියලුම කර්මාන්ත පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය ඇතිව සකස් කරන ලද වේගවත් අලෙවිකරණ උපාය මාර්ග සමග ශ්‍රී ලංකාව අගය දාමයේ ඉදිරි පෙල කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුය. සිලෝන් තේ පරිභෝජනයේ ඇති සෞඛ්‍ය ප්‍රතිලාභ මෙන්ම තිරසාරබව හා සුචතා සාධක මත පදනම්ව නිෂ්පාදනයේ අව්‍යාජබව කෙරෙහි අවධානය යොමු කරන ලද ප්‍රවර්ධන ව්‍යාපාර හරහා ලොව පුරා සිටින බුද්ධිමත් තේ පාරිභෝගිකයින් සිලෝන් තේ සඳහා ඉහල මිලක් ගෙවීමට ආකර්ෂණය කර ගත හැකිය.

ඉහත කරුණු අනුව, අපනයනකරුවන්ට සිලෝන් තේ "සන්නාම සමානාත්මතාවයෙන්" යුතුව ලාභ ඉපයීමට හැකිවන පරිදි නිෂ්පාදිත තේ කිලෝවක පිරිවැය අඩු කිරීම සඳහා නිෂ්පාදකයින් විසින් අවධානය යොමු කරන ප්‍රධාන ක්ෂේත්‍රවලින් එකක් වන්නේ "ඒකාබද්ධ ඵලදායිතාව සහ ගුණාත්මක උපාය මාර්ගයයි. මෙම තත්වයන් තුළ, පාරිසරික හා ආර්ථික තිරසාරබව ළඟා කර ගැනීම සඳහා පසෙහි ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට හා සේවකයන්ගේ, කුඩා වතු හිමියන්ගේ / වගාකරුවන්ගේ සමාජ යහපැවැත්ම කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා නිෂ්පාදකයින් විසින් වැඩි ඛනිජ සහ කාබනික යෙදවුම් සමග ඒකාබද්ධ සමතුලිත පෝෂක කළමනාකරණ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම වැදගත් වේ. රසායනික අපද්‍රව්‍ය අවම මට්ටමක පවත්වා ගැනීම සහ ශ්‍රී ලංකා තේවල පවිත්‍රත්වය සුචතාවය ඇතුළු තිරසාර ලක්ෂණ විදහා පෑම තුළින් ලොව පිරිසිදුම තේ වශයෙන් සිලෝන් තේ සන්නාමය ශක්තිමත් කළ යුතුය. එම වාතාවරණය තුළ පමණක් තේ ක්ෂේත්‍රය පිළිබඳ දැක්ම සැලකිය යුතු සාර්ථකත්වය රඳා පවතින්නේ "තිරසාර ආහාර" කාණ්ඩය යටතේ උසස් තත්වයේ පානයක් ලෙස ඉලක්ක ගෝලීය වෙළඳපල තුළ "සිලෝන් තේ" අලෙවි කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට අපට ඇති හැකියාව මතය.

## නිගමනය

ගොවීන්ගේ සිට දළු නෙළන්නන්, නිෂ්පාදකයින්, තැරැව්කරුවන් සහ තේ අපනයනකරුවන් සහ/හෝ සන්නාම අලෙවිකරුවන් දක්වා ගෝලීය අගය දාමයේ ක්‍රියාකරුවන් හට නිසි පිළිගැනීමක් ලබා දිය යුතුය. මෙම සියලු පාර්ශ්වකරුවන්ට ඔවුන්ගේ කැපවීම, වගවීම සහ සමාලෝචිත වර්ෂය තුළ ලබා ගත් සාපේක්ෂ කාර්ය සාධනය වෙනුවෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සිටින අපගේ කෘතඥතාව පළ කිරීමට කැමැත්තෙමු. දුෂ්කර හා අභියෝගාත්මක වාතාවරණයක් යටතේ එය විශිෂ්ට ජයග්‍රහණයකි. ගරු අමාත්‍ය, රාජ්‍ය අමාත්‍ය, වැවිලි අමාත්‍යාංශයේ නිලධාරීන් සහ අනෙකුත් රාජ්‍ය නිලධාරීන් වෙත ගෞරවය පුද කිරීම මෙහි දී වැදගත්ය. අවසාන වශයෙන්, ශ්‍රී ලංකා තේ මණ්ඩලය තුළ සිටින මගේ සගයන්ට සහ කාර්ය මණ්ඩලයට මාගේ අවංක කෘතඥතාව පුද කරමි.



**ජයම්පති මොල්ලිගොඩ**

සභාපති

ශ්‍රී ලංකා තේ මණ්ඩලය

# මූලික දත්ත

| වර්ගය | ඒකකය | 2019 | 2020 | 2021 | 2020 සහ 2021 වෙනස (%) |
|---|---|---|---|---|---|
| **තේ නිෂ්පාදනය** | | | | | |
| සමස්ථ තේ නිෂ්පාදනය | කි.ග්‍රෑම් මිලියන | 300.12 | 278.85 | 299.49 | 7.40 |
| **උන්නතාංශය අනුව වර්ගීකරණය** | | | | | |
| උඩරට | කි.ග්‍රෑම් මිලියන | 63.05 | 62.24 | 65.33 | 4.95 |
| මැදරට | කි.ග්‍රෑම් මිලියන | 47.17 | 46.73 | 50.99 | 9.10 |
| පහතරට | කි.ග්‍රෑම් මිලියන | 189.90 | 169.88 | 183.18 | 7.83 |
| **සැකසුම් ක්‍රමය අනුව වර්ගීකරණය** | | | | | |
| සාම්ප්‍රදායික (ජෛව, ඇතුළුව) | කි.ග්‍රෑම් මිලියන | 273.89 | 252.72 | 270.72 | 7.12 |
| සී.ටී.සී. තේ | කි.ග්‍රෑම් මිලියන | 23.59 | 24.10 | 26.19 | 8.70 |
| හරිත තේ | කි.ග්‍රෑම් මිලියන | 2.64 | 2.03 | 2.57 | 26.86 |
| ඉහත නිෂ්පාදන දත්ත ක්ෂණික තේ හැර දක්වා තිබේ | | | | | |
| **ක්ෂණික තේ නිෂ්පාදනය** | කි.ග්‍රෑම් මිලියන | 4.36 | 3.06 | 3.64 | 18.95 |
| **තේ අලෙවිය (රාජ්‍ය, සෘජු, පෞද්ගලික අංශ ඇතුළුව)** | | | | | |
| සමස්ථ තේ අලෙවිය | කි.ග්‍රෑම් මිලියන | 301.92 | 268.24 | 295.79 | 10.27 |
| උඩරට | කි.ග්‍රෑම් මිලියන | 59.97 | 56.46 | 63.52 | 12.49 |
| මැදරට | කි.ග්‍රෑම් මිලියන | 52.14 | 48.05 | 52.34 | 8.92 |
| පහතරට | කි.ග්‍රෑම් මිලියන | 189.81 | 163.72 | 179.94 | 9.90 |
| සමස්ථ තේ අලෙවි මිල | රු./කි.ග්‍රෑම් | 545.02 | 628.21 | 615.44 | (2.03) |
| උඩරට | රු./කි.ග්‍රෑම් | 509.40 | 580.90 | 587.13 | 1.07 |
| මැදරට | රු./කි.ග්‍රෑම් | 470.96 | 553.94 | 550.80 | (0.57) |
| පහතරට | රු./කි.ග්‍රෑම් | 576.62 | 666.32 | 644.23 | (3.32) |
| **තේ අපනයන** | | | | | |
| තේ අපනයන ප්‍රමාණය (ප්‍රති අපනයන හැර) | කි.ග්‍රෑම් මිලියන | 283.00 | 256.58 | 276.00 | 7.57 |
| **වර්ගය අනුව** | | | | | |
| කළු තේ | කි.ග්‍රෑම් මිලියන | 277.53 | 251.78 | 270.76 | 7.54 |
| හරිත තේ | කි.ග්‍රෑම් මිලියන | 2.27 | 1.99 | 2.27 | 14.42 |
| ක්ෂණික තේ | කි.ග්‍රෑම් මිලියන | 3.04 | 2.81 | 2.97 | 5.55 |
| තේ අපනයනය - වටිනාකම (ප්‍රති අපනයන හැර) | රු. බිලියන | 227.00 | 218.80 | 249.10 | 13.85 |
| **වර්ගය අනුව අපනයන අදායම** | | | | | |
| කළු තේ | රු. බිලියන | 219.35 | 210.62 | 238.86 | 13.41 |
| හරිත තේ | රු. බිලියන | 4.41 | 4.11 | 5.07 | 23.48 |
| ක්ෂණික තේ | රු. බිලියන | 4.12 | 4.07 | 5.16 | 26.96 |
| සමස්ත තේ අපනයන ප්‍රමාණය | කි.ග්‍රෑම් මිලියන | 292.66 | 265.57 | 285.87 | 7.64 |
| සමස්ත තේ අපනයන වටිනාකම | රු. බිලියන | 241.00 | 230.17 | 263.35 | 14.42 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය හා ශ්‍රී ලංකා රේගුව

# 1.ආයතනයේ පසුබිම

*1985 අංක 17, 1990 අංක 44, 2003 අංක 29, 2006 අංක 44 සහ 2018 අංක 13 දරණ පනත් මගින් සංශෝධිත 1975 අංක 14 දරණ ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතිය යටතේ තේ පාලන දෙපාර්තමේන්තුව - 1957 අංක 51 දරණ තේ පාලන පනත, තේ අපනයන කොමසාරිස් දෙපාර්තමේන්තුව 1959 අංක 16 දරණ තේ (බදු සහ අපනයන පාලන) පනත, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය- 1925 තේ පර්යේෂණ ආඥාපනත සහ ශ්‍රී ලංකා තේ ප්‍රචාරණ මණ්ඩලය ඒකාබද්ධ කරමින් 1976 ජනවාරි පළමු වන දින ශ්‍රී ලංකා තේ මණ්ඩලය පිහිටුවන ලදී. 1993 දී, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය, 1993 අංක 52 දරණ තේ පර්යේෂණ පනතේ කළමනාකරණය යටතට පත්විය. ගෝලීය අවශ්‍යතා සපුරාලීම සඳහා වර්තමාන නීති හා රෙගුලාසි හැඩගස්වා ගැනීමේ අවශ්‍යතාවයන් මත පදනම්ව ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතියෙහි හා තේ පාලන පනතෙහි සංශෝධනයන් සිදු වෙමින් පවතී.*

ශ්‍රී ලංකා තේ මණ්ඩලය පිහිටුවීමට පෙර, ගෝලීය සන්දර්භය තුළ පුද්ගලික අංශය විසින් සිදු කරන ලද ශ්‍රී ලංකා තේ (සිලෝන් තේ) ප්‍රවර්ධනය කිරීමේ කාර්යය තේ ප්‍රචාරක මණ්ඩලය විසින් මෙහෙයවන ලදී. 1976 දී, තේ ප්‍රචාරක මණ්ඩලය පාර්ලිමේන්තුව මගින් අහෝසි කරන ලද අතර තේ ප්‍රචාරක මණ්ඩලය තේ කර්මාන්තයට ඇති බලතල සහිතව ශ්‍රී ලංකා තේ මණ්ඩලය බවට පරිවර්තනය කරන ලදී.

නියාමන ආයතනය ලෙස තේ කර්මාන්තයේ කටයුතු නියාමනය කිරීමේ වගකීම ශ්‍රී ලංකා තේ මණ්ඩලය සතු වේ. එනම්, නිෂ්පාදනය, වගා කිරීම වැඩි දියුණු කිරීම, නැවත සිටුවීම, පැරණි වතු පුනරුත්ථාපනය කිරීම, කර්මාන්තශාලා පිහිටුවීම සහ ඒවායේ මෙහෙයුම් අධීක්ෂණය කිරීම ආදියයි. එයට අමතරව, තේ වතු කළමනාකරණයෙහි සහ දේශීය හා විදේශීය තේ නිෂ්පාදනයෙහි හා අලෙවිකරණයෙහි නියැලී සිටින සියලුම ආයතන සහ සංවිධාන පාලනය කිරීම මෙන්ම මෙහෙයවීම මෙමගින් සිදු කෙරේ. සිලෝන් තේවල ගුණාත්මකභාවය, පවත්වා ගැනීම සඳහා කර්මාන්තශාලාවේ සිට බෙදා හැරීමේ අවස්ථාව දක්වා වූ සමස්ත ක්‍රියාවලියම අධීක්ෂණය කර ඇගයීමට ලක් කර ඇති අතර විකුණුම්, පූර්ව බෙදාහැරීම, තැරැව්කරුවන්ගේ ගබඩාවන්, මිශ්‍ර කරන්නන්, අපනයනකරුවන් සහ මිශ්‍රණය සහ ගබඩා කිරීම සනීපාරක්ෂකව කිරීම පිළිබඳ උපදේශන සේවා සැපයීම යන අවස්ථාවන්හි තේවල ගුණාත්මක ප්‍රමිතීන් අධීක්ෂණය ශක්තිමත් කිරීම සඳහා ක්‍රියා මාර්ග රාශියක් ආරම්භ කර තිබේ.

සංවර්ධන කාර්යයන් යටතේ, වගාකරුවාගේ සිට අපනයනකරුවන් දක්වා අගය දාමයේ සියලුම ස්ථාන ආවරණය වන පරිදි ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සහනාධාර , දැනුවත් කිරීමේ වැඩසටහන් සහ උපදේශන වැඩසටහන් සඳහා පහසුකම් සපයයි. සහනාධාර, තේ වගාකරුවන්, කර්මාන්තශාලා සහ ජෛව පොහොර නිෂ්පාදකයින් සඳහා දැනුවත් කිරීම් වලට අමතරව තේ ඉඩම්වල ඵලදායිතාව ඉහළ නැංවීමට, අමු තේ සහ තේවල ගුණාත්මක බව ඉහළ නැංවීමට සහ අවසානයේ තේ කෝප්පයකට / කිලෝවකට වඩා හොඳ මිලක් ලබාගැනීම සඳහා සංවර්ධන වැඩසටහන් රැසක් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් 2021 සිට ක්‍රියාත්මක කෙරේ.

සංවේදී හා රසායනික නියැදි විශ්ලේෂණ මගින් වෙන්දේසිට පෙර සහ පසු තේ සාම්පල ඇගයීමට ලක් කිරීම  තේ රස බැලීමේ ඒකකය මගින් සිදු කෙරේ. නියාමන සහ සංවර්ධන කාර්යයන් හරහා ලැබෙන තේ සාම්පල සඳහා තත්ව සහතික නිකුත් කිරීම සහ කර්මාන්ත පාර්ශවකරුවන් ආවරණය කිරීම ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ විශ්ලේෂණ රසායනාගාරය විසින් සිදු කරනු ලබයි.

ගෝලීය වශයෙන් උපාය මාර්ගික ප්‍රවේශයන් ඔස්සේ සිලෝන් තේ සම්බන්ධ අලෙවිකරණ හා ප්‍රවර්ධනය කටයුතු ප්‍රවර්ධන ක්‍රියාකාරකම් මගින් සිදු කරනු ලබයි. ලොව පුරා පවතින අස්ථාවර ආර්ථික තත්වය සහ පාරිභෝගිකයින්ගේ පරිභෝජන රටාවන් සහ මිලදී ගැනීමේ හැකියාවන් වෙනස් කරමින්, තේ කර්මාන්තයේ පාර්ශවකරුවන්ගේ විදේශ විනිමය ඉපැයීම් සහ යහපැවැත්ම සුරක්ෂිත කිරීම සඳහා සිලෝන් තේවල ස්ථාවරබව ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ප්‍රයත්න දරනු ලබයි.

කර්මාන්තයේ ප්‍රමුඛතම ආයතනය ලෙස ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් තේ නිෂ්පාදනය, අලෙවිකරණය, අපනයන, තේ සම්බන්ධ ගෝලීය තත්වයන් සහ ඉදිරි වසර සඳහා ඉලක්ක සම්බන්ධ සංඛ්‍යාලේඛන සපයයි.

තේ කර්මාන්තයට අදාළ තීරණ සහ ක්‍රියාත්මක කිරීම් අවසාන වශයෙන් අනුමත කරනු ලබන්නේ පාර්ශ්වකරුවන් සහ රේඛීය අමාත්‍යාංශය හා මුදල් අමාත්‍යාංශය ඇතුලු බලධාරීන්  නියෝජනය කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි.

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීම හා ඒ සඳහා උපදෙස් ලබා දීම වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ විෂය පථය යටතේ සිදු කරනු ලැබේ. මූලික කටයුතු රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව මගින් සමීපව අධීක්ෂණය කරනු ලබන අතර විශේෂයෙන් එමගින් භාණ්ඩාගාර ප්‍රදාන සඳහා නිර්දේශ සහ අනුමැතීන් ලබා දේ.

# 2.ව්‍යුහය සහ සිදු කළ ක්‍රියාකාරකම්



# 2.1 තේ කොමසාරිස් අංශය

1975 අංක 14 දරණ ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ විධිවිධාන යටතේ පත් කර ඇති තේ කොමසාරිස්වරයා ගේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක වන තේ කොමසාරිස් අංශය ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රධාන අංශ අතුරින් එකකි. තේ කොමසාරිස් අංශය විසින් 1975 අංක 14 දරණ ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත සහ 1957 අංක 51 දරණ තේ පාලන පනත අනුව තේ කර්මාන්තයේ සංවර්ධනය, නිෂ්පාදනය, අපනයනය හා අදාළ නියාමන සහ අධීක්ෂණ කාර්යයන් සම්බන්ධයෙන් වන සියලු කටයුතු පාලනය කරයි.

ගම්පොල, බණ්ඩාරවෙල, රත්නපුර, මාතර, බදුරලිය, ගාල්ල සහ නුවරඑළිය යන ප්‍රදේශවල පිහිටුවා ඇති ප්‍රාදේශීය කාර්යාල 07ක් වෙතට තේ කොමසාරිස් අංශයේ කාර්යයන් විමධ්‍යගත කර ඇත.

තේ කර්මාන්තයේ අභිවෘද්ධිය උදෙසා තේ ක්ෂේත්‍රයේ කටයුතු විධිමත් කිරීමේ වගකීම තේ කොමසාරිස් අංශය සතු වේ. කාර්යක්ෂමතාව ඇති කර ගැනීම සඳහා තේ කොමසාරිස් අංශයේ කටයුතු නියාමන, සංවර්ධන හා අපනයන යන ප්‍රධාන අංශ තුනක් (03) යටතේ සිදු කෙරේ.

තේ කොමසාරිස් අංශය තේ කර්මාන්තයේ අඛණ්ඩ පැවැත්ම උදෙසා පහත සඳහන් කාර්යයන් ඉටු කරනු ලබයි..

- තේ නිෂ්පාදකයන් සහ කර්මාන්ත ශාලා ලියාපදිංචිය/බලපත්‍ර ලබාදීම සහ අලුත් කිරීම.
- හරිත තේ දළු වෙළෙන්දන් ලියාපදිංචිය සහ අධීක්ෂණය.
- කසළ තේ පිරිසැකසුම් මධ්‍යස්ථාන ලියාපදිංචිය සහ අධීක්ෂණය.
- වෙන්දේසි අයිතිය සඳහා කසල තේ මධ්‍යස්ථාන ලියාපදිංචිය.
- තේ නිෂ්පාදන ක්‍රියාවලිය, හරිත තේ වෙළෙන්දන් සහ කසළ තේ මධ්‍යස්ථාන සඳහා අධීක්ෂණ හා උපදේශන සේවා ලබා දීම .
- හරිත තේ දළුවල තත්වය ඉහළ දැමීම සඳහා සහ පසු අස්වනු හානිය අවම කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- කර්මාන්තශාලා නවීකරණය සහ නැවත වගාව සඳහා සහනාධාර ලබාදීම (පවතින වගා බිම්වල පාළු සිටුවීම සහ නව වගා බිම් ඇති කිරීම)
- කර්මාන්ත ශාලා සහ දළු වෙළෙඳුන් විසින් දළු සැපයුම්කරුවන් සඳහා සිදුකරන සාධාරණ මිල ගණන් ගෙවීම අධීක්ෂණය කිරීම.
- තේ කර්මාන්තශාලාවල හා ගබඩාවල මනා නිෂ්පාදන ක්‍රම (GMP) පිළිබඳව අධීක්ෂණය.
- තේ නිෂ්පාදනයට අදාළ සංඛ්‍යා දත්ත රැස් කිරීම හා අදාළ ආයතනවලට ඒවා බෙදා හැරීම.
- තේ ක්ෂේත්‍රයේ අවභාවිතාවන් පාලනය කිරීම සඳහා තේ කර්මාන්තශාලාවල, දළු වෙළෙඳ මධ්‍යස්ථානවල සහ කසළ තේ සැකසුම් මධ්‍යස්ථානවල විශේෂ විමර්ශන පැවැත්වීම.
- ශ්‍රී ලංකා තේ මණ්ඩල නිලධාරීන්ගෙන් හෝ පොලිසියෙන් ලද තේ සාම්පල පරීක්ෂණ සඳහා යොමු කිරීම.
- සාම්පල වාර්තාව අනුව අවශ්‍ය පියවර ගැනීම.
- අධිකරණ නඩු සම්බන්ධ බලය ඇති පොලිස් නිලධාරීන් වෙත ලිපි යැවීම.
- තේ බිම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන යටතේ තේ ඉඩම් තොරතුරු යාවත්කාලීන කිරීම සහ අලුත් තොරතුරු ලබා ගැනීම.
- "ආදර්ශ තේ වගාබිම්" වැඩසටහන යටතේ තේ වගාකරුවන්ට (අක්කර 10ට වැඩි) සහනාධාර ලබා දීම.
- තේ ඉඩම් සඳහා ග්ලයිපොස්පෙට් අනුමත කිරීම.
- තේ තවාන් ව්‍යාපෘතිය සඳහා සහනාධාර ක්‍රියාත්මක කිරීම.
- ක්ෂේත්‍රයට නව සාධාරණ මිල සූත්‍රයක් හඳුන්වා දීම.
- ජෛව පොහොර ව්‍යාපෘතිය සඳහා සහනාධාර යෝජනා ක්‍රමය ආරම්භ කිරීම.
- සූර්ය බලශක්ති ව්‍යාපෘතිය සඳහා සහනාධාර යෝජනා ක්‍රමය ආරම්භ කිරීම.
- තේ දළුවල තෙතමනය මනින මීටර් සඳහා සහනාධාර යෝජනා ක්‍රමයක් ආරම්භ කිරීම.
- ආහාර සුරක්ෂිතතා සහතික කිරීම සඳහා වූ සහනාධාර ක්‍රමයක් ආරම්භ කිරීම.(HACCP)

1975 අංක 14 දරණ ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 25 වගන්තිය යටතේ සාදන ලද සහ තේ කොමසාරිස්වරයා වෙත පවරන ලද තේ බිම් නියාමන නියෝග පහතින් සඳහන්වේ.

(අ) 1986 ශ්‍රී ලංකා තේ මණ්ඩල (නිමි තේ පිරිසැකසුම සහ සනීපාරක්ෂක තත්ත්ව) නියෝගය.

(ආ) ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නැවත වගාව සහ කර්මාන්ත ශාලා නවීකරණ සහනාධාර ක්‍රමය.

## ප්‍රධාන ජයග්‍රහණ

- හෙක්ටයාර් 359.68 ක් සඳහා රු. මිලියන 73.88 ක තේ නැවත වගා කිරීමේ සහනාධාරය ලබා දුනි.
- කර්මාන්තශාලා 35ක් සඳහා රු.මිලියන 15.6ක කර්මාන්තශාලා නවීකරණ සහනාධාරයක් ලබා දුනි.
- තේ වවන්නන් හට සහනාධාර ලබා දීම සඳහා ආදර්ශ තේ ඉඩම් ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී (අක්කර 10ට වැඩි). මේ යටතේ රු. මිලියන 13.85 ක් ඉඩම් (පුද්ගලයන්) 43 දෙනෙකු සඳහා ලබා දෙන ලදී.
- තේ ඉඩම් ලියාපදිංචියට අදාළ කටයුතු අඛණ්ඩව සිදු කිරීම (තොරතුරු යාවත්කාලීන කිරීම)
- තේ ඉඩම් සඳහා ග්ලයිපොස්පේට් (glyphosate) අනුමත කිරීම.
- තේ තවාන් සහනාධාර යෝජනා ක්‍රමය ආරම්භ කිරීම හා තවාන් 93 ක් සඳහා රු. මිලියන 84.57 ක් ලබා දීම.

## නිෂ්පාදකයින් සහ කර්මාන්තශාලා ලියාපදිංචි කිරීම

1957 අංක 51 දරණ තේ පාලන පනතට අනුව තේ කොමසාරිස් අංශය විසින් තේ නිෂ්පාදන සහ එම නිෂ්පාදකයන් සතු ලියාපදිංචි කිරීමට තිබෙන කර්මාන්තශාලා සම්බන්ධ අනුමත තොරතුරු පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන යනු ලබයි. පනතට අනුව නිෂ්පාදකයකු ලෙස ලියාපදිංචි වීමට කිසියම් අයෙකු හිමිකම් ලබන්නේ ද යනවග තීරණය කිරීමට තේ කොමසාරිස් වෙත බලය පැවරී ඇත. සෑම නිෂ්පාදකයෙකුම තේ නිෂ්පාදනය සඳහා මෙන්ම කොළඹ වෙන්දේසිය ඔස්සේ තේ විකිණීම සඳහා ද තේ මණ්ඩලයෙහි ලියාපදිංචි විය යුතුයි.

ගුණාත්මක තත්වයේ තේ නිෂ්පාදනයට හිතකරවන පරිදි තම ගොඩනැගිලි, උපකරණ සහ මෙහෙයුම් ක්‍රම ක්‍රියාත්මක වන්නේ ද යනවග සහතික කරලීම සඳහා මෙන්ම කර්මාන්ත ශාලා විසින් නිපදවන තේවල ගුණාත්මක බව අධීක්ෂණය කිරීමේදී සහාය වීම, කසල තේ අපහරණය පාලනය කිරීම සහ සාධාරණ මිල සූත්‍රයක් ක්‍රියාත්මක කිරීම සඳහා සියලුම නිම් තේ නිෂ්පාදන කර්මාන්තශාලා තේ මණ්ඩලයෙහි ලියාපදිංචි වීම අත්‍යාවශ්‍ය වේ.

නිෂ්පාදන ක්‍රියාවලිය අනුව ලියාපදිංචි තේ කර්මාන්තශාලා ආකාර 04කට වර්ග කළ හැකිය. සාම්ප්‍රදායික, CTC, හරිත සහ "අතින් සාදන ලද" ආදී වශයෙනි. තේ කොමසාරිස් විසින් සාදන ලද TC05 ආකෘතිය භාවිත කර සෑම ලියාපදිංචි තේ නිෂ්පාදකයෙකු විසින්ම තම නිෂ්පාදන පිළිබඳ දත්ත ඊළඟ මාසයේ 05ට පෙර තේ කොමසාරිස් වෙත ලබා දිය යුතුය. එසේ කිරීමට අපොහොසත් වීම 1957 අංක 51 දරණ තේ පාලන පනතට අනුව දඬුවම් ලැබිය හැකි වරදකි.

වගුව 2.1.1: මෙහෙයුම් අනුව තේ කර්මාන්තශාලා වර්ගීකරණය

| තත්වය | කර්මාන්තශාලා සංඛ්‍යාව උඩරට | මධ්‍යම | පහතරට | එකතුව |
|---|---|---|---|---|
| තම තේ දළු වලට සීමාවූ | 56 | 17 | 2 | 75 |
| තම තේ දළු සහ මිලදීගත් තේ දළු<br>අ) මුළු නිෂ්පාදනයෙන් 50%කට වඩා අඩු තම වත්තේ තේ දළු | 13 | 36 | 94 | 143 |
| ආ) මුළු නිෂ්පාදනයෙන් 50%කට වඩා වැඩි තම වත්තේ තේ දළු | 63 | 26 | 16 | 105 |
| මිලදීගත් තේ දළු පමණක් | 09 | 29 | 250 | 288 |
| ක්‍රියාත්මකවන ලියාපදිංචි තේ කර්මාන්තශාලා | 182 | 149 | 455 | 786 |
| ක්‍රියාත්මක නොවන ලියාපදිංචි තේ කර්මාන්තශාලා | 19 | 54 | 77 | 150 |
| ලියාපදිංචි මුළු තේ කර්මාන්තශාලා සංඛ්‍යාව | 201 | 203 | 532 | 936 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## මිලදී ගන්නා තේ දළු සඳහා ගෙවිය හැකි සාධාරණ මිල ගණන

තේ පාලන පනතේ විධිවිධාන වලට අනුව මිලදී ගන්නා තේ දළුවලින් තම නිෂ්පාදනයන් කරනු ලබන කර්මාන්තශාලා තේ කොමසාරිස් විසින් නියම කරනු ලබන මිල ගණන් මත පදනම්ව එම කර්මාන්ත ශාලා විසින් නිපදවන තේවල නියමිත මිල පිළිබඳව අවධානය යොමුකරමින්, මිලදී ගන්නා තේ දළු සඳහා ගෙවීම් කළ යුතුය. කර්මාන්ත ශාලා මගින් අමු තේ දළු වෙළෙන්දන් සඳහා සාධාරණ මිල ගණන් ගෙවීමේදී එක් එක් කර්මාන්තශාලාවල මාසික ශුද්ධ විකුණුම් සාමාන්‍යය මත පදනම් ව තීරණය කරනු ලබයි.

නිමි තේ වලින් ලබන ඉපැයීම් දළු සැපයුම්කරුවන් සහ කර්මාන්ත ශාලා අතර 68:32 අනුපාතය ට අනුව බෙදිය යුතුයි. කර්මාන්තශාලා විකුණුම් සාමාන්‍ය, මාසික උන්නතාංශ සාමාන්‍යය ඉක්මවන්නේ නම්, එම වැඩිවූ ආදායම 50:50 අනුපාතයට බෙදනු ලබයි. නිමි තේ වලට අමු දළු වලින් 21.5% ක නිපැයුම් අනුපාතයක් මත පදනම් ව මිල සූත්‍රය ගොඩ නගනු ලැබේ.

### ප්‍රමාද වූ ගෙවීම්

සමාලෝචිත වර්ෂය තුළ 2021 ජනවාරි 01 දිනට දළු සපයන්නන් සඳහා ගෙවීමට තිබූ මුළු අගය වූයේ රුපියල් මිලියන 808කි. 2021 වර්ෂයේ දී, තේ කොමසාරිස් අංශය මැදිහත්වීමෙන් රුපියල් මිලියන 31ක් අය කරගෙන තේ දළු සපයන්නන් වෙත ගෙවන ලදී. ලියාපදිංචිය තාවකාලිකව අත්හිටුවීම හේතුවෙන් නව තවත් ප්‍රමාද ගෙවීම් එකතු වීම නතර විය. හරිත තේ දළු සඳහා සාධාරණ මිලක් පැවතිය දී යම් කර්මාන්තශාලාවක් ප්‍රමාද ගෙවීම් සහිත කර්මාන්තශාලාවක් ලෙස හඳුනා ගනී නම්, එකී කර්මාන්තශාලාවට අවවාද කරනු ලබන අතර ප්‍රමාද වූ ගාස්තු නොගෙවන්නේ නම්, අදාළ කර්මාන්තශාලාවේ ලියාපදිංචිය අත්හිටුවීම, අහෝසි කිරීම හෝ 1993 සංශෝධිත තේ මණ්ඩල පනත අනුව තැරැව්කරුගෙන් අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ. එවැනි කර්මන්තශාවල ලියාපදිංචිය නැවත ලබා දීම සලකා බලනු ලබන්නේ ගෙවීමට ඇති අදාළ ගාස්තු ගෙවා නිම කළ පසුවය.

වගුව 2.1.2 : ගෙවීමට ඇති ගාස්තු පිළිබඳ විස්තරය (රුපියල්)

| ප්‍රදේශය | 2021.01.01 දිනට මුදල | 2021 වර්ෂයේදී එකතුවූ මුදල | පියවාගත් සහ ගෙවන ලද මුදල | 2021.12.31 දිනට කුඩා තේ වතු හිමියන්ට ගෙවිය යුතු ශේෂය (රු) | ක්‍රියාත්මක කර්මාන්තශාලා වලින් ගෙවිය යුතු මුදල (රු) | වසා දමන ලද කර්මාන්තශාලා වලින් ගෙවිය යුතු මුදල (රු) |
|---|---|---|---|---|---|---|
| රත්නපුර | 354,528,184.68 | 752,411.88 | 2,398,863.05 | 352,881,733.51 | 181,274,387.11 | 171,607,346.4 |
| මාතර | 59,119,926.98 | 18,197,850.94 | - | 77,317,777.92 | 40,343,952.98 | 36,973,824.94 |
| ගම්පොල | 156,869,053.81 | 30,833,958.85 | 413,359.03 | 187,289,653.63 | 169,698,990.9 | 17,590,662.73 |
| ගාල්ල | 138,650,982.87 | 43,764,545.02 | - | 182,415,527.89 | 127,763,670.12 | 54,651,857.77 |
| බදුරලිය | 47,868,679.49 | - | - | 47,868,679.49 | 28,110,194.30 | 19,758,485.19 |
| නුවර එළිය | 28,041,398.12 | 2,390,863.11 | 11,599,180.68 | 18,833,080.55 | 14,296,007.29 | 4,537,073.26 |
| බණ්ඩාරවෙල | 23,022,410.48 | - | 16,891,340.4 | 6,131,070.08 | 2,360,421.45 | 3,770,648.63 |
| එකතුව | 808,100,636.43 | 95,939,629.8 | 31,302,743.16 | 872,737,523.07 | 563,847,624.15 | 308,889,898.92 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## තේ දළුවල තත්ත්ව පාලනය

නිමි තේ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා අමු ද්‍රව්‍ය වන්නේ තේ දළු හෙයින්, මිල දී ගත් තේ දළු යොදා ගනිමින් තේ නිෂ්පාදනය කරන අවස්ථාවලදී තේ දළු වල තත්ව පාලනය ඉතාමත් වැදගත් වේ. උසස් තත්වයේ තේ දළු යොදා ගනිමින් තේ නිෂ්පාදනය කරන්නේ නම්, නිමි තේ වල තත්වය උසස්වන අතර කුඩා තේ වතු හිමියන් සහ තේ නිෂ්පාදකයන් යන දෙපාර්ශවයටම ඉහළ ප්‍රතිලාභ ලැබේ.

අමු තේ දළුවල තත්ත්වය සම්බන්ධයෙන් අදාළව ගැසට් නිවේදනයක් ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් 2010 දෙසැම්බර් 14 වැනි දින පළකර තිබේ. තේ කොමසාරිස් අංශය මගින් තේ දළුවල ගුණාත්මක භාවය වර්ධනය කිරීම සඳහා පහත කාර්යයන් ඉටු කරනු ලබයි.

අ) තේ දළු වෙළෙඳුන් හට බලපත්‍ර ලබා දීම.
ආ) තේ දළුවල ප්‍රමිතිය වැඩිදියුණු කිරීම සඳහා “B leaf 60” වැඩසටහන
ඇ) උත්සව සමයේදී බෝග කළමනාකරණය කිරීමේ වැඩසටහන
ඈ) "ආදර්ශ තේ වගා බිම්" ව්‍යාපෘතිය
ඉ) තේ නැවත වගා සහනාධාර යෝජනා ක්‍රමය
ඊ) තේ ඉඩම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන
එ) තේ තවාන් සඳහා සහනාධාර ව්‍යාපෘතිය
ඒ) කාබනික පොහොර හා කාබනික යෙදීම් භාවිතා කිරීම දිරිමත් කිරීම

### අ) තේ දළු වෙළෙඳුන් හට බලපත්‍ර ලබා දීම

තේ පාලන පනතට අනුව, තේ දළු වෙළඳාමේ යෙදීම සඳහා තේ කොමසාරිස් අංශයෙන් වාර්ෂික බලපත්‍ර ලබා ගැනීමට සිදු වේ. ලියාපදිංචි සෑම තේ වෙළෙන්දෙකුම තේ කොමසාරිස් අංශය මගින් නියාමනය කරනු ලැබේ.

වගුව 2.1.3: 2021 වසර තුළදී තේ දළු වෙළඳාම සඳහා ලබා දී ඇති බලපත්‍ර සංඛ්‍යාව

| ස.තේ.කො. – ප්‍රදේශය | 2021.01.01 දිනට බලපත්‍ර ලබා දුන් වෙළෙඳුන් | බලපත්‍ර අලුත් කිරීම | නිකුත් කරන ලද නව බලපත්‍ර | 2021.12.31 දිනට තේ දළු වෙළඳාම සඳහා ලබාදුන් බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|---|---|---|
| බණ්ඩාරවෙල | 176 | 166 | 13 | 179 |
| ගම්පොල | 170 | 159 | 32 | 191 |
| මාතර | 272 | 251 | 14 | 265 |
| ගාල්ල | 267 | 234 | 08 | 242 |
| රත්නපුර | 498 | 528 | 70 | 598 |
| බදුරලිය | 254 | 219 | 31 | 250 |
| නුවරඑළිය | 94 | 85 | 22 | 107 |
| එකතුව | 1731 | 1642 | 190 | 1832 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## ආ) තේ දළුවල ප්‍රමිතිය වැඩිදියුණු කිරීම සඳහා "B leaf 60" වැඩසටහන

දළු නෙළීමේ ප්‍රමිති සහ ප්‍රවාහනය කිරීමේ ප්‍රමිති වැඩිදියුණු කිරීම මගින් පසු අස්වනු හානි අවමකර ගැනීමෙන් දළුවල ගුණාත්මක බව ඉහළනැංවීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරමින් පවතී. මෙම වැඩසටහන ආරම්භයේදී තේ දළුවල ප්‍රමිතිය පැවතියේ හොඳම දළු 33% , හොඳම තත්ත්වයට වඩා අඩු 32% සහ බාල තේ දළු 35% වශයෙනි. නමුත් වර්තමාන තේ දළුවල ප්‍රමිතිය වන්නේ හොඳම දළු 34% ,හොඳම තත්ත්වයට වඩා අඩු 20% සහ බාල තේ දළු 46% වශයෙනි. ක්ෂේත්‍රය තුළ දී හොඳම තේ දළු ප්‍රමිතිය අවම වශයෙන් 60% ක මට්ටමක පවත්වා ගැනීමේ අරමුණ ඇතිව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

වගුව 2.1.4: 2021 වසර තුළ ප්‍රාදේශීය වශයෙන් පැවති තේ දළු ප්‍රමිතීන්

| ස.තේ.කො. - ප්‍රදේශය | වඩාත්ම හොඳ | වඩාත්ම හොඳ මට්ටමට වඩා පහල | බාල තත්වයේ |
|---|---|---|---|
| ගම්පොල | 26 | 24 | 50 |
| ගාල්ල | 40 | 19 | 41 |
| බදුරලිය | 37 | 17 | 46 |
| මාතර | 46 | 15 | 39 |
| රත්නපුර | 29 | 26 | 45 |
| නුවර එළිය | 28 | 21 | 51 |
| බණ්ඩාරවෙල | 20 | 29 | 51 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

මෙම වැඩසටහනේ ඉලක්ක සපුරා ගැනීම සඳහා පහත සඳහන් උපාය මාර්ග දැනටමත් ක්‍රියාත්මක කර ඇත.

1. පාර්ශවකරුවන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
2. තේ දළු හැසිරවීම හා ප්‍රවාහනය සම්බන්ධ රෙගුලාසි පැනවීම

## ඇ) උත්සව සමයේදී බෝග කළමනාකරණය කිරීමේ වැඩසටහන

උත්සව සමයේ දී දීර්ඝ කාලයක් තේ කර්මාන්තශාලා වසා තැබීම හේතුවෙන් සිදුවන අස්වනු හානිය අවම කරගැනීම සඳහා මෙම වැඩසටහන සැලසුම් කර ඇත. මෙය 2005 වසරේ දී ආරම්භ කළ අතර ඒ යටතේ විවිධ ක්‍රියාකාරකම් හඳුන්වා දෙමින් අස්වනු හානිය මුළුමනින්ම පාහේ පාලනය කිරීමට තේ කොමසාරිස් අංශයට හැකි වී ඇත.

## ඇ) "ආදර්ශ තේ වගාබිම්" ව්‍යාපෘතිය

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ස්වයං උත්පාදන මගින් මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් වෙන්කර තිබේ. මෙම ව්‍යාපෘතිය මෙම වසරේ දී තව දුරටත් සාර්ථකව ක්‍රියාත්මක කළ අතර ඉඩම් 24ක් සඳහා මේ යටතේ රුපියල් මිලියන 9ක සහනාධාර සපයා ඇත.

ව්‍යාපෘතිය පහත සඳහන් අරමුණු පෙරදැරිව සැලසුම් කරන ලදි.

- ශ්‍රී ලංකාවේ තේ ක්ෂේත්‍රය තුළ අර්ධ යාන්ත්‍රික තිරසාර තේ වගාවන් ප්‍රවර්ධනය කිරීම (මෙය ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ)
- තේ ක්ෂේත්‍රය තුළ තේ ඉඩම් හා ශ්‍රම ඵලදායිතාවය ඉහල නැංවීම
- වසර පුරාවට නිරන්තර හා ස්ථාවර අස්වැන්නක් ලබා ගැනීම
- තේ වගාවේ ප්‍රශස්ත ආර්ථිකමය ආයු කාලය වැඩි කිරීම
- නිෂ්පාදන පිරිවැය අඩු කිරීම (දළු නෙලීමේ පිරිවැය 60% කින් අඩු කිරීමට බලාපොරොත්තු වේ)
- තේ දළුවල ප්‍රමිතිය ප්‍රමාණවත් මට්ටමක පවත්වා ගැනීම
- සහතිකලාභී බවට පත්වීම සඳහා යහපත් කෘෂිකාර්මික පිළිවෙත්(GAP) තේ වගාවන් තුළට හඳුන්වා දීම

  (උදා: වැසි වනාන්තර සහයෝගිතා සහතිකය)

වගුව 2.1.5: ආදර්ශ තේ බිම් සඳහා සහනාධාර ගෙවීම්

| ස.තේ.කො. - ප්‍රදේශය | ලද අයදුම්පත් සංඛ්‍යාව | ගෙවීම් සිදු කළ ඉඩම් ප්‍රමාණය | ගෙවූ මුදල (රු.) |
|---|---|---|---|
| බණ්ඩාරවෙල | 01 | 03 | 1,050,000 |
| ගම්පොල | 01 | 04 | 600,000 |
| රත්නපුර | 02 | 08 | 2,300,000 |
| මාතර | - | 07 | 2,250,000 |
| ගාල්ල | 01 | 05 | 2,450,000 |
| බදුරලිය | - | 07 | 2,350,000 |
| නුවර එළිය | - | 09 | 2,850,000 |
| එකතුව | 05 | 43 | 13,850,000 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## ඉ) තේ නැවත වගා සහනාධාර යෝජනා ක්‍රමය

දේශීය අරමුදල් යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ සංවර්ධන කටයුතු සඳහා භාණ්ඩාගාරය විසින් අරමුදල් වෙන්කර ඇත. වර්ෂය තුළ දී තේ නැවත වගා කිරීමේ සහනාධාර සඳහා ඉහත මුදල් භාවිත කෙරේ. ඒ අනුව, වතු සමාගම් හා පුද්ගලික ක්ෂේත්‍රයේ අක්කර 10ට වැඩි වතු සඳහා සහනාධාර ලබා දෙමින් පවතී. තේ නැවත වගා කිරීම, අලුතින් වගා කිරීම හා වගා බිම්වල පාළු සිටුවීම සඳහා සහනාධාර සැපයීම මෙම ව්‍යාපෘතියේ ඉලක්ක වේ.

යෝජනා ක්‍රමයේ අරමුණු පහත පරිදි ය.

(i) තේ නිෂ්පාදනය ඉහල නැංවීම

(ii) තේ බිම්වල ඵලදායිතාවය වැඩි කිරීම

(iii)තේ නැවත වගා කිරීමේ ජාතික අනුපාතය 3% ක ප්‍රමාණයක පවත්වා ගැනීම

2021 වසරේදී වතු සමාගම් සහ පෞද්ගලික අංශය නැවත වගා කිරීම සඳහා පහත පරිදි අරමුදල් ලබා ගැනීමට හැකි විය.

වගුව 2.1.6: 2021 වසර සඳහා නැවත වගා කිරීමේ සහනාධාර යෝජනා ක්‍රමය

| ප්‍රදේශය | ලද අයදුම්පත් සංඛ්‍යාව | ගෙවූ මුදල (රු.) | ගෙවීම් සිදු කළ ඉඩම් ප්‍රමාණය (හෙක්) | කරන ලද පරීක්ෂණ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ගම්පොල | 53 | 22,549,810 | 104.41 | 179 |
| බණ්ඩාරවෙල | 22 | 5,105,300 | 33.02 | 43 |
| රත්නපුර | 62 | 13,449,500 | 55.69 | 191 |
| බදුරලිය | 45 | 5,560,425 | 25.61 | 159 |
| මාතර | 61 | 10,148,000 | 37.52 | 139 |
| ගාල්ල | 03 | 2,899,400 | 22.79 | 40 |
| නුවර එළිය | 39 | 14,165,500 | 80.64 | 74 |
| එකතුව | 285 | 73,877,935 | 359.68 | 825 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## ඊ) තේ ඉඩම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන

මෙම වැඩසටහන යටතේ දිවයිනේ සියලුම තේ ඉඩම් ලියාපදිංචි කිරීමට සැලසුම් කරන ලදී. තේ ඉඩම් සම්බන්ධ සියලු තොරතුරු ක්‍රමවත් පිළිවෙලකට මෘදුකාංගයක් භාවිතයෙන් පරිගණක ගත කරන ලදී.

## එ) තේ තවාන් සඳහා සහනාධාර යෝජනා ක්‍රමය

ගුණාත්මක තේ පැළ තවාන් පිහිටුවීමට වැවිලි සමාගම් සහ අක්කර 10ට වැඩි තේ වතු හිමියන් සඳහා තේ මණ්ඩල අරමුදල්වලින් අයවැය ප්‍රතිපාදන යොදා 2021 වසර සඳහා සහනාධාර ගෙවීම් සිදු කරන ලදී. එකවර අවම වශයෙන් තේ පැල 100,000ක් පිහිටුවීමට අදහස් කරන, ඉහළ සෙවණක් සහ විසුරුම් ජල බින්දු වාරි තාක්ෂණ පද්ධතියක් මෙන්ම ස්ථිර ව්‍යුහයක් සහිත තවාන් පමණක් මෙම සහනාධාර ක්‍රමය මගින් ආවරණය කරයි. අවම වශයෙන් තේ පැල 100,000ක ප්‍රමාණයේ තවානක් සඳහා රුපියල් 1,500,000.00ක සහනාධාරයක් හිමි වේ. අනුමත තවාන් අවම වශයෙන් වසර 3ක් පැවතිය යුතු අතර සහනාධාරය නිකුත් කිරීමට පෙර තවාන් හිමියා, වතු හිමියා හෝ ප්‍රාදේශීය වැවිලි සමාගමේ ප්‍රධාන විධායක නිලධාරීවරයා ශ්‍රී ලංකා තේ මණ්ඩලය සමග ගිවිසුමක් අත්සන් කළ යුතුය. සියලුම තවාන් කටයුතු ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ මාර්ගෝපදේශයන්ට අනුකූල විය යුතුය.

වගුව 2.1.7: තේ පැළ තවාන් ව්‍යාපෘතිය සඳහා සහනාධාර යෝජනා ක්‍රමය

| ප්‍රදේශය | ගෙවීම් කළ තවාන් ගණන | ගෙවන ලද මුදල (රු) |
|---|---|---|
| බණ්ඩාරවෙල | 05 | 3,425,000 |
| ගම්පොල | 15 | 6,950,000 |
| රත්නපුර | 23 | 23,150,000 |
| මාතර | 19 | 16,250,000 |
| ගාල්ල | 10 | 10,450,000 |
| බදුරලිය | 14 | 14,600,000 |
| නුවර එළිය | 07 | 9,750,000 |
| එකතුව | 93 | 84,575,000 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## (ඒ) තේ සඳහා කාබනික යෙදවුම් / පොහොර භාවිතය ප්‍රවර්ධනයට දිරිගැන්වීම

ඒකාබද්ධ පාංශු සාරවත් බව කළමනාකරණ උපායමාර්ගයක්, සමබර පෝෂක ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමේ වැදගත්කම මෙන්ම කාබනික පොහොර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම පිළිබඳ දැනුවත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි.ආරම්භක පියවර වශයෙන් දැනට පවතින ජෛව පොහොර නිෂ්පාදන සමාගම් ලියාපදිංචි කිරීම ආරම්භ කර ඇති අතර, දැනුම බෙදාගැනීමේ සැසි කිහිපයක් පවත්වා නව ව්‍යාවසායකයින් සමග ඔවුන්ගේ තාක්ෂණික දැනුම සහ අත්දැකීම් බෙදා ගැනීම සම්බන්ධයෙන් කැමැත්ත ලබා ගන්නා ලදී.ජෛව / කාබනික නිෂ්පාදකයින් දිරිගැන්වීම සඳහා සහනාධාර වැඩසටහන් දෙකක් හඳුන්වා දී ඇත.

ආදර්ශ කාබනික / ජෛව පොහොර ව්‍යාපෘතිය - සහනාධාර මුදල - ඒකකයක් සඳහා රු.500,000 යි.

කාබනික / ජෛව පොහොර සාමාන්‍ය ව්‍යාපෘතිය - සහනාධාර මුදල - ඒකකයක් සඳහා රු.300,000 යි.

මීට අමතරව වෙළඳ ප්‍රදර්ශන සහනාධාර ක්‍රමයක් ලබා දෙමින්, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් කාබනික අංශයේ අපනයනකරුවන් දිරිමත් කරන ලදී.සිලෝන් තේ සඳහා වන ගෝලීය ව්‍යාපාරයට සමගාමීවල ජන මතයක් ගොඩනැගිය හැකි ප්‍රධාන පුද්ගලයන් (ජනමත පුද්ගලයන්) හරහා කාබනික නිෂ්පාදන ප්‍රවර්ධනය වැඩි වශයෙන් සිදු කරන ලදී.අපනයනකරුවන් සඳහා කාබනික සහතිකය ලබා ගැනීමේදී, ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රවර්ධන අංශය විසින් විශාල කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

වගුව 2.1.8: ජෛව පොහොර ව්‍යාපෘතිය සඳහා සහනාධාර ගෙවීම්

| ප්‍රදේශය | ලද අයදුම්පත් සංඛ්‍යාව | ගෙවූ මුදල (රු.) | ඒකක ගණන |
|---|---|---|---|
| ගම්පොල | 33 | 2,600,000 | 09 |
| බණ්ඩාරවෙල | 48 | 2,200,000 | 08 |
| රත්නපුර | 31 | 1,100,000 | 04 |
| බදුරලිය | 33 | 3,500,000 | 12 |
| මාතර | 36 | 900,000 | 03 |
| ගාල්ල | 17 | 900,000 | 03 |
| නුවර එළිය | 49 | 300,000 | 01 |
| එකතුව | 247 | 11,500,000 | 40 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## ගුණාත්මය ඉහළ නැංවීමේ ක්‍රියාකාරකම්

සුදුසු තත්වයේ ගොඩනැගිලි, උපකරණ, යන්ත්‍රසූත්‍ර සහ මෙහෙයුම් ක්‍රමවේද ආදිය පැවතීම නිමි තේ වල උසස් තත්ත්වය සඳහා අත්‍යවශ්‍ය වේ. උසස් තත්ත්වයේ නිමි තේ නිෂ්පාදනය සඳහා ඉහත සඳහන් කළ තත්වයන් හිතකර නොවන්නේ නම් එවැනි කර්මාන්තශාලා ලියාපදිංචිය අත්හිටුවීමට මෙන්ම අවලංගු කිරීමට 1957 අංක 51 දරණ තේ පාලන පනත ප්‍රකාරව තේ කොමසාරිස්වරයාට බලය ඇත.

තේ නිෂ්පාදනයේ ගුණාත්මක බව අධීක්ෂණය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා තේ පාලන පනත මගින් තේ කොමසාරිස් අංශය ට බලය ලබාදෙන අතර නිමි තේවල සහ දළුවල ගුණාත්මක බව වැඩිදියුණු කිරීම සඳහා පහත සඳහන් ව්‍යාපෘති නිර්මාණය කර ක්‍රියාත්මක කරනු ලබයි.

අ) කර්මාන්තශාලා නවීකරණ සහනාධාර යෝජනා ක්‍රමය

ආ) තේ කර්මාන්තශාලා සහ ගුදම්වල යහපත් නිෂ්පාදන පිළිවෙත් ස්ථාපිතකිරීම

ඇ) හදිසි අධීක්ෂණ ක්‍රම (කාර්ය කණ්ඩායම් මෙහෙයුම්)

ඈ) පහළ ශුද්ධ විකුණුම් සාමාන්‍ය සඳහා උපාය මාර්ගය

ඉ) කසල තේ පිරිසැකසුම් වෙළෙඳුන් සඳහා බලපත්‍ර ලබා දීම හා කසල තේ මධ්‍යස්ථානවල යහපත් නිෂ්පාදන පිළිවෙත් වර්ධනය කිරීම

ඊ) කසළ තේ පිරිසකසන්නන් සඳහා වෙන්දේසි අයිතිය ලබා දීම

එ) අනෙකුත් සංවර්ධන ව්‍යාපෘති

### අ) කර්මාන්තශාලා නවීකරණය කිරීමේ සහනාධාර යෝජනා ක්‍රමය

භාණ්ඩාගාරය විසින් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා මුදල් වෙන්කර ඇත. මෙම වෙන්කළ මුදල් කර්මාන්තශාලා නවීකරණ යෝජනා ක්‍රමය සඳහා රාජ්‍ය හා පුද්ගලික අංශයේ තේ කර්මාන්තශාලා වෙනුවෙන් උපයෝගි කරගනු ලබයි.

යෝජනා ක්‍රමයේ අරමුණු පහත පරිදි වේ.

(i) තේ නිෂ්පාදනය වැඩි කිරීම

(ii) නිමි තේවල තත්වය ඉහල නැංවීම

(iii) තේ කර්මාන්තයට නව තාක්ෂණය හඳුන්වා දීම

(iv) තේ කර්මාන්තශාලා නවීකරණය කිරීම

වගුව 2.1.9: කර්මාන්තශාලා නවීකරණය සඳහා සහනාධාර යෝජනා ක්‍රමය සඳහා සහනාධාර ගෙවීම

| ප්‍රදේශය | ලද අයදුම්පත් සංඛ්‍යාව | ගෙවන ලද කර්මාන්තශාලා ගණන | ගෙවූ මුදල (රු) | සිදු කළ පරීක්ෂණ ගණන |
|---|---|---|---|---|
| බණ්ඩාරවෙල | 05 | 06 | 3,535,052.94 | 19 |
| ගම්පොල | 23 | 09 | 4,289,413.33 | 47 |
| රත්නපුර | 16 | 10 | 3,975,620.26 | 112 |
| මාතර | 17 | 03 | 2,169,028.40 | 18 |
| ගාල්ල | 15 | 03 | 1,372,500 | 29 |
| බදුරලිය | 14 | - | - | 24 |
| නුවර එළිය | 31 | 04 | 258,133.33 | 41 |
| එකතුව | 121 | 35 | 15,599,748.26 | 290 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

### ආ) තේ කර්මාන්තශාලාවල යහපත් නිෂ්පාදන පිළිවෙත් (GMP) ස්ථාපිත කිරීම

තේ කර්මාන්තශාලාවල ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම සඳහා උපදෙස් සැපයීමට මෙම වැඩසටහන නිර්මාණය කර ඇත.

මෙම වැඩසටහන යටතේ තේ කර්මාන්තශාලා 442ක් අංශ 187කින් සමන්විත පෙර සකසන ලද පිරික්සුම් ලැයිස්තුවක් භාවිත කරමින් ඇගයීමට ලක් කර තේ නිෂ්පාදන ක්‍රියාවලියේ ප්‍රමිතීන් ඉහල නැංවීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

වගුව 2.1.10 : ප්‍රාදේශීය වශයෙන් තේ කර්මාන්තශාලාවල මනා නිෂ්පාදන පිළිවෙත් තක්සේරුව

| ප්‍රදේශය | යහපත් නිෂ්පාදන පිළිවෙත් තක්සේරුව | කර්මාන්තශාලා ශ්‍රේණිගත කිරීම | | | |
|---|---|---|---|---|---|
| | | විශිෂ්ට | හොඳ | සාමාන්‍ය | දුර්වල |
| බණ්ඩාරවෙල | 59 | 18 | 13 | - | - |
| ගම්පොල | 37 | 15 | 20 | 01 | 01 |
| රත්නපුර | 20 | 37 | 43 | 08 | 00 |
| මාතර | 26 | 50 | 38 | 01 | 00 |
| ගාල්ල | 99 | 41 | 48 | 10 | 00 |
| බදුරලිය | 166 | 25 | 21 | 03 | 00 |
| නුවර එළිය | 35 | 14 | 14 | 07 | 00 |
| එකතුව | 442 | 200 | 197 | 30 | 01 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

දුර්වල තත්වයෙන් පවතින කර්මාන්තශාලාවලට තම ලියාපදිංචිය අලුත් කිරීම සඳහා අවසර නොදීමේ ප්‍රතිපත්තියක් 2019 වසරේ සිට තේ කොමසාරිස් අංශය විසින් අනුගමනය කරමින් සිටී.

## ඇ) හදිසි අධීක්ෂණ ක්‍රමය (කාර්ය කණ්ඩායම් මෙහෙයුම)

තේ කර්මාන්තයේ අවභාවිතාවන් පාලනය කිරීම සඳහා කාර්ය කණ්ඩායම් මෙහෙයුම් ක්‍රියාත්මක කරමින් පවතී. සහකාර තේ කොමසාරිස්ගේ නායකත්වයෙන් යුතු කණ්ඩායමක් විසින් මෙහෙයුම් සිදු කරනු ලබයි. 2021 වසරේදී තේ කොමසාරිස් අංශයේ නිලධාරීන් විසින් තේ කර්මාන්තශාලා හදිසි පිරික්සීම් 168ක් සිදුකර ඇත.

වගුව 2.1.11: 2021 වසර සඳහා කාර්ය කණ්ඩායම් මෙහෙයුම්

| ප්‍රදේශය | සිදු කළ පරීක්ෂණ සංඛ්‍යාව |
|---|---|
| බණ්ඩාරවෙල | 13 |
| ගම්පොල | 52 |
| රත්නපුර | 15 |
| මාතර | 14 |
| ගාල්ල | 28 |
| බදුරලිය | 23 |
| නුවර එළිය | 23 |
| එකතුව | 168 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## ඈ) පහළ ශුද්ධ විකුණුම් සාමාන්‍ය උපාය මාර්ගය

ශුද්ධ විකුණුම් සාමාන්‍යය නමැති ඉණිමගෙහි පහලම ගරාදියෙහි සිටින තේ කර්මාන්ත ශාලා සඳහා මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ඇත. මෙම ව්‍යාපෘතියෙහි අරමුණ වන්නේ තේ දළුවල ප්‍රමිතිය සහ තේ නිෂ්පාදනයේ ප්‍රමිතිය වැඩිකිරීම මගින් එවැනි කර්මාන්තශාලා වල ශුද්ධ විකුණුම් සාමාන්‍ය මට්ටම ඉහළට ගැනීමයි. මෙම වැඩසටහන් යටතේ තේ කර්මාන්තශාලා ආකාර හතරකට වර්ගීකරණය කෙරේ. එනම්, දුර්වල, සාමාන්‍ය, හොඳ, විශිෂ්ට ආදී වශයෙනි. ස්ථාපිත ප්‍රතිපත්තියට අනුව, 2019 සිට ක්ෂේත්‍රය තුළ දුර්වල කර්මාන්තශාලා පැවතිය නොහැක.

## ඉ) කසල තේ පිරිසැකසුම් වෙළෙඳුන් සඳහා බලපත්‍ර ලබා දීම සහ කසල තේ පිරිසැකසුම් මධ්‍යස්ථාන වල මනා නිෂ්පාදන පිළිවෙත්(GMP) ස්ථාපිත කිරීම

කසල තේ පිරිසැකසීම යනු විනාශ නොකළ කසල තේ වලින් භාවිත කළ හැකි තේ වෙන් කර ගැනීමේ ක්‍රියාවලියයි. කසල තේ අලෙවි කරන සෑම වෙළෙන්දෙකුම කසළ තේ සැකසුම්කරුවෙකු ලෙස ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලියාපදිංචි විය යුතුය. කසල තේ පිරිසැකසීමේ මධ්‍යස්ථාන සඳහා බලපත්‍ර නිකුත් කිරීම 1957 තේ පාලන පනතේ අංක 51 ප්‍රකාරව ආරම්භ කර තිබේ. කසළ තේ මධ්‍යස්ථානවල ප්‍රමිතීන් ඉහල නැංවීම සඳහා අවශ්‍ය උපදෙස් සැපයීමේ අරමුණෙන් යහපත් නිෂ්පාදන පිළිවෙත් (GMP) පිළිබඳ වැඩසටහන ක්‍රියාත්මක කෙරේ.

වගුව 2.1.12: කසල තේ පිරිසැකසුම් මධ්‍යස්ථාන ගණන සහ 2021 වර්ෂය සඳහා නිකුත් කළ බලපත්‍ර ගණන

| ප්‍රදේශය | 2021.01.01 දින වන විට ලියාපදිංචි සැකසුම්කරුවන් | වර්ෂය තුළ අලුත් කිරීම් | වර්ෂය තුළ අලුතින් නිකුත් කිරීම් | 2021.12.31 දිනට පිරිසැකසුම් මධ්‍යස්ථාන සංඛ්‍යාව | 2021.12.31 දිනට නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව | බලපත්‍ර මගින් වෙළෙඳුන් විසින් මිලදී ගන්නා ලද තේ ප්‍රමාණය (කිලෝ) |
|---|---|---|---|---|---|---|
| බණ්ඩාරවෙල | 01 | 01 | 00 | 01 | 1,196 | 4,920,176 |
| ගම්පොල | 184 | 119 | 01 | 120 | 1,660 | 7,821,383 |
| මාතර | 09 | 03 | 01 | 04 | 554 | 1,873,462 |
| ගාල්ල | 16 | 03 | 00 | 03 | 790 | 2,770,191 |
| රත්නපුර | 03 | 03 | 01 | 04 | 1,480 | 6,256,417 |
| බදුරලිය | 11 | 08 | 01 | 09 | 1,042 | 4,216,293 |
| නුවර එළිය | 05 | 02 | 00 | 02 | 2,101 | 13,021,001 |
| එකතුව | 229 | 139 | 04 | 143 | 8,823 | 40,878,923 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## ඊ) කසල තේ සකසන්නන් සඳහා වෙන්දේසි අයිතිය

කසල තේ සැකසුම්කරුවන්හට වෙන්දේසි අයිතිවාසිකම් සඳහා අනුමැතිය ලබා දීමේ ක්‍රමවේදයක් සැලසුම් කර ඇත. වෙන්දේසි අයිතිවාසිකම් අයදුම් කිරීම සඳහා, කසල තේ සැකසුම් මධ්‍යස්ථානය තුළ යහපත් නිෂ්පාදන භාවිතාවන් (GMP) පිළිබඳ ප්‍රමිතියෙන් 80% ක් තිබිය යුතුය. කසල තේ සැකසුම්කරුවන්හට වෙන්දේසි අයිතිවාසිකම් සඳහා අනුමැතිය ලබා දීමේ අරමුණු පහත පරිදි වේ.

- කසල තේ සඳහා වෙළඳපොළ ලබා දීම
- කසල තේවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම
- කසල තේවල ගුණාත්මකභාවය අධීක්ෂණය කිරීම
- කසල තේ වෙළඳපොලේ නීති විරෝධි ක්‍රියා වැළැක්වීම සහ ඒ සඳහා නිතිමය ක්‍රියා පටිපාටි සකස් කිරීම
- නිරපේක්ෂ කසල තේ බැහැර කිරීම සඳහා ක්‍රමානුකූල ක්‍රියා පටිපාටියක් සකස් කිරීම

ප්‍රතික්ෂේප කරන ලද තේ සැකසුම් මධ්‍යස්ථාන (30) තිහක් සඳහා 2021 දී අලුතින් වෙන්දේසි අයිතිය ලබා දෙන ලදී. 2021 දී සම්පූර්ණයෙන්ම වෙන්දේසි කිරීමේ අයිතිය ඇති මධ්‍යස්ථාන සංඛ්‍යාව 50 ක් විය.

## එ) අනෙකුත් සංවර්ධන ව්‍යාපෘති

මෙම වසරේ දී තේ කර්මාන්තශාලා සහ අපනයන ගබඩාවල සූර්ය බලශක්තිය ස්ථාපනය කිරීම සඳහා නව සහනාධාර යෝජනා ක්‍රම හඳුන්වා දීම (මේ යටතේ රුපියල් මිලියන 6.16 ක කර්මාන්තශාලා 20ක් සහ ගබඩා 3ක් සඳහා සහනාධාර ලබා දෙන ලදී), තෙතමනය මීටර බෙදා හැරීම (මේ යටතේ කර්මාන්තශාලා 05 ක් සඳහා සහනාධාර ලබා දෙන ලදී), HACCP / ISO ආහාර සුරක්ෂිතතා සහතිකය ලබා දීම, ජෛව පොහොර ව්‍යාපෘතිය සහ අපනයනකරුවන්ගේ ගබඩාවල නව යන්ත්‍රෝපකරණ ස්ථාපනය කිරීම සිදු කිරීම ආදී ව්‍යාපෘති රැසක් සිදු කරන ලදී.

වගුව 2.1.13 : 2021 වසර සඳහා ජාත්‍යන්තර සහතිකයෙන් පිදුම් ලද කර්මාන්තශාලා ගණන

| ප්‍රදේශය | HACCP සහතිකය (කර්මාන්තශාලා ගණන) | ISO 22000 (කර්මාන්තශාලා ගණන) | අනෙකුත් ජාත්‍යන්තර සහතිකකිරීම් (RA/CQC) (කර්මාන්තශාලා ගණන) |
|---|---|---|---|
| බණ්ඩාරවෙල | 51 | 16 | 13 |
| ගම්පොල | 14 | 14 | 04 |
| රත්නපුර | 42 | 43 | 10 |
| මාතර | 27 | 43 | 07 |
| ගාල්ල | 43 | 43 | 00 |
| බදුරලිය | 06 | 09 | 06 |
| නුවර එළිය | 04 | 97 | 15 |
| එකතුව | 187 | 265 | 55 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

# 2.2 තේ අපනයන අංශය

1959 අංක 16 දරණ (බදු සහ අපනයන පාලනය) පනතේ බලතල හා කාර්යන් සහ 1975 අංක 14 දරණ ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතිය යටතේ පවතින රෙගුලාසි පරිපාලනය කරනු ලබන්නේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ අපනයන අංශය විසිනි. තේ අපනයන අංශය මගින් තේ අපනයනකරුවන්, තේ ඇසුරුම්කරුවන්, ගබඩාවන්, ආනයනකරුවන් හා තේ ඇසුරුම් වර්ග ලියාපදිංචි කිරීම, තේ ලබා ගැනීම, තේ සඳහා අවම ප්‍රමිතිය පිළිබඳ අධීක්ෂණය කිරීම, තේ අපනයනය සඳහා අනුමැතිය ලබා දීම, තේ අපනයනය පිළිබඳ සංඛ්‍යාලේඛන පවත්වාගෙන යාම සහ ශ්‍රී ලංකාවේ ද්විපාර්ශ්වික නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ තේ අපනයනය අධීක්ෂණය කිරීම ආදී කටයුතු සිදු කරනු ලබයි. ඊට අමතරව, 2021 වර්ෂය පුරාවට පහත සඳහන් ප්‍රධාන කර්තව්‍යයන් අඛණ්ඩව සිදු කරන ලදී.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය හා ශ්‍රී ලංකා රේගුව එක්ව තේ අපනයනයේ විශිෂ්ටත්වය පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා රේගු අපනයන පහසුකම් සැපයීමේ මධ්‍යස්ථානයේ දී තේ තොග සම්බන්ධයෙන් ඒකාබද්ධව විමර්ශන පවත්වනු ලැබේ. ඊට අමතරව, සියලුම අපනයනකරුවන්ගේ ගබඩාවල තේ සැකසීමේ ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා, HACCP තත්ත්ව සහතිකය ලබා ගැනීම තම මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාම සඳහා අනිවාර්ය අවශ්‍යතාවයක් බව ප්‍රකාශයට පත් කරන ලද අතර, සියලු අපනයන ගබඩාවන් හි දී යහපත් නිෂ්පාදන පිළිවෙත් (GMP) පිළිබඳ ඇගයීම් සිදු කරනු ලැබේ. 2015 සිට අපනයන අංශය විසින් ඉරානය වෙත අපනයනය කරනු ලබන තේ සඳහා යහපත් නිෂ්පාදන භාවිතයන් (GMP) පිළිබඳ සහතිකය නිකුත් කිරීම ආරම්භ කරන ලදී.

ගෝලීය තේ වෙළඳපල තුළ පාරිභෝගික අවශ්‍යතා සහ උවමනාවන් සපුරාලීම සඳහා නිෂ්පාදන විවිධාංගීකරණය, ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම, ඉහළ අගයක් එකතු කිරීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව යනාදිය වැඩිදියුණු කිරීමට හැකි නවීන තාක්ෂණික අංශ කෙරෙහි ආයෝජනය කිරීමට අපනයන ඇසුරුම් කර්මාන්තශාලා දිරිමත් කිරීම සඳහා 2021 දී ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සහන පොලී ක්‍රමයක් හඳුන්වා දෙන ලදී.

## ලියාපදිංචි කිරීම්

තේ අපනයන අංශයේ ප්‍රධාන කාර්යන්ගෙන් එකක් වන්නේ අපනයනකරුවන්, අසුරුම්කරුවන්, ගබඩාවන් සහ ආනයනකරුවන් ලියාපදිංචි කිරීම හා ලියාපදිංචිය අලුත් කිරීමය. තේ අපනයනකරුවෙකු වශයෙන් ලියාපදිංචි වීමට අපේක්ෂා කරන යම් පුද්ගලයෙකු හා සමාගමක් විසින් ඒ සඳහා සුදුසුකම් ලැබීමට අවම නිර්ණායක සමුදායක් සපුරාලිය යුතු වේ. එනම්, වලංගු ව්‍යාපාර ලියාපදිංචියක්, ලියාපදිංචි ගබඩා (තේ ගබඩා කිරීම, මිශ්‍ර කිරීම හා ඇසුරුම් කිරීම සඳහා), තේ රස බැලීමේ පහසුකම් සහිත සුදුසුකම් ලත් තේ රස බලන්නෙකු සහ රුපියල් මිලියන 1ක අවම ප්‍රාග්ධනය (ආයෝජනය කළ/ගෙවන ලද) යන නිර්ණායකයන් ය.

වගුව 2.2.1: අපනයනකරුවන්, අසුරුම්කරුවන්, ගබඩාවන්, නිෂ්පාදන තැරැව්කරුවන් සහ ආනයනකරුවන් ලියාපදිංචි කිරීම පිළිබඳ සංඛ්‍යාලේඛන - 2021

| ලියාපදිංචි කිරීම් | 2021.01.01 දිනට | 2021 වර්ෂය තුළ (නව ලියාපදිංචි කිරීම් සහ වර්ෂය තුළ ලියාපදිංචි නොකළ සමාගම්) | 2021.12.31 දිනට මුළු එකතුව |
|---|---|---|---|
| අපනයනකරුවන් | 357 | නව ලියාපදිංචි කිරීම් : 45<br>වර්ෂය තුළ අලුත් නොකළ : 1256 | 369 |
| ඇසුරුම්කරුවන් | 803 | අපනයනකරුවන්/දේශීය අසුරුම්කරුවන්ගේ නව ලියාපදිංචි කිරීම් : 161<br>වර්ෂය තුළ අලුත් නොකළ : 1818 | 691 |
| ගබඩාවන් | 194 | නව ගබඩා ලියාපදිංචි කිරීම් : 31<br>වර්ෂය තුළ අලුත් නොකළ : 45 | 194 |
| ආනයනකරුවන් | 117 | නව ආනයනකරුවන් ලියාපදිංචි කිරීම් : 06<br>වර්ෂය තුළ අලුත් නොකළ : 125 | 102 |
| නිෂ්පාදන තැරව්කරුවන් | 8 | | 08 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

1986 ජනවාරි 28 දින අංක 386/13 දරන ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කරන ලද 1986 ශ්‍රී ලංකා තේ මණ්ඩල නියාමනය (තේ ඇසුරුම්කරුවන් ලියාපදිංචි කිරීම) ප්‍රකාරව, ගෘහස්ත පරිභෝජනය සඳහා හෝ අන් ආකාරයක තේ ඇසුරුම්කිරීමේ ව්‍යාපාරයක නියැලී සිටින ඕනෑම අයෙකු ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලියාපදිංචි විම අත්‍යවශ්‍ය වේ. සෑම ලියාපදිංචියක්ම වසරක කාලයක් වලංගුවන අතර වාර්ෂිකව ලියාපදිංචිය අළුත් කළ යුතුය.1959 අංක 16 දරණ (බදු සහ අපනයන පාලනය) පනත යටතේ අපනයනකරුවෙකු වශයෙන් ලියාපදිංචි ඕනෑම ආයතනයක් තේ ආනයනකරුවෙකු වශයෙන් ලියාපදිංචි විමට ද සුදුසුකම් ලබයි.

1986 සැප්තැම්බර් 10 දින අංක 410/11 දරණ ගැසට් පත්‍රයෙන් සහ 2003 මාර්තු 20 දින අංක 1280/8 දරණ ගැසට් පත්‍රයෙන් සංශෝධනය කරන ලද 1984 දෙසැම්බර් 05 දින අංක 326/17 දරණ රජයේ ඇති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කරන ලද 1984 ශ්‍රී ලංකා තේ මණ්ඩල නියාමනය (තේ ගබඩා කිරීම) අනුව ඕනෑම එක් වතාවකදී කිලෝ ග්‍රෑම් 1000ට වඩා වැඩි තේ ප්‍රමාණයක් ගබඩා කිරීම සඳහා භාවිතා කරන ගබඩාවන් සහ තේ ගබඩා කිරීම සඳහා සතුටුදායක බවට ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සලකනු ලබන ගබඩාවන් උක්ත නියාමනවල විධිවිධානවලට අනුකූලව ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙහි ලියාපදිංචි කළ යුතුය.

ශ්‍රී ලංකා තේ සමග මිශ්‍රිත වෙනත් සම්භවයක් සහිත විශේෂිත තේ අඩංගු සිල්ලර බහාලුම් 1981 ශ්‍රී ලංකා තේ මණ්ඩල රෙගුලාසි (ආනයන හා අපනයන) යටතේ අපනයනය කරනු ලැබේ. එවැනි බහාලුම් /ඇසුරුම් මත "ශ්‍රී ලංකාවේ දී ඇසුරුම් කරන ලද ශ්‍රී ලාංකීය හා වෙනත් සම්භවයක් සහිත තේ" හෝ "ශ්‍රී ලංකාවේ ඇසුරුම් කරන ලද වෙනත් සම්භවයක් සහිත තේ" යන්න පමණක් සඳහන් කළ යුතු අතර සියලුම බහාලුම් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලියාපදිංචි කළ යුතුය.

සියලුම ලියාපදිංචි තේ අපනයනකරුවන් අපනයනයට අවසර ලබා ගැනීම සඳහා ස්වයංක්‍රීය රේගු දත්ත පද්ධතිය (ASYCUDA) හරහා තේ අපනයන අංශයට වෙනත් අවශ්‍ය ලියකියවිලි සමග රේගු භාණ්ඩ ලියවිලි (CUSDECs) බාර දිය යුතුය. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් අපනයනය කිරීමට සූදානම් තේ තොගය අපනයනය සඳහා අවශ්‍ය ප්‍රමිතීන්ට අනුකූලව පවතින්නේ ද යන්න සොයා බලනු ලැබේ. සියලුම ලියාපදිංචි තේ අපනයනකරුවන් සඳහා ලියාපදිංචිය අලුත් කිරීමේ වැදගත්කම සලකා බැලීමෙන් අනතුරුව 2021 වර්ෂයට සහතිකය නිකුත් කිරීම සඳහා සහතික අලුත් කිරීමේ එක් දින සේවාවක් දියත් කරන ලදී.

## තේ ආනයනය

තේ කිලෝ ග්‍රෑම් 7,130,864.37ක් ආනයනය කිරීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ආනයන බලපත්‍ර 524ක් නිකුත් කර ඇත. කෙසේවෙතත්, සමාලෝචනයට භාජනය වූ කාල සීමාව තුළ සැබෑ ආනයන ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 6,358,679 කි.

වගුව 2.2.2. : තථ්‍ය ආනයන - 2021

| රට | වර්ගය | ආනයන ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්) | පිරිවැය, රක්ෂණ හා ප්‍රවාහන (CIF) අගය (රු.) | අගය (රු.) |
|---|---|---|---|---|
| චීනය | හරිත තේ | 1,725,601 | 497.81 | 859,013,210 |
| | විශේෂ තේ | 138,401 | 885.89 | 122,608,210 |
| | සුදු තේ | 10,065 | 1,032.16 | 10,388,687 |
| | කැෆේන් ඉවත් කළ තේ | 205 | 3,520.13 | 721,627 |
| අනු එකතුව | | 1,874,272 | 529.66 | 992,731,734 |
| ඉන්දියාව | CTC : ඇඹරූ, ඉරූ, සුරුන්ඩි කළ) | 888,669 | 393.51 | 349,702,389 |
| | විශේෂ (කළු තේ) | 809,647 | 917.12 | 742,545,616 |
| | කැෆේන් ඉවත් කළ තේ | 33,800 | 605.33 | 20,460,135 |
| | හරිත තේ | 2,255 | 1,616.00 | 3,644,080 |
| | සුදු තේ | 27,000 | 382.08 | 10,316,160 |
| අනු එකතුව | | 1,761,371 | 639.65 | 1,126,668,380 |
| ජපානය | විශේෂ තේ | 261,040 | 948.29 | 247,540,504 |
| | හරිත තේ | 3,365 | 3,400.18 | 11,441,595 |
| අනු එකතුව | | 264,405 | 979.49 | 258,982,099 |
| තායිවානය | විශේෂ තේ | 50 | 10,762.38 | 538,119 |
| අනු එකතුව | | 50 | 10,762.38 | 538,119 |
| උගන්ඩාව | CTC (ඇඹරූ, ඉරූ, සුරුන්ඩි කළ) | 13,480 | 324.05 | 4,368,194 |
| අනු එකතුව | | 13,480 | 324.05 | 4,368,194 |
| මියන්මාරය | හරිත තේ | 3,280 | 30.89 | 101,312 |
| | CTC (ඇඹරූ, ඉරූ, සුරුන්ඩි කළ) | 350 | 0 | 0 |
| අනු එකතුව | | 3,630 | 27.91 | 101,312 |
| ජර්මනිය | හරිත තේ | 4,305 | 2,187.34 | 9,416,489 |
| අනු එකතුව | | 4,305 | 2,187.34 | 9,416,489 |
| ඉන්දුනීසියාව | CTC (ඇඹරූ, ඉරූ, සුරුන්ඩි කළ) | 49,500 | 451.64 | 22,356,180 |
| අනු එකතුව | | 49,500 | 451.64 | 22,356,180 |
| කෙන්යාව | CTC (ඇඹරූ, ඉරූ, සුරුන්ඩි කළ) | 2,387,666 | 354.07 | 845,389,153 |
| අනු එකතුව | | 2,387,666 | 354.07 | 845,389,153 |
| **මුළු එකතුව** | | **6,358,679** | **512.77** | **3,260,551,660** |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## සාදන ලද තේ සඳහා ISO 3720 අවම තත්ව ප්‍රමිතිය පවත්වා ගැනීම

දෙන ලද සියලුම තේ නියැදි සහ තේ කර්මාන්තශාලාවලින් ලබා ගන්නා ලද සියලුම තේ නියැදි, ආනයනයෙන් පසු ලබා ගන්නා ලද තොග හා අපනයනය සඳහා සූදානම් කරන ලද තොග වලින් ලබා ගත් නියැදි ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් පත් කරන ලද තේ රස බලන්නන්ගේ කමිටුව විසින් පරීක්ෂාවට ලක් කරනු ලබයි. එනම්, අදාළ තේ වර්ගය අවසර ලත් වර්ගයට අයත් වේ ද, ISO 3720 ප්‍රමිතියට අනුකූල වේ ද, කිසිදු අපවිත්‍රතාවයකින් තොර වේ ද යන්න පිළිබඳ සොයා බැලීම එකී පරීක්ෂාව සිදු කරන අතර එහිදී අපනයනයට සුදුසු තේ සඳහා පමණක් අවසර දෙනු ලබයි.

වගුව 2.2.3: එක් එක් නියැදිවලදී ගුණාත්මකබව සම්බන්ධ දෝෂ (2021)

| නියැදි වර්ගය | නියැදි ගණන | ISO ප්‍රමිතියට පහලින් පවතින සහ අපවිත්‍රතා සහිත බවට හඳුනාගත් ප්‍රමාණය |
|---|---|---|
| වෙන්දේසියට පෙර අපනයන අංශය මගින් ලබාගත් නියැදි | 5067 | 2424 |
| වෙන්දේසියට පෙර ඉවත් කරන ලද නියැදි (කමිටුව විසින්) | 1934 | |
| වෙන්දේසියට පසු නියැදි | 377 | 25 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

පූර්ව වෙන්දේසි, පූර්ව බෙදා හැරීම් සහ විශේෂ පරීක්ෂණ මට්ටම්වලදී මිනිස් පරිභෝජනයට නුසුදුසු බවට හඳුනා ගන්නා ලද තේ විනාශ කිරීම අපනයන අංශයේ අධීක්ෂණය යටතේ සිදු කෙරේ. 2021 වසරේදී ඉහත සියලු අවස්ථා තුළදී හඳුනාගත් තේ කිලෝ ග්‍රෑම් 200,566.32ක් මෙම අංශය විසින් විනාශ කිරීමට භාජනය කරන ලදී.

තේවල ගුණාත්මක බව තහවුරු කිරීම සඳහා වෙන්දේසියේ දී කිලෝ එකක මිල රුපියල් 300ට අඩු සියලුම තේ තොගයන්හි නියැදි ඇගයීමට ලක් කිරීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලය තීරණය කර ඇත. මෙය සෑම සතියකම නියාමනය කෙරේ.

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කොන්දේසි මත ඉවත්කර ගත් තේ තොග නිකුත් කිරීමට මෑතක දී තීරණය කර ඇත. ඉහළ අමු තන්තු මට්ටමක් (16.5% ට වඩා වැඩි) පමණක් පවතින තේ තොග වැඩි දියුණු කිරීම සඳහා සංයුක්ත ගාස්තු ප්‍රතිලාභය මත පදනම්ව තේ කර්මාන්තශාලා සඳහා නිකුත් කරනු ලබන අතර වැඩි දියුණු කිරීමෙන් පසු නිෂ්පාදකයාට එම ඉන්වොයිස් අංකයෙන් නැවත නාමාවලියක් සකස් කළ හැකි අතර ක්ෂුද්‍රජීවීන්ගෙන් අපවිත්‍ර වූ තේ, ලියාපදිංචි නිෂ්පාදකයාගේ අනුමැතිය ඇතිව ක්ෂණික තේ නිෂ්පාදනයට යොමු කළ හැකිය.

## තේ නැවත ලබා ගැනීම

විදේශීය ගැනුම්කරු විසින් යම් තේ තොගයක් ප්‍රතික්ෂේප කරනු ලැබුව හොත්, දේශීය අපනයනකරුට එය ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අනුමැතිය ඇතිව නැවත ලබා ගැනීමට සිදු වේ. අපනයනය / නැවත භාවිත කිරීම සඳහා අවසර ලබා දීමට පෙර මෙම තොගය ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් නැවත පරීක්ෂාවට ලක් කරනු ලැබේ.

## නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ අපනයන කාර්ය සාධනය

ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) සහ පාකිස්තාන-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) යටතේ තේ සඳහා මනාප ගාස්තු අනුපාතයක් (TQR) ශ්‍රී ලංකාව තුළ පවතී. කෙසේ වෙතත්, මනාප ගාස්තු අනුපාතයෙහි සැලකිය යුතු උපයෝජනයක් 2021 වර්ෂය තුළ දී වාර්තා වී නොමැත.

වගුව 2.2.4: නිදහස් වෙළඳ ගිවිසුම යටතෙප ගාස්තු අනුපාත උපයෝජනය - 2021

| නිදහස් වෙළඳ ගිවිසුම | වසරකට වෙන් කරන ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්) | මුළු අපනයන (කිලෝ ග්‍රෑම්) |
|---|---|---|
| ඉන්දියා - ශ්‍රී ලංකා | 15,000,000.00 | 74,006.46 |
| පකිස්තාන් - ශ්‍රී ලංකා | 10,000,000.00 | 34,710,.00 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## තේ වැඩිදියුණු කිරීම හෝ නවීකරණය කිරීම සඳහා සහන පොලී යෝජනා ක්‍රමය

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සහන පොලී ක්‍රමයක් දියත් කර ඇති අතර එහිදී අපනයනකරුවා විසින් වසර 5ක කාලයක් සඳහා රුපියල් මිලියන පහක් දක්වා වාර්ෂිකව ගෙවිය යුතු පොලියෙන් 50% උපරිමකට යටත්ව 10%ක උපරිම පොලී සහනාධාරයක් අපනයනකරුට හිමිවේ. මෙම සහනාධාර යෝජනා ක්‍රමයේ අරමුණු වන්නේ ගෝලීය තේ වෙළෙඳපොළ තුළ පාරිභෝගික අවශ්‍යතා සහ උවමනාවන් සපුරාලීම සඳහා නිෂ්පාදන විවිධාංගීකරණය, තත්ත්වය ඉහල නැංවීම, අගය එකතු කිරීම ඉතා ඉහළ මට්ටමකට ගෙන ඒමයි. මෙම යෝජනා ක්‍රමය යටතේ සිය ගබඩාවල නවතම යන්ත්‍ර සවි කිරීම සඳහා අපනයනකරුවන් 16 දෙනෙකු 2021 වසරේ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අතර අපනයනකරුවන් හය දෙනෙකු සමග ගිවිසුම් අත්සන් කර ඇත.

# 2.3 සිලෝන් තේ ප්‍රවර්ධනය

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සිලෝන් තේ ගෝලීය පානයක් ලෙස ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව 2021 වර්ෂයේදී සිලෝන් තේ ප්‍රවර්ධන වැඩසටහන් රැසක් දියත් කරන ලදී. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රවර්ධන අංශයට අනුයුක්ත කණ්ඩායමේ දුරදර්ශී හා උද්යෝගිමත් මගපෙන්වීම මත, කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ඇති වූ බාධක ජය ගැනීමට හැකි වූ බව සඳහන් කළ යුතුය. විශේෂයෙන්ම ප්‍රවර්ධන කටයුතු සඳහා භෞතිකව එක්රැස්වීමට බාධා ඇති වූ අතර, ලෝකය තුළ වඩාත්ම ජනයා ප්‍රිය කරන පානය ලෙස සිලෝන් තේ පත්කිරීමට දරන ප්‍රයත්නයේ දී, ඩිජිටල් නිර්මාණ සහ සමාජ මාධ්‍ය වේදිකා හරහා එම බාධාවන් අවස්ථාවක් කර ගැනීමට කණ්ඩායමට හැකි විය. රටින් බැහැර ක්‍රියාත්මක වන රුසියාව, චීනය සහ මැදපෙරදිග පිහිටි ප්‍රවර්ධන ඒකක මගින් කලාපීය වශයෙන් සිලෝන් තේ ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් රාශියක් පවත්වන ලදී. ශ්‍රී ලංකාවේ තේ අපනයනකරුවන් නියෝජනය කරන ප්‍රවර්ධන සහ අලෙවි කමිටුව (PMC) විසින් ප්‍රවර්ධන ක්‍රමෝපායන් වඩාත් පාරිභෝගිකව හා ඵලදායි ලෙස සිදු කිරීම සඳහා කාලෝචිත උපදෙස් ලබා දෙමින් ප්‍රමාණවත් මග පෙන්වීමක් ලබා දෙන ලදී. විශේෂයෙන් ගෝලීය වසංගත සමය තුළ විදේශ අමාත්‍යාංශය සහ රටින් පිටත ස්ථාපිත ශ්‍රී ලංකා දූත මණ්ඩල විසින් ලබා දුන් සම්බන්ධීකරණය සහ සහයෝගය අති මහත් විය.

1975 අංක 17 දරණ තේ මණ්ඩල නීතියට අනුව 2010 ඔක්තෝබර් 27 දින ප්‍රකාර අංක 1677/14 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් තේ ප්‍රචාරණ හා අලෙවිකරණ බද්ද හඳුන්වාදෙනු ලැබූ අතර, ශ්‍රී ලංකාව තුළ සහ ඉන් පිටත අලෙවිකරණ උපාය මාර්ගය වෙනුවෙන් 2010 නොවැම්බර් 1 දින සිට එය ක්‍රියාත්මක කෙරිණි. නමුත් 2021 වසර තුළදී, තේ තවාන් පිහිටුවීම, කොම්පෝස්ට්/ජෛව පොහොර නිෂ්පාදන බලාගාර පිහිටුවීම, සූර්ය පැනල, පොලී සහනාධාර ලබා දීම හා අනෙකුත් බොහෝ සංවර්ධන වැඩසටහන් කර්මාන්තයේ තිරසාරභාවය සඳහා ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම සැලකිල්ලට ගනිමින් තේ ක්ෂේත්‍රයේ සංවර්ධන කටයුතු සඳහා ඉල්ලුම් කරන ලද අරමුදල් ප්‍රවර්ධන සහ අලෙවි කමිටුව විසින් අනුමත කරන ලදී.

## අංශයේ මූලික කාර්යයන්

පහත දැක්වෙන පුළුල් කාණ්ඩ යටතේ වර්ගීකරණය කරන ලද දේශීය හා විදේශීය වෙළඳපොළවල ශ්‍රී ලංකා තේ ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තේ ප්‍රවර්ධන අංශයේ වගකීම වේ.

- ඒක ජාතික ශ්‍රී ලංකා තේ ප්‍රචාරණය
- තේ වර්ගීය ප්‍රවර්ධනය
- ශ්‍රී ලංකාව සතු සිංහ ලාංඡනය සඳහා සන්නාම ප්‍රවර්ධනය
- ජාත්‍යන්තර ආහාර හා පාන වෙළඳ සල්පිල් සහ ප්‍රදර්ශන සඳහා සහභාගී වීම
- පරිභෝජනය කරන සියලුම ප්‍රධාන පෙළේ රටවල උපායමාර්ගික වෙළඳපල පිළිබඳ විස්තර සම්පාදනය කිරීම හා බෙදා හැරීම
- තේ ක්ෂේත්‍රය සඳහා ප්‍රතිපත්ති සැකසීමේදී වැවිලි කර්මාන්ත අමාත්‍යාශයට සහයෝගය දැක්වීම
- තරගකරුවන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳ විශ්ලේෂණය
- සිංහ ලාංඡන වෙළඳ ලකුණු ලියාපදිංචිය, අධීක්ෂණය සහ පුද්ගලික අංශයේ ඇසුරුම්කරුවන්ට බලය පැවරීම
- භූගෝලීය දර්ශක ලෙස ශ්‍රී ලංකා තේ සහ අනෙකුත් තේ සම්බන්ධ ප්‍රාදේශීය නාමයන් / ලාංඡන ආරක්ෂා කිරීමේ ක්‍රියාවලිය
- ඕසෝන් හිතකාමී හා පිරිසිදු ශ්‍රී ලංකා තේ ලාංඡනය ලියාපදිංචි කිරීම සහ පුද්ගලික අංශයේ ඇසුරුම්කරුවන්ට බලය පැවරීම
- අගය එකතු කළ තේ අපනයනකරුවන්ගේ අපනයන ආදායම සඳහා 5%ක දිරිදීමනා සහනාධාරයක් හඳුන්වාදීම
- දේශීය තේ ප්‍රවර්ධනය

## "සිලෝන් ටී" ඒක-ජාතික ප්‍රවර්ධනය

සිලෝන් ටී ඒක-ජාතක ප්‍රවර්ධනය යනු වෙනත් සම්භවයක් ඇති තේ වලට සමගාමීව ශ්‍රී ලංකා තේ ප්‍රචාරණය සහ ප්‍රවර්ධනයට සම්බන්ධ වේ. තේ මණ්ඩලය විසින් විදේශ වෙළඳපොලවල සිලෝන් ටී සඳහා ඒක-ජාතික ප්‍රවර්ධනය ව්‍යාපාර දියත් කරනු ලබන්නේ එතෙර තේ ප්‍රවර්ධන ඒකක සහ විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල වාණිජ අංශ හරහාය. මාධ්‍ය ප්‍රචාරණය (ATL සහ සමාජ / ඩිජිටල්), එළිමහන් ප්‍රචාරණය, දියර තේ සේවා, තේ වැඩමුළු සහ සම්මන්ත්‍රණ මෙන්ම අනෙකුත් මහජන සම්බන්ධතා ක්‍රියාකාරකම් මණ්ඩලය විසින් සිදු කරනු ලබන ඒක-ජාතික ප්‍රවර්ධන ක්‍රියාකාරකම් ප්‍රධාන අංග වේ.

## සිලෝන් තේ නිෂ්පාදන ස්ථානගත කිරීමේ උපාය මාර්ගය

අව්‍යාජ - තිරසාර බව

- මා මිලදී ගන්නා තේ අව්‍යාජ නිෂ්පාදනයක් වීම වැදගත් කරුණකි.
- තිරසාරබව පිළිබඳ සාධක සපුරාලීම - පාරිසරික සහ සමාජ යහපැවැත්ම යන දෙකම

සෞඛ්‍යය සහ සුවතාවය - සිලෝන් තේ වල පිරිසිදු බව

- මම මගේ ආහාර වේල සඳහා හොඳ සෞඛ්‍ය සම්පන්න ආහාර මිලදී ගන්නවා
- මම මනා ලෙස සමබර වූ පෝෂ්‍යදායී ආහාර අනුභව කරමි

ගුණාත්මක සිලෝන් තේ

- මම නිතරම හොඳ තත්ත්වයේ ආහාර සහ බීම සඳහා වැඩියෙන් ගෙවමි
- මිල වැඩි වුවද, මම තවමත් නියම වෙළඳ නාමයක් සහිත දේවල් මිලදී ගැනීමට කැමතියි

## සිලෝන් කළු තේ සඳහා ගෝලීය වැඩසටහන

සෞඛ්‍ය සහ ප්‍රතිශක්තිය ඉහළ නැංවීම සඳහා අද්විතීය පානයක් ලෙස Ceylon Black Tea සඳහා ප්‍රතිරූපයක් ගොඩනැගීම, ලොව හොඳම තේ ලෙස Ceylon Tea හි ප්‍රතිරූපය යළි ස්ථාපිත කිරීම සහ ජාත්‍යන්තරව පාරිභෝගිකයින් අතර කළු තේ තුළ පවතින සෞඛ්‍ය ප්‍රතිලාභ පිළිබඳ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම යන අරමුණු ඇතිව 2021 වර්ෂය තුළදී වඩාත් කාලෝචිත ලෙස දියත් කරන ලද ව්‍යාපාරය මෙය විය.

ප්‍රතිශක්ති වර්ධකයක් ලෙස කළු තේ පරිභෝජනය (තහවුරු කරන ලද විද්‍යාත්මක සාක්ෂි සහ පර්යේෂණ මත පදනම්ව), සුවතාවයට සම්බන්ධ උණුසුම් තේ පානය (සීනි සහ කිරි නොමැතිව), ප්‍රදේශ වඩා දමා තිබූ වකවානුව තුළ පවුලේ අය සමග උණුසුම් සිලෝන් තේ කෝප්පයක් පානය කරමින් විවේකීව සිටීම මෙන්ම සමාජ දුරස්ථභාව තුළ ආදරය සහ කරුණාව යන හැගීම් සමග සිලෝන් තේ වැළඳ ගැනීම වැනි පණිවිඩ මෙම ව්‍යාපාරය මගින් ගෙන යන ලදී. එය සමාජ මාධ්‍ය ප්‍රචාරණ ව්‍යාපාරයක් වූ අතර වැඩි ප්‍රේක්ෂකයින් සංඛ්‍යාවක් ඉලක්ක කිරීම සඳහා Face Book, Twitter, Instagram, YouTube, Yandex, We-chat, Baidu, Etc වැනි මාර්ග ගත වේදිකා භාවිත කරන ලදී.

සිතියම 2.3.1 : සිලෝන් ටී ගෝලීය ප්‍රචාරණ ව්‍යාපාරය / සියළුම රටවල් සඳහා ළඟා වීම

*සමාජ මාධ්‍ය වේදිකා භාවිත කරමින් "සිලෝන් තේ - ලොව කැමතිම තේ" බවට පරිවර්තනය කිරීමේ අරමුණින් රුපියල් මිලියන 35 ක මුළු ආයෝජනයක් සමඟ 2021 ජනවාරි මාසයේ දී සිලෝන් කළු තේ ප්‍රවර්ධන වැඩසටහන ආරම්භ කරන ලදී. මෙහි දී, ඉලක්ක කරගත් රටවල් 12 වූයේ රුසියාව, යුක්රේනය, ජපානය, චීනය, ජර්මනිය, ඇමරිකා එක්සත් ජනපදය, චිලී, ඕස්ට්‍රේලියාව, සෞදි අරාබිය, තුර්කිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ ඉරානයයි.,*




මූලාශ්‍රය: www. facebook.com,global reach matrix,2021

# ගෝලීය වශයෙන් බලපෑම




Impact on a global scale






## සමාජ මාධ්‍ය - එක්සත් රාජධානිය තුළ සිදු කළ ප්‍රවර්ධන ව්‍යාපාරය

මුහුණු පොත සහ ඉන්ස්ටග්‍රෑම් වැනි සමාජ මාධ්‍ය වේදිකා හරහා "සිලෝන් තේ - ලොව ප්‍රියතම තේ" බවට නංවාලීමේ අරමුණින් අහිමි වූ වෙළඳපොළ නැවත ලබා ගැනීම සඳහා ඩොලර් 10000 ක ආයෝජනයක් සිදු කරමින් එක්සත් රාජධානිය තුළ ප්‍රවර්ධන ව්‍යාපාරය ක්‍රියාත්මක කරන ලදී. කළු තේ ව්‍යාපාරය සඳහා සිදු කරන ලද ඩිජිටල් නිර්මාණ මෙම ව්‍යාපාරය සඳහා යොදා ගන්නා ලදී.

සිතියම 2.3.2: කළු තේ ප්‍රචාරණ වැඩසටහනේ බලපෑම




*සිලෝන් තේ පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීම සහ එක්සත් රාජධානියේ තේ පාරිභෝගිකයින්ගේ අවධානය නැවත ලබා ගැනීම සඳහා තේමස් ඩිජිටල් ව්‍යාපාරය (ජුනි - අගෝස්තු 2021) පවත්වන ලදී.*











## සමාජ මාධ්‍ය ව්‍යාපාරය - ජාත්‍යන්තර තේ දිනය

තේ වල අඩංගු ආර්ථික, ජීව විද්‍යාත්මක සහ භෞතික ප්‍රතිලාභ පිළිබඳ ප්‍රකාශ කිරීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් වාර්ෂිකව මැයි 21 වන දින ජාත්‍යන්තර තේ දිනය සමරනු ලබයි. "තේ සහ සාධාරණ වෙළඳාම" යන තේමාව යටතේ 2 වන ජාත්‍යන්තර තේ දිනය මැයි 21 වන දින ගෝලීය වශයෙන් සැමරීමට නියමිතව තිබුණි.

ලොව පුරා පවතින වසංගත තත්ත්වය සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් 2021 මැයි 21 දින සිට දින දහයක කාලයක් ඩිජිටල් ව්‍යාපාරය දියත් කරන ලදී. එහි දී රටවල් දාහතරක් ඉලක්ක කර තිබූ අතර ඒවා රුසියාව, යුක්රේනය, ජපානය, චීනය, ජර්මනිය, ඇමරිකා එක්සත් ජනපදය, චිලී, ඕස්ට්‍රේලියාව, සෞදි අරාබිය, තුර්කිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ඉරානය, එක්සත් රාජධානිය සහ ශ්‍රී ලංකාව විය.

## සියළුම රටවල් සඳහා ළඟාවීම්
### දින දහයක ප්‍රචාරණ ව්‍යාපාරයේ ප්‍රගතිය

| Australia | Chile | China | Germany | Iran | Japan | Russia |
|---|---|---|---|---|---|---|
| 133% | 140% | 171% | 177% | 169% | 179% | 132% |
| 831 Thousand | 2.20 Million | 1.02 Million | 929 Thousand | 632 Thousand | 1.47 Million | 3.95 Million |
| 625 Thousand | 1.57 Million | 600 Thousand | 525 Thousand | 375 Thousand | 825 Thousand | 3.01 Million |

| Saudi Arabia | Sri Lanka | Turkey | United Arab Emirates | Ukraine | United Kingdom | United States of America |
|---|---|---|---|---|---|---|
| 390% | 206% | 152% | 234% | 136% | 139% | 133% |
| 3.705 Million | 3.01 Million | 4.92 Million | 1.57 Million | 2.5 Million | 1.03 Million | 946 Thousand |
| 950 Thousand | 1.46 Million | 3.25 Million | 675 Thousand | 1.85 Million | 750 Thousand | 710 Thousand |







## දිගු කාලීන ගෝලීය ප්‍රවර්ධන ව්‍යාපාරය

සිලෝන් තේ සඳහා ගෝලිය ප්‍රවර්ධන ව්‍යාපාරය විසින් සිලෝන් තේ ප්‍රවර්ධන කටයුතු, හඳුනාගත් ඉලක්කගත වෙළඳපළ 12ක් තුළ දියත් කිරීමට අවධානය යොමු කර ඇත. එනම් රුසියාව, යුක්රේනය, ඇමරිකා එක්සත් ජනපදය, ජපානය, චීනය, ජර්මනිය, ඕස්ට්‍රේලියාව, චිලි, සෞදි අරාබිය, තුර්කිය, එක්සත් අරාබි එමීර් රාජයය සහ ඉරානය යන රටවල් ය.

මෙහි දී අංශ තුනක් හැසිරවීම සම්බන්ධයෙන් ආයතන තුනකින් ටෙන්ඩර් කැඳවා ඇත. එනම්,
i) ව්‍යාපාරය නිර්මාණය කිරීම සහ අවශ්‍ය නිෂ්පාදන ද්‍රව්‍ය නිර්මාණය කිරීම
ii) මාධ්‍ය සැලසුම් කිරීම, කාල රාමු සැකසීම සහ මාධ්‍ය මිලදී ගැනීම ඇතුළත් මාධ්‍ය පිළිබඳ කොටස, සහ
iii) මහජන සම්බන්ධතා ව්‍යාපාරය වශයෙනි.

වර්තමාන ගෝලිය තත්ත්වය පිළිබඳ සලකා බැලීමෙන්, ප්‍රවර්ධන හා අලෙවි කමිටුව විසින් තීරණය කරන ලද්දේ මෙම ව්‍යාපාරය දැනට සමාජ/ ඩිජිටල් වේදිකා හරහා ක්‍රියාත්මක කිරීම වඩා උචිත බවයි. කෙසේ වෙතත්, ව්‍යාපාරයේ සාර්ථකත්වය තක්සේරු කිරීමේ අරමුණින් සෙවුම් යන්ත්‍ර අලෙවිකරණය සහ සමාජයේ අදහස් ගොඩනැගීමට හැකියාව සහිත ප්‍රධාන පෙළේ පුද්ගලයන් යොදා ගනිමින් ප්‍රවර්ධන ව්‍යාපාරයේ (Influencer Marketing Campaign) යෙදෙන රුසියාවෙන් සහ යුක්රේනයේ සිට ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීමට ප්‍රවර්ධන හා අලෙවි කමිටුව විසින් අදහස් ලබා දෙන ලදී.

ඒ අනුව,

- රුසියාවේ සහ යුක්රේනයේ ගෝලීය වෙළඳ ප්‍රචාරණ ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීම සඳහා KOLs බඳවා ගැනීම, ටෙන්ඩර් තේරීම් කළමනාකරණය සහ සෙවුම් යන්ත්‍ර භාවිතය සඳහා 2021 මාර්තු මාසයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබිණි. කොන්ත්‍රාත් ගිවිසුම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ සහ විදේශ අමාත්‍යාංශයේ අනුමැතිය ද ලබාගෙන ඇත.
- 2021 අගෝස්තු මාසයේ සිට ජපානයේ ගෝලීය ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු නියෝජිතායතනයක් තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කරන ලද අතර 2021 දෙසැම්බර් මස ජපානයෙන් ලංසු කැඳවන ලදී.
- 2021 දී ජපානය, චීනය සහ ජර්මනිය සඳහා මාධ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ සැලසුම් සම්පූර්ණ කරන ලදී.
- ගෝලීය ව්‍යාපාරය සඳහා භාෂා හතකින් යුත් වෙබ් අඩවි සකස් කර අවසන් කරන ලද අතර "මිලදී ගත හැකි ස්ථාන" පිළිබඳ පහසුකම් ස්ථාපිත කරන ලදී.

# වෙළඳ සල්පිල් සඳහා සහභාගී වීම

තෝරාගත් වෙළඳපොල තුළ "සිලෝන් තේ නාමය" ජාතික සන්නාමය ලෙස හා සහභාගීවන සමාගම්හි සංනාම නාම ප්‍රවර්ධනය කරමින් තේ ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන සඳහා සහභාගීවන ශ්‍රී ලංකා තේ අපනයන සමාගම්වලට ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් පහසුකම් සලසා දුනි. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ  සහනාධාරය මගින් බිම් කුලිය සහ කුටිය ඉදිකිරීම සඳහා වන වියදමෙන් 50%ක් ආවරණය කරයි. ඉතිරි පිරිවැය සහ අනෙකුත් වියදම් ප්‍රදර්ශනය සඳහා සහභාගිවන තෝරාගත් සමාගම් විසින් දැරිය යුතුය.

වසංගත තත්ත්වය හේතුවෙන්, ශ්‍රී ලංකා තේ මණ්ඩලය පහත වෙළඳ ප්‍රදර්ශන සඳහා පහසුකම් සැලසීම සහ සහභාගී වීම සිදු කළ අතර 2021 වසරේ පැවැත්වීමට නියමිත අනෙකුත් වෙළඳ ප්‍රදර්ශන අවලංගු කිරීම් / කල් දැමීම් සම්බන්ධයෙන් කටයුතු කරන ලදී.

- **ඩුබායි හි Gulfood 2021**

ශ්‍රී ලාංකික අපනයනකරුවන් ඩුබායි හි පැවැත්වෙන "Gulfood 2021"  සඳහා සාර්ථකව සහභාගී විය. 2021 පෙබරවාරි 21 සිට 25 දක්වා එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ඩුබායි හි, ඩුබායි ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ පැවති ශ්‍රී ලංකා මණ්ඩපයට ආහාර පාන අංශයේ ශ්‍රී ලාංකික අපනයනකරුවන් 11 දෙනෙකු සහභාගී විය.






- **ඩුබාහි WORLD EXPO තුළ සිලෝන් තේ ප්‍රවර්ධනය**

World Expo Dubai ප්‍රදර්ශනය 2022 ඔක්තොම්බර් 01 සිට 2022 මාර්තු 31 දක්වා ඩුබායි හිදී පැවැත්විණි. මාස හයක කාලයක් තුළ පැවති ප්‍රදර්ශනයේ දී ජාතීන් 190ක් විසින් "සිත් සතන් එකතු කිරීම, අනාගතය නිර්මාණය කිරීම (Connecting Minds" Creating the Future)" යන තේමාව යටතේ ප්‍රදර්ශන පැවැත්විය. මෙම ප්‍රදර්ශනයෙහි උප තේමා තුනක් ද විය: එනම්, අවස්ථාව, චලතාවය  සහ තිරසාර බව වශයෙනි.  මෙම අවස්ථාවට ලොව පුරා මිලියන 25 ක පමණ ජනතාවක් පැමිණෙනු ඇතැයි අපේක්ෂා කෙරිණි. මෙම ප්‍රදර්ශනයෙහි ශ්‍රී ලංකාවට අයත් මණ්ඩපය "අවස්ථාව" යන උප තේමාව යටතේ පවතින  ශ්‍රී ලංකා සහභාගීත්ව කටයුතු ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් සංවිධානය කරන ලදී.

දැනට ශ්‍රී ලංකාවේ සමස්ත තේ අපනයනයෙන් 55%ක් පමණ අපනයනකරණ මැදපෙරදිග වෙළඳ කලාපයේ සිලෝන් තේ සඳහා පවතින වැදගත්කම හඳුනාගෙන එම කලාපය විසින් සිදු කර ඇති අතර, කලාපය තුළ එයට හිමි තත්ත්වය ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව අනුව, ශ්‍රී ලංකා තේ මණ්ඩලය ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සමග එක්ව, ශ්‍රී ලංකාවට අයත් ප්‍රදර්ශන මණ්ඩපය තුළ සය මාසයක ප්‍රදර්ශන කාලය පුරාවටම සිලෝන් තේ ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරන ලදී. ශ්‍රී ලංකා මණ්ඩපය යටතේ, සිලෝන් තේ  ප්‍රවර්ධන කටයුතු සඳහා වෙනම ස්ථානයක් වෙන් කර ඇති අතර, එම ස්ථානය සිලෝන් තේ ප්‍රවර්ධන වීඩියෝ සහ සිලෝන් තේ සිංහ ලාංඡනයේ පින්තූර සහ අනෙකුත් රූපාකාර නිරූපණයන් ප්‍රදර්ශනය කිරීම සඳහා එල්.ඊ.ඩී තිරයකින් ද සමන්විත වේ. සිලෝන් තේ රස බැලීමේ සැසි සහ තේ පැන් තේ සේවා සැලසීම මගින් ප්‍රදර්ශනය පුරාවටම සිලෝන් තේ  හි අඩංගු සැබෑ රසය නරඹන්නන්ට විඳගැනීමට අවස්ථාව සලසා ඇත.

තේ දල්ලේ සිට කෝප්පයට එකතු වන ලෝක ප්‍රසිද්ධ සිලෝන් තේවල රහස දැන ගැනීමටත් නැවුම් තේ කෝප්පයක රස විඳීමටත් විශේෂ තේ කලාපයේ ඇති මණ්ඩපය දිගේ ගමන් කරන අතරවාරයේ දී ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කවුළුවේදී නරඹන්නන්ට හැකියාව ලැබේ.







- **ප්‍රොඩක්ස්පෝ (PRODEXPO) -2021**

ආහාර නිෂ්පාදන, පාන වර්ග සහ නිෂ්පාදනය සඳහා භාවිතා කරන අමුද්‍රව්‍ය ප්‍රදර්ශනය හෙවත් 28 වන වාර්ෂික ජාත්‍යන්තර "PRODEXPO-2021" ප්‍රදර්ශනය වර්ෂ 2021 අප්‍රේල් 12 වන දින මොස්කව්හි "එක්ස්පෝ සෙන්ටර්" හිදී ආරම්භ වී අප්‍රේල් මස 16 දක්වා දින පහක් පැවතුන අතර එහි දී සිලෝන් තේ ප්‍රවර්ධනය ද සිදුකෙරිණි.

සිලෝන් තේ කුටිය මගින් සිය ගණනක් නරඹන්නන් ආකර්ෂණය කර ගත් අතර, එහි ශ්‍රී ලංකාවේ සුවිශේෂී කලාප හතක තේ සහ රුසියාවේ ජනප්‍රිය ප්‍රධාන පෙළේ ශ්‍රී ලාංකික තේ වර්ග අන්තර්ගත විය. Jafferjee Brothers වෙතින් එන සුප්‍රසිද්ධ සිලෝන් තේ සන්නාමය වන JAF Tea ද තම නිෂ්පාදන අසල්වැසි කුටියේ ප්‍රදර්ශනය කරමින් ප්‍රදර්ශනයට සහභාගී විය. සම්ප්‍රදායික ශ්‍රී ලාංකේය ඔසරියෙන් සැරසුණු රුසියානු තේ ප්‍රදර්ශනකරුවන් විසින් නරඹන්නන්ට නැවුම් සිලෝන් තේ කෝප්පයකින් සංග්‍රහ කරන ලදී.

## • වර්ල්ඩ් ෆුඩ් මොස්කව් (World Food Moscow) - 2021

2021 සැප්තැම්බර් 21 සිට 24 දක්වා IEC "Crocus Expo" හිදී මෙම ප්‍රදර්ශනය පැවැත්විණි. මොස්කව් හි තේ ප්‍රචාරණ ඒකකය සමග එක්ව සිලෝන් ටී ලැන්ඩ් පුද්ගලික සමාගම ("Ceylon Tea Land Pvt Ltd") සහ කෞශල්‍යා තේ අපනයන පුද්ගලික සමාගම ("Kaushalya Tea Exports Pvt Ltd") ද සිලෝන් තේ ප්‍රදර්ශනය සඳහා සහභාගී විය.

"වර්ල්ඩ් ෆුඩ් මොස්කව් (World Food Moscow)" යන දැරිය හැකි සාධාරණ මිලක් සහිත හා උසස් තත්ත්වයේ ආහාර නිෂ්පාදන රාශියකින් සමන්විත සරත් ඍතුවේ පවත්වනු ලබන රුසියාවේ විශාලතම ආහාර ප්‍රදර්ශනය වේ. මෙම වසරේ, රුසියානු සහ විදේශීය ආහාර පාන නිෂ්පාදකයින් සහ සැපයුම්කරුවන් 600 කට වැඩි පිරිසක් විසින් ඔවුන්ගේ හොඳම තත්වයේ නව නිෂ්පාදන ආහාර වෙළඳපල විශේෂඥයින් වෙත ඉදිරිපත් කරන ලදී. සිලෝන් තේ පිළිබඳ වැඩි විස්තර දැනගැනීමේ රුචියක් සහිත නරඹන්නන් විශාල පිරිසක් සිලෝන් තේ කවුළුව මගින් ආකර්ෂණය කර ගන්නා ලදී. ශ්‍රී ලංකාවේ සුවිශේෂී කලාප හතෙන් ලබා ගත් සිලෝන් තේ වලින් සාදන ලද උණුසුම් තේ කෝප්පයක් ද සංග්‍රහ කරනු ලැබූ අතර එය කර්මාන්තයේ නැවතුමක් බවට පත්විය.

## • පීටර්ෆුඩ් 2021 ප්‍රදර්ශනය, ශාන්ත පීටර්ස්බර්ග් (Peterfood 2021 Exhibition, Saint-Petersburg)

2021 නොවැම්බර් 16 සිට 18 දක්වා Saint-Petersburg නගරයේ Expoforum හි පැවති "Peterfood" ආහාර නිෂ්පාදන සඳහා 30 වැනි ජුබිලි ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහභාගී විය. "Peterfood" යනු රුසියාවේ වයඹ දෙසින් ඇති ප්‍රධාන ආහාර ප්‍රදර්ශනය වන අතර Saint-Petersburg යනු රුසියාවේ සිල්ලර වෙළඳාමේ ඉහළම කොටස (80%ට වඩා, මෙය සාමාන්‍ය යුරෝපීය මට්ටමින් දර්ශකයකි) හිමි රුසියාවේ දෙවන විශාලතම නගරය වේ.

## • වර්ල්ඩ් ෆුඩ් යුක්‍රෙන් (World Food Ukraine) 2021 – Kyiv

2021 නොවැම්බර් 2 සිට 4 දක්වා Kyiv හි ජාත්‍යන්තර ප්‍රදර්ශන මධ්‍යස්ථානයේදී ප්‍රදර්ශනය පැවැත්විණි. UHE Exports (Pvt) Ltd ද ශ්‍රී ලංකා තේ මණ්ඩලය සමග ප්‍රදර්ශනයට සහභාගී විය. යුක්රේනයේ සහ වෙනත් රටවල ආහාර හා පාන වර්ග නිෂ්පාදකයින් සහ සැපයුම්කරුවන්, සැකසුම් සමාගම්, බෙදාහරින්නන්, අපනයනකරුවන්, ආනයනකරුවන්, ආහාර නිෂ්පාදන සිල්ලර වෙළෙන්දන් හා අවන්හල් ව්‍යාපාර යනාදිය කෙරෙහි ප්‍රදර්ශනය මගින් විශේෂ අවධානය යොමු කර තිබේ.

## • ශ්‍රී ලංකා තේ මණ්ඩලය මොස්කව්හි "Coffee Tea Cacao Russian Expo 2021" සඳහා සහභාගී වෙයි. (Sri Lanka Tea Board Participates at “Coffee Tea Cacao Russian Expo 2021” in Moscow)

එක්ස්පෝ වාර්ෂික ජාතික සුදුසුකම් ලැබීමේ ශූරතාවලියට අමතරව - තේ ආශ්‍රිත වඩාත් ආකර්ෂණීය ක්‍රියාකාරකමක් වන රුසියාවේ ටී මාස්ටර් කප් (Tea Master Cup) යන්න මෙම ප්‍රදර්ශන කාල වකවානුව තුළ පැවැත්විණි. මෙම උත්සවයේ අරමුණු වූයේ ඉහළ තේ සංස්කෘතියක් ඇති කිරීම, තේ වෘත්තිකයන් සංවර්ධනය කිරීම, රුසියාවේ තේ සඳහා ඇති ඉල්ලුම වැඩි දියුණු කිරීමයි.

## • ඩැමස්කස් ජාතන්තර වෙළඳ ප්‍රදර්ශනය - සිරියාව (Damuscus International Trade Fair-Syria)

ලෙබනනය සහ සිරියාව සඳහා ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලය ඩැමස්කස් හි ජාත්‍යන්තර සල්පිලට සහභාගී වූ අතර, 2021 ඔක්තෝම්බර් 09 වන දින සිරියාවේ ඩැමස්කස් හි ඩමා රෝස් (Dama Rose) හෝටලයේ දී සිලෝන් තේ සහ හස්ත කර්මාන්ත නිෂ්පාදන ප්‍රදර්ශනය කරන ලදී. ජාත්‍යන්තර සල්පිලට රටවල් 19ක් සහභාගී වූ අතර ශ්‍රී ලංකා වෙළෙඳ කුටියට ප්‍රමුඛ ස්ථානයක් හිමි විය.





## • වර්ල්ඩ් ටි එක්ස්පෝ - ඇ.එ.ජ (World Tea Expo – USA)

ලොස් ඇන්ජලීස් හි කොන්සල් ජනරාල් කාර්යාලයේ සහයෝගයෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලය 2021 වර්ෂයේ ජුනි මාසයේ දී ලාස් වේගාස් හි දී මෙම ප්‍රදර්ශනයට සහභාගී විය. වර්ල්ඩ් ටී එක්ස්පෝ යනු තේ කර්මාන්තයට සම්බන්ධ උතුරු ඇමරිකාවේ විශාලතම වාර්ෂික සම්මන්ත්‍රණය සහ වෙළඳ ප්‍රදර්ශනයයි. නියෝජ්‍ය කොන්සල් ජනරාල්වරයා විසින් මෙවර මෙම වාර්ෂික ප්‍රදර්ශනයේ දී ශ්‍රී ලංකා තේ මණ්ඩලය නියෝජනය කරන ලදී.

### • "ශ්‍රී ලංකා නිෂ්පාදන-වැඩෙන මිතුදම" ප්‍රදර්ශනය සහ ඉරානයේ ටෙහෙරානයේ දී තේ පාර්ශවකරුවන්ගේ රැස්වීම - ඉරානය ("Ceylon Products-Growing Friendship" Exhibition & Tea Stakeholders' Gathering in Tehran – Iran)

ඉරානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය ශ්‍රී ලංකා තේ මණ්ඩලය සමග එක්ව 2021දී "ශ්‍රී ලංකා නිෂ්පාදන-වැඩෙන මිතුදම" කෘෂිකාර්මික අපනයන ප්‍රදර්ශනයක් - 2021 වසරේදී සංවිධානය කරන ලද අතර තේ පාර්ශවකරුවන්ගේ රැස්වීමක් ද ඒ සමග 2021 දෙසැම්බර් 06 වන දින වාන්සරි පරිශ්‍රයේ දී පවත්වන ලදී. තේ සංගම්, ප්‍රමුඛ පෙළේ ආනයනකරුවන්, සිල්ලර වෙළෙන්දන්, ප්‍රමුඛ පෙළේ ව්‍යාපාරිකයන් සහ මාධ්‍යවේදීන් ඇතුළු අදාළ පාර්ශවකරුවන්ගෙන් සමන්විත ආරාධිතයින් 75 කට අධික පිරිසක් මේ සඳහා සහභාගි වූහ. ශ්‍රී ලංකා තේ සහ අනෙකුත් කෘෂිකාර්මික අපනයන නිෂ්පාදන ඉරානය තුළ ප්‍රවර්ධනය කිරීම සහ අදාළ පාර්ශවකරුවන් සමග සම්බන්ධ වීම මෙම උත්සවයේ අරමුණු විය.




### • Ikebana ජාත්‍යන්තර ප්‍රදර්ශනය 2021 - ජපානය (Ikebana International Fair 2021 – Japan)

2021 දෙසැම්බර් 14 වන දින රෝයල් පාර්ක් හෝටලයේ දී පැවති Ikebana International Fair 2021 සඳහා ශ්‍රී ලංකා දූත මණ්ඩලය සහභාගි විය. මෙම ප්‍රදර්ශනය සඳහා අනුග්‍රහය දක්වන ලද ටකාමාඩෝ කුමරු විසින් ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටියට ගොස් ලංකා තේ පෙට්ටියක් මිල දී ගත්තේය. ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටිය විශාල නරඹන්නන් පිරිසක් ආකර්ශනය කර ගන්නා ලද අතර, ජපන් යෙන් 80,500/- එකතු කර, එම මුදල අසරණ සරණ කටයුතු සඳහා යෙදවීම සඳහා Ikebana ජාත්‍යන්තර ප්‍රදර්ශනයේ සංවිධායකයින් හට පරිත්‍යාග කරන ලදී.






- ලෝක ආහාර ඉස්තාන්බුල් වෙළඳ ප්‍රදර්ශනයේදී සිලෝන් තේ ප්‍රවර්ධනය - තුර්කිය
- 2021 සැප්තැම්බර් 30 සිට ඔක්තෝබර් 08 දක්වා 54 වැනි කයිරෝ ජාත්‍යන්තර ප්‍රදර්ශනයේදී සිලෝන් තේ ප්‍රවර්ධන කටයුතු.
- වර්සෝ හි ලෝක ආහාර සහ ගිම්හානයේ විසිතුරු ආහාර ප්‍රදර්ශනය සඳහා මාර්ගගත ආකාරයෙන් සහභාගී වීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් පහසුකම් සලසන ලදී.

## සන්නාම ප්‍රවර්ධන යෝජනා ක්‍රමය

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් 2021/2022 වකවානුව සඳහා සන්නාම ප්‍රවර්ධන සහන යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. මෙම යෝජනා ක්‍රමයට අනුව, සිංහ ලාංඡනය සහිත පිරිසිදු ශ්‍රී ලංකා තේ වෙළඳ නාමයන් වෙත ගැළපෙන ප්‍රදාන ලබා දීමෙන් (ප්‍රවර්ධන වියදම්වලින් 50%) ප්‍රවර්ධනය කෙරේ. ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇති ශ්‍රී ලංකා තේ වෙළඳ නාම පමණක්, මෙම ප්‍රවර්ධන වැඩසටහන යටතේ ප්‍රවර්ධන ආධාර ලැබීම සඳහා සුදුසුකම් ලබයි. 2010 ඔක්තෝබර් 27 දින අංක 1677/14 දරණ ගැසට් පත්‍රය යටතේ තේ අපනයනකරුවන් විසින් සපයනු ලබන ප්‍රවර්ධන හා අලෙවිකරණ බද්දෙන් මෙම යෝජනා ක්‍රමය සඳහා අරමුදල් ලබා දෙනු ලැබේ. 2021/2022 කාලය සඳහා රුපියල් බිලියනයක අයවැය ප්‍රතිපාදන වෙන් කර තිබේ.

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය 2020.11.25 දින පැවති රැස්වීමේදී 2021/2022 වසර සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩල ලාංඡනය යටතේ පෞද්ගලික අංශයේ තේ අපනයනකරුවන් සඳහා සන්නාම ප්‍රවර්ධන යෝජනා ක්‍රමයක් අනුමත කරන ලදී. එය 2021.08.06 දින අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර සන්නාම ප්‍රවර්ධන යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා 2021.08.17 දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබිණි.

2021.09.09 දින ප්‍රසිද්ධ දැන්වීම හරහා ලියාපදිංචි තේ අපනයනකරුවන්ගෙන් අයදුම්පත් කැඳවන ලදී. ඒ අනුව සමාගම් 25කින් අයදුම්පත් 70ක් ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත කාලසීමාව තුළ 2021/2022 වසර සඳහා සන්නාම ප්‍රවර්ධන සහනාධාර යෝජනා ක්‍රමය සඳහා තෝරාගත් පෞද්ගලික අංශයේ සමාගම් 22ක් සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලය අතර ගිවිසුම් 65ක් අත්සන් කරන ලදී.

# ප්‍රවර්ධන වැඩසටහන් සහ ක්‍රියාකාරකම්

අපනයන වැඩි කිරීම උදෙසා ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ සිලෝන් තේ පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීමට සහ අපනයනකරුවන්ට පහසුකම් සැලසීම සඳහා පහත පියවර ගෙන ඇත. වසංගතයේ බලපෑම හේතුවෙන් වර්ෂය තුළ සීමිත ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

## තානාපති කාර්යාල සමග සිදු කරන ලද ක්‍රියාකාරකම්

- තුර්කියේ අන්කාරා හි සාප්පු සංකීර්ණවල සිලෝන් තේ ප්‍රවර්ධන කටයුතු.

තුර්කියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සහය ඇතිව ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් තුර්කියේ අන්කාරා හි "පැනෝරා (Panora)" සහ "නටවේගා (Natavega)" යන හඳුනාගත් ප්‍රධාන සාප්පු සංකීර්ණවල ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ තේ නිෂ්පාදන සහ බැනර්/පෝස්ටර් ප්‍රදර්ශනය කරමින් සිලෝන් තේ පිළිබඳ පාරිභෝගිකයන්ගේ දැනුවත්බව ඉහල නැංවීම සඳහා ප්‍රවර්ධන වැඩසටහනක් ආරම්භ කරන ලදී. තවද, නරඹන්නන්ට සැබෑ සිලෝන් තේවල රස විඳ ගැනීම සඳහා සිලෝන් තේ රස බැලීමේ සැසි ද පවත්වා ඇත.





- තිලිණ තේ සහ ප්‍රවර්ධන ද්‍රව්‍ය බෙදා හැරීම (කුවේට්හි කියුරියෝසිටි හෝටලයේ ("ශ්‍රී ලංකා රාත්‍රිය")
- මෙල්බර්න් හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය විසින් පවත්වන ලද ජාත්‍යන්තර තේ සැමරුම් උත්සවය.
- මෙල්බර්න් හි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය විසින් සංවිධානය කරන ලද විශේෂ "සිලෝන් තේ සැන්දෑව".

මෙම අවස්ථාව සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රී සහ වික්ටෝරියානු පාර්ලිමේන්තුවේ "Sri Lanka Friends" හි  සම සභාපති ක්‍රේග් ඔන්ඩාච් මහතා, වික්ටෝරියානු බහු සංස්කෘතික කොමිසමේ සභාපති විවේන් නගුයෙන් ඕස්ට්‍රේලියානු අන්තර් සංස්කෘතික සමාජයේ විධායක අධ්‍යක්ෂ අහමට් කෙකින්, ඕස්ට්‍රේලියානු සංචාරක ආයතනයේ හිටපු නියෝජ්‍ය සභාපති ඇන්ඩෲ ෆෙයාර්ලි, ඕස්ට්‍රේලියානු ටී මාස්ටර්ස් හි ප්‍රධාන විධායක නිලධාරී ෂරින් ජොන්ස්ටන්, තේ ආනයනකරුවන්, කොන්සියුලර් කාර්යමණ්ඩලයේ සාමාජිකයින්, බැංකුකරුවන් සහ මාධ්‍යවේදීන් ඇතුළු මෙල්බර්න් නුවර කීර්තිමත් පුද්ගලයන් රැසක් සහභාගී වූහ.




- ජාත්‍යන්තර තේ දින 2021 සැමරුම්

2021 ජාත්‍යන්තර තේ දිනය සැමරුම  වෙනුවෙන් පැවැත්වුණු සෝෆා සමුළුව (කැනඩාව), FAO/IGG තේ සමුළුව, ගෝලීය සමුළුව (ඉන්දියාව) සහ තේ කර්මාන්ත සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර තේ දින වැඩසටහන (චීනය) යන සමුළු වෙනුවෙන් සිලෝන් තේ නියෝජනය කරමින් සහභාගී වීම




- NCE අපනයනකරුවන්ගේ සම්මාන ප්‍රදානෝත්සවයේදී තේ සහ තේ නිෂ්පාදන අංශයයේ ප්‍රමුඛ අනුග්‍රාහකයා වූයේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය යි.
- එක්සත් රාජධානියේ තේ පානය කරන්නන් නැවත ඇතිකරලීමේ උපායමාර්ගික ප්‍රවේශයෙන් යුතුව 2021 දී එංගලන්ත- ශ්‍රී ලංකා ක්‍රිකට් තරගය වෙනුවෙන් සිලෝන් තේ මගින් අනුග්‍රහය ලබා දෙන ලදී.










- සිලෝන් හරිත තේ සෞදි අරාබියට ආනයනය කිරීම තහනම් කිරීම සම්බන්ධයෙන් සෞදි ආහාර හා ඖෂධ අධිකාරිය (SFDA) සමග රැස්වීම.
- ආනයන බදු සහ තිරුබදු නොවන බාධක අඩු කිරීම සඳහා අදාළ රජයන් සමග ද්විපාර්ශ්වික වෙළඳ රැස්වීම් (ඉන්දියාව / පකිස්ථානය / තුර්කිය / ඉරානය ආදිය).
- අගය එකතු කළ තේ අපනයනය දිරිගැන්වීම සඳහා අපනයනකරුවන් සඳහා 5% දිරි දීමනා යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම.

අගය එකතු කළ අපනයන දිරිමත් කිරීමේ අරමුණෙන් සිලෝන් තේ අපනයනය සඳහා ඉහළ FOB ලබා ගැනීම සඳහා මෙම යෝජනා ක්‍රමය හඳුන්වා දෙන ලදී. තවද, මෙම යෝජනා ක්‍රමය විදේශ වෙළඳපල තුළ ද සිලෝන් තේ සන්නාම ස්ථානගත කිරීමට සහ ඒවායෙහි පැවැත්මට උපකාරී වේ. ඉහත අරමුණුවලට අමතරව, මෙම යෝජනා ක්‍රමය මගින් ආර්ථිකය "ඉහල දැමීම, නැවත ගොඩ නැගීම සහ නැවත ලබා ගැනීම" සඳහා තේ අපනයනකරුවන් දිරි ගන්වනු ලැබේ. මෙම යෝජනා ක්‍රමය 2021 පෙබරවාරි 22 වන දින, ලියාපදිංචි තේ අපනයනකරුවන් වෙත බෙදා හරින ලද අතර යෝජනා ක්‍රමය සඳහා අයදුම්පත් 74 ක් ලැබී ඇත.

- ඉරානය සමග "තෙල් ණය පියවීමේ යාන්ත්‍රණය සඳහා තේ"

"තෙල් ණය පියවීමේ යාන්ත්‍රණය සඳහා තේ" ඉලක්ක කර ගනිමින් තේ අපනයනය ඉහළ නැංවීමට ඉරානයේ සහාය ලැබුණි. විගණන කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවීමෙන් අනතුරුව ඉරානය සමග ගිවිසුම් ගත වීම සඳහා කැබිනට් අනුමැතිය ලබාගැනීමෙන් පසු ගිවිසුම අත්සන් කරන ලදී. ශ්‍රී ලංකා

ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වැවිලි අමාත්‍යාංශය සහ ඉරාන ඉස්ලාමීය ජනරජයේ කර්මාන්ත, පතල් හා වෙළෙඳ අමාත්‍යාංශය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් ජාතික ඉරාන තෙල් සමාගමට හිඟ ඩොලර් 250,925,169 ක මුදලක් පියවීම සඳහා යෝජනා ක්‍රමයක් සැකසීමට අපේක්ෂා කෙරේ. අවබෝධතා ගිවිසුම (MoU) අත්සන් කිරීමෙන් ඉරානයට සිලෝන් තේ අපනයනය කිරීමේ කටයුත්ත සඳහා පහසුකම් සැලසීමට එම මුදල භාවිත කරනු ලබන අතර, 2021 දෙසැම්බර් 21 අඟහරුවාදා දින විදේශ අමාත්‍යාංශයේදී අදාළ අවබෝධතා ගිවිසුම අත්සන් තබන ලදී.

ශ්‍රී ලංකාවේ වැවිලි අමාත්‍ය ආචාර්ය රමේෂ් පතිරණ මහතා සහ ඉරාන ඉස්ලාමීය ජනරජයේ කර්මාන්ත, පතල් සහ වෙළඳ නියෝජ්‍ය අමාත්‍ය අලිරේසා පේමන්පැක් විසින් මෙම අවබෝධතා ගිවිසුම අත්සන් කරන ලදී. අවබෝධතා ගිවිසුම මඟින් සිලෝන් තේ අපනයනය මඟින් ඉරාන ඉස්ලාමීය ජනරජයට තෙල් වෙනුවෙන් ශ්‍රී ලංකාවෙන් ගෙවීමට තිබෙන හිඟ මුදල් නිරවුල් කිරීමේ යෝජනා ක්‍රමයක් සැකසීමේ දී එකිනෙකා විසින් ඉටුකළ යුතු යුතුකම් සහ සිදු කළ යුතු කටයුතු සම්බන්ධයෙන් අන්‍යෝන්‍ය වශයෙන් කැපවී ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳව විස්තර දැක්වේ.





සමස්ථ USD 250,925,169.00 උපයෝජනය කරමින් සහ ඉරානයට ගෙවිය යුතු ණය පියවන තෙක් ශ්‍රී ලංකා තේ අපනයනකරුවන්ට ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රතිපූරණය කරමින් ඉරාන තේ වෙළඳපොළට පහසුවෙන් තේ ලබාදීමට හැකි මට්ටමක ශ්‍රී ලංකාව සිටී. මානුෂීය හේතූන් යටතේ තේ ආහාර ද්‍රව්‍යයක් ලෙස වර්ගීකරණය කර ඇති අතර අසාදු ලේඛන ගත ඉරාන බැංකු කිසිවක් මේ සඳහා සම්බන්ධ නොවන බැවින් මෙම යෝජනා ක්‍රමය එක්සත් ජාතීන්ගේ හෝ එක්සත් ජනපද සම්මුතීන් උල්ලංඝනය නොකරනු ඇත. තවද, සිලෝන් තේ අලෙවිය හරහා ඉරානය වෙත මුදල් පියවීම ශ්‍රී ලංකා රුපියල්වලින් සිදු කෙරෙන බැවින් නිර්දේශිත යෝජනා ක්‍රමය මඟින් ශ්‍රී ලංකාවට අවශ්‍ය විදේශ මුදල් ඉතිරි කර දෙනු ඇත. එමෙන්ම, ශ්‍රී ලංකාවේ තේ අපනයනකරුවන්ට දේශීය මුදල් ඒකකවලින් ගෙවනු ලබන බැවින් යෝජිත තේ විකිණීමෙන් විදේශ මුදල් ජනනය නොවේ.

- ඇමරිකා එක්සත් ජනපදය, කැනඩාව සහ යුරෝපා සංගම් රටවල විශේෂිත තේවල වෙළඳපල කොටස පුළුල් කිරීමට පහසුකම් සැලසීම

ශ්‍රී ලංකා තේ අපනයනකරුවන්ගේ සංගමය සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලය ලොස් ඇන්ජලීස් හි පිහිටි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයේ සහාය ඇතිව ඇමරිකා එක්සත් ජනපදයේ බටහිර වෙරළ තීරයේ සිලෝන් තේ තවදුරටත් ප්‍රවර්ධනය කිරීම සඳහා ලොස් ඇන්ජලීස් හි ගබඩා පහසුකමක් පිහිටුවීමට සැලසුම් කර ඇත. කෙන් නැවුරල්ස් සමාගමේ අධ්‍යක්ෂ සමඟ ලොස් ඇන්ජලීස් හි යෝජිත තේ බෙදා හැරීමේ මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා ඔවුන්ගේ සහාය ලබා ගැනීමේ අරමුණෙන් කොන්සල් කාර්යාලයේ දී සාකච්ඡාවක් ද පැවැත්විය.

- කැනඩාව සහ එක්සත් රාජධානිය සමඟ ගැනුම්කරුවන් සහ ගැනුම්කරුවන් අතර (B2B) අතථ්‍ය රැස්වීම් (Virtual) සංවිධානය කිරීම සහ පැවැත්වීම

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් එක්සත් ජනපද තේ කවුන්සිලය සහ වොෂින්ටන් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සමඟ සහයෝගීතාවයෙන් ඇමරිකා එක්සත් ජනපදයේ තේ කර්මාන්තයේ ආනයනකරුවන් සහ අනෙකුත් පාර්ශවකරුවන් සමඟ ශ්‍රී ලංකා තේ අපනයනකරුවන්ගේ අතථ්‍ය B2B රැස්වීමක් සංවිධානය කරන ලදී.



2021 ජූලි 12 වැනි දින B2B සැසිය - ශ්‍රී ලංකාවේ තේ අපනයනකරුවන් සහ කැනඩාවේ තේ ආනයනකරුවන් අතර මෙම සැසිය ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ කැනඩාවේ තේ සහ ඔසු සංගමය විසින් සංවිධානය කරන ලදී.

ලන්ඩනයේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය සමග සහයෝගයෙන් එක්සත් රාජධානියේ ගැනුම්කරුවන්, ශ්‍රී ලංකා අපනයනකරුවන් සහ ජාත්‍යන්තර තේ කමිටුව සමග එක්සත් රාජධානියේ වෙළඳපොල තුළ සිලෝන් තේ ස්ථානගත කිරීම සහ ප්‍රවර්ධනය කරන්නේ කෙසේද යන්න සාකච්ඡා කිරීම සඳහා ඵලදායී බුද්ධිකලම්භන සැසියක් පැවැත්විය.

ශ්‍රී ලංකාවේ අහිමි වූ තේ වෙළෙඳපොළ යළි අත්පත් කර ගැනීම සඳහා රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයම එක්ව ප්‍රයත්නය දරනු ඇත.

- මගහැරුණු වෙළඳපොලවල් (එක්සත් රාජධානිය, පකිස්ථානය, ඊජිප්තුව) නැවත ලබා ගැනීම සඳහා අලෙවිකරණ උපාය මාර්ග අධ්‍යයනය කිරීම
- පොදුරාජ්‍ය මණ්ඩලීය 2022 ට සමගාමීව ශක්තිමත් ප්‍රවර්ධන වැඩසටහන්.
- ඊජිප්තුවේ Dandy වෙළඳ සමාගී සිලෝන් තේ කඩ පිහිටුවීමේ යෝජනාව.
- ඊජිප්තුවේ සුඩාන්කෝ සමාගම සිලෝන් තේ ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම.
- පකිස්ථාන රජයේ අධිකාරීන් වෙත සිලෝන් තේ සඳහා නිෂ්පාදන විශේෂිත ඉල්ලීම දිගටම සිදු කිරීමට කටයුතු කිරීම.
- පකිස්තාන වෙළඳපොළට සපයන සිලෝන් තේ සඳහා වන පිරිවැය ගැළපීමට ගන්නා ලද උත්සායයන්.

## වර්ගීය තේ ප්‍රවර්ධනය

වෙනත් පාන වර්ග සමග තරගකාරීව තේ ප්‍රවර්ධනය කිරීම මෙම වර්ගීය තේ ප්‍රවර්ධනය යටතට ගැනේ. ශ්‍රී ලංකා තේ මණ්ඩලය ආහාර සහ කෘෂිකර්ම සංවිධානයේ තේ පිළිබඳ අන්තර් රාජ්‍ය කණ්ඩායම, ඇ.එ.ජ. තේ සංගමය, එක්සත් රාජධානියේ ජාත්‍යන්තර තේ කමිටුව සහ ජපාන තේ සංගමය යනාදියෙහි සාමාජිකයෙකි. මෙම වර්ගීය තේ ප්‍රවර්ධනය කාර්යයන් මෙම ආයතන විසින් ඉටුකරනු ලබයි. පාරිභෝගික දැනුවමිත් කිරීම සහ මහජන සම්බන්ධතා ක්‍රියාකාරකම් තුළින් ප්‍රවර්ධනය කරනු ලබන තේ සහ සෞඛ්‍ය යන සංකල්පය කෙරෙහි වර්ගීය තේ ප්‍රවර්ධනය මගින් ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරනු ලබයි. තෝරාගත් රටවල ඉහතින් සඳහන් කළ ආකාරයේ වර්ගීය තේ ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් තේ සමාගම්වල ප්‍රචාරණ අයවැය සඳහා 2021 වසරේදී ශ්‍රී ලංකා තේ මණ්ඩලය දායක වී ඇත.

## භූගෝලීය දර්ශක යටතේ සිලෝන් තේ, කලාපීය නම් සහ ලාංඡන ලියාපදිංචි කිරීම

සිලෝන් තේ නාමය සහ අනෙකුත් කෘෂි දේශගුණික කලාපීය තේ වර්ග හත (නුවර එළිය, උඩ පුස්සැල්ලාව, දිඹුල, ඌව, නුවර, සබරගමුව සහ රුහුණ) භූගෝලීය දර්ශකයන් ලෙස සුරැකීම සඳහා ලෝක වෙළඳ සංවිධානයේ TRIPS ගිවිසුම ප්‍රකාරව ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් අවශ්‍ය නීති සහ රෙගුලාසි සම්පාදනය කරන ලදී. මෙමගින් විශේෂයෙන්ම කොන්ත්‍රාත් පදනමෙන් කටයුතු කරන විදේශීය ඇසුරුම් කරුවන් විසින් සිලෝන් තේ නාමය සහ කලාපීය වශයෙන් ඉස්මතු වෙමින් පවතින අනෙකුත් තේ නාම අවභාවිත කිරීම වැලැක්වීමට සහායවීම පමණක් නොව, භූගෝලීය දර්ශකයන් යටතේ අලෙවි කෙරෙන ශ්‍රී ලංකා තේ සඳහා අගය සහ නියම මිල එකතු කිරීම ද සිදුකෙරේ

### සිලෝන් තේ සඳහා භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම

භූගෝලීය තොරතුරු (GI) දර්ශකයක් යනු නිශ්චිත භූගෝලීය සම්භවයක් සහ එම සම්භවය හේතුවෙන් ක්‍රියාවලයේ ගුණාංග හෝ කීර්තිනාමයක් සහිත නිෂ්පාදන සඳහා භාවිත කරන සලකුණකි. භූගෝලීය තොරතුරු දර්ශකයක් ලෙස ක්‍රියා කිරීම සඳහා, යම් නිෂ්පාදනයක් යම් සුවිශේෂී ස්ථානයකින් සම්භවය වන බවට සලකුණ මගින් හඳුනාගැනීමට අවස්ථාව සලසනු ලැබේ.

ඒ අනුව, ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ කර්මාන්තයේ පාර්ශ්වකරුවන් (සිලෝන් තේ මාර්ග සිතියම 2030 - CTTA) වසර 150 කට අධික සිලෝන් තේ කර්මාන්තයේ කීර්තිනාමය මත පදනම්ව ප්‍රථමයෙන් යුරෝපා සංගමයෙන් "සිලෝන් තේ" සඳහා භූගෝලීය දර්ශක තත්ත්වය ලබා ගැනීමට එකග විය. යුරෝපීය සංගම් නීතිය යටතේ, 1992 දී බලාත්මක වූ සම්භව රාමුවේ ආරක්ෂිත නාමය විසින් භූගෝලීය දර්ශකයන් හි "ආරක්ෂිත මූලාරම්භ නාමය (PDO)" "ආරක්ෂිත භූගෝලීය දර්ශකය (PGI)" සහ "සහතික සම්ප්‍රදායික විශේෂතා (TSG)" නියාමනය කරනු ලබයි. එම පදනම මත, සිලෝන් තේ සඳහා ආරක්ෂිත භූගෝලීය දර්ශකය (PGI) භාවිත කළ හැක. මන්ද යත්, ආරක්ෂිත භූගෝලීය දර්ශක (PGI) කෘෂිකාර්මික නිෂ්පාදනයක්, අමු හෝ සැකසූ, සමස්ථ ගුණය, කීර්ති නාමය හෝ වෙනත් ලක්ෂණ එහි භූගෝලීය සම්භවය සමග සම්බන්ධ කර ඇති බවට හඳුනා ගන්නා හෙයිනි.

ඒ අනුව, 2021.10.25 වන දින ප්‍රංශ කෘෂිකාර්මික පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානය වෙතින් තාක්ෂණික සහාය ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයට කැබිනට් අනුමැතිය හිමි වූ අතර, යුරෝපා සංගමය සහ තවත් රටවල් දෙකක් වෙතින් භූගෝලීය දර්ශක ලබා ගැනීම සඳහා තාක්ෂණික සහය වෙනුවෙන් යුරෝ මිලියන එකක් සඳහා ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය, ප්‍රංශ කෘෂිකාර්මික පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානය සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලය සමග ගිවිසුම 2021.12.07 දින අත්සන් තබන ලදී.

භූගෝලීය දර්ශකය සඳහා ත්‍රි පාර්ශව ගිවිසුම අත්සන් කිරීම (ශ්‍රී ලංකා තේ මණ්ඩලය, ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය සහ ප්‍රංශ කෘෂිකාර්මික පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානය).

**සිලෝන් තේ සඳහා භූගෝලීය දර්ශක (GI) සහතිකය සඳහා ප්‍රංශය යුරෝ මිලියනයක් ලබා දෙයි.**

ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය සිලෝන් තේ සඳහා භූගෝලීය දර්ශකයක් (GI) සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ ප්‍රංශ කෘෂිකාර්මික පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානය සමග යුරෝ මිලියන 1ක තාක්ෂණික ප්‍රදාන ගිවිසුමක් සඳහා අත්සන් කළේය. ප්‍රංශ සංවර්ධන නියෝජිතායනයේ ජාතික අධ්‍යක්ෂ රෙඩා සූර්ගි මහතා සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සභාපති ජයම්පති මොල්ලිගොඩ මහතා, වැවිලි අමාත්‍ය රමේෂ්

පතිරණ, ප්‍රංශ තානාපති එච්.ඊ. එරික් ලැවර්ටු, සමාගම් වතු ප්‍රතිසංස්කරණ තේ සහ රබර් වතු ආශ්‍රිත බෝග පිළිබඳ රාජ්‍ය අමාත්‍ය කනක හේරත් මහතා, වතු නිවාස සහ ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍ය ජීවන් තොණ්ඩමන් මහතා යන අය විසින් මෙම ගිවිසුමට අත්සන් තබන ලදී. සිලෝන් තේ සඳහා භූගෝලීය දර්ශක නිර්මාණය කිරීම, ගුණාත්මක නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම, එය පදනම් කරගත් සාම්ප්‍රදායික දැනුම ආරක්ෂා කිරීම, ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ එහි වාණිජ වටිනාකම සහ පිළිගැනීම ඉහළ නැංවීම එමගින් අරමුණු කෙරේ.




## වෙළඳ සලකුණෙහි සුරක්ෂිතබව

CEYLON TEA
SYMBOL OF QUALITY

සිංහ ලාංඡනය වෙළඳ ලකුණ ලියාපදිංචි කිරීම

සිලෝන් තේ සිංහ ලාංඡන වෙළඳ සලකුණෙහි නෛතික හිමිකරුවා වනුයේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයයි. ශ්‍රී ලංකාව සහ වෙනත් රටවල සිලෝන් තේ සිංහ ලාංඡනය ලියාපදිංචි කිරීම / අලුත් කිරීම ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රවර්ධන අංශය මගින් කරනු ලබයි. 2020 වසර වන විට සිංහ ලාංඡනය රටවල් 103ක ලියාපදිංචි කර ඇත. සිංහ ලාංඡනය භාවිත කිරීමේ අධිකාරිය ප්‍රදානය කර ඇත්තේ 100% ක්ම ශ්‍රී ලංකා තේ අඩංගු, ISO 3720 ප්‍රමිතියට අනුකූල, එක් එක් වෙළඳපොළවල අවම ප්‍රමිතියට වඩා ඉහළින් වූ අගය එකතු කළ තේ නිෂ්පාදන (තේ මළු සහ ඇසුරුම්) සන්නාමයන් සඳහා පමණක් වන අතර ඒවා ශ්‍රී ලංකාව තුළ ඇසුරුම් කරන ලද ඒවා ද විය යුතුයි.

සමාලෝචනයට ලක්වන කාලසීමාව තුළ, තුර්ක්මෙනිස්තානය, නෝර්වේ, ජෝර්දානය, පකිස්ථානය, ඉන්දියාව, බංග්ලාදේශය, මොරොක්කෝව, සෝමාලියාව, හොංකොං, උස්බෙකිස්තානය, අසර්බයිජානය යන රටවල නව සිංහ ලාංඡනයක් (සිලෝන් තේ, ගුණාත්මකබවේ සලකුණ - සිංහ ලාංඡනය සහිත) ලියාපදිංචි කිරීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලය මුලිකත්වය ගෙන ඇත. කිර්ගිස්තාන් ජනරජය, ඊජිප්තුව සහ සර්බියාව. හොංකොං, ජෝර්දානය සහ ඊජිප්තුව යන රටවල නව ලියාපදිංචිය සම්පූර්ණ කර ඇත. තවද, ටර්ක්මෙනිස්තානය, තායිවානය, ඉරාකය සහ නෝර්වේ යන රටවල සිංහ ලාංඡනය උපාංගය අලුත් කිරීමේ ක්‍රියාවලිය සඳහා උපදෙස් ලබා දී ඇති අතර දැනට එම කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී.

## ඕසෝන් හිතකාමී පිරිසිදු සිලෝන් තේ ලාංඡනය ලියාපදිංචි කිරීම

ඕසෝන් හිතකාමී තේ නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමේ අරමුණ සහිතව සහතික සලකුණක් ලෙස ශ්‍රී ලංකාව තුළ ඕසෝන් හිතකාමී Pure Ceylon Tea ලාංඡනය ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ලියාපදිංචි කර ඇත. මොන්ට්‍රියල් ගිවිසුම (Montreal Protocol) අනුව නිරෝධායනීය නොවන හා පූර්ව බෙදාහැරීමේ අරමුණු සඳහා මීතයිල් බ්‍රෝමයිඩ් භාවිතය නතර කිරීම සඳහා ශ්‍රී ලංකාව විසින් ව්‍යාපෘති දෙකක් ක්‍රියාත්මක කරන ලදී. තේ වගාවන් සඳහා මීතයිල් බ්‍රෝමයිඩ් භාවිත නොකර පරිසර හිතකාමී තාක්ෂණ ක්‍රමවලට අනුගත වෙමින් තේ ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය 2002

වසරේදී සාර්ථකව අවසන් කෙරුණු අතර මේ සඳහා 2007 වසරේදී ශ්‍රී ලංකාව මොන්ට්‍රියල් ගිවිසුම ක්‍රියාත්මක කරන්නන්ගේ සම්මානය (Montreal Protocol Implementers Award 2017) දිනාගන්නා ලදී. එහෙයින්, ඕසෝන් හිතකාමී තේ නිෂ්පාදනය කරන ලොව පළමු රට බවට ශ්‍රී ලංකාව පත් වූ අතර තවමත් මෙම සම්මානය ලත් එකම තේ නිෂ්පාදනය කරනු ලබන රට වනුයේ ශ්‍රී ලංකාව යි.

සමාලෝචිත කාලසීමාව තුළ, "ඕසෝන් හිතකාමී පිරිසිදු සිලෝන් තේ ලාංඡනය" අලුත් කිරීමේ ක්‍රියාවලිය සඳහා උපදෙස් ලබා දී ඇති අතර, දැනට එම කටයුතු ඉරානය, එක්සත් රාජධානිය, යුරෝපා සංගමය සහ කුවේට් යන රටවල ක්‍රියාත්මක වේ. ටියුනීසියාවේ සහ ජෝර්දානයේ ලියාපදිංචිය අලුත් කිරීම සම්පූර්ණ කර ඇත.

2021 වසර තුළදී සන්නාම හයක් සඳහා ඕසෝන් හිතකාමී පිරිසිදු සිලෝන් තේ ලාංඡනය භාවිත කිරීම සඳහා තේ අපනයනකරුවන් හය දෙනෙකු ශ්‍රී ලංකා තේ මණ්ඩලයවෙතින් වරලත් අයිතිය ලබාගෙන ඇත.

ඩේලි මිරර් (Daily Mirror) පුවත්පත 2021 සැප්තැම්බර් 16 වැනි දින "ලෝක ඕසෝන් දිනය" වෙනුවෙන් විශේෂ අතිරේකයක් පළ කරන ලදී. මොන්ට්‍රියල් ගිවිසුම මගින් "ඕසෝන් හිතකාමී" සම්මානයෙන් පිදුම් ලැබූ එකම තේ සම්භවය සිලෝන් තේ වන බැවින් සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් එම අත්පත් කරගැනීම තම ගෝලීය අලෙවිකරණ කටයුතුවලදී අද්විතීය අලෙවිකරණ සැලසුමක් වශයෙන් භාවිත කරන බැවින්, ශ්‍රී ලංකා තේ මණ්ඩලය ප්‍රතිපත්තිමය වශයෙන් මෙම සුවිශේෂී දිනයේ දී මෙම අතිරේකයට සහාය දීමට එකඟ විය. ඒ අනුව, ඩේලි මිරර් හි "ලෝක ඕසෝන් දිනය 2021" විශේෂ සංස්කරණය සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් පිටු කාලක සිලෝන් තේ දැන්වීම් පළ කරන ලදී.

## විදේශීය තේ ප්‍රවර්ධන කාර්යාල සහ වෙළඳපල ආවරණය

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් දැනට එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ, රුසියාවේ සහ චීනයේ ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට අනුබද්ධ කලාපීය විදේශීය තේ ප්‍රවර්ධන ඒකක තුනක් පවත්වාගෙන යනු ලැබේ. ඩුබායි හි කාර්යාලය විසින්, මැද පෙරදිග / ගල්ෆ් / උතුරු අප්‍රිකානු කලාපවල තේ ප්‍රවර්ධනය කටයුතුවල වගකීම දරනු ලබන අතර මොස්කව්හි කාර්යාලය විසින් රුසියානු සමූහාණ්ඩුවේ සහ CIS වෙළඳපලවල තේ ප්‍රවර්ධන කටයුතු හසුරුවනු ලබයි. නැගී එන වෙළඳපොළක් ලෙස හඳුනාගෙන ඇති චීනයේ සිලෝන් තේ වල වෙළඳපල කොටස ප්‍රවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා 2015 වර්ෂයේදී බීජිං හි නියෝජිත කාර්යාලයක් පිහිටුවන ලදී. ඉහත කලාපවල සිලෝන් තේ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් තේ ප්‍රවර්ධන ඒකක තුන විසින් සෘජුවම සිදු කරනු ලබන අතර අනෙකුත් වෙළඳපලවල් කොළඹ තේ ප්‍රවර්ධන අංශය මගින් විදේශයන්හි අදාළ ශ්‍රී ලංකා දූත මණ්ඩල ඒකක සමග සහයෝගයෙන් මෙහෙයවනු ලැබේ.

### තේ ප්‍රවර්ධන ඒකක මගින් සිදු කරනු ලබන තේ ප්‍රවර්ධන කටයුතු

#### තේ ප්‍රවර්ධන ඒකකය - චීනය

- වසරකට සිලෝන් තේ කිලෝග්‍රෑම් මිලියන 4ක් ආනයනය කිරීම සඳහා චීනයේ තේ ප්‍රවර්ධන ඒකකය විසින් චීන සමාගමක් සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට පහසුකම් සලසා ඇත.



- බීජිං හි කැෆේ ප්‍රදර්ශනය, කිංඩාඕ SCO ප්‍රදර්ශනය, ෂැංහයි හි CIIE ප්‍රදර්ශනය, Jiangsu පළාතේ ආහාර සහ සංස්කෘතික ප්‍රදර්ශනය, Tea-Lives expo" Fuzhou" Fujian පළාත සහ බීජිං SCO ප්‍රදර්ශනය ආදියෙහි ශ්‍රී ලංකා තේ මණ්ඩලය නියෝජනය කිරීම සඳහා චීනයේ තේ ප්‍රවර්ධන ඒකකය විසින් වෙළඳ ප්‍රදර්ශන හයකට සහභාගී වීමට පහසුකම් සලසා ඇත
- ජාත්‍යන්තර තේ කර්මාන්තය පිළිබඳ 4 වැනි චීන තේ සමුළුව සහ 2 වැනි ජාත්‍යන්තර තේ දිනය සැමරීම.
- The Qilu (Shandong) TaoBao ගමේ සමුළු සංසදය හා ප්‍රදර්ශනයත 1 වන Shandong ජාත්‍යන්තර ඊ-වාණිජ්‍යය සන්නාම කර්මාන්ත සංවර්ධන සමුළුව.
- 14 වැනි චීන ජාත්‍යන්තර තේ වාණිජ සම්මුතිය.
- දෙවන චීන සෙලේනියම් තේ තරගය සහ ජාත්‍යන්තර තේ කර්මාන්ත සංවර්ධන සංසදය.
- "Customs Saloon" ද්වි මාසිකව නිකුත් කිරීම.
- 2022 වසර සඳහා Guangzhou අධිවේගී දුම්රිය ජාලයේ මගීන්ට සිලෝන් තේ (Lions Tea) සැපයීමට සහාය ලබා දීම.
- JD.COM සහ Wumai.com ජාලගත වේදිකාවලට සිලෝන් තේ සන්නාමව ඇතුලත් කිරීම පිළිබඳ සාකච්ඡා පැවැත්වීම.

- සිව්වන කාර්තුවේදී කණ්ඩායම් නවයක් (ගුරුවරුන්, සිසුන් සහ දෙමාපියන්) සඳහා තානාපති කාර්යාල වැඩසටහනේදී සිලෝන් තේ ප්‍රවර්ධන කටයුතු සිද්ධ කිරීම.
- බිපිං හි Ceylon Tips "Made in Sri Lanka" නිෂ්පාදන සාප්පුව සැකසීමට සහ විවෘත කිරීමට සහාය වීම.
- සිලෝන් තේ අපනයනය කිරීම සඳහා චීන රේගු සාමාන්‍ය පරිපාලන පද්ධතියේ ලියාපදිංචි වීමට ශ්‍රී ලංකා තේ අපනයනකරුවන්ට සහාය වීම.

## මොස්කව් තේ ප්‍රවර්ධන ඒකකය - රුසියාව

සිලෝන් තේ ප්‍රවර්ධනය සම්බන්ධයෙන් 2021 වසර තුළදී පහත සඳහන් ක්‍රියාකාරකම්වල නිරත විය.

- රුසියාවේ "තේ මාස්ටර්" කුසලාන සඳහා අනුග්‍රහය ලබා දීමට පහසුකම් සැලසීම.
- මොස්කව් කලාපයේ ඩොමොඩෙඩොවෝ ගුවන් තොටුපළ වෙත ශ්‍රී ලංකන් ගුවන් සේවයේ සමාරම්භක උත්සවයේ දී සිලෝන් තේ ප්‍රවර්ධනය කටයුතු සිදු කිරීම.
- "RUSTEACOFFEE" සංගමය සමග රැස්වීම.
- ජාත්‍යන්තර කාන්තා දින සැමරුම් - ජාත්‍යන්තර කාන්තා සමාජය/ රුසියාවේ කාන්තා සංගමය
- ජාත්‍යන්තර තේ දිනයට සමගාමීව 2021 මැයි 21 වන දින තරුණ විද්‍යාඥයින්ගේ ජාත්‍යන්තර ලීගයේ සම්මේලනයට සහභාගී වීම.
- නගර මධ්‍යයේ මොස්කව් කෞතුකාගාර භූමියේ පැවති "වාෂ්කා" (කුසලාන) උත්සවයට සහභාගී වීම.
- 2021 මැයි 9 දින ජයග්‍රාහී දින සැමරුම:
- රුසියාවේ ප්‍රවීණයන් 20,000 වැඩිහිටි නිවාස 400කට අධික සංඛ්‍යාවක් අතර සිලෝන් තේ පිළිබඳ වීඩියෝ පණිවිඩයක් බෙදා හැරීමට මොස්කව් හි තේ ප්‍රවර්ධන ඒකකය කටයුතු කිරීම.
- "තේ කලා" ප්‍රදර්ශනය

ඉන්දියානු තේ, ජපන් තේ, තායිවාන් තේ සහ සිලෝන් තේ සමග රුසියානු තේ සංගමය විසින් සංවිධානය කරන ලද "තේ කලා" ප්‍රදර්ශනය 2021 මැයි 26 වන දින මොස්කව්හි රුසියානු රාජ්‍ය පුස්තකාලයේ පෙරදිග සාහිත්‍ය මධ්‍යස්ථානයේදී ආරම්භ විය. මොස්කව් හි තේ ප්‍රවර්ධන ඒකකය මෙම අවස්ථාවේ දී සිලෝන් තේ ඉදිරිපත් කරමින් සහභාගී විය.

- ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය හා සම්බන්ධ වෙමින් මොස්කව්හි "OTDYKH Leisure Fair" තුළ සිලෝන් ප්‍රවර්ධනය කටයුතු සිදු කිරීම.
- ශ්‍රී ලංකා සතිය - 2021

මොස්කව් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් සංවිධානය කරන ලද "ශ්‍රී ලංකා සතිය - 2021" ට සමගාමීව, රුසියානු මිත්‍රත්ව සංගමයේ ශ්‍රී ලංකාවේ ශාන්ත පීටර්ස්බර්ග් ශාඛාව විසින් 2021 නොවැම්බර් 19 සිට 28 දක්වා කාලය තුළ සිලෝන් තේ ප්‍රවර්ධන වැඩසටහන සමගින් ක්‍රියාකාරකම් රාශියක් පවත්වන ලදී.

- ශ්‍රී ලංකා දිනය - 2021

ශ්‍රී ලංකාවේ සංස්කෘතිය, සිලෝන් තේ, සංචාරක ව්‍යාපාරය සහ ශ්‍රීලංකාවේ භාණ්ඩ රැසක් ප්‍රවර්ධනය කිරීම සඳහා 2021 නොවැම්බර් 23 වැනි දින රුසියානු රාජ්‍ය පුස්තකාලයේ පෙරදිග සාහිත්‍ය මධ්‍යස්ථානයේ සම්මන්ත්‍රණ ශාලාවේදී "ශ්‍රී ලංකා දිනය" - 2021" රුසියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහ රුසියානු රාජ්‍ය පුස්තකාලය එක්ව සංවිධානය කරන ලදී.

- සිල්පෝ ප්‍රදර්ශනය තුළ ස්ථාන නැරඹීමේ කටයුතු - සිලෝන් තේ ප්‍රවර්ධන ව්‍යාපෘතිය

සිලෝන් තේ සහ ශ්‍රී ලංකාවට අයත් තේ සන්නාම සඳහා ඉඩ කඩ ලබා දීමට ප්‍රමුඛත්වය දෙමින් යුක්රේනයේ කියෙව් හි සිල්පෝ ශ්‍රී ලංකා අලෙවිසැලක් සැලසුම් කිරීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය 2020 ජූලි මාසයේදී සීමාසහිත සමාගමක් වන "සිල්පෝ-ෆුඩ්" සමග ගිවිසුමකට එළඹ ඇත. මෙම ව්‍යාපෘතියේ පළමු අදියර 2020 දී දියත් කිරීමත් සමග, නිම කරන ලද අතර ශ්‍රී ලාංකේය කලාවන් සහිත පදක්කම්කරුවන්, වෙස් මුහුණු, අලියන්, දිවියන්, මොනරුන් සහ ගිරවුන් ගේ අනු රූ සහ බිත්තිවල නිර්මාණය කරන ලද සිතුවම් යොදා ගනිමින් ගබඩාව තුළ සැබෑ ශ්‍රී ලාංකේය වටපිටාවක් නිර්මාණය කරන ලදී.




සිලෝන් තේ සඳහා වෙනම අවකාශයක් නිර්මාණය කරමින් (Gondola Branding) සහ ගුණාත්මක බවේ සංකේතය වන "සිංහ ලාංඡනය" ශීර්ෂයෙහි නිරූපනය කරමින් මෙම ශ්‍රී ලාංකීය සිල්පෝ වෙළඳ කුටිය තුළ "සිලෝන් තේ" සන්නාමය ප්‍රවර්ධනය කරමින් විශේෂ දැන්වීමක් ප්‍රදර්ශනයට සහභාගීවන්නන් වෙත බෙදා දෙන ලදී. මෙම ප්‍රවර්ධන සන්නාමය සමස්ත 2021 වර්ෂය සඳහා ම පැවතුනි. තවද, වර්ෂය තුළ ගොන්ඩෝලා සිලෝන් තේ සන්නාමයේ පිළිබඳ අතිරේක වශයෙන් සිදු කරන ලද ස්ථානගත කිරීම් යුක්රේනයේ සිල්පෝ වෙළඳසැල් 25ක සිදු කරන ලද අතර පින්තූරවල පරිදි "සිලෝන් තේ" සන්නාමය සහිත ප්‍රදර්ශන රාක්ක 25ක් නිෂ්පාදනය කරන ලදී. සිලෝන් තේ සන්නාමයන් කෙරෙහි නරඹන්නන්ගේ අවධානය පහසුවෙන් ලබා ගැනීම සඳහා සිල්පෝ වෙළඳසැල් 25ක රාක්ක වල ප්‍රදර්ශනය කිරීම සඳහා "සිලෝන් තේ" සන්නාමය සහිත (සිංහ ලාංඡනය ප්‍රදර්ශනය කරන ලද) දැන්වීම් 2000 කට අධික ප්‍රමාණයක් සකස්කර මුද්‍රණය කරන ලදී.





ගොන්ඩෝලා සන්නාම　　　　කාණ්ඩ සන්නාම　　　　රාක්ක දැන්වීම්

ව්‍යාපෘතිය යටතේ 2021 සඳහා වැඩසටහන අවසන් කරමින්, සිල්පෝ ප්‍රදර්ශනය විසින් ඔවුන්ගේ කාර්ය මණ්ඩලය සඳහා සිලෝන් තේ පිළිබඳ අධ්‍යාපනික වැඩසටහන් කිහිපයක් පවත්වා ඇත. කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් නරඹන්නන් සඳහා රස බැලීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට බාධාවක් නොවන්නේ නම්, 2022 දෙසැම්බර් වන විට ව්‍යාපෘතිය අවසන් කිරීමට අදහස් කරනු ලබයි.

## ප්‍රවර්ධන/තොරතුරු ප්‍රකාශන

ද්වි-මාසික පුවත් පත්‍රිකාව: 2021 වර්ෂය තුළ වෙළුම් 06ක් නිකුත් කරන ලදී.

## දේශීය තේ ප්‍රවර්ධනය

### දේශීය වෙළඳ ප්‍රදර්ශන

බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව තුළ පැවති "ශ්‍රී ලාංකිකයෙකු වන්න, ශ්‍රී ලාංකික නිෂ්පාදන මිලදී ගන්න" වෙළඳ ප්‍රදර්ශනය 2021 සඳහා (2021 පෙබරවාරි 12 සිට 14 දක්වා) ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහභාගී විය. ප්‍රදර්ශන වකවානුවේ දී පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

- කලාප 7ක තේ වර්ග ඇතුළත්ව තේ ශ්‍රේණි ප්‍රදර්ශනයට තැබීම
- අත් පත්‍රිකා හා කුඩා තේ පැකට් බෙදා දීම

### අනුග්‍රහදැක්වීම් / සඟරාවල ප්‍රදර්ශන

- "සංස්කෘතික වශයෙන් එක් බාලදක්ෂ ලෝකයක්" තේමාව යටතේ 2021 ජූලි 16 - 18 පැවති ගෝලීය සංස්කෘතික ජම්බෝරිය සඳහා අනුග්‍රහ වශයෙන් සඟරා වෙළඳ දැන්වීම්
- දිවයින ඉරිදා පුවත්පතෙහි කෘෂි අතිරේකය සඳහා වෙළඳ දැන්වීම
- පුවත් පතෙහි වෙළඳ දැන්වීම් - රජය සඳහා පළමු සංවත්සරයේ විශේෂ අතිරේකය (සෞභාග්‍යයේ දැක්ම)
- නල්ලූර් උත්සවයේ රූපවාහිනී වැඩසටහන සඳහා අනුග්‍රහය දැක්වීම සහ කොවිඩ් 19 දැනුම්වත් කිරීමත් සමග අළෙවි ප්‍රවර්ධනය
- ශ්‍රී ලංකා අපනයනකරුවන්ගේ ජාතික මණ්ඩලයේ අනුග්‍රාහකත්වය 29 වාර්ෂික අපනයන සම්මාන උළෙල 2021
- දිනමිණ පුවත්පතේ විශේෂ අතිරේකයේ දැන්වීම් - දළදා හිමි වරුණ
- "වේයෝ පියඹති" වේදිකා නාට්‍ය සඳහා අනුග්‍රහය
- තිරසාර වැවිලි කළමනාකරණය පිළිබඳ 2 වැනි ජාතික සම්මන්ත්‍රණය සඳහා අනුග්‍රහය
- කළුතර දිස්ත්‍රික් T 20 ක්‍රිකට් තරගාවලිය සඳහා අනුග්‍රහය.
- අතිගරු ජනාධිපති ධුරයේ 2 වන සංවත්සරය වෙනුවෙන් Sunday Observer පුවත්පතෙහි දැන්වීම
- ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ වාර්ෂික සම්මාන උළෙල සඳහා අනුග්‍රහය
- ශ්‍රී ලංකා රුසියානු ව්‍යාපාරික කවුන්සිලයේ සාමාජික රාත්‍රිය සඳහා අනුග්‍රහය
- බළපිටිය මූලික රෝහලට BI-PAP පහසුකම සහිත හිතකර සංවාතක උපකරණයක් පරිත්‍යාග කිරීම.

## ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ අළෙවි මධ්‍යස්ථානය

අංක 574, ගාලු පාර, කොළඹ 03 (ශ්‍රී ලංකා තේ මණ්ඩල කාර්යාල ගොඩනැගිලි පරිශ්‍රය) යන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ අලෙවි මධ්‍යස්ථානය විසින් සිය තේ මිලදී ගැනීමේ අවශ්‍යතා සඳහා අලෙවිසැලට පැමිණෙන දේශීය/ විදේශීය පාරිභෝගිකයන්ගේ විවිධ රස අවශ්‍යතා සපුරාලීම සඳහා පුළුල් පරාසයක තේ පැකට් පිරිනමනු ලබයි. පෞද්ගලික අංශයේ සිලෝන් තේ අපනයන සමාගම් 25කට අධික ප්‍රමාණයක් නියෝජනය කරමින් තේ පැකට් 1500කට අධික ප්‍රමාණයක් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලේබල් සමගින් අලෙවි මධ්‍යස්ථානයේ ගබඩා කර ඇත.

කොවිඩ් -19 වසංගත තත්වය පැතිරීම යටතේ ඉහළ අවදානම් මට්ටමක් පැවතියද, සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුගමනය කරමින් පාරිභෝගිකයින්ට ප්‍රශස්ත මට්ටමේ සේවාවක් ලබාදීමට ශ්‍රී ලංකා තේ මණ්ඩල අලෙවිසැල් කාර්ය මණ්ඩලය කැපවී කටයුතු කරයි. එහි දී මිලියන 20ක මෙහෙයුම් පිරිවැටුමක් වාර්තා කර ඇති අතර එය නිරෝධායන සීමාවන් යටතේ වසර තුළ වාර්ෂික සාමාන්‍ය පිරිවැටුමට වඩා 5 ගුණයකින් අඩු මට්ටමකි.

# 2.4 තේ රස බැලීමේ අංශය

ශ්‍රී ලංකාවේ තේවල තත්ත්ව සහතික කරන ප්‍රධාන ආයතනයක් වශයෙන් මෙම අංශය කටයුතු කරයි. වෙන්දේසි කිරීමට හා අපනයනයට පෙර තේවල ගුණාත්මක බව පිළිබඳ තක්සේරු කිරීම මෙහි වගකීම වේ. සාදන ලද තේවල පෙනුම සහ රසය *camellia sinensis* පැළෑටියේ විවිධ ක්ලෝන, දේශගුණික සාධකවල බලපෑම (වර්ෂාපතනය, හිරුඑළිය පවතින වේලාවන් සහ උෂ්ණත්වය වැනි) හා ලක්ෂණ සහ නිෂ්පාදන ක්‍රියාවලියේ විවිධ ප්‍රභේදයන් වැනි හේතු මත විශාල වශයෙන් වෙනස්වීම්වලට ලක්වේ. රස පරීක්ෂා කරන ලද තේ නියැදිවල ගතිලක්ෂණ මත පදනම්ව පුහුණු රස බලන්නන් විසින් ඒවායෙහි තත්ත්වය සහතික කරනු ලබයි. අසතුටුදායක මට්ටමක පවතින නියැදි ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ විශ්ලේෂණ විද්‍යාගාරය වෙත වැඩිදුර පරීක්ෂා කිරීම සඳහා යවනු ලැබේ.

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ රස පරීක්ෂා කිරීමේ කණ්ඩායම රාජ්‍ය සහ පුද්ගලික අංශයේ තේ රස පරීක්ෂා කරන්නන්ගෙන් යුත් විශේෂඥ මණ්ඩලයකින් සමන්විත වේ. ඔවුන් සියලුම පාර්ශව නියෝජනය කරයි. එනම්, කොළඹ තේ වෙළෙඳුන්ගේ සංගමය [Colombo Tea Traders' Association (CTTA)], කොළඹ බ්‍රෝකර්වරුන්ගේ සංගමය [Colombo Brokers' Association (CBA)], සිලෝන් වැවිලි සංගමය [Ceylon Plantation Association (CPA)], කුඩා තේ හිමියන්ගේ සංවර්ධන සමාජ පිළිබඳ ශ්‍රී ලංකා සම්මේලනය [Sri Lanka Federation of Tea Small Holdings Development Societies (SLFTSHDS)], ශ්‍රී ලංකා තේ කර්මාන්ත හිමියන්ගේ සංගමය [Sri Lanka Tea Factory Owners Association (SLTFOA)] වැනි ආයතනයන් සහ ස්වාධීන සාමාජික මඩුල්ලකින් ද මෙම කණ්ඩායම සමන්විත වේ.

මෙම අංශයෙහි ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි ලැයිස්තු ගත කළ හැක.

- තේ ලබා දෙන ඕනෑම අවස්ථාවක අවම තත්ත්ව ප්‍රමිතිය සහ ISO 3720 හා ISO 11287 යන ප්‍රමිතීන් පවත්වා ගැනීම.
- පුද්ගලික විකුණුම්, සෘජු විකුණුම් හා කොන්ත්‍රාත්තු අධීක්ෂණය හා අනුමත කිරීම.
- සන්නාම සහිත නිෂ්පාදන සහ පරිභෝජන ඇසුරුම් සඳහා සිංහ ලාංඡන සහතික නිකුත් කිරීම පහසුකරණය කිරීම.
- නව අපනයන සමාගම් සඳහා තේ රස බලන්නන් ඇගයීමට ලක් කිරීම.

**තේ රස බැලීමේ සංකල්පය හා ක්‍රමවේදය**

- ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සංවේදක පරීක්ෂණවලදී තේ පිළියෙල කිරීම පිළිබඳ ISO 3103 පිළිගනු ලබයි.
- ශ්‍රී ලංකාවේ තේ රස බැලීම සම්බන්ධයෙන් කළු තේ සඳහා ISO 6078 පාරිභාෂිත වචන මාලාව / ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය පිළිබඳ විෂය ග්‍රන්ථය - අංක 4 - ලංකාවේ තේ නිෂ්පාදනය.



## තේ ලබා දෙන ඕනෑම අවස්ථාවක අවම තත්ත්ව ප්‍රමිතිය

තේ පිළිබඳ විශේෂඥ මණ්ඩලයක සහභාගීත්වයෙන් ප්‍රධාන වශයෙන් සඳුදා සහ බ්‍රහස්පතින්දා යන දිනයන්හි දී සතියකට දෙවරක් සාමාන්‍ය තේ රස බැලීමේ සැසි පවත්වනු ලැබේ. මෙම සැසි අතරවාරයේදී ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ ආනයනය අංශයට මඟින් ලබාදෙන සහ තේ රස බැලීමේ අංශයට සෘජුව ලැබෙන පහත තේ නියැදි ඇගයීම සඳහා සලකා බලනු ලැබේ.

(අ) පූර්ව වෙන්දේසි තේ

(ආ) විශේෂ විමර්ශන තේ

(ඇ) පූර්ව ආනයන නියැදි

(ඈ) සෘජු විකුණුම්

(ඉ) දෛනික ඇගයීමට ලක්කරන බෙදාහැරීමට පෙර කරනු ලබන අධීක්ෂණය

නියැදි සම්බන්ධයෙන් මණ්ඩලයේ තීරණය වැඩිදුර නියාමන කටයුතු සඳහා තේ කොමසාරිස් ශාඛාවට සහ තේ අපනයන අංශයට යවනු ලැබේ.

වගුව 2.4.1 : 2021 වසර තුළ පරීක්ෂා කරන ලද හා සැක සහිත නියැදි පිළිබඳ විස්තර

| විස්තරය | පරීක්ෂාවට ලක් කළ නියැදි සංඛ්‍යාව | සැකයට බඳුන් කරන ලද නියැදි සංඛ්‍යාව |
|---|---|---|
| දෘශ්‍ය පරීක්ෂණ | 209,639 | |
| කාබනික පරීක්ෂණය | 31,446 | |
| පූර්ව වෙන්දේසි නියැදි | | |
| අහඹු ඇගයීම | 5,067 | 490 |
| දියර වර්ග මිශ්‍ර වීමෙන් අපවිත්‍ර වී ඇතැයි යන සැකය හේතුවෙන් මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කිරීම | | 417 |
| සිලිකාමය කරුණු | | 264 |
| අමු කෙඳි | | 1,253 |

මූලාශ්‍රය - ශ්‍රී ලංකා තේ මණ්ඩලය

### අ) පූර්ව වෙන්දේසි තේ

විකිණීමට සති දෙකකට පෙර තැරැව්කරුවන් අටදෙනා ඔවුන්ගේ තේ නියැදි වෙන්දේසියට පෙර ඇගයීම සඳහා එවනු ලැබේ. පළමු පියවර ලෙස උඩරට සහ මධ්‍යම, හොඳින් මල් සහිත, අඩු වැඩුණු පත්‍ර, අඩු වැඩුණු අර්ධ-පත්‍ර, අඩු වැඩුණු කිනිති සහිත/ තත්වයෙන් පහල කුඩා සහ උප වර්ග, කුඩු සහ BOP1A නියැදීන් හඳුනාගැනීම සඳහා දෘශ්‍ය ඇගයීම සිදු කරනු ලැබේ. තැරැව්කරුවන් තේ නියැදි පරිගණක යෙදවුමකින් අහඹු ලෙස තෝරාගනු ලබන අතර. ඉන් පසුව, කාබනික ඇගයුම සිදු කරනු ලැබේ. ඇගයීමෙන් පසු තෝරාගත් සාම්පල ඉදිරි වෙන්දේසියේදී ඉදිරිපත් කිරීම හෝ නොකිරීම පිළිබඳ සාමූහික තීරණයක් ගැනීමට විශේෂඥ කණ්ඩායමට ඉදිරිපත් කර අදාළ තීරණය අපනයන අංශයේ නියෝජ්‍ය තේ කොමසාරිස් වෙත දැනුම් දෙනු ලැබේ.

### ආ) බෙදා හැරීමට පෙර තේ

සිංහ ලාංඡනය භාවිතය, ISO 3720 පරාමිතීන් හෝ තේ තොග නැව්ගත කිරීමට පෙර වෙනත් අපවිත්‍රතාවයක් සඳහා කරනු ලබන පරීක්ෂාව යටතේ සාම්පල 7528ක් පරීක්ෂාවට ලක්කරන ලදී.

### ඇ) පූර්ව ආනයන තේ සහ පශ්චාත් ආනයන තේ

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අපනයන අංශය හරහා ලැබෙන පූර්ව ආනයන නියැදි සමග අපනයනය සඳහා එහි වූ යෝග්‍යතාවය ඇගයීමට ලක්කිරීම සඳහා ආකෘතියක්ද අඩංගු කර ඇත. සෑම ඉල්ලුම් පත්‍රයකම අදාළ නියැදිය පිළිබඳ විස්තර ඇතුලත්ය. එනම්, එහි සම්භවය, ශ්‍රේණිය සහ අදාල අනෙකුත් තොරතුරුය.

තේ රස බැලීමේ කණ්ඩායම විසින් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ චක්‍රලේඛ අංක OR/1/65 සහ එහි සංශෝධනයන්හි මාර්ගෝපදේශ අනුව තේ නියැදි ඇගයීමට ලක් කරනු ලබයි. 2021 වසර සඳහා තේ රස බැලීමේ අංශය විසින් නියැදි 1126 ක් ආනයනයට පෙර නියැදි වශයෙන් පරීක්ෂාවට ලක් කරන ලදී.

## පුද්ගලික විකුණුම් අනුමත කිරීම සහ මණ්ඩල තක්සේරු සහතිකය

### අ) පුද්ගලික විකුණුම් අනුමත කිරීම

ස්වාධීන තැරැව්කරුවන්ගේ අනුමැතිය සමග විකුණුම් තැරැව්කරුවන් විසින් මණ්ඩලය මගින් ලැබෙන තේ නියැදි තේ රසය පිළිබඳ ඇගයීම සඳහා ඉදිරිපත් කර ඇත. මෙහිදී නියමිත සේවා ගාස්තු අදාළවන අතර අනුමත කිරීමේ ගාස්තු වශයෙන් එක් තේ වර්ගයක් සඳහා රුපියල් 500ක් [+අගය මත එකතු කළ බද්ද (VAT)] අය කරනු ලැබේ. වර්තමානයේදී, ඉහත යෝජනා ක්‍රමය කොළඹ වෙන්දේසි හරහා විකුණනු නොලබන හරිත තේ, කාබනික තේ, විශේෂිත තේ සහ කුඩා පරිමාණයේ ශ්‍රේණි සඳහා පමණක් සීමා කර ඇත. සමස්ථයක් ලෙස 10,908ක පුද්ගලික විකුණුම් කොටස් ප්‍රමාණයක් 2021 වර්ෂය සඳහා පරීක්ෂා කර අනුමත කරන ලදී.

### ආ) ඉදිරි කොන්ත්‍රාත්තු සහතික කිරීම

ගැනුම්කරුවන්ගේ අවශ්‍යතාවය අනුව තෝරාගත් ලකුණු කිහිපයක් සඳහා යම් කාල වකවානුවක් වෙනුවෙන් අනුමත කිරීම සිදු කරන ලදී. විකුණුම්කරු, ගැනුම්කරු, තැරැව්කරු සහ තේ මණ්ඩලය විසින් විකිණීමේ කොන්ත්‍රාත්තුව අනුමත කිරීම සිදු කරන ලදී. රු.500ක අනුමත කිරීමේ ගාස්තුවක් [+අගය මත එකතු කළ බද්ද (VAT)] ඉහත සේවාව සඳහා ද අය කරන ලදී. වර්ෂය තුළ ඉදිරි කොන්ත්‍රාත්තු 1086ක් අනුමත කරන ලදී.

### ඇ) සෘජු විකිණීම අනුමත කිරීම

තම නිෂ්පාදන සෘජුවම විදේශීය ගැනුම්කරුවන්ට විකිණීම සඳහා ඉහත යෝජනා ක්‍රමය මගින් නිෂ්පාදකයාට සහ අපනයනකරුවාට අවසර දෙනු ලබයි. හරිත තේ හැර, කාබනික තේ සහ විශේෂ තේ දේශීය ගැනුම්කරුවන්ට අලෙවි කිරීමට හැකි විය. බ්‍රහස්පතින්දා දිනයන්හි රැස්වන විශේෂඥ කමිටුව මගින් සෘජු විකුණුම් අනුමත කරනු ලැබේ. එමෙන්ම, සලකා බලන ලද වර්ෂය සඳහා විකුණුම් වාර 1,203 ක් අනුමත කරන ලද අතර අනුමත කළ ප්‍රමාණය කිලෝ ග්‍රෑම් මිලියන 1.37 කි.

## සිංහ ලාංඡනය සඳහා ලියාපදිංචි වීම

ගුණාත්මකබව සහ නිෂ්පාදනයේ ආරම්භක රට පිළිබඳ සංකේතයක් වන සිංහ ලාංඡනය ශ්‍රී ලංකා තේ මණ්ඩලය සතුය. සන්නාම සහිත පාරිභෝගික ඇසුරුම්වල සිංහ ලාංඡනය නිරූපණය කිරීමට අපේක්ෂා කරන අපනයනකරුවන් ඒ සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර එහිදී ගමනාන්තය සහ වෙළඳපොළ අනුව සන්නාමගත නිෂ්පාදන ඇගයීමට ලක් කරනු ලැබේ. වෙළඳ නාම සඳහා සිංහ ලාංඡන සහතිකයකය වලංගුවන කාලය වසර තුනකි. සිල්ලර ඇසුරුම්වල සිංහ ලාංඡනය භාවිත කිරීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් අවසරය ලබා දෙනු ලබයි. 2021 වසරේදී නව වෙළඳ නාම, අළුත් කිරීම් සහ අමතර ඇසුරුම් සඳහා අයදුම්පත් 517ක් පිළිබඳ කටයුතු කරන ලදී.

ගුණාත්මකබව හා කීර්ති නාමය පවත්වා ගැනීම උදෙසා මෙන්ම ප්‍රධාන වශයෙන් සිංහ ලාංඡනය වංචනික ලෙස භාවිත කිරීමේ අවස්ථා හඳුනාග ැනීම සඳහා විදේශීය වෙළඳපොළවල සහ දේශීය වෙළඳපොළවල සිංහ ලාංඡනය භාවිතය පිළිබඳ අධීක්ෂණ ක්‍රියාවලින් සිදු කරනු ලැබේ. පූර්ව බෙදාහැරීමේ අධීක්ෂණය අතරවාරයේදී, සිංහ ලාංඡනය සහිත බෙදාහැරීමේ බඩු තොග 80%කට අධික ප්‍රමාණයක් අහඹු නියැදි පදනම මත ඇගයීමට ලක් කෙරේ. රට අමතරව, විදේශීය කාර්යාංශ සහ ශ්‍රී ලංකා තානාපති කාර්යාලවල සිටින වාණිජ තානාපතිවරු විදේශීය වෙළඳපොලවල තිබෙන සිංහ ලාංඡනය සහිත ඇසුරුම් ඇගයීම් කටයුතු සඳහා වාර්තා කිරීම සඳහා ඉදිරිපත් කරනු ලැබේ. දේශීය වෙළඳපොල තුළ සිංහ ලාංඡනය භාවිත කරන වෙළඳ නාම ද අහඹු ලෙස තෝරා ගැනීමෙන් සිංහ ලාංඡනය භාවිත කිරීමේ කොන්දේසි කඩකිරීම් සම්බන්ධයෙන් ඇගයීමට ලක් කෙරේ. ප්‍රධාන වශයෙන්, තේ මණ්ඩලයේ ලියාපදිංචි වී සිටින හා සැලකිය යුතු වෙළඳපල කොටසක් හිමි කීර්තිමත් හා දිගුකාලීන ඇසුරුම්කරුවන්ට සිංහ ලාංඡනය භාවිත කිරීමට අවසර ලබා දී ඒ අනුව අධීක්ෂණය කරනු ලැබේ.

# 2.5 විශ්ලේෂණ විද්‍යාගාරය

2021 වසර ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ විශ්ලේෂණ විද්‍යාගාරයට සුවිශේෂී වසරක් විය. විශ්ලේෂණ විද්‍යාගාරයේ ජ්‍යෙෂ්ඨතම සහ පළපුරුදු පුද්ගලයා වන ආචාර්ය කේ.ආර්.ඩබ්ලිව්. අබේවික්‍රම මහතා විශ්ලේෂණ රසායනාගාරයේ අධ්‍යක්ෂවරයා ලෙස පත් කරනු ලැබුවේ දීර්ඝ කාලයක් පුරප්පාඩුව පැවති තනතුරක් පිරවීමක් වශයෙන් වන අතර වසරේ අග භාගයේදී ඔහුට 2021 දෙසැම්බර් මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි ලංකා රසායන විද්‍යා ආයතනයේ "සහෘද සාමාජික" යන ඉහළම වෘත්තීය සාමාජිකත්වය පිරිනමන ලදී. ඔහුගේ මගපෙන්වීම සහ සම්බන්ධීකරණය යටතේ රසායනාගාර පරීක්ෂණ පහසුකම් පුළුල් කිරීමට රසායනාගාරයට හැකි වූ අතර LCMS/MS උපකරණ මිලදී ගැනීම විශාල ජයග්‍රහණයක් විය. LCMS/MS යන්ත්‍රය විශ්ලේෂණ රසායනාගාරයේ පළිබෝධනාශක අපද්‍රව්‍ය විශ්ලේෂණ ඒකකයේ ස්ථාපනය කිරීමත් සමග ඩයිරෝන් සහ MCP ඇතුළු පළිබෝධනාශකවල බහු අපද්‍රව්‍ය විශ්ලේෂණය සම්බන්ධයෙන් තේ කර්මාන්තයේ පැවති විශාල පරීක්ෂණ හිඩැසක් පිරවීමට එමගින් හැකි විය. ඩයිරෝන් සහ MCPA විශ්ලේෂණය තේ කර්මාන්තයට පිළිවෙළින් 2021 නොවැම්බර් සහ දෙසැම්බර් මාසවලදී හඳුන්වා දෙන ලදී.

සිලෝන් තේ ප්‍රමිතිය පවත්වා ගැනීමට සහ තේ මණ්ඩලයේ රසායනාගාර පරීක්ෂණ සේවා බලගැන්වීම සඳහා පවතින රෙගුලාසි ශක්තිමත් කරමින් 2021/10/06 දින, ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නව නියෝග අංක 2248/37 යටතේ රජයේ අති විශේෂ ගැසට් පත්‍රයක් නිකුත් කර "තේ විශ්ලේෂණය සහ තත්ත්ව සහතිකය" ප්‍රකාශයට පත් කරන ලදී.

නිෂ්පාදනය කරන ලද තේවල අවම ගුණාත්මකභාවය පවත්වා ගැනීම උදෙසා, "ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රමිතිය/ තේ සඳහා විධාන" (AL/MQS-02/2021) සඳහා වන දෙවන සංශෝධනය 2021 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අගය එකතු කිරීම සහ ප්‍රතිඅපනයනය කිරීම සඳහා සියලුම ලියාපදිංචි නිෂ්පාදකයින්, තේ අපනයනකරුවන් සහ තේ ආනයනකරුවන් වෙත නිකුත් කරන ලදී. තවද "සිංහ ලාංඡනය සුදුසුකම් නිර්ණායක" සංශෝධනය සම්පූර්ණ කිරීමට රසායනාගාරයට හැකි වූ අතර සිංහ ලාංඡනය සහිත තේ සඳහා වැඩි පිළිගැනීමක් ලබා දීම සඳහා නව පරීක්ෂණ අවශ්‍යතා හඳුන්වා දෙන ලදී.

වගුව 2.5.1: විශ්ලේෂණ රසායනාගාරය විසින් සිදු කරන ලද පරීක්ෂණවල සාරාංශය

| පරීක්ෂණයේ නම | පරීක්ෂණ ගණන | |
|---|---|---|
| | 2020 | 2021 |
| **රසායනික විශ්ලේෂණ ඒකකය** | | |
| තේ වල තෙතමනය තීරණය කිරීම | 280 | 334 |
| තේ වල අඩංගු සමස්ථ අළු ප්‍රමාණය තීරණය කිරීම | 355 | 382 |
| තේ වල අඩංගු ජලයේ ද්‍රාව්‍ය අළු ප්‍රමාණය නිර්ණය කිරීම | 353 | 351 |
| තේ වල අඩංගු ද්‍රාව්‍ය අළුවල ඇති අම්ල ප්‍රමාණය නිර්ණය කිරීම | 355 | 313 |
| තේ වල අඩංගු ජලසාරය තීරණය කිරීම | 189 | 127 |
| තේ වල අඩංගු ජලයේ ද්‍රාව්‍ය අළුවල ක්ෂාරීයතාව තීරණය කිරීම | 356 | 320 |
| තේ වල ඇති අමු කෙඳි ප්‍රමාණය තීරණය කිරීම | 420 | 549 |
| මූලික විකිරණ නිර්ණය කිරීමේ පරීක්ෂණ | 150 | 241 |
| ශ්‍රේණිය හඳුනා ගැනීමේ පරීක්ෂණ / පෙරන විශ්ලේෂණය | 27 | 33 |
| රසායනික ඒකකයේ පරීක්ෂණ ක්‍රම වලංගු කිරීම, සත්‍යාපනය කිරීම පිළිබඳ ක්‍රියාකාරකම් | 7 | - |
| **ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක විශ්ලේෂණ ඒකකය** | | |
| සමස්ථ පට්ටක ගණන තීරණය කිරීම | 171 | - |
| යීස්ට් සහ පුස් ප්‍රමාණය තීරණය කිරීම | 579 | 455 |
| තේවල ඇති මැරුණු හෝ සජීවී කෘමීන් සහ වෙනත් අපද්‍රව්‍ය / බාහිර ද්‍රව්‍ය පිළිබඳ අන්වීක්ෂීය පරීක්ෂණය | 28 | 35 |
| තේවල අඩංගු ජානමය වශයෙන් වෙනස් කරන ලද ජීවීන් (GMO) නිර්ණය කිරීම | 280 | 191 |
| මළ කොලිෆෝම් සහ එස්චරිචියා කොලි (E.coli) හඳුනා ගැනීම සහ ගණනය කිරීම | 544 | 455 |
| සම්පූර්ණ කොලිෆෝම් හඳුනා ගැනීම සහ ගණනය කිරීම | 544 | 462 |
| රසායනික ඒකකයේ පරීක්ෂණ ක්‍රම වලංගු කිරීම හා සත්‍යාපනය කිරීම පිළිබඳ ක්‍රියාකාරකම් | 4 | - |
| **පළිබෝධ නාශක අපද්‍රව්‍ය විශ්ලේෂණ ඒකකය** | | |
| HPLC RI අනාවරකය භාවිත කරමින් සීනි පිළිබඳ විශ්ලේෂණය | 5085 | 5131 |
| LCMS/MS භාවිතයෙන් ඩයිරෝන් විශ්ලේෂණය | | 124 |
| LCMS/MS භාවිතයෙන් MCPA විශ්ලේෂණය | | 4 |
| පළිබෝධ නාශක ඒකකයේ පරීක්ෂණ ක්‍රම වලංගු කිරීම හා සත්‍යාපනය කිරීම | 3 | - |
| එකතුව | 9240 | 9507 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

කෘත්‍රිම පොහොර තහනම් කිරීමේ රජයේ තීරණයට සමගාමීව ජෛව/කොම්පෝස්ට් පොහොර පිළිබඳ ප්‍රමිතීන් සැකසීමේ කටයුතුවල නිරත වෙමින් ජෛව/කොම්පෝස්ට් පොහොර, දියර පොහොර සහ ජෛව අඟුරු භාවිතයෙන් පසෙහි සාරවත් බව වැඩි දියුණු කරන්නේ කෙසේද යන්න පිළිබඳව පැහැදිලි කිරීමේදී විශ්ලේෂණ රසායනාගාරයට ප්‍රධාන කාර්යභාරයක් ඉටු කිරීමට සිදු විය. විශ්ලේෂණ රසායනාගාරයට අනුබද්ධිත "පාංශු සහ පොහොර පරීක්ෂණාගාරයක්" පිහිටුවීමට ගත් තීරණයකට සමගාමීව එහි මූලික පියවර 2021 දෙසැම්බර් මාසයේදී ආරම්භ කරන ලදී. මේ අතරතුර ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලබන ආදර්ශ පොහොර බලාගාර සහනාධාරය යටතේ නිෂ්පාදනය කරන ලද කාබනික ඝන පොහොර සහ දියර පොහොර සඳහා භෞතික පරීක්ෂණ හඳුන්වා දීමට රසායනාගාරයට හැකි විය.

## තේ කර්මාන්තයට පහසුකම් සැලසීම වෙනුවෙන් විශ්ලේෂණ විද්‍යාගාරයේ මැදිහත්වීම

2021 වර්ෂය තුළ, විශ්ලේෂණ විද්‍යාගාරය වෙතට සමස්ත පරීක්ෂණ 9507ක් ලැබුණු අතර එයින් අවම ISO ප්‍රමිති මට්ටමට වඩා පහල තේ නියැදි 1440 ක් හඳුනාගෙන ඇත.

වගුව 2.5.2: විශ්ලේෂණ රසායනාගාරයේ කාර්ය සාධනය

| විශ්ලේෂණ ඒකකය | අවම තත්ව ප්‍රමිතියට වඩා පහල තේ නියැදි සංඛ්‍යාව |
|---|---|
| ක්ෂුද්‍රජීව විද්‍යාත්මක | 450 |
| රසායනික | 684 |
| සීනි/පළිබෝධ නාශක | 306 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## පළිබෝධ නාශක අපද්‍රව්‍ය විශ්ලේෂණ ඒකකයේ ක්‍රියාකාරීත්වය

පළිබෝධ නාශක අපද්‍රව්‍ය විශ්ලේෂණ ඒකකය මගින් සීනි හා ඩයිරෝන් විශ්ලේෂණ 5131ක් සිදු කරන ලද අතර එයින් නියැදි 306ක් තත්වයෙන් පහල බව හඳුනාගන්නා ලදී.

වගුව 2.5.3: - පළිබෝධ නාශක අපද්‍රව්‍ය විශ්ලේෂණ ඒකකයේ කාර්ය සාධනය

| පළිබෝධ නාශක පරීක්ෂණයේ ස්වභාවය | අවම තත්ව ප්‍රමිතියට පහල |
|---|---|
| ෆ්‍රක්ටෝස් | 27 |
| ග්ලූකෝස් | 67 |
| සුක්රෝස් | 159 |
| ඩයිරෝන් | 53 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## ක්ෂුද්‍ර ජීව විද්‍යා විශ්ලේෂණ ඒකකයේ ක්‍රියාකාරීත්වය

වර්ෂය තුළ අභ්‍යන්තර සහතික කිරීමේ සේවාව මගින් ලැබුණු සමස්ථ තේ නියැදි 1866 අතරින් තේ නියැදි 450ක් ප්‍රමිතියට වඩා අඩු මට්ටමේ හෝ පරිභෝජනයට සුදුසු නොවන බව හඳුනාගන්නා ලදී.

වගුව 2.5.4 ක්ෂුද්‍ර ජීව විද්‍යා විශ්ලේෂණ ඒකකයේ ක්‍රියාකාරීත්වය

| ක්ෂුද්‍ර විද්‍යා පරීක්ෂණයේ ස්වභාවය | අවම තත්ව ප්‍රමිතියට / උපදෙස් මාලාවට පහල |
|---|---|
| යීස්ට් සහ පුස් ප්‍රමාණය | 249 |
| කොලිෆෝම් | 198 |
| එස්චරිචියා කොලි | 3 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## රසායනික විශ්ලේෂණ ඒකකයේ ක්‍රියාකාරිත්වය

සමස්ථ රසායනික පරීක්ෂණ අතරින් නියැදි 684ක් තත්වයට පහලින් ඇති බවට හඳුනා ගන්නා ලද අතර තේවල පැවති අසතුටුදායක ගුණාත්මක බව හේතුවෙන් ඒවා විනාශ කරන ලදී.

වගුව 2.5.5: රසායනික විශ්ලේෂණ ඒකකයේ ක්‍රියාකාරිත්වය

| රසායනික පරීක්ෂණයේ ස්වභාවය | අවම තත්ව ප්‍රමිතියට / උපදෙස් මාලාවට පහල |
|---|---|
| අමු කෙඳි ප්‍රමාණය | 444 |
| ක්ෂාරීයතා ප්‍රමාණය | 20 |
| තෙතමනය | 214 |
| සිලිකාමය කරුණු | 04 |
| සමස්ථ අළු ප්‍රමාණය හා ජලයේ ද්‍රාව්‍ය අළු | 02 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## තත්ව පරීක්ෂණ ඒකකයේ ක්‍රියාකාරිත්වය

තේ කොමසාරිස් හා හෝ නියෝජ්‍ය තේ කොමසාරිස් (අපනයන) විසින් ඉල්ලීම් කළ ආකාරයට, තත්ව කළමනාකරණ නිලධාරි විසින් 2021 වසරේදී නැවත නියැදිගත කිරීම් 50 ක් සඳහා තේ අපනයන අංශයට සම්බන්ධ වී සහාය ලබා දී ඇත. පරීක්ෂණාගාරවලින් සිදු කරන සියළුම පරීක්ෂණවල ප්‍රතිඵලවල නිරවද්‍යතාවය රඳා පවතිනුයේ ඒ සඳහා යොදා ගනු ලබන තේ සාම්පල මතය.









# 2.6 පාලන අංශය

සියලුම මානව සම්පත් කළමනාකරණ සහ මානව සම්පත් සංවර්ධන ක්‍රියාකාරකම් සැකසීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ ඇගයීම, නෛතික කටයුතු, සැලසුම් කටයුතු, අධීක්ෂණ සහ ඇගයීම් කටයුතු, ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ පුස්තකාලය කළමනාකරණය සහ නඩත්තු කිරීම, ප්‍රසම්පාදන කටයුතු, ආරක්ෂක සහ ප්‍රවාහන කටයුතු ආදිය ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ පරිපාලන අංශයේ වගකීම් වේ.

වගුව 2.6.1: ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ වත්මන් කාර්යමණ්ඩලය

| වර්ගය | කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව | | එකතුව |
|---|---|---|---|
| | පුරුෂ | ස්ත්‍රී | |
| ජ්‍යේෂ්ඨ මට්ටම | 04 | 01 | 05 (1.9%) |
| තෘතියික මට්ටම | 38 | 17 | 55 (21.2%) |
| ද්විතියික මට්ටම | 49 | 88 | 137 (83%) |
| ප්‍රාථමික මට්ටම | 57 | 05 | 62 (58.9%) |
| එකතුව | 148(57.2 %) | 111 (42.8%) | 259 (100%) |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

රූප සටහන 2.6.1: කාර්යමණ්ඩලයේ ස්ත්‍රී පුරුෂ අනුපාතය




පසුගිය වසර තුළ සේවකයින්ගේ ඉල්ලා අස්වීම් 04 ක් සහ විශ්‍රාම යෑම් 11 ක් ඇතුළුව රැකියා පිරිවැටුම් 15ක් දැකිය හැකි විය.

ජ්‍යෙෂ්ඨ මට්ටමේ සිට ප්‍රාථමික මට්ටම දක්වා වූ නිලධාරීන් කොවිඩ් 19 මාර්ගෝපදේශ අනුගමනය කරමින් සේවක ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වී ඇත. රට තුළ සහ ගෝලීය වශයෙන් පවතින වසංගත තත්ත්වය හේතුවෙන් මෙම වසර සඳහා අයවැයෙන් වෙන් කරන ලද විදේශ පුහුණු වැඩසටහන් සහ දේශීය කණ්ඩායම් ගොඩනැගීමේ ක්‍රියාකාරකම් සංවිධානය කිරීමට නොහැකි විය.

වගුව 2.6.2: සේවක වර්ගය අනුව දේශීය පුහුණු වැඩසටහන

| වර්ගය | පුහුණු වූ සේවක සංඛ්‍යාව |
|---|---|
| ජ්‍යේෂ්ඨ මට්ටම | 02 |
| තෘතියික මට්ටම | 11 |
| ද්විතියික මට්ටම | 57 |
| ප්‍රාථමික මට්ටම | 02 |
| එකතුව | 72 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## ආයතනික සමාජ වගකීම (CSR) සම්බන්ධ ක්‍රියාකාරකම්

කොවිඩ් 19 රෝගීන්ට ප්‍රතිකාර කිරීමේදී රෝහල්වල ස්වසනය පහසු කිරීමේ යන්ත්‍ර සඳහා ඉහළ ඉල්ලුමක් පැවතුන බැවින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ගාල්ල දිස්ත්‍රික්කයේ බලපිටිය මූලික රෝහල සඳහා ස්වසනය පහසු කිරීමේ යන්ත්‍රයක් (ventilator) පරිත්‍යාග කරන ලදී. එම උත්සවයේ ප්‍රධාන ආරාධිතයා ලෙස ගරු අමාත්‍ය ආචාර්ය රමේෂ් පතිරණ මහතා සහභාගි විය.





## 2.7 අභ්‍යන්තර විගණන ඒකකය

අභ්‍යන්තර විගණන අංශයේ අරමුණ වන්නේ ශ්‍රී ලංකා රජයේ තේ කම්හල් හිමියන්, තේ වතු හිමියන්, තේ අංශයේ සේවකයන් සහ මහජනතාව වැනි ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන් සාක්ෂාත් කිරීම සඳහා එහි මූල්‍ය, පරිපාලන සහ මානව සම්පත් ඵලදායී ලෙස යොදා ගැනීම උදෙසා අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රියාත්මක කිරීමයි.

අවදානම් කළමනාකරණය, පාලනය සහ පාලන ක්‍රියාවලියේ සඵලතාවය ඇගයීම සහ වැඩිදියුණු කිරීම සඳහා ක්‍රමවත් විෂයානුකූල ප්‍රවේශයක් අනුගමනය කිරීම හා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට අභ්‍යන්තර විගණන අංශය විසින් උපකාර කරනු ලබයි. වසංගත තත්වය හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ විගණන කමිටුව දෙවරක් රැස් වූ අතර අවශ්‍යතාවය අනුව කැඳවීම මත අදාළ අංශ ප්‍රධානීන් / නිලධාරීන් කමිටු රැස්වීම් සඳහා සහභාගි වූහ. සුදුසු නිවැරදි ක්‍රියාමාර්ග ගන්නා බවට සහතික කිරීම සඳහා වාර්තා සහ පසු විපරම් සහිතව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ සපයන ලදී.

## 2.8 තොරතුරු තාක්ෂණ ඒකකය

2020 වසරට සාපේක්ෂව 2021 වසර ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ විෂය පථය කෙරෙහි ධනාත්මක වෙනසක් ඇති කරන ලදී. ගෝලීය වශයෙන් පවතින තත්වය හේතුවෙන් බොහෝ සංවර්ධන සැලසුම් කල් දමා ඇත. එබැවින්, කොට්ඨාස මට්ටමේ නිපුණයන් නොමැති වීම හේතුවෙන් තේ වට්නාකම් දාම පද්ධතිය ද 2020 වසර පුරාවට මන්දගාමීව පැවතිනි. මෘදුකාංග අවශ්‍යතා පිරිවිතරයන්හි ඇතැම් සැලකිය යුතු ප්‍රොසෙසර භාවිත කරන්නන්ගේ භෞතිකව හමුවීමකින් තොරව ග්‍රහණය කර ගැනීමට අලෙවිකරුවාට නොහැකි විය. 2021 වසර උදාවත් සමගම අලෙවිකරු හා එක්ව සංවර්ධන කටයුතු සාර්ථකව කරගෙන යාමට අපිට හැකි විය.

පෙර තිබූ ෆයර්වෝලය යල් පැන ගිය අතර එය එම සන්නාමයේම නව සහ වැඩි දියුණු කළ අනුවාදය සමග ප්‍රතිස්ථාපනය කර ඇත. සයිබර් අවකාශයේ සිදු විය හැකි සයිබර් ප්‍රහාර සහ අනෙකුත් අවදානම් අවම කිරීම සඳහා එය බොහෝ නවීන අංගවලින් යුක්ත වේ. තේ රස බැලීමේ ඒකකය තුළ සිවිල් කැමරා පද්ධති ස්ථාපනය කර නොතිබුණ ද, එම ඒක්කය තුළ සිදුවන වැරැදි ක්‍රියාකාරකම් අවම කිරීම සඳහා 2021 දී තේ රස බැලීමේ ඒකකය තුළ නවතම කැමරාවක් ස්ථාපනය කිරීමට හැකි විය. එමගින් එම ඒකකය තුළ වඩා විනිවිදභාවයක් ඇති විය.

පවතින මානව සම්පත් මෘදුකාංගයට ප්‍රවේශ විය හැක්කේ ඩෙස්ක්ටොප් යෙදුම හරහා පමණි. කෙසේ වෙතත්, නව තාක්ෂණය සමග අත්වැල් බැඳ ගැනීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ඉදිරියට පියමැන ඇති අතර ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සේවකයන්ට ජංගම උපාංගයක් හරහා දුරස්ථව නිවාඩු ඉල්ලුම් කිරීමට හැකි වන පරිදි ජංගම යෙදුමක් නිර්මාණය කර ඇති අතර එය ජක්හි එදරු හරහා බාගත කළ හැකිය.

# 3.0 කර්මාන්ත පැතිකඩ

2021 වසර ආරම්භ වුයේ කොවිඩ් 19 වසංගතයෙන් පසු ආර්ථිකය යථා තත්ත්වයට පත් වනු ඇතැයි යන සුබවාදී බලාපොරොත්තුව සහිත ය. ශ්‍රී ලංකාව ඇතුළුව ලෝකයේ සෑම ආර්ථිකයක්ම පාහේ බොහෝ සංකීර්ණ අභියෝගවලට වසංගත කාලපරිච්ඡේදය තුළ මුහුණ දුනි. ගෝලීය ආර්ථික පසුබෑමේ ප්‍රතිඵලයක් වශයෙන්, 2020 වර්ෂයේදී ශ්‍රී ලංකා ආර්ථිකය 3.6% කින් අඩු විය. කෙසේ වෙතත්, මෙම ආර්ථික පසුබෑම සෑම ආර්ථික ක්‍රියාකාරකමකටම අහිතකර ලෙස බලපෑවේය. රජය මෙම අහිතකර ප්‍රතිවිපාක අවම කිරීමට ක්‍රියාමාර්ග ගත් අතර "නව සාමාන්‍ය" ප්‍රතිපත්තිය හඳුන්වා දුන්නේය. අතථ්‍ය (Vertual) රැස්වීම්, දුරස්ථ ව වැඩ කිරීමේ සංස්කෘතිය 2021 වර්ෂය තුළ ප්‍රමුඛව පැවතුණි.

2021 වසර තුළ දේශීය හා ජාත්‍යන්තර වශයෙන් පෙර නොවූ විරූ අභියෝගවලට මුහුණ දුන් මුත් ශ්‍රී ලංකා තේ කර්මාන්තයේ සමස්ත කාර්ය සාධනය විශිෂ්ට මට්ටමක පැවතුනි. 2021 වර්ෂය තුළ වාර්ෂික තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 299 ක් වූ අතර, එය අනුරූප කාලපරිච්ඡේදයේ කිලෝග්‍රෑම් මිලියන 279 ට සාපේක්ෂව කිලෝග්‍රෑම් මිලියන 20 ක වැඩිවීමක් (7%) වාර්තා විය. එසේම 2021 වර්ෂය තුළ වාර්ෂික තේ අපනයන ප්‍රමාණය 2020 වසරට සාපේක්ෂව 7.65% ක වර්ධනයක් වාර්තා කර ඇත. 2020 වසරේ සමස්ත අපනයන කිලෝග්‍රෑම් මිලියන 265 ට සාපේක්ෂව 2021 වසරේ දී කිලෝග්‍රෑම් මිලියන 286 ක් වාර්තා වූ අතර එය 2020 ට සාපේක්ෂව 8% ක වර්ධනයකි. එසේම, 2021 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය සඳහා තේ අපනයන ආදායම රුපියල් බිලියන 263 (ඇමරිකානු ඩොලර් බිලියන 1.32) වේ. කෙසේ වෙතත්, 2021 වර්ෂය තුළ අපනයන ආදායම ඇමරිකානු ඩොලර් 7% ක වර්ධනයක් පෙන්නුම් කරයි. 2020 දී කිලෝ ග්‍රෑමයක් සඳහා රුපියල් 867ක් වූ සාමාන්‍ය FOB මිල 2021 දී රුපියල් 921.23 දක්වා ඉහළ නගින ලදී.

සම්ප්‍රදායික තේ යනු ලංකා තේ වල ප්‍රධාන සංඝටකය වන අතර එය 2021 වසර තුළදී කිලෝග්‍රෑම් මිලියන 270.7ක් ලෙස වාර්තා වී ඇති අතර 2020 වසරේ තුළ එය කිලෝග්‍රෑම් මිලියන 252.7ක් ලෙස වාර්තා විය. එනම්, 2020ට සාපේක්ෂව එය 7%ක වර්ධනයක් වාර්තා කර ඇත. 2021 වර්ෂය සඳහා සමුච්චිත CTC නිෂ්පාදනය 9% ක වැඩිවීමක් පෙන්නුම් කළ අතර එය සමාලෝචන වර්ෂයේ දී කිලෝග්‍රෑම් මිලියන 26 ක් ලෙස වාර්තා විය. කෙසේ වෙතත්, හරිත තේ නිෂ්පාදනය 27% ක වර්ධනයක් පෙන්නුම් කරමින් 2021 දී කිලෝග්‍රෑම් මිලියන 2.6 ක් සහ 2020 දී කිලෝග්‍රෑම් මිලියන 2 ක් නිෂ්පාදනය කරන ලදී.

2021 වර්ෂයේදී ශ්‍රී ලංකා රජය විසින් ක්‍රියාත්මක කරන ලද සම්පූර්ණ එන්නත්කරණ ක්‍රියාවලිය යටතේ, කොවිඩ් 19 වසංගතය යම් ප්‍රමාණයකට පාලනය කර ගැනීමට හැකි විය. යම් සීමාවන් යටතේ එදිනෙදා වැඩ / ආර්ථික කටයුතුවල නිරත වීමට ජනතාවට හැකි වූ අතර එය ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීමට අවස්ථාවක් විය. මෙම තත්ත්වය වඩා හොඳ කාර්ය සාධනයක් ලබා ගැනීමට ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයට බෙහෙවින් බලපෑවේය. කර්මාන්තයේ නිෂ්පාදනය, අපනයන, විකුණුම් සහ මිල ගණන්වල ප්‍රධාන දර්ශක ධනාත්මක ලෙස දැකිය හැකි විය.

එපමණක් නොව, තවත් වසර ගණනාවක් ඉදිරියට ක්‍රියාත්මක කළ හැකි ඩිජිටල් විද්‍යුත් වෙන්දේසි ක්‍රමය තේ කර්මාන්තයේ තවත් ජයග්‍රහණයකි. පසුගිය වසරේ දී, ලෝක ප්‍රසිද්ධ භෞතික වෙන්දේසි ක්‍රමය, එක රැයකින් පැවැත්වීමට හැකි පරිදි ඩිජිටල් වේදිකාවකට වෙනස් කරන ලදී. සජීවී තේ වෙන්දේසිය වසර 125 කට වැඩි කාලයක් පැවති අතර එය තවදුරටත් ලංකා තේ අලෙවිය සම්බන්ධයෙන් සිදු නොකරයි.

කෙසේ වෙතත්, 2020 කාලපරිච්ඡේදය හා සසඳන විට 2021 වසරේ පළමු කාර්තුව තුළ 39%ක නිෂ්පාදන වර්ධනයක් වාර්තා විය. එසේම, 2020 ට සාපේක්ෂව දෙවන, තුන්වන සහ සිව්වන කාර්තු තුළ දී සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

ඍණාත්මක ලක්ෂණ සහ අනෙකුත් ගෝලීය වෙළෙඳපොළ ප්‍රවණතා හමුවේ, කොළඹ තේ වෙන්දේසියේ සමුච්චිත සාමාන්‍ය මිල, පෙර වසර තුළ කිලෝවක් සඳහා ඇමෙරිකානු ඩොලර් 3.39 ට සාපේක්ෂව මෙම වසරේදී කිලෝවකට ඇමෙරිකානු ඩොලර් 3.09 කින් අඩු වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, කොළඹ තේ වෙන්දේසියේ මිල 2020 දී රුපියල් 628.21 සිට 2021 දී 615.44 දක්වා නාමික අඩුවීමක් පෙන්නුම් කළේය.

වසර තුළ සමස්ත තේ මෙට්‍රික් ටොන් 285,871ක් ශ්‍රී ලංකාවෙන් අපනයනය කර ඇති අතර එමගින් රුපියල් බිලියන 263 (ඇමරිකානු ඩොලර් බිලියන 1.32) (ප්‍රති අපනයන ඇතුළුව) ආදායමක් උපයා ඇත. සමාලෝචිත වර්ෂය තුළ මුළු අපනයන පරිමාව (ප්‍රති අපනයන ඇතුළුව) මෙට්‍රික් ටොන් 20.302 ක වැඩිවීමක් වාර්තා කළ අතර අපනයන ඉපැයීම් 14% කින් වැඩි විය.

# 3.1.තේ ඉඩම් ව්‍යාප්තිය

වර්තමානයේදී ශ්‍රී ලංකාවේ තේ වගා කරන සමස්ත භූමි ප්‍රමාණය හෙක්ටයාර් 202,540කි.(වෙනස්විය හැක). කළමනාකරණ නිර්ණායක අනුව මෙම තේ වතු පෞද්ගලික අංශය (60%) සහ රාජ්‍ය අංශය (40%) යනුවෙන් වර්ග කළ හැකිය. මෙරට තේ වගාව ව්‍යාප්තව ඇත්තේ දිස්ත්‍රික්ක කිහිපයක් තුළය. ප්‍රධාන වශයෙන් තේ වගාව සඳහා හිතකර දේශගුණික තත්වයන් පවතින්නේ තෙත් කලාපයේ ය.

# 3.2.තේ නිෂ්පාදනය

2021 වසර තුළ ශ්‍රී ලංකාවේ ජාතික තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 299.5ක් ලෙස වාර්තා විය. එය 2020 වසරට සාපේක්ෂව කිලෝග්‍රෑම් මිලියන 20ක (7%) වැඩි වීමකි.

ශ්‍රී ලංකාවේ තේ වගා කරන හා නිෂ්පාදනය කරන භූමියේ විවිධ මුහුදු මට්ටම් අනුව ශ්‍රී ලංකාවේ තේ වර්ග තුනකට බෙදනු ලැබේ. මුහුදු මට්ටමේ සිට මීටර් 600 දක්වා පරාසයක් තුළ වූ උස් භූමි මට්ටම්වල පහත රට තේ වගාකරන අතර නිම් තේ කළු පැහැති පෙනුමකින් ද, පිළියෙල කරන තේ කෝප්පය තද වර්ණයකින් හා රසයකින් ද යුක්ත වන අතර ජාතික නිෂ්පාදනයෙන් තුනෙන් දෙකකට (2021 දී 61%) වඩා දායක වේ.

මීටර් 1,200 වැඩි උන්නතාංශයකින් යුත් භූමිවල වගාකරන තේ උඩරට තේ වශයෙන් හඳුන්වන අතර ඒවා මනා රසයකින් හා සුවඳකින් යුත් උසස්ම තත්වයේ තේ ලෙස සලකනු ලැබේ. 2021 වසර තුළ ජාතික නිෂ්පාදනයට උඩරට හා මැදරට තේ මගින් දෙන ලද දායකත්වය පිළිවෙලින් 22%ක් හා 17%ක් විය. ජාතික තේ නිෂ්පාදනයෙන් තුනෙන් දෙකකට (61%) වඩා වැඩි ප්‍රමාණයකට පහත රට තේ නිෂ්පාදනය දායක වී ඇත.

වගුව 3.1. උන්නතාංශය අනුව තේ නිෂ්පාදනය

| උන්නතාංශය | ප්‍රමාණය (කි.ග්‍රෑ.) |
|---|---|
| උඩරට | 65,326,571 |
| මැදරට | 50,985,716 |
| පහතරට | 183,176,135 |
| එකතුව | 299,488,422 |
| මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය | |

ප්‍රස්ථාරය 3.1. උන්නතාංශය අනුව තේ නිෂ්පාදනය




මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## මාසික තේ නිෂ්පාදනය

වසර පුරාම සෑම මාසයකම පහතරට තේ නිෂ්පාදනය මගින් ජාතික තේ නිෂ්පාදනය සඳහා ප්‍රධාන දායකත්වයක් ලැබුණි. 2021 වසරේදී කිලෝ ග්‍රෑම් මිලියන 31ක ඉහළම මාසික තේ නිෂ්පාදනය මැයි මාසය තුළදී වාර්තා වූ අතර කිලෝ ග්‍රෑම් මිලියන 20ක අවම නිෂ්පාදනයක් නොවැම්බර් මස තුළ දී වාර්තා විය.

ප්‍රස්තාරය 3.2: මාසික තේ අපනයන ප්‍රමාණයන සහ FOB මිල ගණන්




## දිස්ත්‍රික්ක අනුව කෘෂි දේශගුණික විශ්ලේෂණය

කිලෝ ග්‍රෑම් මිලියන 48ක ප්‍රමාණයකින් නිෂ්පාදන දායකත්වයක් සපයමින් කෘෂි දේශගුණික දිස්ත්‍රික්ක අනුව ඉහළම තේ නිෂ්පාදනයක් රත්නපුර දිස්ත්‍රික්කයෙන් වාර්තා වූ අතර දෙවන ඉහලම නිෂ්පානදය වූ කිලෝ ග්‍රෑම් මිලියන 42ක් ගාල්ල දිස්ත්‍රික්කයෙන් වාර්තා විය. පහත රට තේ 2021 වසර තුළ කිලෝ ග්‍රෑම් මිලියන 168.7ක් නිෂ්පාදනය කර ඇති අතර 2020 වසර තුළ දී එය කිලෝ ග්‍රෑම් මිලියන 156.7ක් විය.

වගුව 3.2: කෘෂි දේශගුණික දිස්ත්‍රික්ක අනුව තේ නිෂ්පාදනය

| කෘෂි දේශගුණික දිස්ත්‍රික්කය | 2021 (කි.ග්‍රෑ.) | 2020 (කි.ග්‍රෑ.) | වෙනස (කි.ග්‍රෑ.) | % |
|---|---|---|---|---|
| නුවරඑළිය | 3,587,636 | 2,858,604 | 729,032 | 26 |
| බටහිර | | | | |
| රම්බොඩ | 1,957,781 | 1,832,914 | 124,867 | 7 |
| පුඬළුඔය | 3,685,134 | 3,564,815 | 120,320 | 3 |
| ආගරපතන | 5,069,113 | 4,536,186 | 532,927 | 12 |
| නානුඔය/ ලිඳුල/ තලවකැලෙ | 8,514,839 | 8,062,390 | 452,449 | 6 |
| පතන / කොටගල | 4,187,182 | 4,475,252 | -288,070 | (6) |
| හැටන් / දික්ඔය | 8,152,096 | 7,844,983 | 307,113 | 4 |
| බොගවන්තලාව | 5,588,128 | 5,612,580 | -24,451 | - |
| අප් කොට් / මස්කෙළිය | 5,488,000 | 5,049,048 | 438,952 | 9 |
| බටහිර එකතුව | 42,642,272 | 40,978,167 | 1,664,106 | 4 |
| මධ්‍යම | | | | |
| වටවල/ ගිනිගත්හේන/ නෝටන් බ්‍රිජ් | 1,817,763 | 2,163,883 | (346,120) | (16) |
| පුස්සැල්ලාව/ හේවාහැට | 5,905,005 | 6,005,389 | (100,384) | (2) |
| කොත්මලේ | 940,778 | 876,354 | 64,424 | 7 |
| ගම්පොළ/ නාවලපිටිය/ දොළොස්බාගේ | 19,650,628 | 17,718,123 | 1,932,505 | 11 |
| නිලඹේ/ හන්තාන/ ගලහ | 1,441,313 | 1,447,513 | (6,200) | - |
| කඩුගන්නාව | 5,462,630 | 4,642,927 | 819,704 | 18 |
| මඩුල්කැලේ / නකල්ස් / රත්ගල | 3,121,792 | 3,383,210 | (261,419) | (8) |
| හුන්නස්ගිරිය / මාතලේ / යක්දෙස්ස | 1,522,678 | 1,386,413 | 136,266 | 10 |
| බලංගොඩ / රක්වාන | 8,846,827 | 8,027,660 | 819,167 | 10 |
| මධ්‍යම එකතුව | 48,709,412 | 45,651,470 | 3,057,942 | 7 |
| උඩපුස්සැල්ලාව | | | | |
| උඩපුස්සැල්ලාව/ හල්ග්‍රාන්ඔය | 4,060,550 | 3,944,295 | 116,255 | 3 |
| මතුරට | 1,373,647 | 935,085 | 438,562 | 47 |
| උඩපුස්සැල්ලාව එකතුව | 5,434,197 | 4,879,380 | 554,817 | 11 |
| ඌව | | | | |
| කොස්ලන්ද/ හල්දුමුල්ල | 602,593 | 817,742 | -215,149 | (26) |
| හපුතලේ | 4,130,515 | 3,598,688 | 531,827 | 15 |
| බණ්ඩාරවෙල/ පූනාගල | 3,289,655 | 2,520,658 | 768,997 | 31 |
| මල්වත්ත/ වැලිමඩ | 3,378,505 | 2,858,823 | 519,682 | 18 |
| දෙමෝදර/ හාලිඇල/ බදුල්ල | 9,996,299 | 9,543,215 | 453,085 | 5 |
| ඇල්ල/නමුනුකුළ | 1,904,508 | 1,737,631 | 166,877 | 10 |
| පස්සර/ ලුනුගල | 3,663,468 | 3,011,099 | 652,369 | 22 |
| මඩුල්සීම | 3,486,843 | 3,657,828 | -170,985 | (5) |
| ඌව එකතුව | 30,452,384 | 27,745,683 | 2,706,701 | 10 |
| පහතරට | | | | |
| දෙනියාය | 13,691,965 | 12,942,346 | 749,619 | 6 |
| ගාල්ල | 42,869,465 | 37,496,469 | 5,372,997 | 14 |
| කළුතර | 18,953,545 | 18,444,550 | 508,995 | 3 |
| කෑගල්ල | 7,071,361 | 6,439,832 | 631,528 | 10 |
| කැලණි මිටියාවත | 8,231,949 | 7,310,799 | 921,150 | 13 |
| මහනුවර/ මාතලේ/ කුරුණෑගල | 3,889,004 | 3,829,102 | 59,902 | 2 |
| මාතර | 14,157,203 | 11,941,807 | 2,215,396 | 19 |
| මොරවක | 6,292,262 | 5,620,667 | 671,595 | 12 |
| රත්නපුර | 48,328,640 | 47,734,905 | 593,735 | 1 |
| බලන්ගොඩ | 5,177,128 | 4,977,985 | 199,143 | 4 |
| පහතරට එකතුව | 168,662,520 | 156,738,462 | 11,924,059 | 8 |
| එකතුව | **299,488,422** | **278,851,765** | **20,636,656** | **7** |

*ප්‍රතිශෝධනය කර ඇත.

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## දිස්ත්‍රික්ක අනුව තේ නිෂ්පාදනය

සමාලෝචිත වසර තුළදී ඉහළම උඩරට තේ නිෂ්පාදනය නුවර එළිය දිස්ත්‍රික්කයෙන් ද ඉහළම පහත රට තේ නිෂ්පාදනය රත්නපුර දිස්ත්‍රික්කයෙන් ද වාර්තා විය. මෙම දිස්ත්‍රික්ක දෙකම ජාතික තේ නිෂ්පාදනයට 15% කින් සහ 22% කින් පිළිවෙලින් දායක විය.

සියලු උන්නතාංශ කලාප තුන අතරින් රත්නපුර දිස්ත්‍රික්කය ඉහලම නිෂ්පාදනය වාර්තා කළ අතර අඩුම නිෂ්පාදනය හම්බන්තොට හා මොණරාගල යන දිස්ත්‍රික්ක වලින් වාර්තා විය.

වගුව 3.3: දිස්ත්‍රික්ක අනුව තේ නිෂ්පාදනය (කි.ග්‍රෑ වලින්)

| දිස්ත්‍රික්කය | උඩරට | මැදරට | පහතරට | එකතුව |
|---|---|---|---|---|
| බදුල්ල | 18,100,469 | 12,923,786 | - | 31,024,255 |
| කොළඹ | - | - | 1,185,515 | 1,185,515 |
| ගාල්ල | - | - | 42,450,978 | 42,450,978 |
| හම්බන්තොට | - | - | 205,138 | 205,138 |
| කලුතර | - | - | 18,068,135 | 18,068,135 |
| මහනුවර | 1,014,151 | 20,189,858 | 11,321,960 | 32,525,969 |
| කෑගල්ල | - | 329,012 | 10,545,900 | 10,874,912 |
| මාතලේ | - | 1,632,628 | 472,865 | 2,105,493 |
| මාතර | - | 99,465 | 34,525,329 | 34,624,794 |
| මොණරාගල | - | 9 | - | 9 |
| නුවරඑළිය | 46,211,951 | 13,399,740 | 848,505 | 60,460,196 |
| රත්නපුර | - | 2,411,218 | 63,551,811 | 65,963,028 |
| එකතුව | 65,326,571 | 50,985,716 | 183,176,135 | 299,488,422 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## අමු තේ දළු රැස්කිරීමේ ක්‍රමවේදය අනුව නිෂ්පාදනය විශ්ලේෂණය කිරීම

තේ කර්මාන්ත ශාලාවක තේ දළු අවශ්‍යතාවය ඔවුන්ගේම වතුවලින් මෙන්ම මිලදී ගත් තේ දළුවලින් සපුරා ගනු ලැබේ. නිමි තේ ප්‍රමාණය 4.65න් ගුණකරමින් නිෂ්පාදනය සඳහා සහතික කරන ලද තේ දළු ප්‍රමාණය ගණනය කරන අතර එය තේ කර්මාන්තයේ පිළිගත් සූත්‍රයක් ලෙස භාවිත කෙරේ.

වගුව 3.4: දිස්ත්‍රික්ක අනුව අමු තේ දළු නිෂ්පාදනය (කි.ග්‍රෑ. වලින්)

| දිස්ත්‍රික්කය | උඩරට | මැදරට | පහතරට | එකතුව |
|---|---|---|---|---|
| බදුල්ල | 84,167,182 | 60,095,604 | - | 144,262,786 |
| කොළඹ | - | - | 5,512,645 | 5,512,645 |
| ගාල්ල | - | - | 197,397,050 | 197,397,050 |
| හම්බන්තොට | - | - | 953,892 | 953,892 |
| කලුතර | - | - | 84,016,827 | 84,016,827 |
| මහනුවර | 4,715,802 | 93,882,840 | 52,647,113 | 151,245,755 |
| කෑගල්ල | - | 1,529,906 | 49,038,433 | 50,568,339 |
| මාතලේ | - | 7,591,722 | 2,198,822 | 9,790,544 |
| මාතර | - | 462,512 | 160,542,778 | 161,005,291 |
| මොණරාගල | - | 42 | - | 42 |
| නුවරඑළිය | 214,885,571 | 62,308,793 | 3,945,546 | 281,139,910 |
| රත්නපුර | - | 11,212,161 | 295,515,921 | 306,728,082 |
| එකතුව | 303,768,555 | 237,083,580 | 851,769,026 | 1,392,621,161 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## සැකසුම් ක්‍රමවේද අනුව නිෂ්පාදන විශ්ලේෂණය කිරීම

### කළු තේ සහ හරිත තේ නිෂ්පාදනය

2021 වසර තුළදී සම්ප්‍රදායික තේ නිෂ්පාදනය සහ සී.ටී.සී. තේ නිෂ්පාදනය පිළිවෙලින් 7% කින් සහ 9% කින් වර්ධනයවීමක් පෙන්නුම් කරයි. සමාලෝචිත වසර තුළදී සමස්ත කළු තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් මිලියන 20 කින් (7%) ඉහල ගොස් ඇත. හරිත තේ නිෂ්පාදනය පෙර වර්ෂය හා සැසඳීමේදි 27%ක වර්ධනයක් පෙන්නුම් කරයි.

### ක්ෂණික තේ සහ ජෛව තේ නිෂ්පාදනය

2020 වසර හා සැසඳීමේ දී 2021 වසර තුළදී, ක්ෂණික තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් 575,482 කින් පහල යාමක් පෙන්නුම් කරන අතර ජෛව තේ නිෂ්පාදනය මෙ.ටො 15ක පහත වැටීමක් පෙන්නුම් කරයි. එමෙන්ම, ක්ෂණික තේවලින් 99%ක්ම වාර්තා වන්නේ ඉහල උන්නතාංශයක් සහිත භූමි ප්‍රදේශවල පිහිටි කර්මාන්තශාලා තුළිනි.

## නිමි තේ නිෂ්පාදන වියදම

නිෂ්පාදන පිරිවැය සහ ඵලදායීතාවය එකිනෙකට සම්බන්ධ වන අතර වැඩි වන නිෂ්පාදන පිරිවැය වැවිලි ක්ෂේත්‍රයේ අඛණ්ඩව පවතින කණගාටුදායක කරුණක් බවට පත්ව ඇත. තේ නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා විශාල වශයෙන් ශ්‍රමිකයන් අවශ්‍යවීම මෙයට ප්‍රධාන හේතුවකි. තේ නිපදවන ප්‍රධාන පෙළේ රටවල් අතර ශ්‍රී ලංකාව තුළ ඉහළ නිෂ්පාදන වියදමක් දැකිය හැක. ගෝලීය වෙළඳපොල තුළ පවතින තරගකාරීත්වයට ද මෙම තත්වය බලපා ඇත.

නිමි තේ කිලෝ ග්‍රෑමයක නිෂ්පාදන වියදම පසුගිය දශකය තුළ සීඝ්‍රයෙන් ඉහළ ගොස් තිබේ. ශ්‍රම පිරිවැය සහ යෙදවුම් මිල ඉහළ යාම විශේෂයෙන් නිෂ්පාදන වියදම සඳහා බලපා තිබුණි. 2020/2021 වර්ෂ සඳහා ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා දත්ත අනුව තේ කිලෝ ග්‍රෑමයක් සඳහා වාර්ෂික නිෂ්පාදන වියදම රැපියල් 618.49ක් වූ අතර එය 2019/2020 හා සැසඳීමේදි 13% ක වර්ධනයකි.

සටහන්: පවතින කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් නිෂ්පාදන පිරිවැය පිළිබඳ ප්‍රශ්නාවලි සඳහා තොරතුරු රැස් කිරීමට නොහැකි විය. එමනිසා, 2020/2021 වසර සඳහා නිෂ්පාදන පිරිවැය ඇස්තමේන්තු ගත ප්‍රමාණයක් වශයෙන් දක්වා ඇත.

ප්‍රස්තාරය 3.3: නිමි තේ කිලෝවක සමස්ත පිරිවැය




මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

# 3.3.තේ අලෙවිය

තේ වෙන්දේසිවල දී වාර්තා වූ ශුද්ධ විකුණුම් සාමාන්‍ය අගයන් සමග සසඳන විට, 2021 වසරේ මේ දක්වා වාර්ෂික සාමාන්‍යය රුපියල් 615.44 ක් (අවමය කිලෝ ග්‍රෑමයකට රුපියල් 587 ක් හා උපරිමය කිලෝ ග්‍රෑමයකට රුපියල් 654 කි. එය පසුගිය වසර හා සැසඳීමේ දී කිලෝ ග්‍රෑමයකට රුපියල් 13ක අඩුවීමකි (කිලෝ ග්‍රෑමයකට රුපියල් 628.21)

ඉහළම විකුණුම් සාමාන්‍යය වාර්තා වූයේ පහත රට තේ මගින් කිලෝ ග්‍රෑමයකට රුපියල් 644ක් වශයෙනි. 2021 වර්ෂයේ දී වාර්ෂික විකුණුම් ප්‍රමාණය මිලියන 296 ක් වූ අතර 2020 දී එය තේ කිලෝග්‍රෑම් මිලියන 268.2 ක් විය. පොදු, පෞද්ගලික සහ සෘජු විකුණුම් ඇතුළුව, සමාලෝචිත වර්ෂය සඳහා කිලෝග්‍රෑම් මිලියන 28 ක විකුණුම් ප්‍රමාණයේ අඩුවීමක් (10%) වාර්තා විය.

2021 ජනවාරි මාසය තුළ මේ දක්වා විකුණුම් සාමාන්‍යය කිලෝ ග්‍රෑමයකට රුපියල් 645.02ක් වූ අතර එය 2020 ජනවාරි මාසයට සාපේක්ෂව කිලෝ ග්‍රෑමයකට රුපියල් 58ක වැඩිවීමක් පෙන්නුම් කළේය. 2021 වසරේ පළමු මාස පහ තුළ විකුණුම් සාමාන්‍යය රුපියල් 600 ඉක්ම වූ අතර පසුව ක්‍රමයෙන් අඩු විය. පසුගිය කාර්තුව තුළ එහි සුළු වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

## අලෙවි ක්‍රම

කර්මාන්තශාලාවල නිපදවන තේ අලෙවි කරන ප්‍රධාන මාදිලිය වන්නේ ප්‍රසිද්ධ වෙන්දේසියයි. 2021 වසරේදි තේ කිලෝ ග්‍රෑම් මිලියන 287ක ප්‍රමාණයක් කොළඹ තේ වෙන්දේසියේ දී අලෙවි කරන ලදී. පෞද්ගලික විකුණුම් කිලෝ ග්‍රෑම් මිලියන 8 ක් වූ අතර ඉතිරි කිලෝ ග්‍රෑම් මිලියන 1ක ප්‍රමාණය සෘජු විකුණුම් හරහා අලෙවි කරන ලදී.

## කොළඹ තේ වෙන්දේසිය

කොළඹ තේ වෙළෙඳුන්ගේ සංගමය යටතේ ලංකා වාණිජ මණ්ඩලය මගින් කොළඹ තේ වෙන්දේසිය පවත්වන අතර 2021 වසර තුළ දී වෙන්දේසි 50ක් පවත්වන ලදී. ප්‍රසිද්ධ වෙන්දේසියේදී තේ කිලෝ ග්‍රෑම් මිලියන 25ක (10%) ක වැඩි වීමක් වාර්තා විය. එම වසර තුළදී, කොළඹ තේ වෙන්දේසියෙහි සාමාන්‍ය මිලෙහි කිලෝ ග්‍රෑමයකට රුපියල් 13ක අඩු වීමක් තුළ දැකිය හැකි විය.

## භූමි උන්නතාංශය අනුව අලෙවිය

උන්නතාංශ තුනම අතුරින්, උඩරට තේ මිල රුපියල් 6 (1%) ක ආන්තික වර්ධනයක් වාර්තා කළ අතර මැදරට සහ පහතරට ඒකක මිල පිළිවෙලින් රුපියල් 3 සහ රුපියල් 22 කින් අඩු විය. කෙසේ වෙතත්, පසුගිය වසරට සාපේක්ෂව සමස්ත තේ විකුණුම් මිල රුපියල් 13 ක අඩුවීමක් (2%) වාර්තා කළේය.

වගුව 3.5: උන්නතාංශය අනුව අලෙවිය

| උන්නතාංශය | ප්‍රමාණය (මිලියන කි.ග්‍රෑ) | | | | ඒකක මිල (රු./කි.ග්‍රෑ) | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2020 | 2021 | වෙනස | % | 2020 | 2021 | වෙනස | % |
| උඩරට | 56.46 | 63.52 | 7.06 | 12.50 | 580.9 | 587.13 | 6 | 1 |
| මැදරට | 47.56 | 52.34 | 4.78 | 10.05 | 554.28 | 550.8 | (3) | (1) |
| පහතරට | 164.21 | 179.94 | 15.73 | 9.58 | 665.88 | 644.23 | (22) | (3) |
| මුළු අලෙවිය | 268.24 | 295.79 | 27.55 | 10.27 | 628.21 | 615.44 | (13) | (2) |

# 3.4.තේ අපනයනය

සමාලෝචන වර්ෂය සඳහා කිලෝ ග්‍රෑම් මිලියන 286ක් වූ සමස්ත තේ අපනයනය (ප්‍රති අපනයනය ඇතුළුව) කිලෝ ග්‍රෑම් 20ක වර්ධනයක් පෙන්නුම් කළ අතර 2020 වර්ෂය සඳහා එය කිලෝ ග්‍රෑම් මිලියන 266ක් විය. සමාලෝචිත වර්ෂයේදී රුපියල් බිලියන 263ක් වූ ඉපයීම්, රුපියල් බිලියන 33ක වර්ධනයක් පෙන්නුම් කළ අතර 2020 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ඉපයීම වූයේ රුපියල් බිලියන 230කි. 2021 වසර තුළ දී සාමාන්‍ය වාර්ෂික FOB ඒකක මිල කිලෝ ග්‍රෑමයකට රුපියල් 921.23ක් වූ අතර එයට සාපේක්ෂව පසුගිය වසරේ කිලෝ ග්‍රෑමයකට රුපියල් 866.70ක් ලෙස වාර්තා විය. එනම්, රු.55ක වැඩි වීමකි. ලෝක තේ වෙළෙඳපොළ තුළ තේ අපනයනය කරන රටවල් අතරින් ශ්‍රී ලංකාව විකුණුම් ප්‍රමාණය අතින් තුන්වන ස්ථානයේ පසුවන අතර තේ මගින් ආදායම් ලබන රටවල් අතරින් ද තුන්වන ස්ථානය හිමිකරගෙන සිටී. ගෝලීය තේ වෙළඳපොල තුළ ගුණාත්මක තේ සපයනු ලබන රටක් වශයෙන් ඉදිරියට යාමට ශ්‍රී ලංකාව සතු හැකියාව එමගින් පෙන්නුම් කෙරේ.

තරඟකරුවන් තුළ දැකිය හැකි දැඩි තරඟකාරීත්වය රටෙහි තරඟකාරී තත්වය කෙරෙහි අයහපත් ලෙස බලපා ඇති අතර මෙම තත්වය ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදන වියදම අධික වීම සහ තේ අස්වැන්න පහළ මට්ටමක පැවතීම යන කරුණු හේතුවෙන් වඩාත් උග්‍ර වී ඇත. ඊට අමතරව ගෝලීය තේ පරිභෝගිකයන්ගේ වෙනස්වන රුචිකත්වයන් හමුවේ ශ්‍රී ලංකාව තවදුරටත් CTC තේවලින් බැහැරව සම්ප්‍රදායික තේ මත ම රැඳීසිටීමෙන් තම වෙළෙඳපොළ කොටස තව දුරටත් අහිමි විය.

ප්‍රස්තාරය 3.4: මාසික තේ අපනයන ප්‍රමාණයන සහ FOB මිල ගණන්



වගුව 3.6: වාර්ෂික තේ අපනයනය 2021

| අපනයන ආකාරය | ප්‍රමාණය (කි.ග්‍රෑම්) | වටිනාකම (රු.) | FOB (රු./කි.ග්‍රෑම්) |
|---|---|---|---|
| **අපනයනය** | | | |
| කළු තේ | | | |
| මළු | 20,095,797 | 33,730,033,892 | 1,678.46 |
| තොග | 123,626,294 | 96,326,626,678 | 779.18 |
| ඇසුරුම් (1 කි.ග්‍රෑ -3 කි.ග්‍රෑ) | 1,884,867 | 1,501,248,515 | 796.47 |
| ඇසුරුම් (3 කි.ග්‍රෑ -5 කි.ග්‍රෑ) | 15,517,134 | 13,008,946,882 | 838.36 |
| ඇසුරුම් (4 ග්‍රෑම් -1 කි.ග්‍රෑ) | 77,004,922 | 71,513,419,308 | 928.69 |
| ඇසුරුම් (5 කි.ග්‍රෑ -10 කි.ග්‍රෑ) | 32,630,091 | 22,784,243,943 | 698.26 |
| සමස්ථ කළු තේ | 270,759,106 | 238,864,519,218 | 882.2 |
| හරිත තේ | | | |
| මළු | 848,849 | 2,843,632,870 | 3,349.99 |
| තොග | 427,803 | 498,443,348 | 1,165.12 |
| ඇසුරුම් (1 කි.ග්‍රෑ -3 කි.ග්‍රෑ) | 1,744 | 4,033,639 | 2,312.87 |
| ඇසුරුම් (3 කි.ග්‍රෑ -5 කි.ග්‍රෑ) | 3,356 | 8,363,794 | 2,492.56 |
| ඇසුරුම් (4 ග්‍රෑම් -1 කි.ග්‍රෑ) | 946,947 | 1,647,649,187 | 1,739.96 |
| ඇසුරුම් (5 කි.ග්‍රෑ -10 කි.ග්‍රෑ) | 44,847 | 70,411,680 | 1,570.04 |
| සමස්ථ හරිත තේ | 2,273,545 | 5,072,534,518 | 2,231.11 |
| ක්ෂණික තේ | | | |
| ඇසුරුම් (1 කි.ග්‍රෑ -3 කි.ග්‍රෑ) | 2,966,186 | 5,162,319,572 | 1,740.39 |
| ඇසුරුම් (3 කි.ග්‍රෑ -5 කි.ග්‍රෑ) | 9 | 15,935 | 1,770.56 |
| ඇසුරුම් (4 ග්‍රෑම් -1 කි.ග්‍රෑ) | 367 | 413,283 | 1,127.40 |
| සමස්ථ ක්ෂණික තේ | 2,966,562 | 5,162,748,790 | 1,740.31 |
| අපනයන මුළු එකතුව | 275,999,213 | 249,099,802,526 | 902.54 |
| **ප්‍රති අපනයන** | | | |
| කළු තේ | | | |
| මළු | 4,541,722 | 5,888,551,847 | 1,296.55 |
| තොග | 1,665,671 | 1,377,334,387 | 826.89 |
| ඇසුරුම් (1 කි.ග්‍රෑ -3 කි.ග්‍රෑ) | 0 | 500 | 1,250.00 |
| ඇසුරුම් (3 කි.ග්‍රෑ -5 කි.ග්‍රෑ) | 38,544 | 110,204,294 | 2,859.18 |
| ඇසුරුම් (4 ග්‍රෑම් -1 කි.ග්‍රෑ) | 1,189,387 | 1,392,286,202 | 1,170.59 |
| ඇසුරුම් (5 කි.ග්‍රෑ -10 කි.ග්‍රෑ) | 48,040 | 82,745,435 | 1,722.43 |
| සමස්ථ කළු තේ | 7,483,364 | 8,851,122,665 | 1,182.77 |
| හරිත තේ | | | |
| මළු | 1,219,628 | 4,065,343,154 | 3,333.26 |
| තොග | 441,785 | 299,188,258 | 677.23 |
| ඇසුරුම් (1 කි.ග්‍රෑ -3 කි.ග්‍රෑ) | 230 | 405,881 | 1,767.24 |
| ඇසුරුම් (3 කි.ග්‍රෑ -5 කි.ග්‍රෑ) | 6,307 | 9,143,428 | 1,449.73 |
| ඇසුරුම් (4 ග්‍රෑම් -1 කි.ග්‍රෑ) | 639,345 | 918,435,540 | 1,436.53 |
| ඇසුරුම් (5 කි.ග්‍රෑ -10 කි.ග්‍රෑ) | 20,086 | 26,065,594 | 1,297.70 |
| සමස්ථ හරිත තේ | 2,327,380 | 5,318,581,855 | 2,285.22 |
| ක්ෂණික තේ | | | |
| මළු | 81 | 117,833 | 1,451.15 |
| ඇසුරුම් (කි.ග්‍රෑ 3 ට වැඩි) | 61,565 | 83,678,998 | 1,359.21 |
| ඇසුරුම් (1 කි.ග්‍රෑ -3 කි.ග්‍රෑ) | 120 | 138,782 | 1,156.52 |
| සමස්ථ ක්ෂණික තේ | 61,766 | 83,935,613 | 1,358.94 |
| ප්‍රතිඅපනයන මුළු එකතුව | 9,872,510 | 14,253,640,133 | 1,443.77 |
| සමස්ථ අපනයන | 285,871,722 | 263,353,442,659 | 921.23 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගුව

## වර්ග අනුව තේ අපනයන විශ්ලේෂණය

සාමාන්‍යයෙන් සලකා බැලීමේදී, තේ දළුවල සම්භවය හා ගුණාත්මකභාවය අනුව තේ සඳහා ඇති රුචිකත්වය සැලකිය යුතු අන්දමෙන් වෙනස් වේ. මැද පෙරදිග සහ පොදුරාජ්‍ය මණ්ඩලයට අයත් ස්වාධීන රටවල් CIS) තුළ මූලික වශයෙන් ශ්‍රී ලංකාවේ නිපදවන පහත රට, සාම්ප්‍රදායික, තද රසයක් සහිත තේ සඳහා ඉල්ලුමක් පවතී.

2021 වසරේදී, ප්‍රති අපනයනයන් ද සහිතව සමස්ත කළු තේ, හරිත තේ සහ ක්ෂණික තේ අපනයනය ප්‍රමාණාත්මකව හා වටිනාකම අතින් ඉහල නැගීමක් පෙන්නුම් කරයි. සාමාන්‍යයෙන් කළු තේ අපනයන ප්‍රතිශතය ආසන්න වශයෙන් සෑම වසරකම 97%ක් වන අතර හරිත තේ ප්‍රතිශතය 2%ක් පමණ හා ක්ෂණික තේ අපනයනය 1%ක් වශයෙන් පවතී.

කිලෝ ග්‍රෑම් මිලියන 20ක ප්‍රමාණාත්මක වෙනසක් සහිතව සමස්ත තේ අපනයනය 9%ක ඉහල නැගීමක් පෙන්නුම් කරන ලදී. අපනයන සහ ප්‍රති අපනයන වෙන් වෙන් වශයෙන් ප්‍රමාණයෙන් හා වටිනාකමෙන් වර්ධනයක් පෙන්නුම් කරන ලදීග තවදල අපනයන සහ ප්‍රති අපනයන ප්‍රමාණයෙන් පිළිවෙලින් 8%ක හා 10%ක ඉහල නැගීමක් වාර්තා කළ අතර වටිනාකම ද පිළිවෙලින් 14%කින් හා 25% කින් වැඩිවීමක් පෙන්නුම් කරන ලදී. කෙසේ වෙතත්, 2021 වසරේදි සමුච්චිත අපනයන ආදායම ඇමරිකානු ඩොලර් මිලියන 1,324ක් වූ අතර 2020 වසරේදි එය ඇමරිකානු ඩොලර් මිලියන 1,241ක් විය. එනම්, 7% ක ඉහල යාමකි.

## අගය එකතු කළ තේ අපනයන

තේ සඳහා වූ ගෝලීය රුචිකත්වය අගය එකතු කළ තේ කරා සීඝ්‍රයෙන් වෙනස් වෙමින් පවතින අතර ගෝලීය වශයෙන් ගත් කළ ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික වෙළඳපොළ තත්වය ආරක්ෂා කර ගැනීම උදෙසා එකී වෙනස්කම්වලට ශ්‍රී ලංකාව අනුගත විය යුතුය. අගය එකතු කළ තේ එනම් කි. ග්‍රෑම් 03 වඩා අඩු ඇසුරුම්, තේ මළු සහ ක්ෂණික තේ අපනයනය 2021 වසරේ සමස්ත තේ අපනයනයෙන් 39% ක් විය. එමගින් උපයාගත් ආදායම රු පියල් බිලියන 129 ක් වූ අතර එය සමස්ත අපනයන ආදායමෙන් 49% ක් විය.

වගුව 3.7: වාර්ෂික අගය එකතු කළ තේ අපනයනය - 2021

| අපනයන වර්ගය | | ප්‍රමාණය (කි.ග්‍රෑ.) | වටිනාකම (රු.) | FOB (රු/ කි.ග්‍රෑ.) |
|---|---|---|---|---|
| අපනයනය | කළු | 98,985,586 | 106,744,701,715 | 1,078.39 |
| | හරිත | 1,797,540 | 4,495,315,696 | 2,500.82 |
| | ක්ෂණික | 2,966,562 | 5,162,748,790 | 1,740.31 |
| උප එකතුව | | **103,749,688** | **116,402,766,201** | **1,121.96** |
| ප්‍රති අපනයනය | කළු | 5,731,109 | 7,280,838,549 | 1,270.41 |
| | හරිත | 1,859,203 | 4,984,184,575 | 2,680.82 |
| | ක්ෂණික | 61,766 | 83,935,613 | 1,358.94 |
| උප එකතුව | | **7,652,077** | **12,348,958,737** | **1,613.80** |
| එකතුව | | 111,401,765 | 128,751,724,938 | 1,155.74 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගුව

*පානය සඳහා සුදානම් කළ තේ අපනයන පිළිබඳ විස්තර රහිතව මෙම වගුව පිළියෙළ කරන ලදී. පානය සඳහා සුදානම් කළ තේ අපනයන අගය එකතු කළ අපනයන ලෙස සැලකේ.

ප්‍රස්තාරය 3.5: අගය එකතු කළ තේ අපනයනය සහ තොග තේ අපනයනය




මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගුව

අගය එකතු කළ තේ සඳහා FOB මිල තොග තේ මිලට වඩා වැඩිය. එබැවින් තොග තේ වලට වඩා අගය එකතු කළ තේ අපනයනය සඳහා වන ප්‍රවර්ධන කටයුතු ශ්‍රී ලංකා ආර්ථිකය සඳහා ධනාත්මක දායකත්වයක් ලබා දේ. සමාලෝචන වර්ෂය තුළ අගය එකතු කළ තේ හා තොග තේ යන දෙවර්ගයම සඳහා FOB මිලෙහි ඉහළ යාමක් පෙන්නුම් කරන ලදී. කිලෝග්‍රෑම් 3ක් දක්වා අපනයන භාණ්ඩ අගය එකතු කළ තේ වශයෙන් සලකා ඇත.

## ශ්‍රී ලංකාවෙන් තේ අපනයනය කරන ප්‍රධාන රටවල්

අතීතයේ දී එක්සත් රාජධානියල පකිස්ථානය හා ඊජිප්තුව තුළ ශ්‍රී ලංකා තේ සඳහා ශක්තිමත් වෙළඳපොලක් පැවතුන නමුත් වත්මනේ දී ශ්‍රී ලංකාව විසින් තේ අපනයනය කරන ප්‍රධාන රටවල් 25 අතර එකී රටවල් නොපවතී. සමස්ත තේ අපනයනයෙන් 14.8%ක් ආනයනය කරමින් ඉරාකය ශ්‍රී ලංකාවේ තේ සම්බන්ධයෙන් ප්‍රධාන අපනයනකරුවා බවට පත් විය. එනම්, 2020 වසර හා සැසඳීමේ දී 27%ක වර්ධනයකි.

2019 හා 2020 වර්ෂ තුළ ශ්‍රී ලංකා තේ අපනයනය කරන ප්‍රධාන රටක් වු තුර්කිය සමාලෝචිත වසර තුළ දී සමස්ත තේ අපනයනයෙන් 10%ක් ආනයනය කරමින් ශ්‍රී ලංකාවෙන් තේ ලබා ගන්නා දෙවන විශාලම ආනයනකරුවා බවට පත් විය.

2021 වසරේ දී 10%ක අපනයන කොටසක් සහිතව තෙවන අපනයන රට බවට රුසියාව පත් වු අතර එය 2020 වසර ට සාපේක්ෂව අපනයන ප්‍රමාණයේ 8%ක අඩුවීමක් පෙන්නුම් කරයි. සිරියාව සඳහා FOB මිලෙහි සාමාන්‍ය අගය 2021 වසරේ දී ඉහළම රටවල් දහය අතරින් ඉහළ මිලක් පෙන්නුම් කළ අතර එය කිලෝ ග්‍රෑමයකට රුපියල් 944ක් විය. ප්‍රධාන රටවල් දහය අතරින් ඉරාකය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ඉරානය, චීනය, ලිබියාව හා අසර්බයිජානය යන රටවල් විසින් ශ්‍රී ලංකා තේ ආනයන ප්‍රමාණය වැඩි කර ඇති අතර තුර්කිය, රුසියාව, චිලි හා සිරියාව විසින් 2020 වසරට සාපේක්ෂව 2021 වසර තුළ අඩු ප්‍රමාණයක් ආනයනය කර ඇත. කෙසේ වෙතත්, ඉහළම අපනයන රටවල් දහය (10), 2021 වසර තුළ සිලෝන් තේ අපනයනයෙන් 67%ක ප්‍රමාණයක් සඳහා දායක වී ඇත.

වගුව 3.8: ශ්‍රී ලංකාව තේ අපනයනය කරනු ලබන ප්‍රධාන රටවල් - 2021

| රට | 2021 | | | | 2020 | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ස්ථානය | ප්‍රමාණය කි.ග්‍රෑ | FOB රු/කි.ග්‍රෑම් | අපනයන කොටස (%) | ස්ථානය | ප්‍රමාණය කි.ග්‍රෑ | FOB රු/කි.ග්‍රෑම් | අපනයන කොටස (%) | Growth (%) |
| ඉරාකය | 1 | 42,455,312 | 642.78 | 14.85 | 2 | 33,377,320 | 575.54 | 12.57 | 27 |
| තුර්කිය | 2 | 29,745,684 | 858.71 | 10.41 | 1 | 38,866,312 | 796.55 | 14.64 | (23) |
| රුසියාව | 3 | 27,357,322 | 834.06 | 9.57 | 3 | 29,608,373 | 825.16 | 11.15 | (8) |
| එ.අ.එ.රාජ්‍ය | 4 | 23,147,842 | 891.15 | 8.1 | 9 | 8,670,346 | 804.95 | 3.26 | 167 |
| ඉරානය | 5 | 15,833,588 | 887.83 | 5.54 | 4 | 15,127,067 | 914.63 | 5.7 | 5 |
| චීනය | 6 | 14,221,526 | 847.79 | 4.97 | 5 | 14,123,418 | 754.71 | 5.32 | 1 |
| ලිබියාව | 7 | 12,338,991 | 739.58 | 4.32 | 10 | 7,806,247 | 692.2 | 2.94 | 58 |
| අසර්බයිජානය | 8 | 10,591,096 | 882.58 | 3.7 | 6 | 10,303,102 | 909.69 | 3.88 | 3 |
| චිලි | 9 | 8,834,919 | 809.2 | 3.09 | 8 | 9,419,055 | 714.04 | 3.55 | (6) |
| සිරියාව | 10 | 7,767,179 | 944.03 | 2.72 | 7 | 9,536,804 | 879.75 | 3.59 | (19) |
| ප්‍රධාන රටවල් 10 හි එකතුව | | 192,293,459 | 807.87 | 67.27 | | 176,838,044 | 768.87 | 66.6 | 9 |
| මුළු එකතුව | | 285,871,722 | 921.23 | 100 | | 265,569,374 | 866.7 | 100 | 8 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගුව

ශ්‍රී ලංකාවෙන් තේ අපනයනය කරන ප්‍රධාන රටවල් ලැයිස්තුවේ රුසියාවට තෙවෙනි තැන හිමිවී ඇත. එක්සත් අරාබි එමීර් රාජ්‍යය 8%ක අපනයන ප්‍රමාණයකින් දායක වෙමින් සිව්වන ස්ථානයේ රැඳී සිටීමට සමත්වී ඇත. කලාපයක් වශයෙන් මැද පෙරදිග ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන ප්‍රදේශය වේ. ඉහල තෙල් මිල හේතුවෙන් ඉල්ලුම විශාල වශයෙන් වැඩි වෙමින් පවතී. කෙසේ වෙතත්, සිරියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය හා ඉරානය විසින් සාමාන්‍ය FOB ඒකක මිල සම්බන්ධයෙන් සැලකිය යුතු ඉහළ FOB මිල ගණන් පවත්වා ගන්නා ලදී. එපමණක් නොව, සමස්ත අපනයන ආදායම 2020 ට සාපේක්ෂව 2021 දී ඉහල නැගීමක් පෙන්නුම් කරමින් රුපියල් බිලියන 263ක් ඉක්මවිය. කෙසේවෙතත්, අනෙකුත් කලාපවල තේ මළු භාවිත කිරීම හේතුවෙන් ශ්‍රී ලංකා තොග තේ අපනයනය මැද පෙරදිග දෙසට යොමු වී ඇත.

වගුව 3.9 ඇසුරුම් ක්‍රමය අනුව ප්‍රධාන රටවල් 20 සඳහා තේ අපනයන ප්‍රමාණයන් හා ශ්‍රේණිගත කිරීම

| රට | ප්‍රමාණය කි.ග්‍රෑ | | | | | | | | හිමි ස්ථානය | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මළු | තොග | ඇසුරුම් (>කි.ග්‍රෑ 3) | ඇසුරුම් (1-3 කි.ග්‍රෑ) | ඇසුරුම් (3-5 කි.ග්‍රෑ) | ඇසුරුම් (4-1 කි.ග්‍රෑ) | ඇසුරුම් (5-10 කි.ග්‍රෑ) | මුළු එකතුව | මළු | තොග | ඇසුරුම් (>කි.ග්‍රෑ 3) | ඇසුරුම් (1-3 කි.ග්‍රෑ) | ඇසුරුම් (3-5 කි.ග්‍රෑ) | ඇසුරුම් (4 -1 කි.ග්‍රෑ) | ඇසුරුම් (5-10 කි.ග්‍රෑ) |
| ඉරාකය | 182,415 | 5,278,815 | - | 356,468 | 2,171,485 | 18,663,487 | 15,802,642 | 42,455,312 | 14 | 8 | - | 2 | 3 | 1 | 1 |
| තුර්කිය | 275,390 | 7,470,649 | - | 732,382 | 8,107,738 | 10,130,078 | 3,029,447 | 29,745,684 | 11 | 7 | - | 1 | 1 | 3 | 4 |
| රුසියාව | 772,821 | 22,149,927 | 596 | 105 | 5,515 | 4,386,768 | 41,590 | 27,357,322 | 8 | 1 | 7 | 8 | 10 | 4 | 11 |
| එ.අ.එ.රාජ්‍ය | 529,301 | 16,178,220 | 26 | 22,359 | 267,540 | 2,222,823 | 3,927,573 | 23,147,842 | 9 | 2 | - | 6 | 4 | 9 | 3 |
| ඉරානය | 58,889 | 8,312,095 | - | 194,128 | 236,215 | 1,231,113 | 5,801,148 | 15,833,588 | 18 | 5 | 11 | 3 | 5 | 12 | 2 |
| චීනය | 343,797 | 12,140,258 | 192,400 | 71,930 | 545 | 240,382 | 1,232,215 | 14,221,526 | 10 | 3 | 1 | 4 | 11 | 17 | 5 |
| ලිබියාව | 56,687 | - | - | - | - | 12,282,304 | - | 12,338,991 | 19 | 20 | - | 9 | 13 | 2 | 18 |
| අසර්බයිජානය | 7,231 | 10,095,967 | - | - | 22,830 | 465,068 | - | 10,591,096 | 20 | 4 | - | - | - | 15 | 18 |
| චිලි | 1,093,655 | 7,521,395 | 882 | - | - | 194,207 | 24,780 | 8,834,919 | 5 | 6 | 6 | 0 | 13 | 18 | 12 |
| සිරියාව | 860,005 | 581,870 | - | 70,500 | 3,978,760 | 2,000,544 | 275,500 | 7,767,179 | 7 | 17 | - | - | - | 10 | 7 |
| ජපානය | 934,242 | 5,245,809 | 25 | 354 | 65,308 | 56,677 | 293,072 | 6,595,487 | 6 | 9 | 10 | 7 | 7 | 20 | 6 |
| සෞදි අරාබිය | 2,111,205 | 1,206,100 | 24,879 | - | 211,530 | 2,968,245 | 8,983 | 6,530,943 | 2 | 16 | 5 | - | 0 | 6 | 14 |
| ජර්මනිය | 202,199 | 4,332,534 | 48,000 | 3 | 40 | 1,816,241 | 3,780 | 6,402,796 | 13 | 10 | - | 0 | 12 | 11 | 17 |
| ඇ.එ.ජ. | 1,273,864 | 2,360,430 | 77,833 | 1,217 | 20,192 | 2,231,488 | 8,720 | 5,973,744 | 3 | 14 | 2 | - | 9 | 8 | 15 |
| ජෝර්දානය | 2,427,491 | 78,080 | - | - | - | 2,528,413 | 184,354 | 5,218,337 | 1 | 19 | 11 | 9 | 13 | 7 | 8 |
| තායිවානය | 72,948 | 4,298,197 | 43,710 | - | 243,013 | 131,436 | 98,418 | 4,887,722 | 17 | 11 | - | - | - | 19 | 9 |
| හොංකොං | 256,982 | 3,493,269 | - | 299,099 | 113,012 | 261,966 | 16,246 | 4,440,574 | 12 | 12 | 11 | 0 | 0 | 16 | 13 |
| යුක්රේනය | 153,055 | 3,154,706 | - | - | - | 900,369 | 68,400 | 4,276,530 | 15 | 13 | - | - | - | 13 | - |
| බෙල්ජියම | 118,492 | 214,955 | 293 | - | - | 3,198,792 | - | 3,532,532 | 16 | 18 | 8 | 0 | 0 | 5 | 0 |
| පෝලන්තය | 1,242,958 | 1,207,779 | - | - | - | 891,809 | 6,864 | 3,349,410 | 4 | 15 | - | - | 13 | 14 | 0 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගුව මූලාශ්‍රය: ශ්‍රී ලං

## කළු තේ අපනයනය

සමස්ත තේ අපනයනයෙන් 97% (කි.ග්‍රෑ.මී.278)ක ප්‍රමාණයක් කළු තේ අපනයනය කර ඇති අතර සමස්ත තේ අපනයන ආදායමෙන් 94% (රුපියල් බිලියන 248) ක් සඳහා දායකත්වය සපයා ඇත. ශ්‍රී ලංකාව කළු තේ අපනයනය කරන සියලු රටවල් අතුරින් ඉහළින්ම සිටින ප්‍රධාන රටවල් විස්ස මගින් 86%ක් ප්‍රමාණාත්මකව හා 83%ක් වටිනාකමෙන් දායක වී තිබේ. සිලෝන් තේ අපනයනවලින් 15%ක ප්‍රමාණයක් ආනයනය කරමින් 2021 වසර තුළ දී ශ්‍රී ලංකාවෙන් කළු තේ ආනයනය කරනු ලබන රටවල් අතරින් ඉරාකය පළමු ස්ථානයේ රැඳුන අතර 2020 වසර තුළ දී සිලෝන් තේ අපනයනවලින් 15%ක ප්‍රමාණයක් ආනයනය කරමින් ශ්‍රී ලංකාවෙන් කළු තේ වැඩියෙන්ම ආනයනය කළ රට බවට තුර්කිය පත් විය. කෙසේවෙතත්, 2013 වසර දක්වා රුසියාව ශ්‍රී ලාංකීය කළු තේ ආනයනය කරන ප්‍රධාන රට වශයෙන් පැවතුණි. 2014 වසරේදි තුර්කිය ශ්‍රී ලාංකීය කළු තේ ආනයනයේ ප්‍රමුඛ රට බවට පත්විය. නැවතත් රුසියාව විසින් ශ්‍රී ලාංකීය කළු තේ ආනයනයෙන් 12% කට දායක වෙමින් 2015 වසර තුළ ශ්‍රී ලංකා කළු තේ ආනයනයේ පළමු ස්ථානයට පැමිණ තිබේ.

වගුව 3.10: කළු තේ අපනයනය කරන ප්‍රධාන රටවල් 20 සහ වෙළඳපොළ කොටස් 2021 (ප්‍රති අපනයනය සමග)

| රට | ප්‍රමාණය (කි.ග්‍රෑම් මිලියන) | වටිනාකම (රු.බිලි) | FOB (රු / කි.ග්‍රෑම්) | ප්‍රමාණයේ කොටස (%) | වටිනාකමේ කොටස (%) | ප්‍රමාණයේ වර්ධනය (%) |
|---|---|---|---|---|---|---|
| ඉරාකය | 42.43 | 27.25 | 642.24 | 15.25 | 11.00 | 27 |
| තුර්කිය | 29.71 | 25.50 | 858.16 | 10.68 | 10.29 | (23) |
| රුසියාව | 26.80 | 21.93 | 818.55 | 9.63 | 8.85 | (8) |
| එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 22.71 | 20.22 | 890.00 | 8.16 | 8.16 | 167 |
| ඉරානය | 15.82 | 14.04 | 887.57 | 5.69 | 5.67 | 5 |
| චීනය | 13.93 | 11.58 | 831.33 | 5.01 | 4.67 | 2 |
| ලිබියාව | 12.13 | 8.93 | 736.33 | 4.36 | 3.61 | 60 |
| අසර්බයිජානය | 10.58 | 9.33 | 881.48 | 3.80 | 3.77 | 3 |
| චිලි | 8.74 | 6.94 | 793.95 | 3.14 | 2.80 | (7) |
| සිරියාව | 7.76 | 7.33 | 943.86 | 2.79 | 2.96 | (19) |
| ජපානය | 6.59 | 7.28 | 1,105.45 | 2.37 | 2.94 | 18 |
| සෞදි අරාබිය | 6.36 | 8.61 | 1,352.95 | 2.29 | 3.48 | (3) |
| ජර්මනිය | 6.28 | 6.35 | 1,011.01 | 2.26 | 2.56 | 1 |
| ඇමරිකා එක්සත් ජනපදය | 5.27 | 5.04 | 955.57 | 1.90 | 2.03 | 1 |
| ජෝර්දානය | 5.20 | 5.46 | 1,049.18 | 1.87 | 2.20 | 11 |
| තායිවානය | 4.74 | 3.75 | 791.27 | 1.70 | 1.51 | 8 |
| හොංකොං | 4.43 | 3.72 | 838.57 | 1.59 | 1.50 | 18 |
| යුක්රේනය | 3.90 | 3.67 | 941.23 | 1.40 | 1.48 | (6) |
| බෙල්ජියම | 3.52 | 2.82 | 801.44 | 1.27 | 1.14 | 58 |
| පෝලන්තය | 3.19 | 4.15 | 1,300.95 | 1.15 | 1.67 | 12 |
| ප්‍රධාන රටවල් 20හි එකතුව | 240.10 | 203.89 | 849.16 | 86.29 | 82.31 | 9 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගුව

කළු තේ අපනයනය කරන ප්‍රධාන රටවල් පහ විසින් තම අපනයන ප්‍රමාණයන්ගේ කොටස් 6% - 15% අතර පවත්වා ගනු ලබයි.

## හරිත තේ අපනයනය

2021 වසරේ දි සමස්ත තේ අපනයනයෙන් 2% (කිලෝ ග්‍රෑම් මිලියන 4.6) ක් සහ ආදායමෙන් 4%ක් (රුපියල් බිලියන 10.3ක්) සඳහා හරිත තේ මගින් දායක වී තිබේ. ශ්‍රී ලංකාවෙන් හරිත තේ අපනයනය කරන සියලු රටවල් අතුරින් ඉහළින්ම සිටින ප්‍රධාන රටවල් විස්ස මගින් ප්‍රමාණය අනුව 82% ක් හා වටිනාකම අනුව 80%ක් සඳහා දායක වේ. ශ්‍රී ලාංකීය හරිත තේ ආනයනය කරන ප්‍රධාන රටවල් අතුරින් ඇමරිකා එක්සත් ජනපදය සැලකියයුතු ප්‍රමාණයක් එනම් කි.ග්‍රෑම් මිලියන 0.6ක් සඳහා දායක වූ අතර එක්සත් රාජධානිය ඉහල FOB මිලක් 2021 වසරේ දී වාර්තා කර ඇත. අනෙක් අතට, ශ්‍රී ලංකාවෙන් තේ අපනයනය කරනු ලබන ප්‍රධාන පෙළේ සියලු රටවල් 20 ම පාහේ ඉහල FOB මිලක් වාර්තා කරන ලද අතර ලිබියාව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය තුළ තරමක් පහල මිල ගණන් වාර්තා විය. කෙසේ වෙතත්, පසුගිය වසර හා සැසඳීමේ දී, ශ්‍රී ලංකා හරිත තේ අපනයනය කරනු ලබන ප්‍රධාන රටවල් 20 හි අපනයනය අගයන් ඉහල යාමක් පෙන්නුම් කරන ලදී.

වගුව 3.11: හරිත තේ අපනයනය කරන ප්‍රධාන රටවල් විස්ස - 2021

| රට | ප්‍රමාණය (කි.ග්‍රෑ) | වටිනාකම (රු.මිලි) | FOB (රු./කි.ග්‍රෑ) | ප්‍රමාණයේ කොටස (%) | වටිනාකමේ කොටස (%) | ප්‍රමාණයේ වර්ධනය (%) (2020 ට සාපේක්ෂව) |
|---|---|---|---|---|---|---|
| ඇමරිකා එක්සත් ජනපදය | 623,105 | 2,078,665,214 | 3,335.98 | 13.54 | 20.00 | 29 |
| රුසියාව | 561,621 | 883,419,653 | 1,572.98 | 12.21 | 8.50 | (3) |
| එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 432,718 | 411,425,163 | 950.79 | 9.41 | 3.96 | 159 |
| යුක්රේනය | 379,901 | 529,829,404 | 1,394.65 | 8.26 | 5.10 | (8) |
| නෙදර්ලන්තය (ඕලන්දය) | 263,770 | 880,666,327 | 3,338.77 | 5.73 | 8.48 | (9) |
| ලිබියාව | 209,858 | 194,592,402 | 927.26 | 4.56 | 1.87 | (9) |
| පෝලන්තය | 162,177 | 396,484,899 | 2,444.77 | 3.52 | 3.82 | 21 |
| සෞදි අරාබිය | 142,668 | 298,234,080 | 2,090.41 | 3.10 | 2.87 | (33) |
| ඕස්ට්‍රේලියාව | 127,662 | 408,681,869 | 3,201.27 | 2.77 | 3.93 | 44 |
| ප්‍රංශය | 120,198 | 460,634,608 | 3,832.30 | 2.61 | 4.43 | 19 |
| තායිවානය | 103,077 | 121,568,195 | 1,179.39 | 2.24 | 1.17 | 13 |
| චීනය | 100,184 | 243,227,627 | 2,427.80 | 2.18 | 2.34 | 96 |
| චිලි | 94,979 | 209,699,431 | 2,207.85 | 2.06 | 2.02 | 59 |
| නයිජීරියාව | 81,243 | 232,424,042 | 2,860.83 | 1.77 | 2.24 | (22) |
| ජර්මනිය | 76,977 | 130,512,820 | 1,695.47 | 1.67 | 1.26 | 12 |
| කැනඩාව | 76,046 | 177,312,243 | 2,331.66 | 1.65 | 1.71 | 34 |
| උස්බෙකිස්ථානය | 69,941 | 97,040,989 | 1,387.47 | 1.52 | 0.93 | 50 |
| එක්සත් රාජධානිය | 68,859 | 337,694,010 | 4,904.16 | 1.50 | 3.25 | (19) |
| ඊජිප්තුව | 51,851 | 57,244,852 | 1,104.03 | 1.13 | 0.55 | 28 |
| චෙක් ජනරජය | 47,389 | 164,080,027 | 3,462.39 | 1.03 | 1.58 | 13 |
| ප්‍රධාන රටවල් 20හි එකතුව | 3,794,224 | 8,313,437,855 | 2,191.08 | 82.47 | 80.01 | 13 |

මූලාශ්‍රය: වරාය දත්ත

හරිත තේ අපනයනය කරනු ලබන ප්‍රධාන රටවල් 05 හි ප්‍රමාණ කොටස පහත ප්‍රස්තාරයෙන් දැක්වේ.

## ක්ෂණික තේ අපනයනය

ශ්‍රී ලංකාවෙන් ක්ෂණික තේ ආනයනය කරනු ලබන ප්‍රමුඛ රටක් ලෙස අයර්ලන්තය ක්ෂණික තේ කිලෝ ග්‍රෑම් මිලියන 2.4 (80%)ක ප්‍රමාණයක් ආනයනය කරමින් මහත් කාර්යභාරයක් ඉටු කරයි. එනම් ක්ෂණික තේ වලින් 80% කි. ශ්‍රී ලංකාවේ ක්ෂණික තේ අපනයනය කරනු ලබන ඊළඟ ප්‍රමුඛ රටවල් වන්නේ පිළිවෙලින් චීනය, ඇමරිකා එක්සත් ජනපදය, තායිලන්තය හා ජර්මනිය යි. සමාලෝචන වර්ෂය තුළ අපනයනය කළ සමස්ත ක්ෂණික තේ ප්‍රමාණය කිලෝ ග්‍රෑම් මිලියන 3ක් වන අතර වටිනාකම රුපියල් බිලියන 5.2ක් වේ.

## ආර්.ටී.ඩී (පානය සඳහා පිළියෙල කළ) තේ අපනයනය

2021 වර්ෂය තුළදී, පානය සඳහා පිළියෙළ කළ සමස්ථ තේ ලිටර් 898ක් අපනයනයෙන් රුපියල් මිලියන 0.5ක අපනයන ආදායමක් ලබා ගත හැකි විය. ශ්‍රී ලංකාවෙන් ලිටර් 852ක් ආනයනය කරමින් මාලදිවයින විසින් පානය සඳහා පිළියෙළ කළ තේ වෙළඳපොලේ වැදගත් භූමිකාවක් ඉටු කරන ලද අතර එමගින් රටට රුපියල් මිලියන 0.48ක ආදායමක් ලැබිණි.. මැලේසියාව සහ ඉන්දියාව යනු ලංකාවේ පානය සඳහා පිළියෙළ කළ තේ අපනයන වෙළඳපොලේ සිටින අනෙකුත් ප්‍රධාන රටවල් ය. කෙසේ වෙතත්, පසුගිය වසර දෙක තුළ, ශ්‍රී ලංකා පානය සඳහා පිළියෙළ කළ තේ වෙළඳපොළ තුළ ක්‍රමික පහත වැටීමක් පවතින බව නිරීක්ෂණය විය.

# 3.5.ගෝලීය තේ කර්මාන්තයේ පසුබිම

තේ යනු ජලයට පමණක් දෙවෙනි වන ලෝකයේ නිතරම පරිභෝජනය කරන උණුසුම් පානවලින් එකකි. ස්වාභාවික පානයක් ලෙස එය ලෝකයේ සියලුම ජනවාර්ගික කණ්ඩායම් අතර සහ සෑම වයස් කාණ්ඩයකම පාහේ ජනප්‍රියය. ශ්‍රී ලංකාවෙන් කරනු ලබන අපනයන අතර, විශේෂයෙන් තේ මගින් ජාතික ආර්ථිකය හා සමාජ සංවර්ධනය සඳහා ඉතිහාසයේ පටන් වැදගත් කාර්යභාරයක් ඉටු කර ඇත. ශ්‍රී ලංකාවේ අපනයන ඉපැයීම් සඳහා සැලකිය යුතු දායකත්වයක් වෙළඳ භාණ්ඩ පදනම් කරගත් නිෂ්පාදන මගින් සපයන අතර රටේ සේවා යෝජකයන් වැඩි ප්‍රමාණයක් සිටින කණ්ඩායමට තේ අංශයද ඇතුළත්ය.

තේ නිෂ්පාදනය කරනු ලබන රටවල් අතර ප්‍රධාන නිෂ්පාදකයින් වන්නේ චීනය, ඉන්දියාව, කෙන්යාව, තුර්කිය හා ශ්‍රී ලංකාව යි. සමාලෝචිත වසර තුළ සිව්වන ස්ථානයේ රැඳී සිටීමට ශ්‍රී ලංකාව අපොහොසත් වූ අතර තුර්කිය ශ්‍රී ලංකාව අභිබවා සිව්වන ස්ථානයට පැමිණ තිබේ. එමෙන්ම, වියට්නාමය ප්‍රධාන නිෂ්පාදන රටවල් ලයිස්තුවේ පස්වන ස්ථානයට පත්විය. මෙම රටවල් පහ ලෝක නිෂ්පාදනයෙන් 85%ක් සහ ගෝලීය අපනයනයෙන් 80%ක් සඳහා දායක වේ. ලෝක තේ වගාව ඉහළ නැංවීම සඳහා චීනය ප්‍රමුඛ ලෙස වැදගත් වූ අතර අප්‍රිකානු මහාද්වීපය විශේෂයෙන් කෙන්යාව ද විශාල අස්වැන්නක් වාර්තා කළේය. කෙසේ වෙතත්, ගෝලීය තේ කර්මාන්තය තුළ ශ්‍රී ලංකාවේ පසුබිම සැලකිල්ලට ගනිමින්, 2020 වසරේ කාර්ය සාධනය අනෙකුත් තේ නිෂ්පාදන සාමාජිකයින්ට සාපේක්ෂව අපනයන, නිෂ්පාදනය, වෙන්දේසි මිල සහ ආදායම් කාර්ය සාධනය (අපනයන) පිළිබඳ ප්‍රධාන කාර්ය සාධන දර්ශක සැලකිල්ලට ගැනීමේ දී මධ්‍යස්ථ මට්ටමක පවතී.

## ගෝලීය තේ වගාව

2021 වසර අවසානයේදී ලෝකයේ තේ වගාව සහිත මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර මිලියන 5 ඉක්මවනු ඇතැයි ගණන් බලා තිබේ.

වගුව 3.12: වැඩිම තේ වගා බිම් පිළිබඳ විස්තර (හෙක්)

| රට | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|---|
| චීනය | 2,810,000 | 2,920,000 | 3,059,000 | 2,985,800 | 3,065,500 | 3,165,130 |
| ඉන්දියාව | 566,660 | 577,480 | 590,000 | 636,560 | 636,560 | 636,560 |
| ශ්‍රී ලංකාව* | 188,000 | 202,839 | 202,540 | 202,540 | 202,540 | 202,540 |
| කෙන්යාව | 209,426 | 218,538 | 232,742 | 234,300 | 269,430 | 269,430 |
| වියට්නාමය | 125,000 | 134,000 | 134,000 | 130,000 | 130,000 | 130,000 |
| ඉන්දුනීසියාව | 119,361 | 118,100 | 116,500 | 115,300 | 114,300 | 113,500 |
| මියන්මාරය | 79,000 | 80,000 | 80,000 | 81,000 | 81,400 | 81,400 |
| තුර්කිය | 77,500 | 77,000 | 77,000 | 83,000 | 83,000 | 83,000 |
| බංගලිදේශය | 53,500 | 59,000 | 59,000 | 59,300 | 61,000 | 65,429 |
| ජපානය | 39,300 | 43,100 | 42,400 | 41,600 | 40,600 | 39,100 |

මූලාශ්‍රය: ජාත්‍යන්තර තේ කමිටු වාර්ෂික සංඛ්‍යාලේඛන ප්‍රකාශන - 2021

*වගා කර ඇති බවට ලියාපදිංචි ඇස්තමේන්තුගත ප්‍රදේශ

ජාත්‍යන්තර තේ කමිටුවට අනුව වැඩිම තේ වගා ව්‍යාප්තියක් දකින්නට ලැබෙන්නේ චීනයේ (62.08%) වන අතර, වාර්ෂිකව ඔවුන් තම තේ වගාව සීඝ්‍රයෙන් ව්‍යාප්ත කරමින් සිටී. කෙන්යාව ද 2010 සිට 2020 දක්වා කාලය තුළ වැඩි බිම් ප්‍රමාණයක තේ වගා කරන ලදී. තේ වගා කරනු ලබන ප්‍රමුඛ රටවල් 10 ලොව සමස්ත තේ වගා ව්‍යාප්තයෙන් 94%ක ප්‍රමාණයකට හිමිකම් කියයි.

## ගෝලීය තේ පරිභෝජනය

2018-2020 තෙවසරක කාල වකවානුව තුළ වාර්ෂික තේ පරිභෝජනය සහ ත්‍රෛවාර්ෂික සාමාන්‍ය ඒක පුද්ගල තේ පරිභෝජනය අනුව වාර්ෂික තේ පරිභෝජනය ඉහළින්ම පවතින්නේ චීනයේය. එය කි.ග්‍රෑ. මිලියන 2289ක් ලෙස වාර්තාවී ඇති නමුත් ඒක පුද්ගල තේ පරිභෝජනය කිලෝ ග්‍රෑම් 1.64ක් ලෙස වාර්තා වී ඇත. වාර්ෂික තේ පරිභෝජනය කි.ග්‍රෑ.මිලියන 263.27ක් වශයෙන් පවතින තුර්කිය ඉහළම ඒක පුද්ගල තේ පරිභෝජනය වන කි.ග්‍රෑ. 3.2ක ප්‍රමාණය වාර්තා කරන ලදී. ලිබියාව ද කිලෝග්‍රෑම් 2.64ක් ලෙසට ඉහළ මට්ටමේ ඒක පුද්ගල පරිභෝජනයක් පෙන්නුම් කරයි.

වගුව 3.13: රටවල් අනුව තේ පරිභෝජනය පිළිබඳ සංඛ්‍යාලේඛන ( එකතුව: කිලෝ ග්‍රෑම් මිලියන / ඒක පුද්ගල: කිලෝ ග්‍රෑම් )

| රට | 2016-18 | | 2017-19 | | 2018-20 | |
|---|---|---|---|---|---|---|
| | එකතුව | ඒක පුද්ගල | එකතුව | ඒක පුද්ගල | එකතුව | ඒක පුද්ගල |
| ලිබියාව | 17.07 | 2.80 | 17.83 | 3.02 | 15.33 | 2.64 |
| ඇෆ්ගනිස්ථානය | 38.77 | 1.37 | 30.77 | 1.02 | 27.87 | 0.91 |
| තුර්කිය | 251.00 | 3.09 | 252.30 | 3.04 | 263.27 | 3.2 |
| එක්සත් රාජධානිය | 107.81 | 1.62 | 106.77 | 1.59 | 107.6 | 1.61 |
| මොරොක්කෝව | 70.95 | 2.04 | 73.05 | 2.07 | 74.23 | 2.09 |
| අයර්ලන්ත ජනරජය | 8.66 | 1.79 | 9.76 | 2.00 | 10.38 | 2.1 |
| තායිවානය | 36.14 | 1.29 | 36.67 | 1.31 | 36.55 | 1.3 |
| කටාර් | 4.00 | 1.45 | 4.19 | 1.51 | 4.28 | 1.53 |
| ශ්‍රී ලංකාව | 28.96 | 1.35 | 29.16 | 1.35 | 29.53 | 1.36 |
| හොංකොං | 11.26 | 1.52 | 11.85 | 1.59 | 12.37 | 1.65 |
| චිලි. | 20.66 | 1.11 | 20.25 | 1.09 | 21.45 | 1.12 |
| සිරියාව | 11.10 | 0.65 | 10.70 | 0.60 | 9.85 | 0.64 |
| ඊජිප්තුව | 93.02 | 0.96 | 99.86 | 1.00 | 98.85 | 1 |
| ඉරාකය | 42.30 | 1.12 | 43.50 | 1.13 | 43.23 | 1.11 |
| ඉරානය | 76.83 | 0.94 | 81.87 | 1.00 | 78.23 | 0.94 |
| චීනය | 2,050.33 | 1.48 | 2,152.67 | 1.55 | 2289 | 1.64 |
| ඉන්දියාව | 1,036.00 | 0.82 | 1,083.33 | 0.84 | 1091 | 0.83 |
| පොදු රාජ්‍ය මණ්ඩලීය ස්වාධීන රාජ්‍ය (CIS) | 248.90 | 0.85 | 245.33 | 0.83 | 239.23 | 0.82 |
| පාකිස්ථානය | 180.18 | 0.85 | 190.81 | 0.89 | 216.34 | 1.01 |
| ඇ.එ.ජ. | 125.61 | 0.39 | 120.96 | 0.37 | 114.09 | 0.35 |
| ජපානය | 103.87 | 0.82 | 104.21 | 0.82 | 100.05 | 0.79 |
| ඉන්දුනීසියාව | 94.00 | 0.36 | 94.33 | 0.35 | 95.33 | 0.36 |
| බංගලිදේශය | 82.33 | 0.51 | 82.83 | 0.50 | 85.17 | 0.51 |
| පෝලන්තය | 36.59 | 0.96 | 37.37 | 0.98 | 38.78 | 1.02 |
| ජර්මනිය | 29.69 | 0.36 | 28.07 | 0.34 | 24.93 | 0.3 |

මූලාශ්‍රය: ජාත්‍යන්තර තේ කමිටු වාර්ෂික සංඛ්‍යාලේඛන ප්‍රකාශන - 2021

## ගෝලීය තේ නිෂ්පාදනය

2021 වසරේ දී ගෝලීය තේ නිෂ්පාදනය කි.ග්‍රෑම් බිලියන 6.5ක් වූ අතර 2020 වසර හා සැසඳීමේදී එය 3%ක වර්ධනයකිග 2021 වසර තුළ දී, චීනය, ඉන්දියාව, කෙන්යාව, ශ්‍රී ලංකාව, තුර්කිය, වියට්නාමය සහ ඉන්දුනීසියාව මගින් ගෝලීය තේ නිෂ්පාදනයෙන් 91% ක් පමණ නිෂ්පාදනය කර ඇත. ඉන්දියාව සහ චීනය තවමත් විශාලතම තේ නිෂ්පාදකයන් වන නමුත් මෙම රටවල් දෙකෙහි තේ පරිභෝජනය සැලකියයුතු අන්දමින් ඉහල මට්ටමක පවතින හෙයින්, ලොව විශාලතම තේ අපනයනකරු බවට කෙන්යාව පත්ව ඇත.

2021 වසර තුළ දී සිලෝන් තේ නිෂ්පාදනයේ ඉහල නැගීමක් සහිතව ශ්‍රී ලංකාව ගෝලීය නිෂ්පාදක ලයිස්තුව තුළ ලෝකයේ සිව්වන විශාලතම තේ නිෂ්පාදකයා බවට පත්වන අතරතුර තුර්කිය සිව්වන ස්ථානයට පැමිණ තිබේ. කෙසේ වෙතත්, 2021වසර තුළ ගෝලීය තේ නිෂ්පාදනයෙන් 5%ක කොටසක් සඳහා ශ්‍රී ලංකාව දායක වී තිබේ.

ලෝක තේ නිෂ්පාදනයෙන් 48%ක කොටසකට හිමිකම් කියමින් කි.ග්‍රෑ. මිලියන 3,120 ක් නිපදවමින් චීනය ඉහළ ම ස්ථානයේ රැඳී සිටින අතර ලෝක තේ නිෂ්පාදනයෙන් 21%ක කොටසකට හිමිකම් කියමින් ඉන්දියාව 2021 වසරේ දී කි.ග්‍රෑ. මිලියන 1,329 ක වාර්ෂික නිෂ්පාදනයක් වාර්තා කරමින් දෙවැනි ස්ථානයෙහි පසුවෙයි. කිලෝ ග්‍රෑම් මිලියන 533ක් නිෂ්පාදනය කරමින් හා 8%ක කොටසක් හිමිකර ගනිමින් කෙන්යාව තුන්වන ස්ථානයට පත්ව ඇත. ලෝක තේ නිෂ්පාදනයේ සිව්වන දායකයා වශයෙන් තුර්කිය 2021 වසරේ දී 4%ක කොටසකට හිමිකම් කියමින් තේ කිලෝ ග්‍රෑම් මිලියන 280ක් නිෂ්පාදනය කර ඇත.

ප්‍රස්තාරය 3.6: ලෝක තේ නිෂ්පාදන සංඛ්‍යාදත්ත




මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගුව

## ගෝලීය තේ අලෙවිය

2021 වසරේ දී කොළඹ තේ වෙන්දේසිය මගින් කි.ග්‍රෑ. 01 ක් සඳහා සාමාන්‍ය මිල ඇ.ඩො. 3.09ක් වශයෙන් කි.ග්‍රෑ. මිලියන 296ක් වෙන්දේසි කර ඇත. කෙසේ නමුත්, 2021 වසර තුළ දී මුම්බාසා වෙන්දේසියේ ද කි.ග්‍රෑ. මිලියන 500කට වැඩි ප්‍රමාණයක් හා කල්කටා වෙන්දේසියේ දී කි.ග්‍රෑ. මිලියන 169ක ප්‍රමාණයක් වෙන්දේසි කර ඇත. ලෝකයේ ප්‍රධාන වෙන්දේසි මධ්‍යස්ථාන සැලකීමේ දී, පසුගිය වසර කිහිපය තුළ කොළඹ වෙන්දේසිය මගින් ඉහල සාමාන්‍ය මිලක් පවත්වා ගෙන ගිය බව පැහැදිලිව පෙනෙන කරුණ කි.

වගුව 3.14: ප්‍රධාන තේ වෙන්දේසි සංඛ්‍යාලේඛන (ප්‍රමාණය - කි.ග්‍රෑ. මිලියන / සාමාන්‍ය ඒකක මිල ඇ.ඩො./කි.ග්‍රෑ.)

| වෙන්දේසි මධ්‍යස්ථානය | 2018 | | 2019 | | 2020 | | 2021 | |
|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය | මිල | ප්‍රමාණය | මිල | ප්‍රමාණය | මිල | ප්‍රමාණය | මිල |
| චිතගොං | 79 | 3.12 | 85 | 2.31 | 82.99 | 2.05 | 88 | 2.32 |
| කොචින් | 48 | 1.81 | 42 | 1.66 | 41.52 | 1.92 | 48 | 1.92 |
| කොළඹ | 288 | 3.60 | 298 | 3.07 | 268.24 | 3.39 | 296 | 3.09 |
| ගුවාහාත | 177 | 2.13 | 150 | 2.09 | 162.52 | 2.69 | 155 | 2.49 |
| ජකර්තා | - | - | - | - | - | - | - | - |
| කල්කටා | 159 | 2.46 | 168 | 2.43 | 132.60 | 2.91 | 169 | 2.86 |
| ලිම්බෙ | 9 | 1.84 | 9 | 1.46 | 5.98 | 1.44 | 13 | 1.38 |
| මොම්බාසා | 458 | 2.43 | 454 | 2.04 | 516.80 | 1.93 | 504 | 1.97 |

මූලාශ්‍රය: ජාත්‍යන්තර තේ කමිටුවේ වෙබ් අඩවිය

2021 වසර තුළ කොළඹ වෙන්දේසි මධ්‍යස්ථානය තුළ කිලෝ ග්‍රෑමයක සාමාන්‍ය මිල ඇමරිකානු ඩොලර් 3 ඉක්මවූ අතර පසුගිය වසර කිහිපය තුළ දී තේ කිලෝ ග්‍රෑමයක මිල ඇමරිකානු ඩොලර් 3 ඉක්මවා පවත්වා ගැනීමට හැකි විය. සමාලෝචන කාල වකවානුව තුළදී චිතගොන්, කල්කටා සහ ගුවහටි වෙන්දේසිවල තේ කි.ග්‍රෑ. 01 ක මිල ඇ.ඩො. 2ක් ඉක්මවිය. කල්කටා දෙවැනි ඉහළ සාමාන්‍ය වෙන්දේසි මිල වාර්තා කළ අතර ගුවහටි තුන්වෙනි තැනට පත්විය.

# ගෝලීය තේ අපනයනය

ප්‍රස්තාරය 3.7: ප්‍රධාන තේ අපනයනකරුවන්




මූලාශ්‍රය: අතිරේකය: ජාත්‍යන්තර තේ කමිටු වාර්ෂික සංඛ්‍යාලේඛන ප්‍රකාශන - 2021

සැගයුග ශ්‍රී ලංකාවට අදාළ සංඛ්‍යා ප්‍රති අපනයනයන් ඇතුළත් නොකර දක්වා තිබේ.

පසුගිය වසර හා සැසඳීමේදී 2021 වසර තුළ ගෝලීය තේ අපනයනය කි.ග්‍රෑ. මිලියන 49 (3%) කින් අඩු වුණි. පසුගිය වසර හා සැසඳීමේදී චීනය හා වියට්නාමය සිය අපනයන ප්‍රමාණයන් පිළිවෙලින් 7% සහ 2%ක ප්‍රමාණයෙන් අඩුවීමක් පෙන්නුම් කරයි. 2020 වර්ෂයට සාපේක්ෂව කෙන්යාව විසින් 7%ක වර්ධනයක් සහිතව අපනයන ප්‍රමාණයන්ගේ වැඩි වීමක් පෙන්නුම් කරන ලදී. විශාලතම තේ අපනයන කරුවන් තිදෙනා වන කෙන්යාව, චීනය සහ ශ්‍රී ලංකාව ගෝලීය තේ අපනයනයෙන් 64% කට වඩා වැඩි කොටසකට හිමිකම් කියා ඇත.

2021 වසරේ ප්‍රමුඛ පෙළේ තේ අපනයනකරුවන් සහ ඔවුන්ගේ අපනයන ආදායම් පහත දැක්වේ. එයට අනුව, තේ අපනයන මගින් වැඩිම ආදායමක් උපයාගන ලැබුයේ චීනය විසිනි. කෙන්යාව තෙවන විශාලම තේ අපනයන අදායම් උපයන්නා බවට පත් විය. දෙවැනි තැනට වැඩිම අපනයන ආදායම් ලබන රට වශයෙන් ශ්‍රී ලංකාවට තම ශ්‍රී ලංකා තේ අපනයනය මගින් ඇ.ඩො. බිලියන 1.2ක කර්මාන්ත තත්වයක් පවත්වා ගැනීමට හැකිවිය.

ප්‍රස්තාරය 3.8: ඉහළම අපනයන ආදායම් මූලාශ්‍රය:




ජාත්‍යන්තර තේ කමිටු වාර්ෂික සංඛ්‍යාලේඛන ප්‍රකාශන - 2021

# 4. තිරසාර සංවර්ධන ඉලක්ක වෙත යොමු වීම




තිරසාර සංවර්ධන ඉලක්ක යනු වසර 2030 වන විට මිනිසුන්ට සමෘද්ධිමත්, සමාන, සාධාරණ සහ සුරක්ෂිත ලෝකයක් සහ සියලු ආකාරයේ දරිද්‍රතාවය අවසන් කිරීම සඳහා වූ ප්‍රබල විශ්වීය එකගතාවයකි.

අපගේ ලෝකය පරිවර්තනය කිරීමේ අංගයක් වශයෙන් තිරසාර සංවර්ධන අරමුණු 17 සහ ඉලක්ක 169; තිරසාර සංවර්ධනය සඳහා වූ 2030 න්‍යාය පත්‍රය, 2015 සැප්තැම්බර් මස පැවති ඓතිහාසික එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සමුළුවේදී සාමාජික රටවල් 193ක් විසින් සම්මත කරන ලද අතර, එය 2016 ජනවාරි 1 දින සිට බලාත්මක විය.

තිරසාර සංවර්ධන අරමුණු සකස්කර ඇත්තේ පෙර නොවූ විරූ උපදේශන ක්‍රියාවලියක් මගින් ජාතික ආණ්ඩු සහ ලොව පුරා වාසය කරන මිලියන සංඛ්‍යාත පුරවැසියන් සාකච්ඡා කිරීමට සහ බලාපොරොත්තු සහගත න්‍යාය පත්‍රය අනුගමනය කිරීම සඳහා එක් රොක් කරමිනි.

ස්ථාපිත ඉලක්ක 17න් ශ්‍රී ලංකා තේ මණ්ඩල සන්දර්භය තුළ තේ කර්මාන්තයට අදාළ වන්නේ ඉලක්ක කිහිපයක් පමණි. තේ කර්මාන්තයේ තිරසාර බව සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ සියලුම පාර්ශ්වකරුවන් දරන උත්සාහයන් එක් එක් ඉලක්ක යටතේ කෙටියෙන් විස්තර කරන ලදී.




ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් පළමු ඉලක්කයට අදාළ ව වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කරනු ලබයි.

- තත්ත්ව ප්‍රමිතීන් ඉහළ නැංවීම සඳහා තේ වගාකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- දැනට තේ කර්මාන්ත ශාලා 585ක් පමණ සහ කුඩා තේ වතු හිමියන් 485,000ක් පමණ, RPC වතු කම්කරුවන්, ලියාපදිංචි නිෂ්පාදකයින් හරහා අපනයන FOB මිල පහත හෙලීම, තේ දළු ප්‍රමිතිය සහතික කිරීම සහ කුඩා වතු හිමියන් සඳහා සාධාරණ මිලක් ගෙවීම සඳහා නිරන්තර අධීක්ෂණ සහ නියාමන යාන්ත්‍රණයක් පවත්වා ගැනීම.

2020-21 කාලය තුළ ශ්‍රී ලංකා තේ කර්මාන්තය මනා ප්‍රගතියක් අත්කරගෙන ඇති අතර 2019 වසරට සාපේක්ෂව ඉහළ කාර්ය සාධනයක් ලබාගෙන ඇති අතර ඒ අනුව තේ අපනයනයෙන් ලැබෙන ආදායම කුඩා තේ වතු හිමියන් වෙතට ගලා යමින් තිබේ.




ශ්‍රී ලංකා තේ මණ්ඩලය කුසගින්න තුරන්කිරීමට අදාළව ඒ යටතේ ඇති උප අංක 2.4 සහ 2.5 ට අනුකූල වැඩසටහන් කිහිපයක් ක්‍රියාවට නංවමින් දායකවේ. ගුණාත්මක තේ පැළ ලබාගැනීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා ආදර්ශ තේ තවාන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද අතර 2021 වසර අවසානයේ තේ පැළ මිලියන 8.5 ක් කරමින් තේ

- තවාන් 113ක් ස්ථාපිතකර රුපියල් මිලියන 55. 78 ක් ගෙවා ඇත.
- ජපානයේ (MCPA සහ Diuron), UK (Diuron), S. කොරියාවේ (2. 6 DIPIN) ජර්මනියේ (Trimethy Sulforium), Taiwan (Glyphosate) MRL ගැටලු හැසිරවීම.

අපනයනය කරන තේවල ඩයුරොන් හඳුනාගැනීම ප්‍රමාණය අඩුවීම (තේ ආනයනකරුවන්ගේ පැමිණිලි අඩුව ඇත.)




- කොවිඩ් 19 වසංගත තත්ත්වයන් තුළ සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුගමනය කරමින් තේ නිෂ්පාදන ක්‍රියාවලිය බාධාවකින් තොරව කරගෙන යාමට ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් තේ කර්මාන්ත ශාලා සහ වතු කම්කරුවන්ට අවශ්‍ය මාර්ගෝපදේශ සහ උපදෙස් ලබා දෙන ලදී.
- ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කාර්ය මණ්ඩලය සඳහා කොවිඩ් 19 වසංගත කාලසීමාව තුළ සිංහ ලාංඡනය සහිත සායම් කළ මුහුණු ආවරණ ප්‍රවර්ධන වැඩසටහන් තුළින් බෙදා දෙන ලදී.




- අදාළ අංශ ප්‍රධානීන්ගේ මගපෙන්වීම ඇතිව ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සංවිධානය කරන ලද පුහුණු වැඩසටහන් සඳහා සේවකයන් 72 දෙනෙකු සහභාගී විය.
- සිංහ ලාංඡනය සහිත ව ප්‍රවර්ධන වැඩසටහන් මගින් කොවිඩ් 19 වසංගත කාල සීමාව තුළ වගාකරුවන්, අලෙවිකරුවන්ගේ දැනුවත්භාවය වැඩි කිරීම.

**5 ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය**

- ශ්‍රී ලංකා තේ මණ්ඩලය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත කිසිදු පක්ෂග්‍රාහිත්වයක් නොමැති අතර ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව සියලුම ක්‍රියාකාරකම් සැකසීම සඳහා සියලුම පාර්ශවකරුවන් දිරිමත් කරනු ලැබේ.

**7 දැරිය හැකි පිවිතුරු බලශක්තිය**

- 2021 දී ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සූර්ය බලශක්ති සහනාධාර යෝජනා ක්‍රමය හඳුන්වා දුන් අතර, එම වැඩසටහන යටතේ හරිත බලශක්ති සංකල්පය අනුව තේ කර්මාන්ත ශාලා 156ක සහ අපනයන සමාගම්වල සූර්ය බලශක්ති ස්ථාපනය කිරීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය රුපියල් මිලියන 80ක පොලී සහනාධාරයක් වෙන් කරන ලදී.

**8 සුනිසි මෙහෙවර සහ ආර්ථික වර්ධනය**

- 2020 වසර සඳහා NCE අපනයනකරුවන්ගේ සම්මාන පිරිනැමීමේ දී අගය එකතු කළ තේ කාණ්ඩයට අනුග්‍රහය දක්වනු ලැබේ.
- ශ්‍රී ලංකා තේ කර්මාන්තයේ නිෂ්පාදන නවෝත්පාදන සහ විවිධාංගීකරණය දිරිගැන්වීම සඳහා සහනාධාර යෝජනා ක්‍රමයේ නව ව්‍යාපෘති සැලසුම් ක්‍රියාකාරකම් සිදු කිරීම.
- අගය එකතු කළ තේ අපනයනය දිරිගැන්වීම සඳහා අපනයනකරුවන් සඳහා 5% දිරි දීමනා යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම.

**9 කර්මාන්ත නවෝත්පාදන සහ යටිතල පහසුකම්**

- තේ කම්හල් නවීකරණ සහනාධාර යෝජනා ක්‍රමය ක්‍රියාවට නංවා ඇති අතර මේ වන විට රුපියල් මිලියන 20.19ක් වැය කරමින් කර්මාන්ත ශාලා 42ක් ආවරණය කර ඇත.
- ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කාර්ය මණ්ඩලය අතර කොවිඩ් 19 වසංගත කාලසීමාව තුළ සිංහ ලාංඡනය සහිත ප්‍රවර්ධන වැඩසටහන් සමග සායම් කළ මුහුණු ආවරණ බෙදා දෙන ලදී.

**12 වගකීමෙන් යුතු පාරිභෝජනය සහ නිෂ්පාදනය**

- තේ ඉඩම්වල තේ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා තේ නැවත වගා කිරීමේ සහනාධාර යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කෙරේ. සහනාධාර යෝජනා ක්‍රමය යටතේ හෙක්ටයාර 263ක් නැවත වගා කිරීම සඳහා 2021 වර්ෂයේදී රුපියල් මිලියන 79.81ක් ගෙවා ඇත.
- තේ කර්මාන්ත ශාලා 250ක් සඳහා තෙතමන මැනුම් උපකරණ ලබා ගැනීම සඳහා රු.මි.25ක් වෙන් කරන ලදී.
- තේ කර්මාන්තශාලා 214 ක ප්‍රමිතීන් සහ ජාත්‍යන්තර පිළිගැනීම වැඩි දියුණු කිරීම වෙනුවෙන් HACCP සහතිකය ලබා ගැනීම සඳහා 50% සහනාධාර යෝජනා ක්‍රමයක් යටතේ රුපියල් මිලියන 10ක් වෙන් කරන ලදී.

**13 දේශගුණික ක්‍රියාකාරකම්**

- තේ ඉඩම්වල නිසි වාරිමාර්ග පද්ධතියක් ඇති කිරීම සඳහා වාරිමාර්ග සහනාධාර යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.
- ඉහළ සෙවන කළමනාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

**15 ගොඩබිම මත ජීවය**

- ආදර්ශ කාබනික/ජෛව පොහොර ව්‍යාපෘතිය- සහනාධාර මුදල - ඒකකයකට රු. 500,000/= ආදර්ශ පොහොර ඒකක 72ක් තම නිෂ්පාදනය කටයුතු ආරම්භ කර ඇති අතර මේ දක්වා මෙ.ටොන් 1400ක් නිෂ්පාදනය කර ඇත.
- කාබනික/ජෛව පොහොර සාමාන්‍ය ව්‍යාපෘතිය- සහනාධාර මුදල - ඒකකයකට රු.300,000/= වන අතර 2021 දෙසැම්බර් අවසානයේ ජෛව පොහොර ඒකක 141ක් ස්ථාපිත කිරීමට අනුමැතිය ලබාදී ඇති අතර 81ක් ගිවිසුම් අත්සන් කර ඇත.

**17 තිරසාර සංවර්ධනය සඳහා පාර්ශ්වකරුණයන්**

- ලංකා තේ අපනයනය හරහා ඉරානයට ශ්‍රී ලංකාවෙන් ගෙවිය යුතු හිඟ තෙල් නිරවුල් කිරීම සඳහා 2021 දෙසැම්බර් 21 වැනි දින ඉරාන ඉස්ලාමීය ජනරජය සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.
- ආනයන බදු සහ තිරුබදු නොවන බාධක (ඉන්දියාව / පකිස්ථානය / තුර්කිය / ඉරානය / රුසියාව / බංග්ලාදේශය / තායිලන්තය / දකුණු අප්‍රිකාව ආදී) අඩු කිරීම සඳහා අදාළ රජයන් සමග ද්විපාර්ශ්වික වෙළඳ රැස්වීම් පැවැත්වීම.

# 5.මූල්‍ය සමාලෝචනය

## මූල්‍ය තත්ව ප්‍රකාශය
2021 දෙසැම්බර් 31 දිනට

| වත්කම් | සටහන් | 2021 (රු.) | 2020 (රු.) |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | F | 908,011,343.42 | 834,002,398.10 |
| ඉඩම් සඳහා පෙර ගෙවුම් කල්බදු හිමිකම් | G | 2,503,722.21 | 2,580,107.81 |
| අස්පෘශ්‍ය වත්කම් | H | 24,353,346.91 | 18,683,407.32 |
| | | **934,868,412.54** | **855,265,913.23** |
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩ තොග | I | 32,614,624.72 | 35,975,522.72 |
| වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ | J | 133,629,022.43 | 86,978,501.12 |
| තැන්පතු සහ පෙර ගෙවුම් | K | 30,610,919.26 | 45,623,918.19 |
| අනෙකුත් මූල්‍ය වත්කම් | L | 8,752,587,567.50 | 7,621,289,731.25 |
| ණය | M | 1,244,653,507.12 | 2,210,370,586.25 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | N | 174,934,864.88 | 151,302,423.72 |
| | | 10,369,030,505.91 | 10,151,540,683.25 |
| **මුළු වත්කම්** | | **11,303,898,918.45** | **11,006,806,596.48** |

| හිමිකම් සහ වගකීම් | | | |
|---|---|---|---|
| දායක ප්‍රාග්ධනය | | 672,012,201.85 | 672,012,201.85 |
| රඳවා ගත් ඉපැයුම් | | (172,889,011.73) | (138,037,671.84) |
| ප්‍රවර්ධන සහ අලෙවි බද්ද | O | 9,476,026,218.81 | 9,151,390,517.56 |
| ප්‍රත්‍යාගණන සංචිත | | 537,223,480.50 | 537,223,480.50 |
| **මුළු හිමිකම්** | | **10,512,372,889.43** | **10,222,588,528.07** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| සේවක ප්‍රතිලාභ බැඳීම් | P | 58,344,043.65 | 70,461,681.09 |
| | | 58,344,043.65 | 70,461,681.09<br>70,461,681.09 |
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු ආදායම් බදු | Q | 22,959,560.28 | 34,614,463.63 |
| වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ | R | 709,462,474.79 | 678,318,079.34 |
| බැංකු අයිරාව | S | 759,950.30 | 823,844.35 |
| | | 733,181,985.37 | 713,756,387.32 |
| **මුළු වගකීම්** | | **11,303,898,918.45** | **11,006,806,596.48** |

පිටු අංක 71 සිට 83 දක්වා දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 84 සිට 89 දක්වා දැක්වෙන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අත්‍යවශ්‍ය අංගයකි. මෙම මූල්‍ය ප්‍රකාශ සැකසීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වග කියනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශ අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලද්දේය

| | | | |
|---|---|---|---|
| ........................ | ........................ | ........................ | ........................ |
| Director Finance | Director General | Chairman | Director |
| Date: | Date: | Date: | Date: 25/02/2022 |

## ආදායම් ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | සටහන් | 2021 (රු.) | 2020 (රු.) |
|---|---|---|---|
| **ආදායම** | **A** | **616,447,344.50** | **455,013,176.55** |
| | | | |
| **වියදම** | | | |
| තේ ක්ෂේත්‍ර සංවර්ධන වියදම් | B | (177,021,113.66) | (63,979,702.12) |
| පරිපාලන වියදම් | C | (449,018,158.62) | (442,916,930.49) |
| **මෙහෙයුම් අතිරික්තය / (හිඟය)** | | **(9,591,927.78)** | **(51,883,456.06)** |
| මූල්‍ය ආදායම් | D | 22,916,904.02 | 47,487,608.47 |
| මූල්‍ය වියදම් | E | (169,885.00) | (6,335,483.30) |
| **බදු අය කිරීමට පෙර අතිරික්තය / (හිඟය)** | | **13,155,091.24** | **(10,731,330.89)** |
| පොළී ආදායම මත ගෙවු බදු | R | (4,961,057.56) | (10,716,323.56) |
| **බදු අය කිරීමෙන් පසු අතිරික්තය / (හිඟය)** | | **8,194,033.68** | **(21,447,654.45)** |

පිටු අංක 71 සිට 83 දක්වා දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 84 සිට 89 දක්වා දැක්වෙන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අත්‍යවශ්‍ය අංගයකි.

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | 2021 (රු.) | 2020 (රු.) |
|---|---|---|
| **කාලපරිච්ඡේදය තුළ අතිරික්තය/ (හිඟය)** | **8,194,033.68** | **(21,447,654.45)** |
| ප්‍රත්‍යාගණන අතිරික්තය / (අලාභය) | - | 27,456,494.80 |
| **කාලපරිච්ඡේදය තුළ අතිරික්තය/ (හිඟය)** | **8,194,033.68** | **6,008,840.35** |

පිටු අංක 71 සිට 83 දක්වා දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 84 සිට 89 දක්වා දැක්වෙන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අත්‍යවශ්‍ය අංගයකි.

## හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | දායක ප්‍රාග්ධනය (රු.) | ප්‍රවර්ධන හා අලෙවි බද්ද (රු.) | ප්‍රත්‍යාගණන සංචිත (රු.) | සමුච්චිත ලාභය (රු.) | එකතුව (රු.) |
|---|---|---|---|---|---|
| **2019 ජනවාරි 01 දිනට ශේෂය** | **672,012,201.85** | **7,474,510,801.00** | **508,216,543.20** | **(123,546,104.00)** | **8,531,193,442.05** |
| ප්‍රවර්ධන හා අලෙවි බද්ද (සටහන -O) | - | 1,082,860,694.06 | - | - | 1,082,860,694.06 |
| ගැළපුම් | - | 446,175,971.87 | 1,550,442.50 | 3,869,486.48 | 451,595,900.85 |
| 2019 වර්ෂය සඳහා අතිරික්තය | - | - | - | 2,675,523.48 | 2,675,523.48 |
| **2019 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **672,012,201.85** | **9,003,547,466.93** | **509,766,985.70** | **(117,001,094.04)** | **10,068,325,560.44** |
| 2020 ජනවාරි 01 දිනට ශේෂය | 672,012,201.85 | 9,003,547,466.93 | 509,766,985.70 | (117,001,094.04) | 10,068,325,560.44 |
| ප්‍රවර්ධන හා අලෙවි බද්ද (සටහන -O) | - | 148,907,390.13 | - | - | 148,907,390.13 |
| ගැළපුම් | - | (1,064,339.50) | - | 411,076.65 | (653,262.85) |
| 2020 වර්ෂය සඳහා අතිරික්තය | - | - | 27,456,494.80 | (21,447,654.45) | 6,008,840.35 |
| **2020 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **672,012,201.85** | **9,151,390,517.56** | **537,223,480.50** | **(138,037,671.84)** | **10,222,588,528.07** |
| 2021 ජනවාරි 01 දිනට ශේෂය | 672,012,201.85 | 9,151,390,517.56 | 537,223,480.50 | (138,037,671.84) | 10,222,588,528.07 |
| ප්‍රවර්ධන හා අලෙවි බද්ද (සටහන -O) | - | 744,046,096.93 | - | - | 744,046,096.93 |
| ගැළපුම් | - | (419,410,395.68) | - | (43,045,373.57) | (462,455,769.25) |
| 2021 වර්ෂය සඳහා අතිරික්තය | - | - | - | 8,194,033.68 | 8,194,033.68 |
| **2021 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **672,012,201.85** | **9,476,026,218.81** | **537,223,480.50** | **(172,889,011.73)** | **10,512,372,889.43** |

පිටු අංක 71 සිට 83 දක්වා දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 84 සිට 89 දක්වා දැක්වෙන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අත්‍යවශ්‍ය අංගයකි.

## මුදල් ප්‍රවාහ ප්‍රකාශය
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| මෙහෙයුම් කටයුතුවලින් මුදල් ප්‍රවාහ | 2021 (රු.) | 2020 (රු.) |
|---|---|---|
| **මෙහෙයුම් කටයුතුවලින් ලද ශුද්ධ ලාභය** | **8,194,033.68** | **(21,447,654.45)** |
| පහත සඳහන් කාරණා සඳහා ගැලපුම්: | | |
| දේපල, පිරියත සහ උපකරණ ක්ෂය වීම | 38,154,508.97 | 43,153,712.06 |
| දේපල, පිරියත සහ උපකරණ අපහරණයෙන් ලද ලාභය හෝ පාඩුව | 931.09 | - |
| කල්බදු ඉඩම් ක්‍රමක්ෂය කිරීම | 76,385.60 | 76,385.60 |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීම | 3,909,036.92 | 3,953,111.71 |
| පාරිතෝෂික ප්‍රතිපාදන | 957,005.52 | 18,461,431.13 |
| මූල්‍යමය වියදම් | 169,885.00 | 6,335,483.30 |
| මූල්‍යමය ආදායම් | (22,916,904.02) | (47,487,608.47) |
| ගැලපුම් | 6,198,261.03 | - |
| බදු සඳහා ප්‍රතිපාදන | 4,961,057.56 | 10,716,323.56 |
| | 31,510,167.67 | 35,208,838.89 |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය** | **39,704,201.35** | **13,761,184.44** |
| භාණ්ඩ ලැයිස්තුවල අඩුවීම / (වැඩිවීම) | 2,779,513.28 | (15,170,750.99) |
| වෙළඳ සහ අනෙකුත් ලැබිය යුත දෑ අඩුවීම /(වැඩිවීම) | (45,309,268.11) | (7,669,328.84) |
| තැන්පතු සහ පෙර ගෙවුම් අඩුවීම /(වැඩිවීම | 18,737,812.23 | 48,414,960.28 |
| වෙළඳ සහ අනෙකුත් ගෙවියයුතු දෑ අඩුවීම /(වැඩිවීම) | 68,568,208.23 | 171,595,789.11 |
| ගෙවිය යුතු අදායම් බදුවල අඩුවීම /(වැඩිවීම) | (11,654,903.35) | (35,298,324.06) |
| ප්‍රාදේශිය වැවිලි සමාගම් සඳහා ණය | 456,092,766.63 | (423,988,780.04) |
| | 489,214,128.91 | (262,116,434.54) |
| **මෙහෙයුම් කටයුතුවලින් ලද මුදල** | **528,918,330.26** | **(248,355,250.10)** |
| ගෙවනු ලැබූ පාරිතෝෂික | (13,074,642.96) | (15,074,040.00) |
| බදු ගෙවීම් | (4,961,057.56) | (13,456,705.65) |
| ප්‍රවර්ධන කටයුතු සඳහා ශුද්ධ වියදම | 743,107,884.59 | 147,843,050.63 |
| **මෙහෙයුම් කටයුතුවලින් ලද ශුද්ධ මුදල** | **725,072,184.07** | **119,312,304.98** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වල (භාවිත කරන ලද) මුදල් ප්‍රවාහ** | **1,253,990,514.35** | **(129,042,945.12)** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වල (භාවිත කරන ලද) මුදල් ප්‍රවාහ** | | |
| දේපල, පිරියත හා උපකරණ විකිණීමෙන් ලද මුදල් ප්‍රවාහ | 7,900.00 | - |
| මූල්‍ය ආදායම් | 22,916,904.02 | 47,487,608.47 |
| අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම | (9,578,976.51) | 1,195,033.02) |
| දේපල, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම | (112,172,285.40) | (13,793,605.58) |
| පිරියත හා යන්ත්‍රෝපකරණ ඇතුළු ආයෝජන | (1,131,297,836.25) | 158,906,893.26 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වල භාවිත කරන ලද ශුද්ධ මුදල් ප්‍රවාහ** | **(1,230,124,294.14)** | **191,405,863.13** |
| **මූල්‍ය කටයුතුවලදී භාවිත කරන ලද මුදල් ප්‍රවාහ** | | |
| මූල්‍ය වියදම් | (169,885.00) | (6,335,483.30) |
| බැංකු ණය | - | (135,682,622.16) |
| **ශුද්ධ මුදල් ප්‍රවාහ / මූල්‍ය කටයුතුවලදී (භාවිත කරන ලද)** | **(169,885.00)** | **(142,018,105.46)** |
| **ශුද්ධ වැඩිවීම (අඩුවීම) / මුදල් සහ මුදල් හා සමාන දේවල්** | **23,696,335.21** | **(79,655,187.45)** |
| **වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ** | **150,478,579.37** | **230,133,766.82** |
| **වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ** | **174,174,914.58** | **150,478,579.37** |

පිටු අංක 78 සිට 92 දක්වා දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 93 සිට 99 දක්වා දැක්වෙන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අත්‍යවශ්‍ය අංගයකි.

# මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන්
## 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

## 1. සංස්ථාව පිළිබඳ තොරතුරු

### පොදු

1985 අංක 17, 1990 අංක 44, 2003 අංක 29 හා 2006 අංක 44 දරන පනත්වලින් සංශෝධිත 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ 1976 ජනවාරි 01 දින ශ්‍රී ලංකා තේ මණ්ඩලය පිහිටුවන ලදී. මෙහි ප්‍රධාන කාර්යාලය අංක 574, ගාලු පාර, කොළඹ 03 යන ස්ථානයේ පිහිටා ඇත.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මාස දොළහක කාල පරිච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරනු ලබන අතර මෙම මූල්‍ය ප්‍රකාශන 2022 පෙබරවාරි 28 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබේ

### මූලික කාර්යයන්

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ පරමාර්ථය වනුයේ ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය නියාමනය කිරීම, සංවර්ධනය කිරීම, සහ ශ්‍රී ලංකා තේ (සිලෝන් ටී) ගෝලීය වශයෙන් ප්‍රවර්ධනය කිරීමයි. එයට තේ කර්මාන්තයේ කටයුතු නියාමනය කිරීමේ වගකීම හා අධිකාරිය පැවරී ඇත. එනම්, තේ නිෂ්පාදනය, අලුත් ප්‍රදේශවල තේ වගාකිරීම සහ තේ නැවත වගාකිරීම, පැරණි තේ වතු පුනරුත්ථාපනය කිරීම, තේ කර්මාන්තශාලා පිහිටුවීම සහ ඒවායේ මෙහෙයුම් යනාදී කටයුතු ය. තවද, තේ වෙන්දේසි පැවැත්වීම, ගුණාත්මක තත්වය අධීක්ෂණය කිරීම මෙන්ම තේ විකිණීම, අපනයනය, තැරැව්කරුවන්, ගබඩා සහ තේ බෙදා හැරීම ආදී කටයුතු නියාමනය කිරීම ද එමගින් සිදුකරනු ලබයි. තේ වතු පාලනයේ සහ තේ නිෂ්පාදනයේ මෙන්ම අලෙවිකරණයේ නියැලී සිටින සියලුම ආයතන සහ සංවිධාන නියාමනය කිරීම, පාලනය කිරීම සහ මෙහෙයවීමද ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සිදුකරනු ලබයි.

## 2. පිළියෙළ කිරීමේ පදනම

### 2.1. 2012 ජනවාරි 01 දිනෙන් හෝ එදිනෙන් පසුව ආරම්භ වන මූල්‍ය කාලපරිච්ඡේදය සඳහා අදාළවන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. සහ ලං.ගි.ප්‍ර.) පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මුදල් වාර්තාකරණ ප්‍රමිති (ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර) සහ ලංකා ගිණුම් ප්‍රමිති (ලං.ගි.ප්‍ර) වලින් සමන්විත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇත.

### 2.2 ගණනය කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත.
මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇත.

## 3. ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

### 3.1 ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී භාවිත කරන ලද ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත පරිදි වේ.

### 3.2 දේපළ, පිරියත සහ උපකරණ

කිසියම් සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානි පාඩු වෙතොත් ඒවා හැර, දේපළ, පිරියත හා උපකරණ පිරිවැය යටතේ දක්වනු ලැබේ. එම පිරිවැය යන්නට දේපළ, පිරියත සහ උපකරණවල උපාංග කොටස් ප්‍රතිෂ්ඨාපනය කිරීම් සඳහා දරනු ලබන පිරිවැය සහ හඳුනාගැනීමේ නිර්ණායකයන් සපුරාලයි නම් දීර්ඝකාලීන ඉදිකිරීම් සඳහා අදාළ වන ණය පිරිවැය ඇතුළත් වේ. දේපළ, පිරියත සහ උපකරණවල වැදගත් කොටස් වරින්වර ප්‍රතිස්ථාපනය කිරීමට අවශ්‍යවන විටදී ශ්‍රී ලංකා තේ මණ්ඩලය ප්‍රතිෂ්ඨාපිත උපාංග හඳුනා නොගන්නා අතර නව කොටස් ඒවායේ සඵල ආයු කාලය හා ක්ෂයවීම මත හඳුනාගනී. එසේම ප්‍රධාන පරීක්ෂණයක් සිදුකරන අවස්ථාවකදී එහි පිරිවැය හඳුනාගැනීමේ නිර්ණායකයන් සපුරාලයි නම් ප්‍රතිෂ්ඨාපනයක් වශයෙන් පිරියත සහ උපකරණවල ධාරණ අගය මත හඳුනාගනී. අනෙකුත් සියලුම අලුත්වැඩියා සහ නඩත්තු පිරිවැය දරන ලද පිරිවැයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශවල හඳුනාගනී.

### 3.3 ක්ෂයවීම

ක්ෂයවීම ගණනය කරනු ලබන්නේ පහත ආකාරයේ දේපල, පිරියත හා උපකරණවල පිරිවැය හෝ ඇස්තමේන්තුගත සඵල ආයු කාලය මත පදනම්වූ සෘජු රේඛීය ක්‍රමයෙනි.

| | |
|---|---|
| සින්නක්කර ගොඩනැගිලි | අවුරුදු 50 |
| කාර්යාල උපකරණ | අවුරුදු 02 - 20 |
| ලිබඩු සහ සවිකුරු | අවුරුදු 01 - 20 |
| මෝටර් වාහන | අවුරුදු 10 |
| පරිගණක උපාංග | අවුරුදු 05 |
| පුස්තකාල පොත් | අවුරුදු 05 |
| රසායනාගාර උපකරණ | අවුරුදු 03 - 10 |
| පරිගණක මෘදුකාංග | අවුරුදු 01 - 10 |

## මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන්
### 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

### 3.4 ප්‍රත්‍යාගණනය

ඇතැම් වත්කම් ඉවත් කිරීමේ තත්වයට පැමිණීම හේතුවෙන් ඉඩම්, ගොඩනැගිලි සහ රසායනාගාර උපකරණ හැර සෙසු වත්කම් සඳහා නැවත තක්සේරුවක් සිදු කෙරිණි. ඉඩම් සහ ගොඩනැගිලි තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කරන ලදී. රසායනාගාර උපකරණ කාර්මික තාක්ෂණ ආයතනය විසින් තක්සේරු කරන ලද නමුත් තවමත් වාර්තාව ලබා දී නොමැත.

### 3.5 සිදු වෙමින් පවතින ප්‍රාග්ධන වැඩ

ශේෂ පත්‍රයේ දිනට ප්‍රාග්ධනීකරණය නොකරන ලද වර්ෂය තුළ වූ වියදම් සිදු වෙමින් පවතින ප්‍රාග්ධන වැඩ ලෙස දක්වන අතර ප්‍රාග්ධනීකරණය කර භාවිතයට ගෙන ඇති ප්‍රාග්ධන වත්කම් දේපල, පිරියත හා උපකරණ වෙත ලබා දී තිබේ.

### 3.6 කල්බදු ඉඩම්

යම් විධිවිධානයක්, වත්කමක් හෝ කල්බද්දක් ආරම්භක දිනයේ දී විධිවිධානයේ තත්වය මත පදනම් වන්නේ ද, විධිවිධානය සපුරාලීම යම් දේපලක්/-දේපොළ භාවිත කිරීම මත රඳා පවතින්නේ ද, නැතහොත් එකී විධිවිධානය මගින් දේපොළ භාවිත කිරීමේ අයිතිය ලබා දෙන්නේ ද (එම අයිතිය විධිවිධානයක නිශ්චිතව දක්වා නොමැති වුවද) යන්න තිරණය කෙරේ. කල්බදු වත්කම්වල ඇස්තමේන්තුගත සඵල ආයු කාලය පරිදි වේ.

කල්බදු ඉඩම අවුරුදු 50

### 3.7 අස්පෘශ්‍ය වත්කම්

වෙන වෙනම අත්පත් කරගනු ලැබූ අස්පෘශ්‍ය වත්කම් ආරම්භක හඳුනාගැනීමේ පිරිවැය මත ගණනය කරනු ලැබේ. ආරම්භක හඳුනාගැනීමෙන් අනතුරුව පිරිවැය අඩුකළ සමුච්චිත ක්‍රමක්ෂයට සහ කිසියම් සමුච්චිත හානි පාඩු වෙතොත් ඒ මත අස්පෘශ්‍ය වත්කම් ගණනය කරනු ලැබේ. ප්‍රාග්ධනිත සංවර්ධන පිරිවැය හැර අභ්‍යන්තර වශයෙන් ඇති කරගන්නා ලද අස්පෘශ්‍ය වත්කම් ප්‍රාග්ධනිත කරනු නොලබන අතර පිරිවැය දරනු ලබන වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනය තුළ පිරිවැය දක්වනු ලැබේ. අස්පෘශ්‍ය වත්කම්වල සඵල ආයුකාලය පහත සඳහන් පරිදි වේ.

**2021.12.31 දිනට අස්පෘශ්‍ය වත්කම්**

| අස්පෘශ්‍ය වත්කම් | අපේක්ෂිත සඵල ආයු කාලය |
|---|---|
| POS පද්ධතිය - අලෙවි කවුන්ටරය | අවුරුදු 1 |
| SOL Server 2012 ප්‍රමිතිය සඳහා බලපත්‍රය | අවුරුදු 2 |
| Hsenid මෘදුකාංග පද්ධතිය | අවුරුදු 5 |
| Finpac මෘදුකාංග | අවුරුදු 6 |
| B 60 සහනය සඳහා මෘදුකාංග පැකේජය | අවුරුදු 4 |
| Hsenid මෘදුකාංග නිපැයුම MSL/Co. | අවුරුදු 4 |
| Factory Moder / ප්‍රතිරෝපණ මෘදුකාංගය | අවුරුදු 4 |
| Jumla මාදිලියේ වෙබ් අඩවිය | අවුරුදු 2 |
| Finpac ඒකක අනුකලනය | අවුරුදු 6 |
| FINPAC ස්ථාවර වත්කම් මොඩියුලය | අවුරුදු 10 |
| hSenid – TI මොඩියුල මෘදුකාංගය | අවුරුදු 3 |
| DMS- තේ ඉඩම් ලියාපදිංචි කිරීමේ මෘදුකාංගය | අවුරුදු 10 |
| Hsenid මානව සම්පත් පද්ධතිය | අවුරුදු 3 |
| DMS – තේ ඉඩම් දත්ත කළමනාකරණ පද්ධතිය | අවුරුදු 10 |
| පද්ධතිය | අවුරුදු 5 |
| Hsenid වැටුප් ගෙවීමේ මොඩියුලය | අවුරුදු 5 |
| POS භාණ්ඩ ලැයිස්තු පාලන පද්ධතිය | අවුරුදු 10 |

### 3.8 බදු අයකිරීම

ශ්‍රී ලංකා තේ මණ්ඩලය ආදායම් බදු ගෙවනු ලැබුවේ උපයන පොලී ආදායම සඳහා පමණි. මූල්‍ය ප්‍රකාශන සඳහා R සටහනෙහි අදාළ විස්තර දක්වා ඇත. මුදල් සංසන්දනය කිරීම සඳහා භාවිත කරනු ලබන බදු අනුපාත සහ බදු නිති වාර්තා කරන දිනයේදී බලාත්මක කරන ලද හෝ සැලකිය යුතු ලෙස බලාත්මක කරන ලද ඒවා වේ.

## මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන්
**2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

### 3.9 භාණ්ඩ ලැයිස්තු
පළමුව ගත් භාණ්ඩය පළමුව නිකුත් කිරීමේ පදනම යටතේ කල් ඉකුත් වූ සහ අඩු ක්‍රියාකාරීත්වයක් සහිත අයිතම සඳහා නියමිත ගැළපීම් කිරීමෙන් පසු පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය මත භාණ්ඩ තොග හඳුනාගනී.

### 3.10 මුදල් සහ මුදල් හා සමාන දෑ
මුදල් සහ මුදල් හා සමාන දෑ සමන්විත වනුයේ අතැති සහ බැංකුවේ ඇති මුදල් මෙන්ම අනෙකුත් කෙටිකාලීන ඉහළ උවශීල ආයෝජනවලිනි.

## 4. වගකීම් සහ ප්‍රතිපාදන

### 4.1 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

#### 4.1.1 නිර්ණිත ප්‍රතිලාභ සැලසුම් - විශ්‍රාම පාරිතෝෂිකය
1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත ප්‍රකාරව පාරිතෝෂික ගෙවීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය බැඳී සිටී. සේවකයෙකු පාරිතෝෂික ලබා ගැනීම සඳහා හිමිකම් ලබන්නේ එකී සේවකයා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අඛණ්ඩව වසර පහක සේවා කාලයක් සපුරන්නේ නම් පමණි. මෙම වගකීම ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 මගින් නිර්දේශ කර ඇති පරිදි ප්‍රක්ෂේපිත ඒකක ණය (PUC) ක්‍රමය මගින් ක්‍රියාත්මක කරන ලදී. "සේවක ප්‍රතිලාභ"- වර්ෂයේ ආරම්භයේ දී ඉදිරියට ගෙන එන ලද ප්‍රතිපාදන සහ වසර අවසානයේ ඉදිරියට ගෙන යන ලද ප්‍රතිපාදන අතර වෙනස වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය සමග සම්බන්ධව පවතී.

ගණනයේ දී භාවිත කරනු ලබන ප්‍රධාන උපකල්පන පහත පරිදි වේ.

අපේක්ෂිත වාර්ෂික සාමාන්‍ය වැටුප - 1.01% to 1.03%
වර්ධන අනුපාතය - 1.01% to 1.03%
පොලී අනුපාතය /වට්ටම් අනුපාතය - 8.2%
කාර්ය මණ්ඩල පිරිවැටුම් - 5.32%

ඒ අනුව උපකල්පන හා පැහැදිලි කරන ලද ක්‍රමවේදය මත පදනම්ව සේවයේ නියුතු සේවකයින් සම්බන්ධයෙන් 2021 දෙසැම්බර් 31 දිනට නියමිත නිර්ණිත ප්‍රතිලාභ වගකීමේ (PVD BO) වර්තමාන වටිනාකම රුපියල් 58,344,043.65ක් ලෙස දැක්වේ.

#### 4.1.4 නිර්ණිත දායක සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල
අදාළ නීති රීති මගින් ආවරණයවන සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් දායකත්වය ලබා දේ. සේවකයන් සඳහා මෙම සැලසුම වෙත කරනු ලබන දායකත්වය වියදමක් ලෙස ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගනු ලැබේ.

**සේවක අර්ථසාධක අරමුදල**
| සංචාරක බංගලාව | 34,350.00 | 118,000.00 |
| | **534,692.00** | **1,342,302.00** |
| **05. වෙනත් ආදායම්** | | |
| කාර්යමණ්ඩල ණය සඳහා පොළිය | 1,612,403.93 | 1,435,900.37 |
| විවිධ ආදායම | 2,391,408.67 | 4,098,502.93 |
| සංඛ්‍යානමය සාරාංශය විකිණීම | 87,350.00 | 94,247.08 |
| වාර්ෂික වාර්තාව විකිණීම | 266,000.00 | 291,300.00 |
| පුවත් ලිපිය | 414,000.00 | 342,000.00 |
| පෝස්ටර්, නාමාවලි සහ අනෙකුත් දෑ | 7,342.00 | 223,260.00 |
| විකිණීම ස්ථාවර වත්කම් බැහැර කිරීමේ ලාභය | - | 340.66 |
| විභාග ගාස්තු | 173,000.00 | 117,150.00 |
| | **4,951,504.60** | **6,602,701.04** |
| **06. පරිපාලන වියදම්** | | |
| **6.1 පුද්ගල පඩිනඩි** | | |
| වැටුප් | 130,404,590.17 | 134,269,976.10 |
| වෙනත් දීමනා (අන්තර්වාර / වෙනත්) | 4,156,736.15 | 4,653,225.34 |
| අතිකාල හා නිවාඩු දින දීමනා | 8,526,645.68 | 9,380,206.01 |
| දෛනිකව ගෙවන වැටුප | 3,953,875.00 | 3,065,365.00 |
| ජීවන වියදම් දීමනා | 24,361,165.48 | 25,193,892.45 |
| කාර්යාල කටයුතුවලින් පසු වියදම් - අපනයන | 48,825.00 | 297,518.21 |
| සේවක අර්ථ සාධක අරමුදලට දායකත්වය | 22,960,283.45 | 23,948,061.84 |
| සේවක භාරකාර අරමුදලට දායකත්වය | 4,588,831.40 | 4,788,966.30 |
| කාර්ය මණ්ඩල පාරිතෝෂික | 957,005.52 | 18,461,431.13 |
| | **199,957,957.85** | **224,058,642.38** |

## මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තරාත්මක උපලේඛන
2021 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | 2021 (රු.) | 2020 (රු.) |
|---|---|---|
| **6.2 වෙනත් පරිපාලන වියදම්** | | |
| සාමාජිකත්ව දායකත්වය (වෘත්තිය) | 67,000.00 | 16,000.00 |
| කාර්ය මණ්ඩලයට ප්‍රසාද දීමනා | 4,000,000.00 | 4,000,000.00 |
| වෛද්‍ය ප්‍රතිලාභ / පුද්ගලික අනතුරු වෙනුවෙන් හිමිකම් ඉල්ලීම් | 31,947,682.53 | 22,731,833.07 |
| කාර්ය මණ්ඩලයට සපයන දියර තේ | 1,718,701.48 | 1,765,281.70 |
| කාර්ය මණ්ඩලයට පැකට් කළ තේ සැපයීම | 5,653,420.42 | 6,066,360.00 |
| සේවක සුබසාධනය | 1,620,946.09 | 1,696,386.60 |
| මරණ පරිත්‍යාගය | 750,000.00 | 750,000.00 |
| ක්‍රීඩා / විනෝදාත්මක පහසුකම් | - | 250,000.00 |
| කාර්යමණ්ඩල දේපල ණය සඳහා පොලිය | 786,252.08 | 752,800.92 |
| කාර්ය මණ්ඩල පුහුණු / සම්මන්ත්‍රණ / වැඩමුළු | 1,099,990.00 | 1,127,020.00 |
| මණ්ඩල / කමිටු සාමාජිකයින්ට ගාස්තු ගෙවීම් | 2,000,500.00 | 1,135,920.00 |
| මණ්ඩල රැස්වීම් වියදම් | 80,835.00 | 73,660.00 |
| විශ්ලේෂණ රසායනාගාරය - පරිභෝජන ද්‍රව්‍ය | 4,494,139.57 | 2,271,923.26 |
| විභාග ගාස්තු | 525,814.90 | 464,847.00 |
| ගනුදෙනුකරුගේ තැන්පතු ආපසු ගෙවීම් | 5,000.00 | 30,000.00 |
| උපදේශන ගාස්තු | 1,395,300.00 | 1,417,975.00 |
| සම්මුඛ පරීක්ෂණ මණ්ඩල ගාස්තු | 68,280.00 | 12,825.00 |
| | **56,213,862.07** | **44,562,832.55** |
| **07. ගමන් වියදම්** | | |
| ගමන් වියදම් (දේශීය) | 17,400,922.58 | 16,931,533.04 |
| | **17,400,922.58** | **16,931,533.04** |
| **08. සැපයුම් සහ අවශ්‍යතා** | | |
| මුද්‍රණ ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | 9,774,701.76 | 5,110,732.36 |
| ඉන්ධන සහ ලිහිසි තෙල් | 4,197,405.76 | 4,071,517.44 |
| යාන්ත්‍රික, විදුලි හා සාමාන්‍ය භාණ්ඩ | 217,401.00 | 262,287.50 |
| පොත්, වාර සඟරා සහ පුවත්පත් | 785,481.00 | 3,373,714.90 |
| නිල ඇඳුම් | 1,593,477.75 | 1,718,939.50 |
| | **16,568,467.27** | **14,537,191.70** |
| **09. අලුත්වැඩියා , නඩත්තු කිරීම සහ ප්‍රාග්ධන වත්කම්** | | |
| වාහන අලුත්වැඩියාව හා නඩත්තුව | 1,755,636.26 | 1,784,217.37 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාව හා නඩත්තුව | 371,434.06 | 1,949,136.07 |
| ගොඩනැගිලි අලුත්වැඩියාව හා නඩත්තුව | 5,515,278.60 | 1,057,697.96 |
| කාර්යාල උපකරණ අලුත්වැඩියාව හා නඩත්තුව | 7,368,265.60 | 6,828,726.96 |
| ගෘහ භාණ්ඩ හා සවිකුරු අලුත්වැඩියාව හා නඩත්තුව | 363,647.00 | 33,348.00 |
| වෙනත් උපයෝජන සේවා | 65,359.00 | 60,366.00 |
| සනීපාරක්ෂක සේවය | 6,700,060.96 | 6,240,473.50 |
| විද්‍යාගාර ප්‍රතිතනය හා උපකරණ නඩත්තු කිරීම | 402,762.53 | 723,305.39 |
| | **22,542,444.01** | **18,677,271.25** |

## මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තරාත්මක උපලේඛන
2021 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | 2021 (රු.) | 2020 (රු.) |
|---|---|---|
| **10. උපයෝගිතා සහ වෙනත් වියදම්** | | |
| පුවත්පත් දැන්වීම් | 5,909,995.54 | 1,349,338.50 |
| දුරකථන, ෆැක්ස් සහ අන්තර්ජාලය | 9,352,272.58 | 9,029,381.76 |
| තැපැල් ගාස්තු | 958,194.26 | 1,067,683.94 |
| විදුලිය | 8,665,618.10 | 10,926,319.58 |
| ගාස්තු සහ බදු | 1,476,416.09 | 1,688,463.07 |
| කුලිය | 10,141,494.83 | 8,208,570.00 |
| රක්ෂණය - ගොඩනැගිලි, වාහන ආදිය | 1,240,674.94 | 1,556,617.45 |
| ආරක්ෂක සේවා | 11,826,486.13 | 9,730,584.10 |
| විගණන ගාස්තු | 1,000,000.00 | 1,200,000.00 |
| නීති ගාස්තු | 360,957.48 | 572,155.00 |
| වෙනත් ගාස්තු | 655,843.20 | 770,307.07 |
| තේ සාම්පල පරීක්ෂණ ගාස්තු | 4,592,791.70 | 1,726,063.21 |
| ජල සැපයුම සහ උණුසුම් කිරීම | 811,498.05 | 678,806.48 |
| තේ රස බැලීමේ මණ්ඩල ගාස්තු | 2,104,380.00 | 2,352,100.00 |
| විවිධ වියදම් | 550,096.95 | 426,187.13 |
| ප්‍රවාහන හා කුලී ගාස්තු | 70,000.00 | 107,500.00 |
| වාහන සඳහා බදු කුලී | 19,928,976.34 | 19,259,556.21 |
| ඉඩම් සඳහා බදු කුලී | 620,400.00 | 1,513,500.00 |
| බැහැර කිරීමේ පාඩුව | 931.09 | - |
| හදිසි අවස්ථා - කෝවිඩ් -19 | 15,564,842.03 | 6,575,470.42 |
| නුවර එළිය වියදම් | 29,750.00 | 34,040.00 |
| | **95,861,619.31** | **78,772,643.92** |
| **11. තොග** | | |
| **11.1 රසායනාගාරය** | | |
| රසායනාගාර පරිභෝජන ද්‍රව්‍ය | 10,947,475.47 | 7,268,252.51 |
| | **10,947,475.47** | **7,268,252.51** |
| **11.2 පරිභෝජන ද්‍රව්‍ය** | | |
| ලිපි ද්‍රව්‍ය | 6,723,205.03 | 8,628,347.99 |
| ප්‍රවර්ධන ද්‍රව්‍ය | 2,017,917.46 | 6,026,463.88 |
| | **8,741,122.49** | **14,654,811.87** |
| **11.3 තේ සහ වෙනත් තොග** | | |
| තේ - ප්‍රධාන ගබඩා | 3,239,035.88 | 4,088,745.93 |
| තේ - විකුණුම් කවුන්ටරය | 228,439.67 | 354,148.48 |
| කාර්ය මණ්ඩල සඳහා තේ | 601,140.00 | 805,185.00 |
| හිස් පෙට්ටි | 6,314,182.98 | 3,553,486.71 |
| තේ රැගෙන යන බෑග | 74,955.90 | 89,241.85 |
| ගැට ගසන පටිය | 33,400.00 | 33,400.00 |
| | **10,491,154.43** | **8,924,207.97** |

## මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තරාත්මක උපලේඛන

### 2021 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | 2021 (රු.) | 2020 (රු.) |
|---|---|---|
| **11.4 සංක්‍රමණ භාණ්ඩ** | | |
| | 2,434,872.33 | 5,128,250.37 |
| | **32,614,624.72** | **35,975,522.72** |
| **12. ලැබිය යුතු දේ** | | |
| විවිධ ලැබීම් | 37,713,739.58 | 39,754,875.30 |
| ණය ගැතියන් - ක්‍රිකට් ටී ෂර්ට් | 679,123.30 | 679,123.30 |
| ණය ගැතියන් පාලනය | 4,200,041.15 | 937,733.65 |
| ලැබිය යුතු ආදායම | 2,615,678.90 | 1,227,497.16 |
| පැකට් කළ තේ අලෙවිය | 638,596.81 | 448,176.28 |
| හිඟය | 195,463.40 | 1,313,986.03 |
| | **46,042,643.14** | **44,361,391.72** |
| **12.1තානාපති කාර්යාල ගිණුම** | | |
| චීනය | 84,764.07 | 84,764.07 |
| එක්සත් රාජධානිය | - | 368,447.03 |
| ජපානය | 472,024.13 | 19,089.91 |
| ප්‍රංශය | 389,602.00 | 513,985.35 |
| පෝලන්තය | 405,644.57 | 422,294.06 |
| ඕස්ට්‍රේලියාව | 28,294.72 | 27,965.78 |
| | **1,380,329.49** | **1,436,546.20** |
| **12.2 තේ ප්‍රවර්ධන ඒකකය - ජංගම ගිණුම්** | | |
| එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 9,623,368.84 | 790,450.15 |
| මොස්කව් | 3,971,946.09 | 706,093.59 |
| චීනය | 1,038,058.54 | 352,681.17 |
| | **14,633,373.47** | **1,849,224.91** |
| **13. ණය සහ අත්තිකාරම්** | | |
| ඒකාබද්ධ ණය - තේ කොමසාරිස් අංශය | 5,784,906.06 | 6,847,852.57 |
| ඒකාබද්ධ ණය - ප්‍රධාන කාර්යාලය | 31,310,802.54 | 31,486,862.54 |
| අත්තිකාරම් - උත්සව | 446,900.00 | 649,400.00 |
| කාර්ය මණ්ඩල තේ ප්‍රතිසාධනය | 148,650.00 | 202,625.00 |
| කාර්ය මණ්ඩල ණය ගැතියන් | 18,337.37 | 10,000.00 |
| අත්තිකාරම් - කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය | 33,470,665.50 | 23,138.85 |
| ණය සහ අත්තිකාරම් - මොස්කව් | 392,414.86 | 11,459.33 |
| වෙනත් අත්තිකාරම් - ප්‍රාදේශීය කාර්යාල | - | 100,000.00 |
| | **71,572,676.33** | **39,331,338.29** |

## මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තරාත්මක උපලේඛන
2021 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | 2021 (රු.) | 2020 (රු.) |
|---|---|---|
| **14. තැන්පතු සහ පෙර ගෙවුම්** | | |
| තැන්පතු | 6,182,536.19 | 5,204,386.19 |
| මුද්දර තැන්පතු | 160,000.00 | 160,000.00 |
| පාර්සල් තැපැල් තැන්පතු | 44,940.00 | 44,940.00 |
| තැන්පතු සහ පෙරගෙවුම් - එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 249,130.00 | 1,025,373.59 |
| තැන්පතු සහ පෙරගෙවුම් - මොස්කව් | 66,510.40 | 277,824.75 |
| තැන්පතු සහ පෙරගෙවුම් - චීනය | 691,801.35 | 652,781.00 |
| පෙර ගෙවීම් | 10,161,540.70 | 5,858,440.98 |
| සජීවිකරණ අත්තිකාරම් | 13,054,460.62 | 32,400,171.68 |
| | **30,610,919.26** | **45,623,918.19** |
| **15. ආයෝජන** | | |
| ස්ථාවර තැන්පතුව - ශ්‍රී ලංකා තේ මණ්ඩලය | 406,500,000.00 | 454,409,000.00 |
| ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී - ශ්‍රී ලංකා තේ මණ්ඩලය | 7,691,643.84 | 8,658,603.97 |
| ස්ථාවර තැන්පතුව - ප්‍රවර්ධන හා අලෙවිකරණ බද්ද | 8,138,139,497.72 | 6,956,839,407.93 |
| ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී - ප්‍රවර්ධන හා අලෙවිකරණ බද්ද | 197,367,713.88 | 198,683,436.01 |
| නිවාස ණය තැන්පතු - රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 2,888,712.06 | 2,699,283.34 |
| | **8,752,587,567.50** | **7,621,289,731.25** |
| **16. මුදල් සහ මුදල් හා සමාන දෑ** | | |
| **16.1 මුදල්** | | |
| සුළු අත්මුදල් - මුද්දර | 10,000.00 | 10,000.00 |
| සුළු අත්මුදල් ඊ පාලන | 25,000.00 | - |
| අත ඇති විකුණුම් මත එකතු කිරීම | 609,980.12 | 564,111.29 |
| | **644,980.12** | 574,111.29 |
| **6.2 බැංකු ශේෂ** | | |
| ලංකා බැංකුව - කොල්ලුපිටිය 2 | 385,191.77 | 7,360,716.77 |
| ලංකා බැංකුව- ආයතනික (ප්‍රධාන කාර්යාලය) | 385,191.77 | 7,360,716.77 |
| ලංකා බැංකුව - බම්බලපිටිය | 639,779.28 | 53,890,207.06 |
| ලංකා බැංකුව - ආයතනික (තේ කොමසාරිස් අංශය) | 6,360,655.60 | 14,771,515.46 |
| ලංකා බැංකුව - නිදහස් චතුරශ්‍රය | 1,037,195.00 | 719,225.00 |
| ලංකා බැංකුව - තේ සහනාධාරය | 93,105,339.13 | 37,899,557.29 |
| මහජන බැංකුව | 14,250.00 | 11,927,139.89 |
| | **163,779,442.78** | 144,012,319.66 |
| **6.3 ලංකා බැංකුව- ප්‍රාදේශීය කාර්යාලයේ ජංගම ගිණුම්** | | |
| ගාල්ල | 524,200.93 | 668,134.62 |
| මාතර | 371,819.01 | 416,354.34 |
| රත්නපුර | 1,330,978.61 | 702,144.92 |
| මතුගම | 492,173.06 | 352,980.50 |
| බණ්ඩාරවෙල | 198,679.40 | 425,693.30 |
| ගම්පොල | 45,621.29 | 390,947.15 |
| නුවරඑළිය | 228,516.51 | 161,477.50 |
| | **3,191,988.81** | 3,117,732.33 |

## මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තරාත්මක උපලේඛන

2021 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | 2021 (රු.) | 2020 (රු.) |
|---|---|---|
| **6.4 ලංකා බැංකුව- ප්‍රාදේශීය කාර්යාලයේ එකතු කිරීමේ ගිණුම්** | | |
| ගාල්ල | - | 401,251.74 |
| ගම්පොල | 3,293,895.50 | - |
| මතුගම | 2,529,397.80 | 2,817,634.50 |
| බණ්ඩාරවෙල | - | 379,374.20 |
| රත්නපුර | 21,254.03 | - |
| මාතර | **16,941.00** | - |
| | **5,861,488.33** | 3,598,260.44 |
| **16.5 ප්‍රාදේශීය කාර්යාලයේ ජංගම ගිණුම්** | | |
| ගාල්ල | 93,380.94 | - |
| ගම්පොල | 112,150.51 | - |
| නුවරඑළිය | 108,820.42 | - |
| බණ්ඩාරවෙල | 1,142,612.97 | - |
| | 1,456,964.84 | - |
| | 174,934,864.88 | 151,302,423.72 |

## 17.ණය හිමියන් සහ ප්‍රතිපාදන

| | 2021 (රු.) | 2020 (රු.) |
|---|---|---|
| **17.1 වෙළඳ ගෙවිය යුතු දෑ** | | |
| ගෙවිය යුතු දෑ | 16,713,008.33 | 9,207,524.78 |
| ණය හිමි පාලනය | 1,375,920.00 | 447,839.75 |
| ණය හිමි තේ ඇණවුම් | 24,641.88 | 24,641.88 |
| ණය හිමියන් සහ ප්‍රතිපාදන - එක්සත් අරාබි එමීර් රාජ්‍යය | - | 76,316.82 |
| ණය හිමියන් සහ ප්‍රතිපාදන - චීනය | 39,530.70 | 44,710.80 |
| ණය හිමියන් - තේ ඉඩම් ලියාපදිංචි කිරීම | - | 84,455.00 |
| ණය හිමියන් සහ ප්‍රතිපාදන - මොස්කව් | 508,668.90 | 3,057.37 |
| ගෙවිය යුතු හරිත පත්‍ර සහනාධාර | 912,229.53 | 912,229.53 |
| | **19,573,999.34** | 10,800,775.93 |
| **17.2 වෙනත් ගෙවීම්** | | |
| සාමාන්‍ය තැන්පතු | 220,410,000.00 | 220,515,162.50 |
| ආපසු ගෙවිය හැකි ටෙන්ඩර් තැන්පතුව | - | 9,000.00 |
| රඳවා ගැනීමේ මුදල් තැන්පතු | 36,609,794.51 | 22,687,433.42 |
| ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නිල අසුරුම්කරු | 3,321,120.82 | 14,505,079.99 |
| කාර්යමණ්ඩලයේ ණය හිමියන් | 4,092,126.89 | 4,697,094.30 |
| හිග - හරිත පත්‍ර තැන්පතු | 8,935,369.62 | 10,597,266.91 |
| සේවක අර්ථ සාධක අරමුදල - ගෙවිය යුතු | - | 3,217,320.96 |
| සමැජ තැන්පතුව | 161,400.00 | 161,400.00 |
| රඳවා ගැනීමේ දිරි දීමනා - විකුණුම් කවුන්ටරය | 18,532.46 | 41,930.42 |
| ආදර්ශ තේ වතු සඳහා සහනාධාර ක්‍රමය | 30,876,856.50 | 12,079,356.50 |
| ගෙවිය යුතු වැට් බදු | 1,917,594.60 | 2,263,561.90 |
| | **306,342,795.40** | 290,774,606.90 |

## මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තරාත්මක උපලේඛන

### 2021 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | 2021 (රු.) | 2020 (රු.) |
|---|---|---|
| **17.3 කල් ඇතිව ලැබීම්** | | |
| කල් ඇතිව ලැබීම් | - | 200,142.00 |
| නුවරඑළිය - විකුණුම් මධ්‍යස්ථානය | 1,620,000.00 | 1,620,000.00 |
| වෙළඳ ප්‍රදර්ශනය | 18,600,000.00 | 2,350,000.00 |
| බලපත්‍ර ගාස්තු | 7,697,000.00 | 8,167,900.00 |
| ප්‍රතික්ෂේපිත තේ | 915,000.00 | 510,000.00 |
| ගබඩාව අලුත් කිරීම | 1,990,000.00 | 1,920,000.00 |
| නිෂ්පාදන තැරැව්කරුවන් සඳහා බලපත්‍ර ගාස්තුව | 1,750,000.00 | 1,750,000.00 |
| තේ කර්මාන්තශාලා ලියාපදිංචිය | - | 1,210,000.00 |
| තේ ඇසුරුම්කරුවන් ලියාපදිංචි කිරීම | 150,000.00 | 50,000.00 |
| තේ අපනයනකරුවන් අලුත් කිරීම | 36,250,000.00 | 34,480,000.00 |
| තේ ඇසුරුම්කරුවන් අලුත් කිරීම | 2,560,000.00 | 2,460,000.00 |
| තේ ගබඩාව ලියාපදිංචි කිරීම | 75,000.00 | 75,000.00 |
| අපනයනකරුවන් ලියාපදිංචි කිරීම | 150,000.00 | 50,000.00 |
| දේශීය ඇසුරුම්කරුවන් ලියාපදිංචි කිරීම | 70,000.00 | - |
| තේ ආනයනකරුවන් අලුත් කිරීම | 440,000.00 | 415,000.00 |
| ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කාර්යමණ්ඩලය සඳහා වෛද්‍ය තැන්පතු | 711,200.00 | 366,834.00 |
| කල් ඇතිව ලැබීම් :තේ කර්මාන්තශාලා ලියාපදිංචිය, අලුත් කිරීම- | 1,375,000.00 | - |
| කල් ඇතිව ලැබීම් :තේ ආනයනකරුවන් ලියාපදිංචිය- | 10,000.00 | - |
| කල් ඇතිව ලැබීම් :දේශීය ඇසුරුම්කරුවන් අලුත් කිරීම- | 211,900.00 | - |
| කල් ඇතිව ලැබීම් :ප්‍රවර්ධන සහ අලෙවි බද්ද- | 40,553,780.13 | 24,808,058.70 |
| ඒකාධිකාරී කුලිය | - | 108,333.34 |
| විකුණුම් කවුන්ටරය - කුලී තැන්පතුව | 1,680,000.00 | 1,235,000.00 |
| තැන්පතු - BMF | 345,743.00 | 174,643.00 |
| | **117,154,623.13** | 81,950,911.04 |

| | 2021 (රු.) | 2020 (රු.) |
|---|---|---|
| **17.4 උපචිත වියදම්** | | |
| උපචිත වියදම් | 12,266,405.60 | 11,639,019.48 |
| උපචිත වියදම් - ප්‍රවර්ධන හා අලෙවි බද්ද | 44,514,202.56 | 267,125,405.06 |
| | **56,780,608.16** | 278,764,424.54 |

## මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තරාත්මක උපලේඛන

2021 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | 2021 (රු.) | 2020 (රු.) |
|---|---|---|
| **17.5 උපචිත වියදම්** | | |
| ගමන් | 4,284,096.98 | 5,588,982.27 |
| විගණන ගාස්තු | 1,894,000.00 | 2,400,000.00 |
| ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා මුද්‍රණය කිරීම | 139,332.00 | 138,056.71 |
| ඉන්ධන සහ ලිහිසි තෙල් | 307,910.00 | 403,074.00 |
| වාර සඟරා සහ පුවත්පත් | 21,590.00 | 13,010.00 |
| නඩත්තු වියදම් | 114,164.00 | 513,810.13 |
| තැපැල් හා සන්නිවේදනය | 607,514.49 | 999,488.94 |
| විදුලිය සහ ජලය | 755,492.06 | 1,602,642.79 |
| කුලී සහ දේශීය බදු | 55,000.00 | 107,500.00 |
| සනීපාරක්ෂක සේවා | 745,152.02 | 590,664.62 |
| ආරක්ෂක සේවා | 1,055,978.50 | 449,172.00 |
| නෛතික සහ වෙනත් ගාස්තු | - | 54,150.00 |
| වෛද්‍ය ප්‍රතිලාභ | 3,707,879.96 | 1,648,868.00 |
| කොවිඩ් 19 වියදම් | 2,005,233.52 | 1,464,024.00 |
| අතිකාල සහ දෛනිකව ගෙවන වැටුප | 1,099,563.25 | 53,917.47 |
| මහා පරිමාණ සහ මධ්‍යම පරිමාණ වගාකරුවන් සඳහා විසිරි ජල බිඳු පද්ධතිය | 20,310,800.00 | - |
| ජෛව පොහොර ව්‍යාපෘතිය සඳහා සහනාධාර ක්‍රමය | 58,700,000.00 | - |
| සූර්ය බලශක්ති පද්ධතිය ස්ථාපනය සඳහා සහනාධාර යෝජනා ක්‍රමය | 2,777,142.00 | - |
| යාන්ත්‍රිකකරණය සමග නව වගාව සඳහා සහනාධාර ක්‍රමය | 38,085,000.00 | - |
| GMP - තෙතමනය මීටර සහනාධාර යෝජනා ක්‍රමය | 500,000.00 | - |
| තේ තවාන් සංවර්ධන වියදම් සඳහා සහනාධාර | 67,775,000.00 | - |
| පොහොර T200 වැඩසටහන | 2,921,700.00 | - |
| අපනයනකරුවන්ගේ යන්ත්‍රෝපකරණ සංරචක සඳහා සහනාධාර යෝජනා ක්‍රමය | 1,747,899.98 | - |
| | **209,610,448.76** | 16,027,360.93 |

## 18. ප්‍රාදේශීය වැවිලි සමාගම සඳහා ලබා දී ඇති ණය ශේෂ

| | 'සව අත්තිකාරම් ණය | ආපදා ණය |
|---|---|---|
| කොටගල වැවිලි සමාගම | 5,657,492.22 | - |
| ආගරපතන වැවිලි සමාගම | 8,785,800.00 | 21,449,814.90 |
| ඇල්කඩුව වැවිලි සමාගම | 8,760,400.00 | - |
| | **23,203,692.22** | **21,449,814.90** |

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. : පීඑල්/ඩී/එස්එල්ටීබී/එෆ්එස්/2021/26
ඔබේ අංකය / உமது இல. / Your No. :
දිනය / திகதி / Date : 2022 සැප්තැම්බර් 05 දින

සභාපති,

ශ්‍රී ලංකා තේ මණ්ඩලය

**ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය අවසානය වන විට සම්පූර්ණයෙන් ක්ෂය කරනු ලැබූ පිරිවැය රු. 150,717,224 ක් වූ මෝටර් රථ, රසායනාගාර උපකරණ, කාර්යාල උපකරණ, යන්ත්‍ර හා උපකරණ, ජලය හා විදුලි උපකරණ, අස්පෘශ්‍ය වත්කම් හා සැරසිලි උපකරණ, පරිඝනක උපකරණ, ලී බඩු හා සවිකිරීම් සහ පුස්තකාල පොත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතියද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 51 ඡේදය ප්‍රකාරව එම වත්කම්වල ඵලදායි ජීව කාලය නැවත තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල රු. 350,000,000 ක වටිනාකමකට දැක්වෙන ප්‍රධාන කාර්යාලයේ ඉඩම 2008 දෙසැම්බර් 31 දිනෙන් පසුව හා රු. 26,300,000 ක වටිනාකමකට දැක්වෙන ගම්පොළ ප්‍රාදේශීය කාර්යාලය පිහිටි ඉඩම 2016 ජූලි 25 දිනෙන් පසුවද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 34 ඡේදය ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 ප්‍රකාරව විශ්‍රාම ප්‍රතිලාභ වගකීම ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් ප්‍රක්ෂේපිත ඒකක ණය (PUC) ක්‍රමය අනුගමනය කර තිබුණද, 2019 වර්ෂයේදී සිදු කරන ලද ආයුගණක තක්සේරුවේ නිර්දේශයන් පදනම් කර ගෙන මූල්‍ය වර්ෂය අවසානයේදී වර්තමාන සේවා පිරිවැය සහ පොලී පිරිවැය අනුව හඳුනාගත යුතු රු. 9,459,950 ක සේවක පාරිතෝෂික සඳහා වන වියදම සහ විශ්‍රාම ප්‍රතිලාභ මත සත්‍ය ලාභය වන රු. 8,502,945 ක වටිනාකම වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි කාලානුරූපීව හඳුනාගෙන නොමැති බව නිරීක්ෂණය විය. තවද මෙම බැඳීම් පියවීමට ප්‍රමාණවත් ආයෝජනයන් සිදු කර නොතිබුණි.

(ඈ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07 පරිදි සමාලෝචිත වර්ෂයේ බදු පෙර ලාභයට ගැලපීම කළ යුතු වුවත්,මණ්ඩලය විසින් බදු ගැලපීමෙන් පසු ලාභයට ගැලපීම් කර තිබුණි.

(ඉ) ව්‍යාපාර ආදායම් සහ වෙනත් ගාස්තු අයකිරීම් වැනි ආදායම් සඳහා බදු නිදහස් කිරීමක් ලබාගත් බවට සාක්ෂි නොතිබුණද, මණ්ඩලය විසින් ආයෝජන ආදායම් සඳහා හැර එබඳු වෙනත් ආදායම් සඳහා ආදායම් බදු ගෙවීමට කටයුතු කර නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. තවද සමාලෝචිත වර්ෂය සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ආයෝජන ආදායම් සඳහා බදු වියදම රු. 5,344 ,262 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන තුළ ශ්‍රී ලංකා තේ මණ්ඩලයට අදාළ බදු වියදම වශයෙන් රු. 4 ,961,057 ක් පමණක් හඳුනාගෙන තිබුණි. ඒ අනුව බදු වියදම හා ගෙවිය යුතු වියදම රු.383,205 කින් අඩුවෙන් ගලපා තිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඊ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලංකා බැංකු කොල්ලුපිටිය දෙවැනි ශාඛාවේ සහ ලංකා බැංකු බම්බලපිටිය ශාඛාවේ ගනුදෙනුකරුවන් විසින් සෘජුවම තැන්පත් කරන ලද පිළිවෙලින් රු. 6,391,886 ක හා රු. 7,307,960 ක මුදල් වෙනුවෙන් ආදායම් මූලාශ්‍රය හඳුනාගැනීමට නොහැකිව තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ ආදායම් රු. 13,699,846 කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි.

උක්ත කොල්ලුපිටිය දෙවැනි ශාඛාවේ 2021 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශයට අනුව 2020 වර්ෂයේදී සිදුව තිබුණු බැංකු දෝෂ වශයෙන් රු. 392,673 ක් දක්වා තිබුණද 2022 අප්‍රේල් 30 විගණන දින වන විටත් එම දෝෂය නිවැරදි කොට නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කොළඹ ප්‍රධාන කාර්යාලයේ මධ්‍යගත වායුසමීකරණ පද්ධතිය ස්ථාපිත කිරීමේ කොන්ත්‍රාත්තුවේ ආරම්භක අත්තිකාරම් මුදල වූ රු.6,951,410 ක් කොන්ත්‍රාත්කරුට ගෙවීම්කිරීමේදී අඩුකරගෙන තිබුණද වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගිණුම ඒ අනුව නිරවුල් කර නොතිබුණි.

(ඌ) ණයගැති පාලන ගිණුමේ 2021 දෙසැම්බර් 31 දිනට රු.4,200,041 ක හඳුනා නොගත් ශේෂයක් පැවති අතර එය නිරවුල් කිරීමට කටයුතු නොකිරීම නිසා ණයගැති ශේෂය හා ආදායම එම ප්‍රමාණයෙන් මූල්‍ය ප්‍රකාශනය තුළ වැඩියෙන් දක්වා තිබුණි.

(එ) මණ්ඩලය වෙත සමාලෝචිත වර්ෂය අවසානයට ලැබියයුතු මාර්ගස්ථ තොග ශේෂය වූ රු. 2,434,872 න් රු. 1,869,582 ක් මාස 12 කට වැඩි කාලයක සිට පැවත එන ශේෂයක් බව නිරීක්ෂණය වූ අතර, ඉන් රු. 429,229 ක තොග රසායනාගාර භාවිතයට ඇණවුම්කර ඇති රසායනික ද්‍රව්‍ය බවද නිරීක්ෂණය විය.

(ඒ) තේ කර්මාන්තශාලා වැසීම, ලියාපදිංචිය අවලංගු කිරීම, කොන්ත්‍රාත් කටයුතු සහ වෙනත් සේවා ප්‍රශ්න සම්බන්ධයෙන් තෙවන පාර්ශවයන් විසින් මණ්ඩලයට විරුද්ධව පැවරූ සහ මණ්ඩලය විසින් පවරන ලද නඩු 23 ක් සමාලෝචිත වර්ෂය තුළ විභාග වෙමින් පැවතුන අතර, 2021 ජූලි 27 දින ප්‍රකාශ කරන ලද බේරුම්කරණ නඩු තීන්දුවකට අනුව මණ්ඩලය විසින් කොන්ත්‍රාත්කරුවෙකු වෙත රු. 485,232 ක වන්දි මුදලක් ගෙවීමට තීන්දුවී තිබුණි. මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනයක් සිදු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මණ්ඩලයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන මණ්ඩලයේ 2021 සංශෝධිත වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මණ්ඩලයේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තවදුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

### 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව

ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තිරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (අ) යන ඡේදයේ දැක්වෙන නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක්

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති/ විධානයට යොමුව | නිරීක්ෂණ |
|---|---|
| (අ) 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 13 හා 14 වගන්ති | පනතේ විධිවිධාන අනුව රේගු දෙපාර්තමේන්තුව විසින් අයකළ සෙස් බදු, තේ මණ්ඩලයේ අරමුදලකට බැර කළයුතු නමුත් සෘජුවම මහා භාණ්ඩාගාරය වෙත බැර කර තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මු.රෙ. 715 (2) (ඉ) | භාණ්ඩ භාරගැනීම, භාරයේ තබා ගැනීම හා නිකුත් කිරීම යන කාර්යයන් පවරනු ලැබ සිටින ගබඩා භාරකරු විසින් බඩු බාහිර ලැබීම්, නිකුත් කිරීම් සහ නියාදනයන් සම්බන්ධයෙන් නියමිත ආකාරයෙන් රෙජිස්ටර හා ගිණුම් තබා ගත යුතු වුවත්, 2021 අප්‍රේල් 09 දින සිට එදිනට පැවති භෞතික තොග ශේෂය සඳහන් කර නව ගබඩා ලේඛනයක් ආරම්භ කර තිබුණු අතර, ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ඉකුත් මාසයන්ට අදාළ ගනුදෙනු කිසිවක් එහි ඇතුළත් කර නොතිබුණි. |

පිටුව 7 | 11

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| | |
|---|---|
| (ඇ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය | 2021 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් රු. 8,544,639,497 ක් ස්ථාවර හා කෙටිකාලීන තැන්පතුවල ආයෝජනය කර තිබුණු නමුත් ඒ සඳහා අදාළ අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගෙන නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලයේ තේ අලෙවිසැලෙහි ක්‍රියාකාරිත්වය පැවරීමේ කොන්ත්‍රාත්තුව වසර 6 ක කාලයක් සඳහා රු. 8,162,296 ක බදු මුදලකට, ගෙවීමේ හැකියාව පරීක්ෂා කිරීමෙන් තොරව පුද්ගලික පාර්ශවයකට ගිවිසුමකින් පවරාදී තිබුණි. ඒ හේතුවෙන් 2019 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළදී නුවරඑළිය තේ අලෙවි සැලෙන් මණ්ඩලයට අයවිය යුතු රු. 2,298,572 ක බදු මුදල් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) අපේක්ෂිත පිරිවිතරයන්ට අනුකූල නොවීම හේතුවෙන් භාවිතයට ගෙන නොතිබුණු, 2009 වර්ෂයේදී රු.32,132,088 ක් වැයකර මිලදී ගන්නා ලද පළිබෝධනාශක රසායනික සංඝටක විශ්ලේෂණ යන්ත්‍රය (Liquid Chromatography Mass Spectrometer) මිලදී ගැනීමේදී සිදුව ඇති අක්‍රමිකතා පිළිබඳ එවකට රසායනාගාරයට අනියුක්තව සේවය කළ සහකාර අධ්‍යක්ෂකවරයාට එරෙහිව චෝදනා පත්‍රයක් නිකුත් කර ඇතැත් විධිමත් විනය පරීක්ෂණය අවසන් කර ශ්‍රී ලංකා තේ මණ්ඩලයට සිදු වූ අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා තේවල ඇතුළත් Methyl Chloro Phenoxyacetic Acid (MCPA) ශේෂය පරීක්ෂා කිරීමට නව Liquid Chromatography Tendem Mass Spectrometer (LCMS/MS) උපකරණයක් මිලදී ගැනීම සඳහා ජාතික තරඟකාරී මිල කැඳවීම මගින් 2020 නොවැම්බර් 23 දින දෙහිවල ප්‍රදේශයේ පුද්ගලික කොන්ත්‍රාත්කරුවෙකු වෙත රු. 69,373,510 ක මුදලකට ප්‍රසම්පාදනය පිරිනමා තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුමේ 4.3.2 පරිදි Liquid Chromatography

පිටුව 8 | 11

ජාතික විගණන කාර්යාලය
දේසිය කණක්කාය්වු අලුවලකම්
NATIONAL AUDIT OFFICE
NAOSL

Tendem Mass Spectrometer (LCMS/MS) යන්ත්‍රය ස්ථාපනයට පසුව ISO 17025 පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව වාණිජමය වශයෙන් තේ නියැදි පරීක්ෂා කිරීමෙන් පසු තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය මත සියයට 50 ක දෙවන අත්තිකාරම් මුදල ගෙවිය යුතුව තිබුණි. එසේ වුවද, වාණිජ නියැදි මත පදනම්ව පරීක්ෂණ වාර්තා නිකුත් කිරීම 2021 දෙසැම්බර් 01 දින සිට සිදුකර තිබුණු අතර ඊට පෙර ලංසු ගිවිසුමේ කොන්දේසි වලට පටහැනිව ලංසු වටිනාකමින් සියයට 50ක් එනම් රු.34,917,055 ක මුදලක් 2021 අගෝස්තු 10 දින ගෙවා තිබුණි.

තවද යන්ත්‍රය ඉහළ ධාරිතාවයක් සහිත වුවද 2022 මැයි 25 දින වන විටදී මෙම යන්ත්‍රය භාවිතයෙන් MCPA පරීක්ෂණ 27 ක් පමණක් සිදුකර තිබුණු බව විගණනයට දන්වා තිබුණි. කර්මාන්තය තුළ පවතින රසායනාගාර පරීක්ෂණ අවශ්‍යතාවය ප්‍රමාණවත් ලෙස හා අප්‍රමාදව ඉටුකිරීමෙන් තොරව උපයෝජනය අඩුමට්ටමක පැවතුනද සැමවිටම වායුසමීකරණ තත්ත්වයක් යටතේ ඉහළ පිරිවැයක් ද දරමින් මෙම යන්ත්‍රය නඩත්තු කළ යුතු බවද තවදුරටත් නිරීක්ෂණය විය.

### 2.3 **වෙනත් කරුණු**

(අ) තේ කම්හල්හිමියන් විසින් හරිත තේ සපයන්නන් වෙත ගෙවීම සඳහා මණ්ඩලයේ තැන්පත් කර ඇති තැන්පතු මුදල් නිසි පරිදි නිරවුල් කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් වසර 1 සිට 19 දක්වා එනම් 2000 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය සඳහා නිරවුල් නොකරන ලද තැන්පතු ප්‍රමාණය රු. 6,908,583 කි. එය මුළු තැන්පතු ප්‍රමාණය වන රු. 8,935,369 න් සියයට 77 කි. මේ අනුව පරීක්ෂණ වලින් පසුව මෙම මුදල් ගෙවා නිම කිරීම හෝ ප්‍රතිලාභීන් නොමැති නම් ආපසු තැන්පත්කරුවන් වෙත මුදල් හරවා යැවීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) මණ්ඩලය විසින් 2003 සැප්තැම්බර් 19 දින ලබාදෙන ලද රු. 25,000,000 ක ණය මුදලක් වෙනුවෙන් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් හන්තාන පිහිටි "Ceylon Tea Museum" හි අයිතිය පවරා ගැනීමට ජනතා වතු සංවර්ධන මණ්ඩලය හා තේ මණ්ඩලය 2012 ජුනි 19 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියෝග අනුව තීරණයකට එළඹ තිබුණු නමුත්, මේ දක්වා වර්ෂ 09 කට වැඩි කාලයක් ගත වුවද මෙම ක්‍රියාවලිය අවසන් කරගෙන නොතිබුණි. Ceylon Tea Museum හි අයිතිය පවරාගැනීම හා ණය මුදල් ලබාදීම සම්බන්ධයෙන් දෙපාර්ශවය අතර කිසිදු ගිවිසුමකට එළඹ නොතිබුණි. තවද අංක 2020/492/65 දරන කළමණාකරන මණ්ඩල තීරණය අනුව 2020 පෙබරවාරි 27 දින ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ වතුයායේ කම්කරු වැටුප් ගෙවීම සඳහා තේ මණ්ඩලය විසින් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට නැවතත්

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

රු. 10,000,000 ක ණය මුදලක් ලබාදී තිබුණු අතර ඉන් රු 1,000,000 ක් පමණක් අයකරගෙන තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී මහනුවර හන්තානෙහි පිහිටි " සිලෝන් ටී මියුසියම් " හි කිසිදු ටිකට් පත් අලෙවි ආදායමක් නොමැතිව තිබියදී වියදම රු. 3,000,000ක් ප්‍රතිපූර්ණය කර තිබූ අතර, එය පසුගිය වර්ෂයේ වියදමට සාපේක්ෂව සියයට 41 ක වැඩි වීමක් පෙන්නුම් කරන බව නිරීක්ෂණය වේ. මේ මඟින් සිදුවන කාර්යභාරය සහ ප්‍රවර්ධන හා ප්‍රචාරණ දායකත්වය නැවත සමාලෝචනය කළ යුතු බව නිරීක්ෂණය විය.

(ඇ) ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) සහ පාකිස්තාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) යටතේ තේ සඳහා මනාප ගාස්තු අනුපාතයක් (Preferential Tariff Rate Quota) පැවතියද, එහි සැලකිය යුතු උපයෝජනයක් වාර්තා කිරීමට 2021 වර්ෂයේදීද හැකි වී නොතිබුණි. ඉන්දු ශ්‍රී ලංකා සහ පාකිස්තාන ශ්‍රී ලංකා වෙළඳ ගිවිසුම් යටතේ වසරකට පිළිවෙලින් කි. ග්‍රෑ . මිලියන 15ක් සහ 10ක් වශයෙන් කෝටා වෙන්කර තිබුණද එයින් උපයෝජනය කර තිබුණේ පිළිවෙලින් කි.ග්‍රෑ.74,006 ක් සහ කි.ග්‍රෑ.34,710ක් එනම් සියයට 0.49 ක් හා 0.35ක් පමණි.

(ඉ) ශ්‍රී ලංකාවේ මුළු තේ නිෂ්පාදනයද අපනයනයද ක්‍රමිකව වර්ධනය නොවීමෙන් අන්තර්ජාතික තේ කමිටු ප්‍රවෘත්ති අතිරේකය (Supplementary to International Tea Committee News Bulletin) අනුව 2011 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ තේ සඳහා වන ගෝලීය තේ වෙළඳපොළ කොටස (World Prod Share) සියයට 18 ක් වූවද සමාලෝචිත වර්ෂය වන විට ශ්‍රී ලංකාවේ තේ සඳහා වන ගෝලීය තේ වෙළඳපොළ කොටස සියයට 15 ක් දක්වා පහළ බැස තිබුණි.

(ඊ) මණ්ඩලය විසින් 2019 වර්ෂය අවසානය වන විට රු.211,115,401 ක් වැයකර ගොඩනැගිලි ඉදිකර තිබුණු නුවරඑළිය, බණ්ඩාරවෙල හා රත්නපුර ප්‍රදේශයන්හි පිහිටි ඉඩම් 3 ක අයිතිය නිත්‍යානුකූලව මණ්ඩලය වෙත පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) 2021 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත කාර්යය මණ්ඩලය 328 ක් වූ අතර සත්‍ය කාර්යය මණ්ඩලය 262 ක් විය. ඒ අනුව ඉහළ කළමනාකරණ මට්ටමට අයත් වන නියෝජ්‍ය අධ්‍යක්ෂ (අලෙවිකරණ), අධ්‍යක්ෂ (ප්‍රවර්ධන) සහ අධ්‍යක්ෂ (පාලන) යන තනතුරු 03 ක් (වර්ෂ 02 සිට මාස 06 ත් අතර) ඇතුළුව පුරප්පාඩු වූ තනතුරු 66 ක් වූ අතර ඒවා පිරවීමට හෝ අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනයට කටයුතු කර නොතිබුණි.

(ඌ) ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම හා එහි ප්‍රගතිය අනුව මණ්ඩලයේ රු. මිලියන 525 ක ඇස්තමේන්තුගත ක්‍රියාකාරකම්

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

තුනක මූල්‍ය ප්‍රගතිය සියයට 09 ත් සියයට 37 ත් අතර පැවති අතර, භෞතික ප්‍රගතිය සියයට 0 ත් සියයට 22 ත් තරම් අඩු මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ සැලසුම්කර තිබුණු නිවැරදිව තේ දළු නෙලාගැනීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන, යාන්ත්‍රිකව තේ දළු නෙලා ගැනීම සහ තේ කර්මාන්තශාලාවල සූර්ය බලශක්ති පද්ධති ස්ථාපිත කිරීම වැනි ක්‍රියාකාරකම් 14 ක භෞතික ප්‍රගතිය එහි ඉලක්කගත භෞතික ප්‍රගතියට වඩා සියයට 50 ට අඩු මට්ටමකින් පැවතුන බව නිරීක්ෂණය විය. තවද සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 325 ක ඇස්තමේන්තුගත ව්‍යාපෘති 2 කට අදාළ භෞතික ප්‍රගතිය ඉදිරිපත් කර නොතිබුණු අතර ඉන් රු. මිලියන 210 ක ක්‍රියාකාරකම් වෙනුවෙන් මූල්‍ය ප්‍රගතිය සම්බන්ධ තොරතුරු ද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

# ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කාර්යාල

## ප්‍රධාන කාර්යාලය

### ශ්‍රී ලංකා තේ මණ්ඩලය
574, ගාලු පාර, කොළඹ 03, ශ්‍රී ලංකාව
තැ.පෙ. 1750, කොළඹ ශ්‍රී ලංකාව
දු.ක.: 011 2582121 / 011 2583687
ක්ෂණික ඇමතුම්: 011 2587814
ෆැක්ස්: 011 2582122
විද්‍යුත් තැපෑල: teaboard@pureceylonte.com
වෙබ් අඩවිය: www.pureceylontea.com

### සභාපති
දු.ක.: 011 2587814 / 2590968
ෆැක්ස්: 011 2585701
විද්‍යුත් තැපෑල: chairman@pureceylontea.com

### අධ්‍යක්ෂ ජනරාල්
දු.ක.: 011 2587814 / 2508991
ෆැක්ස්: 011 2582122
විද්‍යුත් තැපෑල: dgsltb@pureceylontea.com

### තේ කොමසාරිස් අංශය
තේ කොමසාරිස්
දු.ක.: 0112580182/2580152 2502485/2584845/2587814 /2587773
ෆැක්ස්: 011 2580161
විද්‍යුත් තැපෑල: tcd@pureceylontea.com

### තේ ප්‍රවර්ධන අංශය
අධ්‍යක්ෂ (තේ ප්‍රවර්ධන)
දු.ක.: 0112583343/2587814/2581418/2580169
ෆැක්ස්: 011 2587341
විද්‍යුත් තැපෑල: promotion@pureceylontea.com

### තේ අපනයන අංශය
නියෝජ්‍ය තේ කොමසාරිස් (අපනයන)
දු.ක.: 011 2502485/2584845/2587814/2504090/2587773
ෆැක්ස්: 011 2584844
විද්‍යුත් තැපෑල: exports@pureceylontea.com

### විශ්ලේෂණ රසායනාගාරය
අධ්‍යක්ෂ (රසායනාගාර)
දු.ක.: 011 2587814රැ2581576
ෆැක්ස්: 011 2581576
විද්‍යුත් තැපෑල: lab@pureceylontea.com

## ප්‍රාදේශීය කාර්යාලය

### නුවර එළිය
සහකාර තේ කොමසාරිස්
ප්‍රාදේශිය කාර්යාලය
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
10 කැගල්ල නානුඔය පාර නුවර එළිය
දු.ක./ෆැක්ස්: 0522234658
විද්‍යුත් තැපෑල :atcnuwaraeliya@pureceylonea.com

# ප්‍රාදේශීය කාර්යාල

## ගම්පොළ

සහකාර තේ කොමසාරිස්
ප්‍රාදේශීය කාර්යාලය
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
140, අඹගමුව පාර,ගම්පොල
දු.ක./ෆැක්ස්: 081-2352279
විද්‍යුත් තැපැල: atcgampola@pureceylontea.com

## මාතර

සහකාර තේ කොමසාරිස්
ප්‍රාදේශීය කාර්යාලය
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
23, අලුත් මාවත
උයන්වත්ත, මාතර
දු.ක. / ෆැක්ස් : 041-2222636
විද්‍යුත් තැපැල : atcmatara@pureceylontea.com

## බදුරලිය

සහකාර තේ කොමසාරිස්
ප්‍රාදේශීය කාර්යාලය
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
281, වතුරාන පාර, බදුරලිය
දු.ක. / ෆැක්ස් : 034-2247444
විද්‍යුත් තැපැල: atcmathugama@pureceylontea.com

## රත්නපුර

සහකාර තේ කොමසාරිස්
ප්‍රාදේශීය කාර්යාලය
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
611, නව නගරය, රත්නපුර
දු.ක./ෆැක්ස්: 045-2222136
විද්‍යුත් තැපැල: atcrathnapura@pureceylontea.com

## බණ්ඩාරවෙල

සහකාර තේ කොමසාරිස්
ප්‍රාදේශීය කාර්යාලය
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
විශාඛා මාවත, නව බදුල්ල පාර,
බණ්ඩාරවෙල
දු.ක. / ෆැක්ස් 057-2222812
විද්‍යුත් තැපැල: atcbandarawela@pureceylontea.com

## ගාල්ල

ප්‍රාදේශීය කාර්යාලය
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
59/A, ඉහල ඩික්සන් පාර, ගාල්ල
දු.ක. / ෆැක්ස් 091-2232052
විද්‍යුත් තැපැල : atcgalle@pureceylontea.com

# විදේශීය ශාඛා

## අමාත්‍ය (තේ ප්‍රවර්ධන) - මැදපෙරදිග/ගල්ෆ් /උතුරු ඇමරිකා

සිලෝන් තේ ප්‍රවර්ධන ඒකකය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොන්සල් ජනරාල් කාර්යාලය
තැ.පෙ: 51528, ඩුබායි, එක්සත් අරාබි එමීර් රාජ්‍යය
දු.ක. : 00971 4 3987871
දු.ක. : (සෘජු) : 00971 4 3989349
ෆැක්ස් : 00971 4 3987872

විද්‍යුත් තැපැල : ctbureau@emirates.net.ae
ceylonteadubai@gmail.com
ceylonte@eim.ae

## 3 වන ලේකම් (ප්‍රවර්ධන නිලධාරී)

සිලෝන් තේ ප්‍රවර්ධන ඒකකය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ තානාපති කාර්යාලය
24, ස්චෙප්කින විදිය, මොස්කව් 129090, රුසියාව
දු.ක: 007 495-688-1620
495-68811651 / 495-688-1463
ෆැක්ස්: 007-495-688-1757
විද්‍යුත් තැපැල: tea@srilankaembassy.ru

## 3 වන ලේකම් (තේ ප්‍රවර්ධන)

සිලෝන් තේ ප්‍රවර්ධන ඒකකය
ශ්‍රී ලංකා තානාපති කාර්යාලය,
අංක:3, ලාන් හුවා ලු, බීජිං - 100600,
මහජන චීන සමූහාණ්ඩුව
දු.ක: 00-86-10-65322919
ෆැක්ස්: 00-86-10-65325426
විද්‍යුත් තැපැල: ceylontea@slemb.com